(The Hon. Mahindananda Aluthgamage)
ගරු මන්ත්‍රීතුමාගේ ඒ කථාව අහලා විපක්ෂ නායකතුමා ඇ... ඇ... ගාලා මේසයට තට්ටුවක් දානවා, දුකයි. ගරු කථානායකතුමනි, මෙතුමන්ලා කිව්වා අපේ රටේ ආහාර හිඟයක් එනවා කියලා. මම ඔබතුමාට ඒකට උත්තරයක් දෙන්නම්, ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා. අපේ රටේ ගොවියෝ හෙක්ටෙයාර ලක්ෂ 13ක වී වගා කරනවා. ඒ කියන්නේ, යල කන්නයේදී හෙක්ටෙයාර ලක්ෂ 5යි; මහ කන්නයේදී හෙක්ටෙයාර ලක්ෂ 8යි. ඔක්කොම හෙක්ටෙයාර ලක්ෂ 13ක වී වගා කරනවා. ඒ කියන්නේ, හෙක්ටෙයාර එකකින් වී මෙට්‍රික් ටොන් 4.5ක් නිෂ්පාදනය කරන්න ඕනෑ. හෙක්ටෙයාර ලක්ෂ 13ක වී වගා කරනවා කියන්නේ, වී මෙට්‍රික් ටොන් මිලියන 5.5ක් අපි නිෂ්පාදනය කරන්න ඕනෑ.

අපේ මාසික සහල් පරිභෝජනය මෙට්‍රික් ටොන් 195,000යි. අපට අවුරුද්දකට සහල් මෙට්‍රික් ටොන් මිලියන 2.4යි ඕනෑ වෙන්නේ. සාමාන්‍ය අගයට වගා කළත් සහල් මෙට්‍රික් ටොන් මිලියනයක අතිරික්තයක් අපට තිබෙනවා. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මේ ගැන සමීක්ෂණය කළා. ඒ අනුව කුරුණෑගල දිස්ත්‍රික්කයේ නිෂ්පාදන අඩුව සියයට 10යි. සමහර දිස්ත්‍රික්කවල සියයට 25යි. ඒ සියයට විසිපහේ අඩුව අරගෙන බැලුවත්, අපට කිසිදු ආහාර හිඟයක් ඇති වෙන්නේ නැහැ, ගරු මන්ත්‍රීතුමා. අදත් අපි සහල් පරිභෝජනය කරන්නේ පසුගිය යල කන්නයේ වී නිෂ්පාදනයෙන්. මහ කන්නයේ වී අස්වැන්න කැපුවාට ඒවා තවම පාවිච්චි කළෙත් නැහැ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට මතක ඇති නේ එළවලු ගැන. මොකද, ඔබතුමා එළවලු ගැන කියනවා. පිටුපස පේළියේ මන්ත්‍රීතුමා, -*[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්න කෝ. රසායනික පොහොර ආනයනය කරන්නේ නැහැ කියපු ගමන් -*[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමා, මම කැමැතියි ගොවීන්ට මේ ඔක්කෝම ටික දෙන්න. ඔබතුමා දැක්කා නේ, ගොවියෝ ඇවිල්ලා පෙන්නුවා, කැරට් අලය පොඩියි; අල ගෙඩිය පොඩියි කියලා. හැබැයි, රසායනික පොහොර තහනම ඉවත් කරපු ගමන් වෙළඳපොළට ආපු කැරට් අලෙත් ලොකුයි; අල ගෙඩියත් ලොකුයි. ඉතින් දවස් හතරෙන් ගෙඩි ලොකු වෙන්න බැහැ නේ. ගරු මන්ත්‍රීතුමා, මම පිළිගන්නවා මේක අභියෝගයක් බව. රසායනික පොහොරවලින් ඉවත්වෙලා මේ යන ගමන අභියෝගයක් බව අපි පිළිගන්නවා. ගරු මන්ත්‍රීතුමා, මේ කටයුත්ත අමාරුයි කියන එක අමතක කරන්න එපා. මේක අමාරුයි. හැබැයි, වස විසෙන් තොර ආහාර -*[බාධා කිරීමක්]* මොකක්ද, ගරු මන්ත්‍රීතුමා?

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
මට ප්‍රශ්නයක් අහන්න පුළුවන්ද?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
බැහැ. රනිල් වික්‍රමසිංහ මහත්මයා මට "හා" කිව්වොත් ඔබතුමාට අවසර දෙනවා. *[බාධා කිරීම්]* එතුමා තමයි දැන් අපේ ලොක්කා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කරුණාකරලා දැන් ඔය ඇති.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු මන්ත්‍රීතුමා, අපි වී ගොවීන් සඳහා වන්දි දෙන්න කටයුතු කරලා තිබෙනවා. එළවලු ගොවීන්ගේ නිෂ්පාදනයේ අඩුවක් වුණු බවත් මම පිළිගන්නවා. හැබැයි, ඔවුන්ට හොඳ මිලක් ආවා. බලන්න, නුවරඑළිය දිස්ත්‍රික්කයේ ලොකුම අල මුදලාලි පිටුපස පේළියේ ඉන්නවා. එතුමාගෙන් අහන්න, මේ සැරේ ආදායම කීයද කියලා. *[බාධා කිරීම්]*

## පොලිස් සැරයන් සිට උප පොලිස් පරීක්ෂක දක්වා උසස්වීම: අවශ්‍ය සේවා කාලය

பொலிஸ் சார்ஜன்ட் தொடக்கம் உப பொலிஸ் பரிசோதகர் வரையான பதவி உயர்வு: தேவையான சேவைக் காலம்

PROMOTION FROM POLICE SERGEANT TO SUB POLICE INSPECTOR: SERVICE REQUIRED

30/2022

**2.** ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) පොලිස් සැරයන් තනතුරේ සිට උප පොලිස් පරීක්ෂක තනතුර දක්වා උසස්වීම සඳහා සම්පූර්ණ කළ යුතු සේවා කාලය;

(ii) එම උසස්වීම සඳහා සම්පූර්ණ කළ යුතු වෙනත් සුදුසුකම්;

(iii) පොලිස් විශේෂ කාර්ය බලකායේ සැරයන් තනතුරේ සිට උප පොලිස් පරීක්ෂක තනතුර දක්වා උසස්වීම සඳහා සම්පූර්ණ කළ යුතු සේවා කාලය;

(iv) එම උසස්වීම සඳහා සම්පූර්ණ කළ යුතු වෙනත් සුදුසුකම්;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) (i) උසස්වීම් ලබා දීමේදී, පොලිස් විශේෂ කාර්ය බලකායේ සැරයන්වරයකුට වඩා වැඩි සේවා කාලයක් අනෙකුත් පොලිස් සැරයන්වරයකුට සම්පූර්ණ කිරීමට සිදු වී ඇති බව පිළිගන්නේද;

(ii) මේ හේතුවෙන් අනෙකුත් පොලිස් නිලධාරින්ට අසාධාරණයක් සිදුවී ඇති බව පිළිගන්නේද;

(iii) ඉහත (i)හි සඳහන් සේවා කාලය සමාන කිරීම සඳහා පියවර ගෙන තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பொதுமக்கள் பாதுகாப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பொலிஸ் சார்ஜன்ட் பதவியிலிருந்து உப பொலிஸ் பரிசோதகர் வரையான பதவி உயர்வுக் கெனப் பூர்த்திசெய்ய வேண்டிய சேவைக் காலத்தையும்;

(ii) அந்தப் பதவி உயர்வுக்கெனப் பூர்த்திசெய்ய வேண்டிய வேறு தகைமைகளையும்;

(iii) பொலிஸ் விசேட அதிரடிப்படையில், பொலிஸ் சார்ஜன்ட் பதவியிலிருந்து உப பொலிஸ் பரிசோதகர் வரையான பதவி உயர்வுக்கெனப் பூர்த்திசெய்ய வேண்டிய சேவைக் காலத்தையும்;

(iv) அந்தப் பதவி உயர்வுக்கெனப் பூர்த்திசெய்ய வேண்டிய வேறு தகைமைகளையும்;

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) பதவி உயர்வுகள் வழங்கப்படும்போது, பொலிஸ் விசேட அதிரடிப்படையின் சார்ஜன்ட் ஒருவரை விடக் கூடுதலான சேவைக் காலத்தை ஏனைய பொலிஸ் சார்ஜன்ட் பூர்த்திசெய்ய வேண்டியிருப் பதை ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(ii) இதனால் ஏனைய பொலிஸ் உத்தியோகத்தர் களுக்கு அநீதி நேர்ந்துள்ளதை ஏற்றுக்கொள் வாரா என்பதையும்;

(iii) மேற்படி (i)இல் குறிப்பிடப்பட்டுள்ள சேவைக் காலத்தைச் சமப்படுத்துவதற்கு நடவடிக்கை எடுக்கப்பட்டுள்ளதா என்பதையும்;

(iv) அவ்வாறாயின், அதற்கென எடுத்துள்ள நடவடிக்கை யாது என்பதையும்;

அவர் மேலும் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Security:

(a) Will he state -

(i) the period of service that should be completed for a promotion from the post of Police Sergeant to the post of Sub Police Inspector;

(ii) other qualifications that should be completed for the aforesaid promotion;

(iii) the period of service that should be completed for a promotion from the post of Police Sergeant to the post of Sub Police Inspector in the Special Task Force; and

(iv) other qualifications that should be completed for the aforesaid promotion?

(b) Will he also state -

(i) whether he accepts the fact that a Sergeant who is not in the Special Task Force has to complete a period of service which is longer than the period of time that should be completed by a Sergeant of the Special Task Force, when promotions are granted to them;

(ii) whether he accepts the fact that an injustice has been caused by this to the police officers who are not in the Special Task Force;

(iii) whether steps have been taken to make the periods of service mentioned in (i) above equal; and

(iv) if so, the said steps?

(c) If not, why?

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා (මහජන ආරක්ෂක අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) சரத் வீரசேகர - பொதுமக்கள் பாதுகாப்பு அமைச்சர்)
(The Hon. (Dr.) Sarath Weerasekera - Minister of Public Security)
ගරු කථානායකතුමනි, ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) සීමිත තරග විභාග ක්‍රමය මත - වසර 03ක සක්‍රිය සේවා කාලයක්

කුසලතා පදනම මත - වසර 05ක සක්‍රිය සේවා කාලයක්

ජ්‍යෙෂ්ඨතාව මත - වසර 08ක සක්‍රිය සේවා කාලයක්

[ගරු ආචාර්ය) සරත් වීරසේකර මහතා]

(ii) උප පොලිස් පරීක්ෂක තනතුරට අදාළ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය ඇමුණුමෙහි දක්වා ඇත.

ඇමුණුම **සභාගත*** කරමි.

(iii) සාමාන්‍ය පොලිස් සේවයේ නිලධාරින් සඳහා සලකා බලනු ලබන සේවා කාලයම වේ.

(iv) ඉහත ඇමුණුමෙහි සඳහන් සුදුසුකම් වේ.

(ආ) (i) නැත.

අනුමත බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය අනුව පොලිස් විශේෂ කාර්ය බලකායේ හා සාමාන්‍ය පොලිස් සේවයේ පොලිස් සැරයන්වරුන් සඳහා එකම සේවා කාලයක් සලකනු ලබයි.

(ii) නැත.

(iii) 2020.10.23 දින අනුමත බඳවා ගැනීමේ සහ උසස් කිරීමේ පටිපාටිය අනුව පොලිස් විශේෂ කාර්ය බලකායේ සහ සාමාන්‍ය පොලිස් සේවයේ පොලිස් සැරයන්වරුන් සඳහා එකම සේවා කාලයක් සලකා බලනු ලබයි.

(iv) අදාළ නොවේ.

(ඇ) පැන නොනඟී.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, විෂය භාර ඇමතිතුමා ලෙස ඔබතුමා න්‍යායාත්මකව මේ කාරණය කිව්වත්, ඔබතුමා නිකමට මේ ගරු සභාවේ සිට පිටතට යන ගමන් පාර්ලිමේන්තුව තුළ සේවය කරන පොලිස් සාජන්ට් මහත්වරුන්ගෙන් ඇහුවොත්, මේ කියන යථාර්ථය නොවෙයි භූමියේ තිබෙන්නේ කියා ඔබතුමාට වැටහේවි. පොලීසියේ වෘත්තීය සමිති නැහැ. පවතින ක්‍රමවේදය අනුව, මේ අයට ලියමනක්, අභියාචනයක් ඉදිරිපත් කරන්න, තමුන්ගේ දුක කියන්න මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට එන්න පුළුවන්කමකුත් නැහැ. සමහර වෙලාවට ඔවුන් ගෙන යන පණිවුඩය ඔවුන්ට ඉහළින් සිටින ප්‍රධානියාගේ සිට තවත් ඉහළට ලැබුණත්, ඔබතුමාගේ අතට ලැබෙන ක්‍රමයකුත් නැහැ. ගරු ඇමතිතුමනි, ඔබතුමා දැන් පොලීසිය භාර ඇමති ලෙස කටයුතු කරන නිසාත්, ශ්‍රී ලංකා සිවිල් ආරක්ෂක බලකායේ සහ නාවික හමුදාවේ කටයුතු කළ නිසාත් දන්නවා, හමුදා තුළ වාගේම පොලීසිය තුළ විශේෂයෙන්ම පහළ මට්ටමේ නිලධාරින්ට, සෙසු නිල දරන නිලධාරින්ට තමන්ගේ දුක්ඛ දෝමනස්ස විසඳා ගැනීමට තිබෙන ක්‍රමවේද හරිම අඩුයි කියලා. පොලිස් සැරයන් තනතුරේ සිට උප පොලිස් පරීක්ෂක තනතුර දක්වාත්, පොලිස් කොස්තාපල් තනතුරේ සිට පොලිස් සැරයන් තනතුර දක්වාත් උසස්වීම සම්බන්ධයෙන් තිබෙන ගැටලු දෙස බැලුවාම සමහරුන්ට තිබෙන්නේ තමන්ටම කේන්ද්‍ර වෙච්ච ප්‍රශ්න. තවත් සමහරුන්ට තිබෙන්නේ පොදු ප්‍රශ්න. ගරු ඇමතිතුමනි, ගෙවී යන මේ 2022 අවුරුද්දේවත් මේ පිළිබඳව සලකා බලා නිල බල ධුරාවලිය රකින ගමන්, ඒ අයගේ හඬට ඇහුම්කන් දෙන ක්‍රමවේදයක් පිළිබඳව අලුතින් සිතා එය ක්‍රියාත්මක කරන්න ඔබතුමාගේ අමාත්‍යාංශයට පුළුවන්කමක් තිබෙනවාද?

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் வீரசேகர)
(The Hon.(Dr.) Sarath Weerasekera)
ගරු මන්ත්‍රීතුමනි, ඇත්ත වශයෙන්ම ඒක සාධාරණ ප්‍රශ්නයක්. ඒ වාගේ ප්‍රශ්න මීට කලිනුත් තිබුණා. මොකද, නියමිත ක්‍රමවේදයට අනුව උසස්වීම් සිදු නොකළ නිසා තමයි ඉතා විශාල stagnation එකක් වුණේ. ඒ කියන්නේ, බොහෝ අය උසස්වීම් නැතිව හිර වුණා. ඒ වාගේ 28,000කට 2019 වර්ෂයේදී උසස්වීම් ලබා දුන්නා. ඒ අවස්ථාවේදී එම උසස්වීම් සඳහා දිනයක්, දින 2ක්, දින 3ක්, දින 4ක්, සුමානයක්, මාසයක් වාගේ කාලයක් මදි වුණු තවත් විශාල සංඛ්‍යාවක් සිටින නිසා අපි ඔවුන් වෙනුවෙනුත් මෙවර කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර තිබෙනවා.

ඔබතුමා කියන දේ නිවැරදියි. එවැනි ක්‍රමවේදයක් නොමැති වීම නිසා තමන්ට තිබෙන දුක් වේදනාවලට නිසි පිළිතුරු නොලැබීම හේතුවෙන් තමයි බොහෝ පොලිස් නිලධාරින් නඩු මහට බැස්සේ. නමුත්, මහජන ආරක්ෂක අමාත්‍යාංශය පිහිටුවීමත් සමඟම ජනතාවට මා හමුවෙන්න පුළුවන් විධියට මාස දෙකෙන් දෙකට දින වෙන්කර තිබෙනවා. ඒ වාගේම අභියාචනා විශාල සංඛ්‍යාවකුත් මට ලැබී තිබෙනවා. මම හිතන විධියට, මහජන ආරක්ෂක අමාත්‍යාංශය ස්ථාපිත කළ පසු දෙදෙනෙකු හෝ තුන්දෙනෙකු හැර වෙනත් කිසි කෙනෙකු නඩු මහට බැස්සේ නැහැ. මොකද, ඔවුන්ගේ අභියාචනාවලට සාධාරණ පිළිතුරක් දෙන්න පුළුවන් ක්‍රමවේදයක් අපි දැනටමත් සකස් කරලා තිබෙනවා. ඒ අනුව, ඕනෑම කෙනෙකුට ඇවිල්ලා අද මා හමුවෙන්න පුළුවන්. දිනපතා හම්බවන අභියාචනාවලට සාධාරණ පිළිතුරක් ලබා දෙන්න ලේකම්වරයා හරහා පොලිස්පතිවරයාට මම ඒවා ඉදිරිපත් කරනවා. සමහර අභියාචනාවලට දැනටත් සාධාරණ පිළිතුරු ලබා දීලා තිබෙනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් මේ ගැනත් දැනගන්න කැමැතියි. මීට සති කිහිපයකට කලින් ජනතා විමුක්ති පෙරමුණේ රැස්වීමකට ප්‍රහාරයක් එල්ල වුණා. ඒ වාගේම හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රිනී හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය තවත් කාන්තාවන් පිරිසක් එක්ක ගිහිල්ලා ඔවුන්ට තිබෙන ජීවන වියදම් ප්‍රශ්න සහ විදුලිය කප්පාදුව ඇතුළු බොහෝ ප්‍රශ්න කිව්වාම, පෙරළා එතුමියගේ නිවස ඉදිරිපිටට ඇවිල්ලා උද්ඝෝෂණ කරලා තිබෙනවා. නමුත්, එතුමියගෙන් දිනා ගන්න දෙයක් නැහැ. මොකද, එතුමිය රාජ්‍ය ව්‍යුහය තුළ හෝ ආණ්ඩුවේ තනතුරක් දරන කෙනෙකු නොවෙයි. නමුත්, එතුමියට තර්ජන කර තිබෙනවා. ඒ වාගේම ඊයේ දිනයේදී සමගි ජන බලවේගයේ ප්‍රධාන කාර්යාලය ඉස්සරහට ඇවිල්ලා බිත්තර ප්‍රහාරයක් එල්ල කරලා තර්ජනාත්මකව කටයුතු කර තිබෙනවා. සමගි ජන බලවේගය පක්ෂයේ කාර්යාලය කියන්නේ, ජනාධිපති ලේකම් කාර්යාලය නොවෙයි, අමාත්‍යාංශයකුත් නොවෙයි. එතැනට ඇවිල්ලා දිනා ගන්න පුළුවන් ඉල්ලීම් නැහැ. හැබැයි, ඒ දේවල් සිදුවන හැම තැනකම වාගේ පොලීසියත් ඉන්නවා. නමුත්, ඒවාට පොලීසිය මැදිහත් වෙන්නේ නැහැ. ඒ පුද්ගලයන්ට ඒ විධියට තර්ජනාත්මකව ඇවිල්ලා ජනතා විමුක්ති පෙරමුණේ රැස්වීමට බිත්තර ගහලා යන්න පුළුවන්, සමගි ජන

---

*** පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

බලවේගය පක්ෂයේ ප්‍රධාන කාර්යාලයට බිත්තර ගහලා යන්න පුළුවන්. ඒ, විපක්ෂයේ ප්‍රධාන කාර්යාලය. හැබැයි, ඒවා සුළු කාරණා නොවෙයි. මේ කාරණාවලදී පොලීසිය මෙහෙම නිහඬව ඉන්නේ ඔබතුමන්ලාගේ උපදෙස් මතද? එහෙමත් නැත්නම් මේ ආණ්ඩුව මැදිහත් වන කාරණාවලදී පොලීසියට මැදිහත් වන්න එපා කියලාද? හැබැයි, මීට කලින් අපි උද්ඝෝෂණයකට කොළඹට එනකොට නම් හැම අධිවේගී මාර්ග පිවිසුමක් ළඟම බාධක ඇති කරනවා. ඒ වාගේ තැන්වලදී පොලීසිය සක්‍රිය අන්දමින් මැදිහත් වෙලා විපක්ෂය නවත්වනවා. නමුත්, විපක්ෂයට එරෙහිව යම් කිසි බලවේගයක් ක්‍රියාත්මක වෙනකොට, හීලෑ නොමැති සත්තු යන විධියට ඒකට යන්න ඉඩ දීලා නිහඬව ඉන්නවා. ඇයි, පොලීසිය මේ විධියට දෙබිඩි ආකාරයකට කටයුතු කරන්නේ? මේක පොලීසියට ඉහළින් ලැබෙන අණක් වෙන්න ඕනෑ. එක්කෝ ඒ අණ දෙන්න ඕනෑ, පොලිස්පතිවරයා හෝ ඊට පහළ ශ්‍රේණියේ උසස් නිලධාරියෙක්. එහෙමත් නැත්නම් විෂය භාර අමාත්‍යවරයා. එහෙමත් නැත්නම් ලේකම්වරයා. ගරු ඇමතිතුමනි, මේ සම්බන්ධයෙන් ඔබතුමාගේ පිළිතුර මොකක්ද?

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் வீரசேகர)
(The Hon.(Dr.) Sarath Weerasekera)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඇහුවේ ඉතාම හොඳ ප්‍රශ්නයක්. නමුත්, මම පැහැදිලිව කියන්න කැමැතියි, කිසිම දේශපාලන බලපෑමකට පොලීසිය යටත් වෙන්නේ නැති බව. ඔවුන් කරන්නේ ඔවුන්ගේ රාජකාරිය. උද්ඝෝෂණවලදී බොහෝ වෙලාවට උසාවියෙන් නියෝගයක් ගන්නවා. ඒ උසාවි නියෝගය අනුව තමයි පොලීසිය කටයුතු කරන්නේ. සමහර වෙලාවට උසාවියෙන් පොලීසියට කියනවා, "නීතිය ක්‍රියාත්මක කරන්න. නැත්නම් අත් අඩංගුවට ගන්න. එහෙම නැත්නම් විසුරුවන්න" කියලා. මේ ජනාධිපතිතුමා පත් වූ දින ඉඳලා අද වනතෙක් අපි කඳුළු ගෑස්, බැටන් පොලු ප්‍රහාර සහ ජල ප්‍රහාර එල්ල කරලා යහ පාලන රජය පැවැති කාලයේදී වාගේ උද්ඝෝෂකයන්ට අඩන්තේට්ටම් -හිරිහැර - කළේ නැහැ. අපි දන්නවා, පසුගිය කාලයේදී tear gas ගහලා රණවිරුවෙකුගේ ඇසක් පවා නැති වුණු බව. ඒ වාගේ කිසිම දෙයක් මේ ජනාධිපතිතුමාගේ කාලයේදී සිදු වුණේ නැහැ. අද ඕනෑම කෙනෙකුට උද්ඝෝෂණය කරන්න නිදහස තිබෙනවා. පොලීසිය ඔවුන්ගේ රාජකාරිය හරියට කරනවා. ඒකට කිසිම දේශපාලන බලපෑමක් නැහැ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්ව ඒ සියලු සිද්ධීන් සම්බන්ධයෙන් සිදු කළ විමර්ශන වාර්තා අවශ්‍ය නම් අපට ලිඛිතව ලබා දෙන්න පුළුවන්.

## දුම්රිය ෂන්ටින් රියැදුරු සහ රියැදුරු සහායක තනතුරු: පුරප්පාඩු
## புகையிரத திருப்பு எந்திரச் சாரதி மற்றும் சாரதி உதவியாளர் பதவிகள்: வெற்றிடங்கள்
## POSTS OF SHUNTING DRIVERS AND LOCOMOTIVE ASSISTANTS: VACANCIES

250/2022

**3.** **ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සඳහා අනුමත දුම්රිය ෂන්ටින් රියැදුරු සංඛ්‍යාව සහ රියැදුරු සහායක සංඛ්‍යාව;

(ii) මේ වන විට සේවය කරනු ලබන දුම්රිය ෂන්ටින් රියැදුරු සංඛ්‍යාව සහ රියැදුරු සහායක සංඛ්‍යාව;

(iii) ඉහත තනතුරුවල මේ වන විට පවතින පුරප්පාඩු සංඛ්‍යාව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) ඉහත පුරප්පාඩු කඩිනමින් පිරවීම සඳහා ගනු ලබන ක්‍රියා මාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை புகையிரதத் திணைக்களத்திற்கென அங்கீகரிக்கப்பட்ட புகையிரத திருப்பு எந்திரச் சாரதிகளின் எண்ணிக்கை மற்றும் சாரதி உதவியாளர்களின் எண்ணிக்கை;

(ii) இன்றளவில் சேவையாற்றுகின்ற புகையிரத திருப்பு எந்திரச் சாரதிகளின் எண்ணிக்கை மற்றும் சாரதி உதவியாளர்களின் எண்ணிக்கை;

(iii) மேற்படி பதவிகளில் இன்றளவில் காணப்படு கின்ற வெற்றிடங்களின் எண்ணிக்கை;

வெவ்வேறாக எத்தனை என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) மேற்படி வெற்றிடங்களைத் துரிதமாக நிரப்புவதற்கு மேற்கொள்ளும் நடவடிக்கைகள் யாவையென் பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Transport:

(a) Will he inform this House, separately -

(i) the number of shunting drivers and locomotive assistants approved for the Sri Lanka Railway Department;

(ii) the number of shunting drivers and locomotive assistants currently serving; and

(iii) the number of vacancies currently existing in the above posts?

(b) Will he also inform this House of the measures that will be taken to fill the above vacancies expeditiously?

(c) If not, why?

**ගරු දිලුම් අමුණුගම මහතා**
(மாண்புமிகு திளும் அமுனுகம)
(The Hon. Dilum Amunugama)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) දුම්රිය ෂන්ටින් රියැදුරු සංඛ්‍යාව -147

රියැදුරු සහායක සංඛ්‍යාව - 540

(ii) දුම්රිය ෂන්ටින් රියැදුරු සංඛ්‍යාව -14

රියැදුරු සහායක සංඛ්‍යාව - 191

(iii) ඔව්.

දුම්රිය ෂන්ටින් රියැදුරු සංඛ්‍යාව -133

රියැදුරු සහායක සංඛ්‍යාව - 349

[ගරු දිලුම් අමුණුගම මහතා]

(ආ) ඔව්.

දුම්රිය ෂන්ටින් රියැදුරු :

මේ වන විට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතියට යොමු කර ඇති දුම්රිය ෂන්ටින් රියැදුරු බඳවා ගැනීමේ පටිපාටිය අනුමත වූ වහාම බඳවා ගැනීම් සිදු කෙරේ.

රියැදුරු සහායක:

තරග විභාගයක් පවත්වා 2022.01.03 දින රියැදුරු සහායකයින් 60ක් බඳවා ගෙන ඇති අතර, සුදුසුකම් සනාථ කිරීමට ප්‍රමාද වූ 07 දෙනෙකුගේ පත්වීම් ලිපි ද මේ වන විට සකසා ඇත.

ඉතිරි පුරප්පාඩු සඳහා තරග විභාගය සමත් තවත් 80දෙනෙකු සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට මූලික කටයුතු සූදානම් කරමින් පවතී. තාක්ෂණික ශිල්පී සහායක III තනතුරේ වසර 10ක සක්‍රිය හා පූර්වාසන්න අවුරුදු පහක සතුටුදායක සේවා කාලයක් සහිත නිලධාරින් සඳහා ලිඛිත පරීක්ෂණයක් පවත්වා ඉන් සමත් වන්නන් වෘත්තීය පරීක්ෂණයකට යොමුකර රියැදුරු සහායක තනතුරට උසස් කිරීමට කටයුතු කරන්නත් මේ වන කොට සූදානම් කරලා තිබෙනවා.

(ඇ) අදාළ නොවේ.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය අහන්න ප්‍රථම, කැබිනට් අමාත්‍ය ධුරයකින් පිදුම් ලැබූ අපේ අමාත්‍යතුමාට සුබපැතුම් එකතු කරනවා.

ගරු ඇමතිතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ඔබතුමා පිළිගත්තා, මේ රටේ දුම්රිය දෙපාර්තමේන්තුව තුළ පුරප්පාඩු විශාල සංඛ්‍යාවක් තිබෙනවා කියලා. මේ දවස්වල රාජ්‍ය සේවයේ පුරප්පාඩු ගැන ආණ්ඩුව තුළ විවිධ මත තිබෙනවා. සමහරු කියනවා, "රාජ්‍ය සේවය කළමනාකරණය කරන්න ඕනෑ. අඩු කරන්න ඕනෑ" කියලා. අපි ඒ කථාව පැත්තකින් තියමු.

ගරු කථානායකතුමනි, රාජ්‍ය සේවකයාගෙන් කාර්යක්ෂම සේවාවක් ලබා ගන්නා ක්‍රමයක් අපේ රටේ නැහැ. උදාහරණයක් විධියට ගත්තොත්, වත්මන් මුදල් ඇමතිතුමා උපාධිධාරින් පිරිසක් සේවයට බඳවාගෙන ගෙවල් ගණනේ ඇට බෙදන්න යැව්වා. ඒ බඳවා ගත් උපාධිධාරින් අද කරන්නේ ඒ වාගේ දේවල්. ඔබතුමන්ලාගේ මාර්ග සංවර්ධන ව්‍යාපෘති අධීක්ෂණයට අද ඔවුන් දාලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කරපු උපාධාධාරින් වාඩි වෙන්න පුටුවක්වත් නැතුව හිටගෙන ඉන්නවා.

රාජ්‍ය සේවයට බඳවා ගැනීමේදී දේශපාලන අවශ්‍යතාව මත නොව, අවශ්‍ය කාරණාවට පුහුණු කරලා බඳවා ගත්තා නම් මීට වඩා කාර්යක්ෂම රාජ්‍ය සේවයක් හැදෙනවා. මම දුම්රිය දෙපාර්තමේන්තුව ගැන විතරක් නොවෙයි, රටේ සමස්ත රාජ්‍ය සේවය ගැනයි කියන්නේ. එහෙම කළා නම් ආණ්ඩුවේ බර අඩු වෙනවා. රටේ තිබෙන රාජ්‍ය ආයතන ටික හරියට ක්‍රියාත්මක කරන්න ඕනෑ. නමුත් ඒ ආයතනවල ඉන්න සේවකයන් ප්‍රමාණය දැන් දෙගුණයක් වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, මේ වෙන කොට රටේ තිබෙන මූල්‍ය අර්බුදය නිසා ආර්ථිකය කඩා වැටීමත් එක්ක, ආණ්ඩුව ප්‍රතිපත්තිමය තීන්දුවක් අරගෙන තිබෙනවාද රාජ්‍ය සේවයට බඳවා ගැනීම යම් කාල සීමාවකට නතර කරන්න, එහෙම නැත්නම් නියාමනයක් කරන්න, එහෙමත් නැත්නම් සමහර ඇමතිවරු කියනවා වාගේ රාජ්‍ය සේවයට පෙර පරිදිම බඳවාගන්න?

**ගරු දිලුම් අමුණුගම මහතා**
(மாண்புமிகு திலும் அமுனுகம)
(The Hon. Dilum Amunugama)

ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම දුම්රිය දෙපාර්තමේන්තුව පිළිබඳවයි ඔබතුමාගේ මුල් ප්‍රශ්නයෙන් අහලා තිබුණේ. දුම්රිය දෙපාර්තමේන්තුවේ තිබෙන පුරප්පාඩුවලට ඒ ඒ ක්ෂේත්‍රය පිළිබඳව පුහුණුවක් තිබෙන අය තමයි බඳවා ගන්න පුළුවන්. ඒක තමයි මම ඔබතුමාට කලිනුත් කිව්වේ, දේශපාලන බලපෑම් මත නොවෙයි, තරග විභාග සහ උසස් කිරීමේ පටිපාටිය අනුව තමයි ඒ අය උසස් කරලා තිබෙන්නේ කියලා.

උපාධිධාරින් ගැන කථා කළොත්, උපාධිධාරින් විශාල පිරිසක් මේ වෙන කොට දුම්රිය දෙපාර්තමේන්තුවේ පරිපාලන තනතුරු පිරවීම සඳහා යොමු කරලා තිබෙනවා.

පසුගිය කාලයේ ජනාධිපතිතුමා රත්මලානේ දුම්රිය අංගණයේ සංචාරය කරපු වෙලාවේ අපට අවසරයක් ලබා දුන්නා, අත්‍යවශ්‍ය පුහුණු තාක්ෂණික සේවාවල පුරප්පාඩු පිරවීම සඳහා -නිකම් පුරවන්න නොවෙයි, කම්කරුවන් හැටියට පුරවන්න නොවෙයි- යම් කොමිසමක් පත් කරලා, ඒ අවශ්‍ය සංඛ්‍යාව කොපමණද කියලා ඒ කොමිසමෙන් තීන්දු කරලා Sri Lanka German Railway Technical Training Centre, Ceylon-German Technical Training Institute වාගේ ආයතනවලින් ඒ අය බඳවා ගන්න කියලා. ඒ අනුව අපි අමාත්‍යාංශයෙන් ඒ කොමිසම පත් කරලා තිබෙනවා. අපට පුරප්පාඩු විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒ සියලු පුරප්පාඩු පුරවන්න අපහසුයි. හැබැයි, මේ මොහොතේ රටේ තිබෙන තත්ත්වය අනුව සියලු දුම්රිය ධාවනය කිරීම සඳහා අත්‍යවශ්‍ය පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් කරන්නයි අපි සූදානමින් ඉන්නේ.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔබතුමාගේ පළමුවැනි අතුරු ප්‍රශ්නයේ ප්‍රශ්න තුනක් තිබුණා.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

නැහැ, ගරු කථානායකතුමනි. දැන් තමයි මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්නේ.

ගරු ඇමතිතුමනි, මම දැක්කා, ඔබතුමාට මේ කැබිනට් අමාත්‍ය ධුරය ලැබීමට පෙර හිටපු පවිත්‍රාදේවි වන්නිආරච්චි මැතිනිය කරපු ප්‍රකාශයක්. එතකොට ඔබතුමා ප්‍රවාහන රාජ්‍ය ඇමති. එතුමිය කියලා තිබුණා, "මේ රටට දුම්රිය මැදිරි ප්‍රමාණයක් සහ දුම්රිය එන්ජින් ප්‍රමාණයක් ගෙනැල්ලා තිබෙනවා. ඒවායේ ප්‍රමිතිය පිළිබඳ ප්‍රශ්න තිබෙනවා. ඒවා තාක්ෂණික පරීක්ෂාවකින් තොරව ගෙන්වලා තිබෙනවා" කියලා. ඒ කාරණාව තුළ ගම්‍ය වන්නේ හිටපු අමාත්‍යවරයා මොකක් හරි 'ගේම්' එකක් ගැහුවා කියන එක. හැබැයි, එහෙම ගේම් එකක් ගැහුවා කියලා හරි, නැතිව හරි මේ රටේ ජනතාවට ප්‍රකාශයක් කළ පමණින් කැබිනට් අමාත්‍යවරයාගේ වගකීම අවසන් වෙන්නේ නැහැ. එහෙම නම්

වත්මන් කැබිනට් අමාත්‍යවරයා විධියට ඒ වෙනුවෙන් ඔබතුමා ක්‍රියාමාර්ග ගන්න ඕනෑ. නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා ඔබතුමන්ලාගේ පැත්තේ ඉන්නවා කියලා, යහ පාලනයට ටොක්කක් ඇන්නා කියලා ක්‍රියාමාර්ග ගන්නේ නැතුව හිටියාට උත්තරයක් ලැබෙන්නේ නැහැ.

ඔබතුමා අභිනව ප්‍රවාහන කැබිනට් අමාත්‍යවරයා විධියට පත් වුණාට පස්සේ ඉදිරිපත් කරන පළමුවැනි ප්‍රශ්නය මේක. මේක හුදු ප්‍රකාශයක් විධියට සලකන්න එපා. අපේ ආණ්ඩුව කාලයේ කවුරු හරි ගේම් එකක් ගහලා තිබෙනවා නම්, හොරකම් කරලා තිබෙනවා නම්, ඉන්දියාවෙන් දුම්රිය කොටස් ගෙන්වීමේදී ගණනක් සාක්කුවේ දාගෙන තිබෙනවා නම් අන්න ඒ වෙනුවෙන් මේ රටේ නීතිය අනුව ගන්න ඕනෑ ක්‍රියාමාර්ග ගන්න අවශ්‍ය පියවර තියන්න කියන ඉල්ලීම මම කරනවා.

ඒ වාගේම ගරු ඇමතිතුමාගෙන් මම මේ ඉල්ලීමත් කරනවා. රටේ ජන දුක කියන්න 15වෙනි දා කොළඹට පැමිණෙන්න කියලා සමගි ජනබලවේගය මේ රටේ මිනිසුන්ට ආරාධනාවක් කරලා තිබෙනවා. ඒ සඳහා ජනතාව සහභාගි කරවා ගැනීමේදී ප්‍රවාහන පහසුකම් ටික සපයාගන්න ගියාම ඔබතුමාට ඕනෑ නම් ඒකට බාධා කරන්න පුළුවන්. ඒවාට මිනිසුන් එන එක නවත්වන්න නීතිය හා සාමය පිළිබඳ විෂයභාර ඇමතිවරයාත් හැම තිස්සේම උදැල්ල දමන එක තමයි කරන්නේ. ඒ කෙසේ වෙතත්, ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, මුදල් ගෙවලා CTB බස් රථ ගන්න ගියාම, හානිදායක තත්ත්වයක් ඇති නොකර මේ රටේ ජනතාවගේ අවශ්‍යතාව වෙනුවෙන්, මගී ප්‍රවාහනය වෙනුවෙන් ඒ අවශ්‍ය අවසරය ලබා දෙන්න කියලා.

**ගරු දිලුම් අමුණුගම මහතා**
(மாண்புமிகு திலும் அமுனுகம)
(The Hon. Dilum Amunugama)
ඔබතුමා දෙවැනි අතුරු ප්‍රශ්නයෙන් ප්‍රශ්න දෙකක්ම ඇහුවා. පළමුවෙන් ඒ පළමුවැනි ප්‍රශ්නයට උත්තර දෙන්න ඕනෑ. ඒ ගෙන්වපු දුම්රිය මැදිරි සහ දුම්රිය එන්ජින් භාවිතයට යෙදවීමේදී යම් යම් ප්‍රශ්න සහගත තත්ත්වයක් තිබෙනවා. ඒවා සහමුලින්ම ඉවත් කළ යුතු තත්ත්වයේ තිබෙනවා කියලා අපි කියන්නේ නැහැ. ඇමතිවරයා හැටියට ඒ සෑම එන්ජින් එකක් පිළිබඳවම

- එන්ජින් දහයම පිළිබඳව- මම වාර්තාවක් අරගෙන තිබෙනවා. ඒ වාගේම ඒ සියලු දුම්රිය මැදිරි අපි පරීක්ෂා කර බලා තිබෙනවා. ඒවා ගෙන්වීමේදී වංචාවක් සිද්ධ වෙලා තිබෙනවාද කියන කාරණය සොයන්න මේ වෙනකොට අපි කණ්ඩායමක් පත් කරලා තිබෙනවා. ඒ කණ්ඩායමේ සොයා ගැනීම් පිළිබඳ වාර්තාවක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට දෙන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ දුම්රිය මැදිරි සහ දුම්රිය එන්ජින් ගෙන්වීම සඳහා විශාල මුදලක් වැය වෙලා තිබෙනවා. ඒ වාගේම ඒවාට සරිලන ප්‍රමිතිය නැති බවත් අපට කියන්න සිද්ධ වෙනවා. ඒ එන්ජින් ධාවනය කිරීමේ යම් ප්‍රශ්නයක් තිබෙනවා. මේවා මිලදී ගැනීම සඳහා එවකට රජයෙන් අවසර දීලා තිබෙන්නේ, ඉන්දියානු ණය ආධාර ක්‍රමය යටතේ පමණයි කියන එකත් අපට අනාවරණ වෙලා තිබෙනවා. ඒ නිසා ඉන්දියාවෙන් කොයිතරම් ප්‍රමිතියක ඒවා ගන්න පුළුවන්ද කියන එක පිළිබඳවත් ප්‍රශ්නයක් තිබෙනවා. ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි මේ දුම්රිය මැදිරි මේ වෙනකොට ධාවනයට එක් කර තිබෙනවා. නමුත් ඒවා එක සැරේම ධාවනයට යොදවන්න බැහැ. ඒවායේ modifications කරන්න වෙලා තිබෙනවා. මොකද, අවශ්‍ය විධියට නොවෙයි ඒවා තිබෙන්නේ. ඒ එන්ජින් වල බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. ඒවා ධාවනය වෙනවාට වැඩිය ධාවනය නොකර තමයි තිබෙන්නේ. සතියක් පමණ ධාවනයේ යෙදෙව්වොත් මාස 3ක් පමණ නඩත්තු කළ යුතු තත්ත්වයේ තමයි තිබෙන්නේ. ඒ පිළිබඳව දැන් අපි පරීක්ෂණයක් කරනවා.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
ගරු ඇමතිතුමනි, මගේ අනෙක් ප්‍රශ්නයටත් උත්තර දෙන්න.

**ගරු දිලුම් අමුණුගම මහතා**
(மாண்புமிகு திலும் அமுனுகம)
(The Hon. Dilum Amunugama)
ඔබතුමන්ලා අදාළ මුදල් ගෙවනවා නම් අපි බස් රථ ලබා දෙන්න ලෑස්තියි. හැබැයි, මේ දවස්වල පවතින ඉන්ධන මිල හේතුවෙන් අපි ටිකක් මිල වැඩි කරලා තිබෙන්නේ. නමුත් ඔබතුමන්ලා ඉල්ලනවා නම් අපි දෙන්නම්, ගැටලුවක් නැහැ.

## ශ්‍රී ලංකාවේ ගංගා: විස්තර
## இலங்கையிலுள்ள ஆறுகள்: விபரம்
## RIVERS IN SRI LANKA: DETAILS

564/2022

**4. ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
පරිසර අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (2):

(අ) (i) ශ්‍රී ලංකාවේ පිහිටා ඇති ගංගා සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) එම ගංගාවල භාරකාරත්වය නිශ්චිත ආයතනයකට පවරා නොමැති බව දන්නේද;

(iv) එම ගංගා ආරක්ෂා කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுற்றாடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையிலுள்ள ஆறுகளின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(ii) அவற்றின் பெயர்கள் யாவை என்பதையும்;

(iii) மேற்படி ஆறுகளின் பொறுப்பு குறிப்பிட்ட நிறுவனமொன்றுக்கு ஒப்படைக்கப்படவில்லை என்பதை அறிவாரா என்பதையும்;

(iv) இந்த ஆறுகளைப் பாதுகாப்பதற்கு மேற் கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Environment:

(a) Will he inform this House -

(i) the number of rivers in Sri Lanka;

(ii) the names of those rivers;

(iii) whether he is aware of the fact that the custody of those rivers has not been assigned to any specific institution; and

[ගරු චමින්ද විජේසිරි මහතා]

(iv) the measures that will be taken to protect those rivers?

(b) If not, why?

**ගරු මහින්ද අමරවීර මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த அமரவீர - சுற்றாடல் அமைச்சர்)
(The Hon. Mahinda Amaraweera - Minister of Environment)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ශ්‍රී ලංකාවේ පිහිටා ඇති ගංගා ද්‍රෝණි සංඛ්‍යාව 103කි.

(ii)

| | |
|---|---|
| 01. කැළණි ගඟ | 53. මියන්ගොල්ල ඇළ |
| 02. බොල්ගොඩ ගඟ | 54. මාදුරු ඔය |
| 03. කළු ගඟ | 55. පුලියන්පොට ආරු |
| 04. බෙන්තර ගඟ | 56. කිරිමෙච්චි ඔඩයි |
| 05. මාදු ගඟ | 57. බෝධිගොල්ල ආරු |
| 06. මාදම්පෙ ගඟ | 58. මන්දන් ආරු |
| 07. තෙල්වත්ත ගඟ | 59. මකරච්චි ආරු |
| 08. රත්ගම ගඟ | 60. මහවැලි ගඟ |
| 09. ගිං ගඟ | 61. කන්තලයි ආරු |
| 10. කොග්ගල ගඟ | 62. පාලම්පොට්ටු ආරු |
| 11. පොල්වත්ත ගඟ | 63. පාන් ඔය |
| 12. නිල්වලා ගඟ | 64. පාන්කුලම් ආරු |
| 13. සීනිමෝදර ඔය | 65. කුන්චිකුම්බන් ආරු |
| 14. කිරම ඔය | 66. පලකුට්ටි ආරු |
| 15. රැකව ඔය | 67. යාන් ඔය |
| 16. ඌරුබොකු ඔය | 68. මී ඔය |
| 17. කච්චිගල් ආර | 69. මහ ඔය |
| 18. වලවෙ ගඟ | 70. චූරිය ආරු |
| 19. කරගන් ඔය | 71. චවර් ආරු |
| 20. මලල ඔය | 72. පල්ලඩි ආරු |
| 21. ඇඹිලිකල ඔය | 73. මානල් ආරු |
| 22. කිරිඳි ඔය | 74. කොඩලිකල්ලු ආරු |
| 23. බඹව ආර | 75. පර් ආරු |
| 24. මහශීලව ඔය | 76. පලි ආරු |
| 25. බුතව ඔය | 77. මරුත්තපිල්ලයි ආරු |
| 26. මැණික් ගඟ | 78. තෙරවිල් ආරු |

| | |
|---|---|
| 27. කටුපිල ආර | 79. පිරමන්තල් ආරු |
| 28. කුරුන්ද ආර | 80. මෙතලි ආරු |
| 29. නාබඩගස් ආර | 81. කනකරයන් ආරු |
| 30. කරඹෙ ආර | 82. කලවලප්පු ආරු |
| 31. කුඹුක්කන් ඔය | 83. අක්කරයන් ආරු |
| 32. හගුර ඔය | 84. මන්දෙකල් ආරු |
| 33. ගිරිකුල ඔය | 85. පල්ලවරයන්කඩ්ඩු ආරු |
| 34. හෙලව ආර | 86. පලි ආරු |
| 35. විල ඔය | 87. චප්පි ආරු |
| 36. හැඩ ඔය | 88. පරංගි ආරු |
| 37. කරඳ ඔය | 89. නෙයි ආරු |
| 38. සෙමන් ආරු | 90. මල්වතු ඔය / අරුවි ආරු |
| 39. තන්ඩිආඩි ආර | 91. කල් ආරු |
| 40. කංගිකඩිච් ආරු | 92. මෝදරගම් ආරු |
| 41. රූෆස් කුලම් | 93. කලා ඔය |
| 42. පන්නල් ඔය | 94. මුන්ගලි ආරු |
| 43. අම්බලන් ඔය | 95. මී ඔය |
| 44. ගල් ඔය | 96. මදුරන්කුලි ආරු |
| 45. අඩෙල්ල ඔය | 97. කලගමුනෙ ආරු |
| 46. තුම්පන් කෙනි | 98. රතඹලා ඔය |
| 47. නමකඩ ආරු | 99. දැදුරු ඔය |
| 48. මංදිපට්ටු ආරු | 100. කරබල ඔය |
| 49. පතන්තොප්පු ආරු | 101. රත්මල් ඔය |
| 50. වෙට් ආරු | 102. මා ඔය |
| 51. මගලවතන් ආරු | 103. අත්තනගලු ඔය |
| 52. මුන්දෙනි ආරු | |

(iii) ගංගාවල භාරකාරත්වය නිශ්චිත ආයතනයකට පවරා නොමැත.

"ශ්‍රී ලංකාවේ ජල මූලාශ්‍ර, ඒවායේ පෝෂක ප්‍රදේශ හා රක්ෂිත ආරක්ෂා කිරීම හා සංරක්ෂණය කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය" යන මැයෙන් නිකුත් කරන ලද අංක 1894/3 - 2014 දෙසැම්බර් මස 22 වැනි සඳුදා දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත ගංගා ආරක්ෂා කිරීමේ වගකීම ලබා දීමට යෝජනා වී ඇත.

(iv) ගංගාවල ව්‍යුහය සම්බන්ධ ගැටලු, ගංගා ඉවුරු ඛාදනය ආදිය සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් විසඳුම් ලබා දෙන බව වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් වාර්තා කර ඇත.

එමෙන්ම, "සුරකිමු ගංගා ජාතික පාරිසරික

වැඩසටහන" යන මැයෙන් පරිසර අමාත්‍යවරයා වශයෙන් මවිසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 20/1576/321/003 හා 2020.10.05 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය සම්බන්ධයෙන් 2020 නොවැම්බර් මස 02 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී එළඹි තීරණය අනුව, ශ්‍රී ලංකාවේ පිහිටා ඇති ගංගා පද්ධතිය සුරක්ෂිත කිරීම සඳහා පරිසර අමාත්‍යාංශය විසින් අදාළ පාර්ශ්වකාර ආයතන සම්බන්ධ කර ගනිමින් විධිමත් හා දිගු කාලීන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට කටයුතු ආරම්භ කර ඇත.

"සුරකිමු ගංගා" වැඩසටහන පිළිබඳව තමයි මේ සඳහන් කරන්නේ. මේ වර්ෂයේත් විශාල මුදලක් වෙන් කරලා තිබෙනවා, රට පුරා තිබෙන මේ ගංගා ටික පිරිසිදු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන්න.

(ආ) පැන නොනඟී.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ස්තුතියි, ගරු ඇමතිතුමනි. මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ඔබතුමා ඔය කියන "සුරකිමු ගංගා" වැඩසටහන තුළින් ගංගා සුරක්ෂිතව ආරක්ෂා නොවෙනවාය කියන කාරණය තහවුරු කරන්න බුදුගල්ලෙන, වැලිආර ගඟ මම උදාහරණයකට ගන්නම්. එය යාල රක්ෂිතය ඇතුළත තිබෙන්නේ. අපිත් එම ස්ථානයට ගියා. මීට මාස නවයකට කලින් මේ ගැන මාධ්‍ය ආයතන ගණනාවක් අනාවරණ කළා. ඔය කියන තේමාව යටතේ තමයි බෝඩ් ගහලා ඒ කටයුතු ආරම්භ කළේ. මාධ්‍ය තුළ සඳහන් වුණා, වැලි කොල්ලයක් සම්බන්ධයෙන්. හැබැයි, ගරු ඇමතිතුමනි, ඔබතුමා ඒ සම්බන්ධයෙන් දැනුවත් වුණාද, නැද්ද කියා මා දන්නේ නැහැ. මේ කියන තේමාව යටතේ ගඟ පිරිසිදු කරනවා යනාදී වශයෙන් දැවැන්ත වැඩ පිළිවෙළක් කරනවාය කිව්වාට, ඒක ඇතුළත වැලි ජාවාරමක් තමයි සිද්ධ වුණේ. බුදුගල්ලෙන, වැලිආර ගඟේ කෝන්ගහකැටිය ග්‍රාම සේවා වසමේ තමයි ඒක සිද්ධ වෙන්නේ. අපි එම ස්ථානයට ගියා. බුත්තල මැතිවරණ කොට්ඨාසය නියෝජනය කරන අපේ ධර්මසේන මන්ත්‍රීතුමාත් එම ස්ථානයට ගියා. මේ ගැන මාධ්‍ය ආයතන ගණනාවක ප්‍රචාරය වුණා. ඒ සිද්ධිය දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සාකච්ඡාවට භාජන වුණා. ඇමතිවරයකුගේ සහෝදරයකු තමයි ඒ වැලි ජාවාරම කරන්නේ. ගරු ඇමතිතුමනි, සුරකිමු ගංගා ව්‍යාපෘතියේ වැඩසටහන් සියල්ල ක්‍රියාත්මක වන්නේ කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ඇතිවයි.

සුරකිමු ගංගා වැඩසටහන වාගේම ඔබතුමන්ලාගේ සෞභාග්‍යයේ දැක්ම තුළ තිබෙන සියලු වැඩසටහන් තමයි ඔබතුමන්ලාගේ ජයග්‍රහණය වෙනුවෙන් නිර්මාණය කළ සහ ඒ ජයග්‍රහණයෙන් පසුව ක්‍රියාත්මක වන වැඩ පිළිවෙළ. ගරු ඇමතිතුමනි, දැන් අපට පෙනෙන දෙයක් තමයි, කැබිනට් අනුමැතියක් ගත්තාට පස්සේ ඒ කැබිනට් අනුමැතියේ සාමූහික වගකීම ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් සමහර ඇමතිවරු ජාවාරම්, හොරකම්-මැරකම් ආරක්ෂා කර ගැනීමට පෙනී සිටිනවාය කියන කාරණය. හැබැයි, ඒ කැබිනට් අනුමැතියෙන් එහා ගිහින් ඇමතිවරු එළියට ඇවිල්ලා එවැනි කාරණා පිළිබඳ තීරණ ගත්තොත් ඒ ඇමතිවරුන්ට දඬුවම් ලැබෙනවා. උදාහරණයක් ගත්තොත් විමල් වීරවංශ මහත්මයාට, ගම්මන්පිල මහත්මයාට දැන් තිබෙන චෝදනාව තමයි සාමූහික එකඟතාව බින්දා කියන එක. හැබැයි ගරු කථානායකතුමනි, අපි ප්‍රායෝගිකව දකින දේ මේකයි. දැන් ඩීසල් ප්‍රශ්නය තිබෙනවා, භූමි තෙල් ප්‍රශ්නය තිබෙනවා. එතුමන්ලා එළියට ඇවිල්ලා ඒ අර්බුදය පිළිබඳව කිව්වා. එළියට ඇවිල්ලා ඒ ගැන කියපු නිසා එතුමන්ලා දෙන්නා කැබිනට් මණ්ඩලයෙන් අයින් කළා.

ගරු ඇමතිතුමනි, ඔබතුමාත් සාමූහික වගකීම ආරක්ෂා කරන්නේ ඇමතිකම ආරක්ෂා කර ගැනීමටද කියලා මම දන්නේ නැහැ. ඔබතුමා එහෙම කෙනෙක් නොවෙයි කියලා මම විශ්වාස කරනවා. ඔබතුමන්ලා සෞභාග්‍යයේ දැක්ම සහ මේ වැඩසටහන් සියල්ල පිටට දාලා, මේ සාමූහික වගකීම නිසා මේ ජාවාරම් ආරක්ෂා කරන්න, හොරකම් ආරක්ෂා කරන්න කටයුතු කරනවා කියන යෝජනාව මම ඉදිරිපත් කරනවා.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

ගරු කථානායකතුමනි, ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා ගොඩක් දේවල් කිව්ව නිසා අපහු ප්‍රශ්නය පැහැදිලි නැහැ. එතුමා ඩීසල් ගැනත් කිව්වා, පෙට්‍රල් ගැනත් කිව්වා. මට තේරුණේ නැහැ එතුමා හරියටම මොකක්ද ඇහුවේ කියලා. ප්‍රශ්නයක් අහනකොට පැහැදිලිව අහනවා නම් මට උත්තර දෙන්න පුළුවන්. *[බාධා කිරීමක්]* සුරකිමු ගංගා වැඩසටහන යටතේ ඔබතුමා ඔය කියන ස්ථානයේ එහෙම වැඩ පිළිවෙළක් පටන් අරගෙන නැහැ, ගරු මන්ත්‍රීතුමා. සුරකිමු ගංගා වැඩසටහනට බුත්තලින් අයිති වෙන්නේ මැණික් ගඟ. අපේ ගංගා 103න් මේ වැඩසටහනට බුත්තලින් අයිති වෙන්නේ මැණික් ගඟ. නමුත් වැලි ගොඩ දැමීමක් පිළිබඳව අපට වාර්තා වෙලා තිබෙනවා, ඔය ප්‍රදේශයේ වෙනත් ආරක හෝ ඇළක. අපේ අමාත්‍යාංශය මැදිහත් වෙලා දැනට ඒක තහනම් කරන්න කටයුතු කරලා තිබෙනවා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු ඇමතිතුමා, අපි අහන සමහර ප්‍රශ්න තේරෙන්නේ නැහැ වාගේ ඉන්න එකත් හොඳයි. හොඳට තේරුණත් සමහරවිට ඒවාට උත්තර දෙන්න බැහැ. උත්තර දුන්නොත් වෙන්නේ එළියට යන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්නය අහන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

මම මේ අහන්නයි හදන්නේ. ගරු ඇමතිතුමාට තේරිච්ච නැති ප්‍රශ්නය ආයෙත් කියන්නයි යන්නේ ගරු කථානායකතුමනි. *[බාධා කිරීමක්]* නැහැ, මම කිව්වේ සාමූහික වගකීමත් එක්ක බැඳුණු එකක්නේ සුරකිමු ගංගා වැඩසටහන; මේක කැබිනට් තීන්දුවක්. එතකොට කැබිනට් තීන්දුවෙන් පිට ගිහින් මේ සිදු වෙන සමහර ජාවාරම්, මංකොල්ලයන් ගැන එළියට ඇවිල්ලා කිව්වොත් ඇමතිකම් පිළිබඳ බරපතළ අර්බුද මතු වෙනවා. ඒක තමයි වුණේ ගම්මන්පිල හිටපු ඇමතිතුමාටත්, විමල් වීරවංශ හිටපු ඇමතිතුමාටත්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඒ ප්‍රශ්නය මේකට අදාළ නැහැනේ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු ඇමතිතුමාට තේරුණේ නැති නිසා කියන එක හොඳයි නේ, ගරු කථානායකතුමනි. එතුමාට තේරුණේ නැහැ කිව්වාම මට හරි නැහැ නේ. මට හරි නැති නිසායි මම එතුමාට තේරුම් කළේ.

සුරකිමු ගංගා වැඩසටහනේ තේමාව හොඳයි. හැබැයි ඒක ප්‍රායෝගිකව ගමේ ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ගරු ඇමතිතුමනි, දැන් තිබෙන ප්‍රශ්නය මේකයි. මේ වාගේ වැඩසටහන් ක්‍රියාත්මක කරලා, ඒ වාගේ බෝඩ් එල්ලලා තිබුණත් අවසානයේ පරිසර හානි, ගංගා හානි සිද්ධ වෙමින් පවතිනවා. ඔබතුමන්ලා අමාත්‍යාංශය හැටියට ඒ පරිසර හානිවලට ක්‍රියාමාර්ග ගන්නකොට වැඩේ වෙලා ඉවරයි. අපි යනකොට කෝන්ගහකැටිය ග්‍රාම නිලධාරි වසමේ විශාල වැලි කඳු ගොඩගහලා තිබුණා.

එතැනට STF එකත් ගිහින් වටලලා තිබුණා. STF එකෙන් තමයි ඒ බැකෝ යන්ත්‍රය අල්ලාගෙන ආවේ. හැබැයි, දීපු දඬුවමකුත් නැහැ, වැලි ටිකත් අතුරුදහන් වුණා. අන්න ඒකයි අවසානයේ සිද්ධ වන්නේ. ඒ අදාළ මංකොල්ලකරුවන්ට වැලි ජාවාරම කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළට නීතියේ රැකවරණය තිබෙනවා. ඒ වැටලීම් කරලා අල්ලනවා. නමුත්, අවසානයේ ඒ බැකෝ යන්ත්‍රයත් නිදහස් වුණා, වැලි ටිකත් නිදහස් වුණා. ඒ ටික තමයි වෙන්නේ. ඔබතුමා වගකිව යුතු ඇමතිවරයෙක්. නමුත්, මේ වැඩසටහන් හරහා සිද්ධ වන දැවැන්ත පාරිසරික හානි වළක්වා ගැනීම සඳහා මැදිහත්වීමක්, වැඩ පිළිවෙළක් ඔබතුමා කියන තරමින් නැහැ. අපි දකිනවා, පසුගිය කාලය තුළ විවිධ අර්බුද මතු වුණා. ඒ අර්බුද ගැන එළියේදී කියනකොට ඇමතිකම නැති කරනවා. ඒ නිසා ඔබතුමාත් ඇමතිකම නැති වෙයි කියන භයට මේ ජාවාරමට සහයෝගය දෙනවාය කියන යෝජනාව මම කළොත් ඔබතුමා ඒක පිළිගන්නවාද?

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ගරු කථානායකතුමනි, මම කියන කාරණය ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා වටහා ගන්නේ නැහැ. මම වගකීමෙන් කියනවා, මැණික් ගඟ තමයි සුරකිමු ගංගා වැඩසටහනට අයිති වන්නේ. මේ කැබිනට් තීන්දුවටත් අදාළ වන්නේ ඒක. නමුත්, ඔබතුමා ඔය කියන කාරණය අපේ අමාත්‍යාංශයට අදාළ කාරණයක් නොවෙයි. ඔබතුමා ඔය කියන්නේ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවෙන් වැවක් සකස් කිරීම සඳහා අවසර ලබාදී තිබෙන එකක් ගැන. මම ඒක දැනගත්තා. ගොවිජන සේවා දෙපාර්තමේන්තුවෙන් වැවක් සකස් කරන්න අවසර දීලා තිබෙනවා. ඒ අනුව තමයි වැලි ඉවත් කර ගැනීමක් සිදුව තිබෙන්නේ. නමුත්, ඒ පිළිබඳ අපිට වාර්තා වුණාම මම ඒ වෙලාවේම භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයටත් දන්වා ඒක නතර කළා. මේ, සිද්ධි දෙකක්. "සුරකිමු ගංගා" කියන්නේ රටේ ප්‍රධාන ගංගා 103ක් ආරක්ෂා කර ගැනීමේ වැඩ පිළිවෙළ. වැව් ආරක්ෂා කර ගැනීම "සුරකිමු ගංගා" වැඩ පිළිවෙළ යටතේ තිබෙන එකක් නොවෙයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමා, මේ කාරණය ඔබතුමාගේ අමාත්‍යාංශයට අදාළ නැත්නම් පිළිතුරු දීම ප්‍රතික්ෂේප කරන්න.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ඒක වෙනම අමාත්‍යාංශයකට අදාළ කටයුත්තක්, ගරු කථානායකතුමනි. ඒ වුණත්, පරිසරය පිළිබඳ අපිට ලැබුණු පැමිණිල්ල මත අපි ඒක දැනට තහනම් කර තිබෙනවා. මේක අපේ අමාත්‍යාංශයට අයිති කටයුත්තක් නොවෙයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට අදාළ නැත්නම් ඒ කාරණයට පිළිතුරු දීම ප්‍රතික්ෂේප කරන්න. ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා එතුමාගේ අමාත්‍යාංශයට අදාළ නැති ප්‍රශ්න ඇහුවාම එතුමා කොහොමද උත්තර දෙන්නේ? *[බාධා කිරීමක්]*

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු ඇමතිතුමා, මේක වැවක් නොවෙයි. 'ආරු' කිව්වාම ඒක පැහැදිලිවම ගඟක් නේ. *[බාධා කිරීමක්]* අතු ගංගාවක්

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන අතුරු ප්‍රශ්නය අහන්න, ගරු මන්ත්‍රීතුමා. *[බාධා කිරීමක්]*

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ඔබතුමා කියනවා හරි. ඔබතුමා සමහර වෙලාවට,- *[බාධා කිරීමක්]*

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ඔබතුමා කියපු වැඩසටහන වෙන්න ඇති. හැබැයි, ව්‍යාජ ලෙස, ඒ බෝඩ් ගහගෙන තමයි මංකොල්ලකරුවන් මේ අතුරු ගංගා ටික විනාශ කරන්නේ. ඔබතුමා ඒ ගැන පොඩ්ඩක් අවධානය යොමු කරන්න, ගරු ඇමතිතුමනි.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ගරු මන්ත්‍රීතුමා, ඒ ස්ථානයේ "සුරකිමු ගංගා" කියලා බෝඩ් එකක් ගහලා තිබෙනවා නම් ඔබතුමා ඒ කාරණා පෙන්වන්න කෝ. මේක ආරක්. වැවක් කියලා අවසර අරගෙන ආරක් තමයි හාරලා තිබෙන්නේ. ඒකත් අපි නතර කර තිබෙනවා. හැබැයි, මේක අපේ අමාත්‍යාංශයට අදාළ කටයුත්තක් නොවෙයි.

## ශ්‍රී ලංකාවේ බන්ධනාගාර: රැඳවියන්ගේ ධාරිතාව
## இலங்கையிலுள்ள சிறைச்சாலைகள்: கைதிகளின் கொள்ளளவு
PRISONS IN SRI LANKA: CAPACITY OF DETAINEES

1019/2022

5. **ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (2):

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට ස්ථාපිත කර ඇති බන්ධනාගාර සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා ස්ථාපිත කර ඇති ස්ථාන කවරේද;

(iii) එම බන්ධනාගාරවල රඳවා තැබිය හැකි රැඳවියන් සංඛ්‍යාව හා මේ වනවිට රඳවා තබා ඇති රැඳවියන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ධාරිතාවය ඉක්මවා රඳවා තබා ඇති අතිරික්ත රැඳවියන් සංඛ්‍යාව කොපමණද;

(v) රඳවා තබා ඇති අතිරික්ත රැඳවියන් සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நீதி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் தற்போது காணப்படுகின்ற சிறைச்சாலைகளின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(ii) அவை அமைந்துள்ள இடங்கள் யாவை என்பதையும்;

(iii) மேற்படி சிறைச்சாலைகளில் தடுத்துவைத்திருக்கக்கூடிய கைதிகளின் எண்ணிக்கை மற்றும் தற்போது தடுத்துவைக்கப்பட்டுள்ள கைதிகளின் எண்ணிக்கை தனித்தனியாக எவ்வளவு என்பதையும்;

(iv) கொள்ளளவையும் தாண்டி தடுத்துவைக்கப்பட்டுள்ள மேலதிக சிறைக்கைதிகளின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்;

(v) தடுத்துவைக்கப்பட்டுள்ள மேலதிக சிறைக் கைதிகள் தொடர்பில் மேற்கொள்ளப்படவுள்ள நடவடிக்கை யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Justice:

(a) Will he inform this House -

(i) the number of prisons in Sri Lanka by now;

(ii) the locations of aforesaid prisons;

(iii) separately, the number of detainees who can be detained in aforesaid prisons and the number of detainees who have been detained there by now;

(iv) the number of extra prisoners who have been detained beyond the capacity; and

(v) the measures that will be taken in regard to the extra prisoners who have been detained?

(b) If not, why?

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා (අධිකරණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி - நீதி அமைச்சர்)
(The Hon. M.U.M. Ali Sabry - Minister of Justice)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) බන්ධනාගාර 60ක් පිහිටුවා තිබෙනවා. එම තොරතුරු පහත දක්වා තිබෙනවා.

<u>ශ්‍රී ලංකාවේ මේ වනවිට පිහිටුවා ඇති බන්ධනාගාර සංඛ්‍යාව</u>

| | | |
|---|---|---|
| සංවෘත බන්ධනාගාර | - | 04 |
| රිමාන්ඩ් බන්ධනාගාර | - | 18 |
| වැඩ කඳවුරු | - | 10 |
| විවෘත සිර කඳවුරු | - | 02 |
| අභ්‍යාස විද්‍යාල | - | 01 |
| විශෝධන මධ්‍යස්ථාන | - | 02 |
| සිර මැදිරි | - | <u>23</u> |
| **එකතුව** | - | <u>60</u> |

(ii) ඒවා පිහිටුවා ඇති ස්ථාන මෙසේයි.

<u>ප්‍රධාන බන්ධනාගාර ආයතන - 22</u>

| අනු අංකය | බන්ධනාගාරය | පිහිටුවා ඇති ස්ථානය | රඳවා තැබිය හැකි සංඛ්‍යාව | **2022.02.28 දිනට** රඳවා ඇති සංඛ්‍යාව | අතිරික්ත රැඳවියන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01 | වැලිකඩ බන්ධනාගාරය | කොළඹ 08 | 1422 | 2642 | 1220 |
| 02 | දුම්බර බන්ධනාගාරය | දුම්බර - පල්ලෙකැලේ | 1006 | 1529 | 523 |
| 03 | මහර බන්ධනාගාරය | මහර | 1000 | 1930 | 930 |
| 04 | අඟුණුකොළපැලැස්ස බන්ධනාගාරය | අඟුණුකොළපැලැස්ස | 952 | 1058 | 106 |
| 05 | කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරය | කොළඹ 08 | 423 | 1323 | 900 |
| 06 | මැගසින් බන්ධනාගාරය | කොළඹ 09 | 493 | 880 | 387 |
| 07 | යාපනය බන්ධනාගාරය | යාපනය | 336 | 641 | 305 |
| 08 | අනුරාධපුරය බන්ධනාගාරය | අනුරාධපුරය | 830 | 502 | -328 |
| 09 | බදුල්ල බන්ධනාගාරය | බදුල්ල | 157 | 352 | 195 |
| 10 | මඩකලපුව බන්ධනාගාරය | මඩකලපුව | 197 | 539 | 342 |
| 11 | ගාල්ල බන්ධනාගාරය | ගාල්ල | 120 | 657 | 537 |
| 12 | මාතර බන්ධනාගාරය | මාතර | 146 | 427 | 281 |
| 13 | මීගමුව බන්ධනාගාරය | මීගමුව | 761 | 1137 | 376 |
| 14 | ත්‍රිකුණාමලය බන්ධනාගාරය | ත්‍රිකුණාමලය | 121 | 181 | 60 |
| 15 | කෑගල්ල බන්ධනාගාරය | කෑගල්ල | 149 | 583 | 434 |
| 16 | කළුතර බන්ධනාගාරය | කළුතර උතුර | 559 | 863 | 304 |
| 17 | පොළොන්නරුව බන්ධනාගාරය | පොළොන්නරුව | 252 | 217 | -35 |
| 18 | වාරියපොළ බන්ධනාගාරය | වාරියපොළ | 182 | 686 | 504 |
| 19 | මොණරාගල බන්ධනාගාරය | මොණරාගල | 114 | 243 | 129 |
| 20 | බූස්ස බන්ධනාගාරය | බූස්ස | 325 | 168 | -157 |
| 21 | කුරුවිට බන්ධනාගාරය | කුරුවිට | 624 | 490 | -134 |
| 22 | වවුනියාව බන්ධනාගාරය | වවුනියාව | 54 | 256 | 202 |
| එකතුව | | | **10223** | **17304** | **7735** |

[ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා]

<u>බන්ධනාගාර වැඩ කඳවුරු - 10</u>

| අනු අංකය | බන්ධනාගාරය | පිහිටුවා ඇති ස්ථානය | රඳවා තැබිය හැකි සංඛ්‍යාව | 2022.02.28 දිනට රඳවා ඇති සංඛ්‍යාව | අතිරික්ත රැඳවියන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01 | හෝමාගම වැඩ කඳවුර | වටරැක-පාදුක්ක | 108 | 331 | 223 |
| 02 | මීතිරිගල වැඩ කඳවුර | මීතිරිගල | 30 | නැත | -30 |
| 03 | වීරවිල වැඩ කඳවුර | වීරවිල | 278 | 323 | 45 |
| 04 | කන්දෙවත්ත වැඩ කඳවුර | කන්දෙවත්ත | 100 | 34 | -66 |
| 05 | කඳුරුගස්ආර වැඩ කඳවුර | ඇඹිලිපිටිය | 80 | 36 | -44 |
| 06 | අඹේපුස්ස වැඩ කඳවුර | වරකාපොළ | 70 | 139 | 69 |
| 07 | හංගිලිපොළ වැඩ කඳවුර | වාරියපොළ | 88 | 21 | -67 |
| 08 | කුරුවිට වැඩ කඳවුර | කුරුවිට | 80 | 73 | -07 |
| 09 | පිටබැද්දර වැඩ කඳවුර | මාතර | 20 | 11 | -09 |
| 10 | වාරියපොළ වැඩ කඳවුර | වාරියපොළ | වාරියපොළ බන්ධනාගාරයේ සිරකරුවන්ම සේවයේ යෙදවීම සිදු කරයි. | | |
| | එකතුව | | **854** | **968** | **337** |

<u>විවෘත බන්ධනාගාර සිර කඳවුරු - 02</u>

| අනු අංකය | බන්ධනාගාරය | පිහිටුවා ඇති ස්ථානය | රඳවා තැබිය හැකි සංඛ්‍යාව | 2022.02.28 දිනට රඳවා ඇති සංඛ්‍යාව | අතිරික්ත රැඳවියන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01 | පල්ලෙකැලේ සිර කඳවුර | කුණ්ඩසාලේ | 287 | 424 | 137 |
| 02 | අනුරාධපුර සිර කඳවුර | අනුරාධපුරය | 177 | 86 | -91 |
| | එකතුව | | **464** | **510** | **137** |

<u>තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථාන - 02</u>

| අනු අංකය | බන්ධනාගාරය | පිහිටුවා ඇති ස්ථානය | රඳවා තැබිය හැකි සංඛ්‍යාව | 2022.02.28 දිනට රඳවා ඇති සංඛ්‍යාව | අතිරික්ත රැඳවියන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01 | පල්ලන්සේන විශෝධන මධ්‍යස්ථානය | දළුපොත | 170 | 352 | 182 |
| 02 | තල්දෙන විශෝධන මධ්‍යස්ථානය | තල්දෙන | 155 | 235 | 80 |
| | එකතුව | | **325** | **587** | **262** |

<u>තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාල - 01</u>

| අනු අංකය | බන්ධනාගාරය | පිහිටුවා ඇති ස්ථානය | රඳවා තැබිය හැකි සංඛ්‍යාව | 2022.02.28 දිනට රඳවා ඇති සංඛ්‍යාව | අතිරික්ත රැඳවියන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01 | තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාලය - වටරැක | වටරැක - පාදුක්ක | 35 | 18 | -17 |
| | එකතුව | | **35** | **18** | **-17** |

(iii) රඳවා තැබිය හැකි රැඳවියන් සංඛ්‍යාව 11,901යි. 2022.02.28 දිනට රඳවා තබා ඇති සංඛ්‍යාව 19,387යි.

(iv) 2022.02.28 දින වන විට අතිරික්ත රැඳවියන් සංඛ්‍යාව 8,471යි. දැනට පවතින තත්ත්වය ඒකයි.

(iii) සහ (iv) ප්‍රශ්නවලට අදාළ සම්පූර්ණ පිළිතුර මෙසේයි.

**<u>බන්ධනාගාර ආයතනවල රැඳවිය හැකි සංඛ්‍යාව හා අතිරික්තය - සාරාංශ සටහන</u>**

| අනු අංකය | බන්ධනාගාරය | රඳවා තැබිය හැකි සංඛ්‍යාව | 2022.02.28 දිනට රඳවා ඇති සංඛ්‍යාව | අතිරික්ත රැඳවියන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 | ප්‍රධාන බන්ධනාගාර ආයතන | 10223 | 17304 | 7735 |
| 02 | බන්ධනාගාර වැඩ කඳවුරු | 854 | 968 | 337 |
| 03 | විවෘත බන්ධනාගාර සිර කඳවුරු | 464 | 510 | 137 |
| 04 | තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථාන | 325 | 587 | 262 |
| 05 | තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාල | 35 | 18 | -17 |
| | එකතුව | **11901** | **19387** | **8471** |

- ප්‍රධාන සංවෘත බන්ධනාගාර වශයෙන් වැලිකඩ, මහර, දුම්බර හා අගුණුකොළපැලැස්ස බන්ධනාගාර වශයෙන් සලකනු ලබන අතර, අනෙක් බන්ධනාගාර රිමාන්ඩ් බන්ධනාගාර වශයෙන් සලකනු ලබයි.
- මීට අමතරව බන්ධනාගාර සිර මැදිරි 23ක් පිහිටා ඇත. එහි තාවකාලිකව රැඳවියන් අධිකරණ වෙත ඉදිරිපත් කරන තෙක් රඳවා තබන අතර, අධිකරණ කටයුතු අවසන් වූ පසු නැවත අදාළ බන්ධනාගාරය වෙත මාරු කිරීම සිදු කරයි.

(v) ඔව්.

**බන්ධනාගාර තදබදය අඩු කර ගැනීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග**

- කොවිඩ්-19 වසංගතය ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වීමට සමගාමීව බන්ධනාගාරගතව සිටින පුද්ගලයන් අඩු කර ගැනීම සඳහා අධිකරණය හා නීතිපති දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධ වී රැඳවියන් සඳහා ඇප කොන්දේසි ලිහිල් කර ඇප මත පුද්ගලයන් බන්ධනාගාරයෙන් මුදා හැරීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන ලද අතර, ඒ අනුව 2020 වර්ෂයේ බන්ධනාගාරගතව රැඳවියන් 32,000ක් සිටි අතර, එම ප්‍රමාණය මේ වනවිට 19,500ට ආසන්නයක් දක්වා අඩු කර ගැනීමට හැකි වී ඇත.
- අධිකරණ අමාත්‍යාංශය හා බන්ධනාගාර දෙපාර්තමේන්තුව එක්ව ආරම්භ කර ඇති මරණ දඬුවම නියමව සිටින සිරකරුවන්, ජීවිතාන්ත සිර දඬුවම් නියමව සිටින සිරකරුවන් හා දීර්ඝකාලීන සිර දඬුවම් නියමව සිටින සිරකරුවන් පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීමේ කමිටුව ක්‍රියාත්මක කිරීම තුළින් බන්ධනාගාරගත සිරකරුවන්ගේ

දඬුවම් ලිහිල් කිරීම මඟින් ඔවුන් බන්ධනාගාරවලින් නිදහස් කිරීමට හැකි වී ඇත. එය බන්ධනාගාර තදබදය අඩු කර ගැනීමට පිටිවහලක් වී ඇත.

- බන්ධනාගාර ආයතනවල පෙර නිමි - prefabricated - ගොඩනැඟිලි ඉදිකරගෙන යාම තුළින් තදබදය අවම කරගත හැකි වී ඇත. මේ වනවිට වාරියපොළ, පල්ලන්සේන බන්ධනාගාර ආයතනවල එම කටයුතු සිදු කර ඇති අතර, එය ඉදිරියේදී අනෙකුත් බන්ධනාගාර ආයතනවල ද ස්ථාපනය කිරීමට කටයුතු සිදු කරගෙන යමින් පවතී.
- මත් ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් බන්ධනාගාරගත වන පුද්ගලයන් පුනරුත්ථාපනය කිරීම සඳහා එළිමහන් කඳවුරු ආශ්‍රිතව, මත් ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීමේ මධ්‍යස්ථාන හතක් ආරම්භ කර ඒ තුළින්, ඔවුන් නැවත නැවත බන්ධනාගාරගතවීම අවම කිරීමට කටයුතු කර ඇත. ඒ මඟින් බන්ධනාගාර තුළ තදබදය අවම කර ගැනීමට ඉදිරියේදී අවකාශ සැලසෙන බව සඳහන් කරමි. උදාහරණ හැටියට, අඹේපුස්ස, පල්ලේකැලේ, මහර (කන්දෙවත්ත), වීරවිල, පල්ලන්සේන, අනුරාධපුර, තල්දෙන පුනරුත්ථාපන මධ්‍යස්ථාන සඳහන් කළ හැක.

(ආ) පැන නොනඟී.

ගරු කථානායකතුමනි, කොවිඩ් නිරෝධායන කටයුතු සඳහා ලබා දුන් කන්දකාඩු මත්ද්‍රව්‍ය නිවාරණ ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය අපි මේ වනවිට නැවත ලබාගෙන තිබෙනවා. එහි ධාරිතාවේ හැටියට මත්ද්‍රව්‍යවලට අබ්බැහි වී සිරගත වූවන් පුනරුත්ථාපනය කිරීම සඳහා කටයුතු ආරම්භ කර තිබෙනවා. එහි ධාරිතාව 2,000ක් දක්වා වැඩි කිරීමටත් බලාපොරොත්තු වෙනවා. ඒ හැර, හොරණ මිල්ලෑව ප්‍රදේශයේ අලුතින් සිර කඳවුරක් ඉදිකිරීම සඳහා අක්කර 200ක ස්ථානයක් ලබා ගෙන එහි මුල්ගල් තැබීමට කටයුතු කරමින් තිබෙනවා. කැබිනට් මණ්ඩලය ඊයේත් මේ පිළිබඳ සාකච්ඡා කළා. කොළඹ තිබෙන ප්‍රධාන බන්ධනාගාර තුනෙහි -රිමාන්ඩ් බන්ධනාගාරය, වැලිකඩ බන්ධනාගාරය සහ මැගසින් බන්ධනාගාරය- තමයි තදබදය වැඩියෙන්ම තිබෙන්නේ. ඒ අනුව ඉදිරියේදී ඒවා හොරණ මිල්ලෑව ප්‍රදේශයට අරගෙන යන්න අපි බලාපොරොත්තු වෙනවා. සාමාන්‍යයෙන් දැනට කොළඹ තිබෙන ඉඩ ප්‍රස්ථාව මෙන් දසගුණයක් විශාල ඉඩ ප්‍රස්ථාවක් ලබා දීලා මැන්ඩෙලා නියමවලට අනුව ඒ සිර කඳවුර සකස් කිරීම සඳහා අපි කටයුතු කරගෙන යනවා.

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)

ගරු ඇමතිතුමනි, විශේෂයෙන් ඔබතුමාගේ පැහැදිලි කිරීම් එක්ක අපට බොහොම පැහැදිලිව තේරෙනවා, රැඳවියන් බැහැර කිරීමේ යම්කිසි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරලාත් 8,471ක අතිරික්තයක් ඉන්නවා කියලා. ඒ කියන්නේ සීමාව ඉක්මවලා දැනටත් ඉන්නවා. ඒ අනුව, රැඳවියන් තුළ ඇති වන මානසික පීඩනය අපට බොහොම පැහැදිලිව තේරුම් ගන්න පුළුවන්.

ගරු ඇමතිතුමනි, දැන් හොරණ ප්‍රදේශයේ අලුතින් බන්ධනාගාරයක් සකස් කරන නිසා මම මේ කාරණය විශේෂයෙන් අහනවා. මේ බන්ධනාගාරවලට ගියාම අපට පෙනෙනවා, බන්ධනාගාර නිලධාරින්ට අපහසුතා රාශියක් තිබෙන බව. විශේෂයෙන් බැරැක්කවල ප්‍රශ්න තිබෙනවා. ඇත්තටම මහන්සිවෙලා සේවය කරලා ගිහින් විවේකයක් ගන්නවත් සුදුසු මානසික පරිසරයක් ඒ අයට එම ස්ථානවල නැහැ. අනෙක් පැත්තෙන්, පොලිස් නිලධාරින්ට වාගේ බන්ධනාගාර නිලධාරින්ටත් ආහාර දීමනාව ලබා දෙන්න කියා ඉල්ලීමක් කළා. බන්ධනාගාර නිලධාරිනුත් විශාල කැප කිරීමක් කරනවා; මහන්සි වෙනවා. ඒ අයගේ සේවය පහසු සේවයක් නොවෙයි. නමුත් තවම ඒ අයට ආහාර දීමනාවක් ලබා දෙන්නේ නැහැ. ඒ නිසා රැඳවියන්ට පහසුකම් සැලසීමේ කාර්යයට අවධානය යොමු කරනවා වාගේම බන්ධනාගාර නිලධාරින්ගේ පැත්තෙනුත් අවධානය යොමු කරලා බැරැක්කවල පහසුකම් ඇති කිරීමට සහ ආහාර දීමනාව ලබා දීමට ඔබතුමා විෂය භාර අමාත්‍යවරයා හැටියට මැදිහත් වෙනවාද, ඒ සඳහා තීරණයක් ගන්නවාද කියන කාරණය මගේ පළමු අතුරු ප්‍රශ්නය හැටියට අහන්න කැමැතියි.

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියපු ආකාරයට, පොලිස් නිලධාරින්ට ලබාදෙන ඒ පහසුකම් ප්‍රමාණය බන්ධනාගාර නිලධාරින්ටත් ලබා දෙන්න කියා අපි ඉල්ලීමක් කර තිබෙනවා. ඒ පිළිබඳව අපි මුදල් අමාත්‍යාංශය සහ භාණ්ඩාගාරය එක්ක සාකච්ඡා කරමින් සිටිනවා. නමුත් තවමත් අපට ඒකට හොඳ පිළිතුරක් ලැබිලා නැහැ. නමුත්, ඔබතුමාත් කියපු ඒ කාරණය සම්බන්ධයෙන් අපි කටයුතු කරමින් යනවා. පසුගිය කාලය පුරාම බන්ධනාගාර නිලධාරින්ගේ විශාල අඩුවක් තිබුණා. ඒ නිසා නිලධාරින් 500ක පමණ ප්‍රමාණයක් මෑතකදී අපි බඳවා ගත්තා. නමුත් ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් දන්නා ආකාරයට ආර්ථිකයට සිදු වෙලා තිබෙන හානිය සහ වර්තමාන ආර්ථික තත්ත්වය තුළ අපි බලාපොරොත්තු වුණු වේගයෙන් ඒ අදාළ ප්‍රතිසංස්කරණ කරගන්න බැරි වෙලා තිබෙනවා.

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)

ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, අධිකරණ අමාත්‍යවරයා හැටියට ඔබතුමා ඔබතුමාගේ විෂයයට ඉතාම සාධාරණයක් කරන ඇමතිවරයෙක්. ඒ නිසා ඔබතුමාට මගේ විශාල ගෞරවයක් තිබෙනවා. විශේෂයෙන් ඔබතුමා අධිකරණ ක්ෂේත්‍රයේ නීති පද්ධතියේ විශාල ප්‍රතිසංස්කරණ ගණනාවකට මුල පුරලා ඒ කටයුතු කරගෙන යනවා.

අද ජාත්‍යන්තර කාන්තා දිනය. මේ වැදගත් දිනයේ සංවේදී කාරණයක් කෙරෙහි මම මේ ගරු සභාවේ අවධානය යොමු කරවනවා. එක පැත්තකින්, අපි ප්‍රතිපත්ති සකස් කරන ස්ථානය මෙතැන නිසා අපි මේවා ගැන මේ ගරු සභාවේ කථා කරන්න ඕනෑ. අනෙක් අතට,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, වෙලාවේ හැටියට ප්‍රශ්නය කෙටියෙන් ඇහුවොත් හොඳයි.

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)

ගරු කථානායකතුමනි, විපක්ෂයේ මන්ත්‍රීවරු තරම් කාලය ගන්නේ නැහැ. ඊට වඩා අඩු කාලයකින් මම ප්‍රශ්නය අහන්නම්.

[ගරු ශාන්ත බණ්ඩාර මහතා]

ගරු ඇමතිතුමනි, අපේ රටේ දැරියක්, එහෙම නැත්නම් තරුණියක් බලහත්කාරී ලිංගික දූෂණයට ලක් වුණාට පසු ඒ දැරියගේ, තරුණියගේ හෝ කාන්තාවගේ කුසේ ඇති වන කලලය ඉවත් කිරීම සම්බන්ධව කටයුතු කිරීමේදී අපේ රටේ පවතින නීති පද්ධතිය තුළ ප්‍රශ්නයක් ඇති වෙනවා, මා දන්නා තරමින්. මේක ඉතා සංවේදී කාරණයක්. සමූහ දූෂණයට ලක් වෙලා හෝ අකැමැත්තෙන්, අමානුෂික විධියට, බලහත්කාරී දූෂණයකට ලක් වෙලා ඉතා අසරණ තත්ත්වයට පත් වීමෙන් අනතුරුවත් එම කාන්තාවට හෝ එම තරුණියට මුළු ජීවිතයෙන්ම වන්දි ගෙවන්න සිදු වෙනවා. ඇතැම් විට එවැනි ආකාරයෙන් ඉතාම අමානුෂික ලෙස දූෂණයට ලක් වූ අයගේ ජීවිත කථාව එතැනින් අවසන් වෙනවා. ඒ ගොඩක් දෙනෙක් ජීවිතය නැති කරන ගන්නවා; සිය දිවි හානි කරගන්නවා. ඒ නිසා ගරු ඇමතිතුමනි, ඔබතුමා නීති පද්ධතියේ විශාල ප්‍රතිසංස්කරණ ගණනාවක් කරන මේ වෙලාවේ මේ පිළිබඳව අවධානය යොමු කරලා මේ සංවේදී කාරණය සම්බන්ධයෙන් යම් වැඩ පිළිවෙළකට මුල පුරනවාද, මේ සම්බන්ධයෙන් පවතින නීති වෙනස් කරන්න කටයුතු කරනවාද කියා මා දැනගන්න කැමැතියි.

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)

ගරු මන්ත්‍රීතුමනි, ඉතාම අමිහිරි, අප්‍රසන්න, ඒ වුණත් කථා කළ යුතු මාතෘකාවක් පිළිබඳව අවධානය යොමු කරවීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. අපි එක පාරටම කියනවා, "ගබ්සාවට විරුද්ධයි" කියලා. නමුත් කාන්තාවගේ ජීවිතය ආරක්ෂා කර ගන්න අවශ්‍ය නම්, ජීවිතයට අවදානමක් තිබෙනවා නම්, අපට ඒ ගැන අවධානය යොමු කරන්න වෙනවා. දූෂණයට, සමූහ දූෂණයට ලක් වෙන කෙනෙක් ඒ දරුවා ජීවිත කාලය පුරා රඳවාගෙන ඒ සිද්ධිය ගැන වෛරයෙන් තමයි ඉන්නේ. මේ සම්බන්ධයෙන් වෙනත් රටවල ව්‍යතිරේක අවස්ථා ලබා දීලා තිබෙනවා, යම් යම් කොන්දේසිවලට යටත්ව ගබ්සාව නීතිගත කිරීම සඳහා. ඒ කතිකාවත ආරම්භ කිරීම ඉතාම වැදගත් කියා මා හිතනවා. කාන්තා දිනය යෙදී තිබෙන අද දවසේ මා යෝජනාවක් කරනවා. මේ පාර්ලිමේන්තුවේ අපේ මන්ත්‍රීවරියන්ගේ සංසදයක් - Women Parliamentarians' Caucus - තිබෙනවා. මේ කාරණය පිළිබඳව සලකා බලා, ඒ මන්ත්‍රීවරියන්ගේ සංසදය ආශ්‍රය කරගෙන අපට යෝජනාවක් කරනවා නම්, අනිවාර්යයෙන්ම ඒ ගැන සලකා බලා, සමාජයේ විවිධ පාර්ශ්ව සමඟත් සාකච්ඡා කරලා කටයුතු කරන්න පුළුවන්. යම් සංශෝධනයක් සිදු විය යුතුයි කියලා පෞද්ගලිකව මමත් විශ්වාස කරනවා. ඔබතුමා ඉදිරිපත් කළ යෝජනාව අනුව ඒ පිළිබඳව මේ ගරු සභාවේ කථා කිරීමට, ඉදිරියට කටයුතු කිරීමට අපි බලාපොරොත්තු වෙනවා.

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)

ගරු කථානායකතුමනි, ඒ කාරණය සම්බන්ධයෙන් අධිකරණ ඇමතිතුමා අවධානය යොමු කිරීම පිළිබඳව මා ස්තුතිවන්ත වෙනවා. එතුමාත් කියූ පරිදි, මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරියන්ගේ සංසදයක් තිබෙනවා. මේ පිළිබඳව එම සංසදයේ අවධානය යොමු කරවන ලෙස ඔබතුමාගෙන් මා ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි.

ප්‍රශ්න අංක 6 -1174/2022- (2), ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මන්ත්‍රීතුමා.

**ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා**
(மாண்புமிகு ஜகத் குமார சுமித்ராரச்சி)
(The Hon. Jagath Kumara Sumithraarachchi)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අසනවා.

**ගරු ශෙහාන් සේමසිංහ මහතා (සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு செஹான் சேமசிங்க - சமுர்த்தி, உள்ளக பொருளாதார, நுண்நிதிய, சுயதொழில், தொழில் அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Shehan Semasinghe - State Minister of Samurdhi, Household Economy, Micro Finance, Self-employment and Business Development)

ගරු කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## බලපත්‍රලාභී මත්පැන් නිෂ්පාදනාගාර : විස්තර
## அனுமதிப்பத்திரமுள்ள மதுபான உற்பத்திச்சாலைகள்: விபரம்
## LICENSED LIQUOR MANUFACTURING PLANTS: DETAILS

1186/2022

7. **ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

මුදල් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ශ්‍රී ලංකාව තුළ පවත්වාගෙන යනු ලබන බලපත්‍රලාභී මත්පැන් නිෂ්පාදනාගාර සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිෂ්පාදනාගාරවල නම් කවරේද;

(iii) එම නිෂ්පාදනාගාර පවත්වා ගෙන යනු ලබන ස්ථානවල ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් මත්පැන් නිෂ්පාදනාගාර අතරින් 2015 වර්ෂයෙන් පසුව වසා දමන ලද මත්පැන් නිෂ්පාදනාගාර තිබේද;

(ii) එසේ නම්, එම නිෂ්පාදනාගාරවල නම් කවරේද;

(iii) එම වසා දමන ලද නිෂ්පාදනාගාරවල නැවත මත්පැන් නිෂ්පාදන කටයුතු ආරම්භ කර තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා හේතු වූ කරුණු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் அனுமதிப்பத்திரம் பெற்று நடாத்திச் செல்லப்படுகின்ற மதுபான உற்பத்திச் சாலைகளின் எண்ணிக்கை எத்தனையென் பதையும்;

(ii) அவ்வுற்பத்திச்சாலைகளின் பெயர்கள் யாவை என்பதையும்;

(iii) அவ்வுற்பத்திச்சாலைகள் நடாத்திச் செல்லப் படுகின்ற இடங்களின் முகவரிகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i ) மேலே (அ)(i ) இல் குறிப்பிடப்பட்ட மதுபான உற்பத்திச்சாலைகளுள் 2015ஆம் ஆண்டுக்குப் பின்னர் மூடப்பட்டுள்ள மதுபான உற்பத்திச் சாலைகள் உள்ளனவா என்பதையும்;

(ii ) ஆமெனில், அந்த உற்பத்திச்சாலைகளின் பெயர்கள் யாவை என்பதையும்;

(iii ) அவ்வாறு மூடப்பட்ட உற்பத்திச்சாலைகளில் மீண்டும் மதுபான உற்பத்தி நடவடிக்கைகள் ஆரம்பிக்கப்பட்டுள்ளனவா என்பதையும்;

(iv ) ஆமெனில், அதற்கு ஏதுவாக அமைந்த கார ணங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Finance:

(a) Will he inform this House -

(i) the number of licensed liquor manufacturing plants in Sri Lanka;

(ii) the names of those plants; and

(iii) the addresses of the places where those manufacturing plants are run?

(b) Will he also inform this House -

(i) out of the liquor manufacturing plants mentioned in the (a)(i) above, whether there are any liquor manufacturing plants that have been closed down after 2015;

(ii) if so, the names of those manufacturing plants;

(iii) whether liquor manufacturing has been resumed in those liquor manufacturing plants which had been closed; and

(iv) if so, the reasons that led to such resumption?

(c) If not, why?

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

ගරු කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) බලපත්‍රලාභී මත්පැන් නිෂ්පාදනාගාර සංඛ්‍යාව 24කි.

(ii) නිෂ්පාදනාගාරවල නම් ඇමුණුමෙහි සඳහන් වේ.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ප්‍රශ්නයේ (අ) (ii) කොටසට අදාළ උත්තරය කියවන්න.

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

ගරු මන්ත්‍රීතුමනි, (අ) (ii) ප්‍රශ්නයට අදාළ උත්තරය ඇමුණුමෙහි සඳහන් වෙනවා. එකින් එක කියවන්න ඕනෑද? *[බාධා කිරීමක්]* නිෂ්පාදනාගාර 24ක් තිබෙනවා. ඒ ඇමුණුම ඔබතුමාට එවන්නම්.

(iii) ඔව්. නිෂ්පාදනාගාර පවත්වාගෙන යනු ලබන ස්ථානවල ලිපිනයන් ඇමුණුමෙහි සඳහන් වේ.

ගරු කථානායකතුමනි, නම් සහ ලිපිනයන් ඇමුණුමෙහි සඳහන් කර තිබෙනවා.

(ආ) (i) ඔව්.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

ගරු කථානායකතුමනි, මට ප්‍රශ්නයට උත්තර ඕනෑ. සභාගත කරලා හරි යන්නේ නැහැ. උත්තර දෙන්න කියන්න.

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

ඔබතුමාට උත්තර ඕනෑ ප්‍රශ්නයේ මොන කොටසට ද?

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

ඔබතුමා සම්පූර්ණ උත්තරය කියවන්න.

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

මොකක්ද ඔබතුමාට අවශ්‍ය? උත්තරය තමයි මේ කියවන්නේ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

(අ) (ii) ට, "එම නිෂ්පාදනාගාරවල නම් කවරේද?" කියන ප්‍රශ්නයට පිළිතුර කියවන්න.

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

නම් 24ක් තිබෙනවා. ඒ නම් 24 ම කියවන්න ඕනෑද?

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

කියවන්නකෝ බලන්න.

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

ගරු කථානායකතුමනි, ඔබතුමා මට කාලය දෙන්න. නම් 24ක් තිබෙනවා කියවන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

සභාගත කළත් ඇති වරදක් නැහැ.

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு ஷெஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

ගරු කථානායකතුමනි, ප්‍රශ්නයේ (අ) (ii) සහ (iii)ට අදාළ පිළිතුරු මෙසේයි.

| නිෂ්පාදනාගාර බලපත්‍රවල නම් සහ ලිපිනයන් | | |
|---|---|---|
| | නිෂ්පාදනාගාරයේ නම | ලිපිනය |
| I | ෆින්ලැන්ඩ් ඩිස්ටිලරීස් කෝපරේෂන් නිෂ්පාදනාගාරය 2020.12.08 දින නාමය වෙනස් වූ රන්දිය ඩිස්ටිලරීස් (පුද්.) සමාගමයි. | නො.09, මොරුක්කුලිය පාර, දංකොටුව |
| II | ශ්‍රී ලංකා ඩිස්ටිලරීස් | මෙස්ටිය, වාද්දුව |
| III | ස්කොට්ලන්ඩ් ඩිස්ටිලරීස් | නො.28, විජිතගම, බදුල්ල |
| IV | ඇක්මී ලංකා නිෂ්පාදනාගාරය | නො.73/1, පරණ අවිස්සාවේල්ල පාර, හංවැල්ල |
| V | සිනර්ජි නිෂ්පාදනාගාරය | රජවත්ත, බොම්බුවල, පයාගල |
| VI | වී.ඒ. ඩිස්ටිලරි | නො.324, හයිලෙවල් පාර, ගලගෙදර, පාදුක්ක |
| VII | රෝයල් කාස්ක් ඩිස්ටිලරීස් | නො.324/1, හයිලෙවල් පාර, ගලගෙදර, පාදුක්ක |
| VIII | වරණි ඩිස්ටිලරීස් | පේදුරුතුඩුව පාර, වරණි |
| IX | ඩබ්ලිව්.එම්. මෙන්ඩිස් සමාගම | අංක 350, ගාලු පාර, මීගමුව, වැලිසර |
| X | රොක්ලන්ඩ් නිෂ්පාදනාගාරය | 7වන, ඕවිටිමුල්ල, ආටිගල, කොටුපළ පාර, තිත්තපත්තර, වෙල්ගම |
| XI | නිපොන් එක්ස්පෝ නිෂ්පාදනාගාරය | පාලුගම, දොම්පේ |
| XII | රන්දෙනිගල නිෂ්පාදනාගාරය | කොරතොට, කඩුවෙල |
| XIII | DCSL සමාගම | අංක 120, නොරිස් කැනල් පාර, කොළඹ 10 (බණ්ඩාරවත්ත, සීදුව, බදුල්ල, නවයාලතැන්න, කළුතර ගුදම්) |
| XIV | පෙරිසිල් (පුද්ගලික) සමාගම | නො.53, නවයාලතැන්න, මහනුවර |
| XV | වලිකාමම් ඩිස්ටිලරීස් | නාවාලි, මනිපායි |
| XVI | සිග්නේචර් ඩිස්ටිලරීස් පුද. සමාගම (මනෝරි ලංකා පුද්ගලික සමාගම ලෙස පැවති නිෂ්පාදනාගාරය 2021.01.27 දින නාමය වෙනස් කර ඇත) | නො.279, ජයමාලපුර, ගම්පොල |
| XVII | අයි.ඩී.එල්. නිෂ්පාදනාගාරය | මෙල්ෆෝට් වත්ත, කොරතොට, කඩුවෙල |
| XVIII | ක්ලැසික් ඩිස්ටිලරීස් | මිහිඳු මාවත, මාලබේ |
| XIX | තික්කම් ඩිස්ටිලරීස් | වඩමරච්චි තල් සං: සමු: සමිතිය, බටහිර අල්වායි, අල්වායි |
| XX | හිඟුරාන ඩිස්ටිලරීස් | මල්වාන පාර, සමනබැද්ද, තිත්තපත්තර |

| නිෂ්පාදනාගාර බලපත්‍රවල නම් සහ ලිපිනයන් | | |
|---|---|---|
| | නිෂ්පාදනාගාරයේ නම | ලිපිනය |
| XXI | ඌව ග්ලේන් සමාගම | දුවහේනවත්ත, මොරගහහේන, මිල්ලෑව, හොරණ |
| XXII | ලයන් බෲවරි සමාගම | නො.254, කොළඹ පාර, බියගම |
| XXIII | හයිනෙකන් ලංකා සමාගම | ග්‍රීන් හවුස්, නො.260, නාවල පාර, නාවල |
| XXIV | රෝයල් සිලෝන් ඩිස්ටිලරීස් (වයඹ ඩිස්ටිලරීස් පුද්ගලික සමාගම ලෙස පැවති නිෂ්පාදනාගාරය 2020.12.18 දින නාමය වෙනස් කර ඇත) | නො.79, මල්කඩුවාව, කුරුණෑගල |

(ආ) (i) ඔව්.

2015 වර්ෂයෙන් පසුව වසා දමන ලද මත්පැන් නිෂ්පාදනාගාර 02ක් පමණක් තිබේ.

(ii) 01. වයඹ ඩිස්ටිලරීස්

(2020.12.18 වන දින සිට රෝයල් සිලෝන් ඩිස්ටිලරීස් නිෂ්පාදනාගාරය ලෙස නාමය වෙනස් කර ඇත.)

02. ඩබ්ලිව්.එම්. මෙන්ඩිස් සමාගම

(2020 ජනවාරි සිට මොරගොල්ල ස්කාගාරය හා නිෂ්පාදනාගාරය ද වසා තබා ඇති අතර, 2020 නොවැම්බර් මස සිට වැලිසර ප්‍රධාන නිෂ්පාදනාගාරය ද වසා ඇත.)

(iii) වයඹ ඩිස්ටිලරීස් නිෂ්පාදනාගාරය (රෝයල් සිලෝන් ඩිස්ටිලරීස් නිෂ්පාදනාගාරය) මත්පැන් නිෂ්පාදන කටයුතු 2020.11.16 දින නැවත ආරම්භ කර තිබේ. නමුත්, ඩබ්ලිව්.එම්. මෙන්ඩිස් සමාගම රජයට ගෙවිය යුතු හිඟ ආදායම් බදු මෙතෙක් ගෙවා නොමැති බැවින් 2021 වසරේ බලපත්‍රය නිකුත් කර නොමැත.

(iv) වයඹ ඩිස්ටිලරීස් (රෝයල් සිලෝන් ඩිස්ටිලරීස් නිෂ්පාදනාගාරය) රජයට ගෙවිය යුතුව පැවැති බදු මුදල් සම්පූර්ණයෙන් ගෙවා අවසන් කර ඇති අතර, ප්‍රමාද ගාස්තු වාරික වශයෙන් ගෙවීම සඳහා ගිවිසුමකට එළඹීමට කටයුතු කර ඇත.

(ඇ) පැන නොනඟී.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

හතරවන වතාවටයි මම මේ ප්‍රශ්නය පාර්ලිමේන්තුවේදී ඇහුවේ. ගරු රාජ්‍ය ඇමතිතුමනි, හතරවන වතාවට හෝ උත්තරයක් ලබා දීම ගැන මම පළමුවෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඔබතුමා කිව්වා, බලපත්‍රලාභී මත්පැන් නිෂ්පාදනාගාර 24ක් තිබෙනවා කියලා. ඒවායේ නම් ටික ඔබතුමා කිව්වා. 2015 අවුරුද්දෙන් පස්සේ වයඹ ඩිස්ටිලරීස් සහ ඩබ්ලිව්.එම්. මෙන්ඩිස් කියන නිෂ්පාදනාගාර දෙක වසා තිබෙනවා කියලාත් කිව්වා. 2020 වර්ෂයේ ඔබතුමන්ලාගේ යහ පාලන ආණ්ඩුව බලයට පත් වුණාට පස්සේ වයඹ ඩිස්ටිලරීස් නිෂ්පාදනාගාරය නැවත විවෘත කළා කියා ඔබතුමා කිව්වා. බොහොම හොඳයි. සාධු! සාධු!! ඩබ්ලිව්.එම්.

මෙන්ඩිස් සමාගම විවෘත කළේ නැහැ කියා කිව්වා. අපි පසුගිය කාලයේ නොයෙක් මාධ්‍ය ඔස්සේ දැක්කා, වයඹ ඩිස්ටිලරීස් ආයතනය සහ මෙන්ඩිස් සමාගම -ඒ ආයතන දෙක- බදු නොගෙවීම නිසා තමයි නිෂ්පාදනය නතර කරලා තිබෙන්නේ කියලා. වයඹ ඩිස්ටිලරීස් ආයතනය නැවත නිෂ්පාදන ආරම්භ කර තිබෙනවා, මෙන්ඩිස් සමාගම බදු නොගෙවීම මත නිෂ්පාදන ආරම්භ කරලා නැහැ කියා ඔබතුමා කිව්වා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අතුරු ප්‍රශ්නය අහන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
අතුරු ප්‍රශ්නය තමයි මම අහන්නේ, ගරු කථානායකතුමනි. ගරු රාජ්‍ය ඇමතිතුමා, මේක බරපතළ ප්‍රශ්නයක්. මොකද, ඔබතුමන්ලාගේ කට්ටිය මල් වට්ටිය අතේ තියාගෙනයි මේ ආණ්ඩුව බලයට පත් කළේ. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් පෙර වරු 11.15යි. ඉක්මනට අහන්න, අතුරු ප්‍රශ්නය.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි, වයඹ ඩිස්ටිලරීස් ආයතනයත් බදු ගෙවා නැහැ, බදු ගෙවීම පැහැර හැර තිබෙනවා කියා මාධ්‍ය තුළින් කියනවා අපි දැක්කා. එහෙම නම්, වයඹ ඩිස්ටිලරීස් ආයතනයට නැවත නිෂ්පාදන කටයුතු ආරම්භ කරන්න ඉඩ දුන්නේ බදු සියල්ල ගෙවා අවසන් වුණාම ද, එහෙම නැත්නම් බදු සහන දීලා ද, එහෙමත් නැත්නම් බදු ගෙවීම සම්බන්ධයෙන් යම් සහනයක් ලබා දීලා ද කියන කාරණය පැහැදිලි කරන්න පුළුවන්ද, ගරු රාජ්‍ය ඇමතිතුමනි?

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නයේ (ආ) (iv) ප්‍රශ්නයට මා ලබා දුන් පිළිතුරෙහි ඔබතුමා අහපු අතුරු ප්‍රශ්නයටත් පිළිතුර තිබෙනවා. ඒ තමයි, "වයඹ ඩිස්ටිලරීස් රජයට ගෙවිය යුතුව පැවති බදු මුදල් සම්පූර්ණයෙන් ගෙවා අවසන් කර ඇති අතර ප්‍රමාද ගාස්තු වාරික වශයෙන් ගෙවීම සඳහා ගිවිසුමකට එළඹීමට කටයුතු කර ඇත" කියන පිළිතුර.

ගරු කථානායකතුමනි, රජයක් හැටියට අපි කිසිම වංචනික ක්‍රියාවලියකට කිසිදු ආයතනයකට ඉඩ ලබා දෙන්නේ නැහැ. එය, මෙන්ඩිස් සමාගම වෙන්න පුළුවන්, වෙනත් සමාගමක් වෙන්නත් පුළුවන්. ඒ සමාගම් සියල්ල රජයේ නීති රාමුව තුළ තමයි කටයුතු කරන්නේ. හැබැයි මෙන්ඩිස් සමාගම පිළිබඳ අද කවුරුවත් කථා කරන්නේ නැහැ. මෙන්ඩිස් සමාගම ගැන කථා නොකරන්න හේතුව මෑත ඉතිහාසයේ ප්‍රසිද්ධ වෙලා තිබුණා, ගරු කථානායකතුමනි. මෙන්ඩිස් සමාගමට සම්බන්ධ පුද්ගලයන් මහ බැංකු බැඳුම්කර වංචනිකයන් හැටියට කටයුතු කරපු ආකාරය, ඒ අයට ඒ චෝදනා එල්ල වෙච්ච ආකාරය, ඒ අය සමහර අය වෙනුවෙන් මැතිවරණ ව්‍යාපාරය පවත්වාගෙන යන්න උදවු කරපු විධිය ආදි ඒ සියල්ල පිළිබඳව මේ ගරු සභාව තුළදී හෙළිදරව් වුණා.

ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම ඒ බදු ගෙවලා නැති හින්දා තමයි නිෂ්පාදන අවසරය ලබා දීලා නැත්තේ. බදු නොගෙවපු ආයතනයක් වුණු මෙන්ඩිස් සමාගම පවත්වාගෙන යන්න ඔබතුමන්ලාගේ කාලයේ අවසරය ලබා දීලා තිබුණා. හැබැයි, වයඹ ඩිස්ටිලරීස් කියන ආයතනය ගෙවිය යුතු බදුවලින් සියයට 80ක් ගෙවලා තිබුණු අවස්ථාවකත්, ඒ කියන්නේ රුපියල් මිලියන 119න්, සියයට 80ක් ගෙවලා තිබුණු අවස්ථාවකත් ඔබතුමන්ලාගේ ආණ්ඩුව ඒ ආයතනය තහනම් කළා. ඔවුන්ට ගෙවන්න තිබුණේ තවත් රුපියල් මිලියන 22යි. ඒ රුපියල් මිලියන 22ත් ගෙවලා, සම්පූර්ණ මුදල ගෙව්වාට පස්සේ තමයි මේ අවසරය ලබා දීලා තිබෙන්නේ. ඒ හින්දා ඒ ආයතනයට කිසිම ආකාරයක බදු සහන ලබා දීමක් සිදු කරලා නැහැ.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි, අපට මෙන්ඩිස් සමාගමත් එකයි; වයඹ ඩිස්ටිලරීස් සමාගමත් එකයි. අපට ඒ කවුරුවත් අදාළ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි, පැහැදිලි කරගෙන යන්න එපා යැ. ඔබතුමා කලබල වෙන්න එපා. ඔබතුමාත් මේකට ටිකක් කලබලයි කියලා මට තේරෙනවා. ගරු කථානායකතුමනි, යහ පාලන ආණ්ඩුව කාලයේ මෙන්ඩිස් සමාගමත් නතර කරලා තිබෙනවා; වයඹ ඩිස්ටිලරීස් සමාගමත් නතර කරලා තිබෙනවා. බලයට පත් වුණාට පස්සේ, අදාළ ආයතනවලින් බදු අය කර ගැනීම ආණ්ඩුවක් ලෙස ඔබතුමන්ලාගේ කාර්ය භාරයක්, ගරු රාජ්‍ය ඇමතිතුමනි.

ගරු කථානායකතුමනි, දැන් අපේ රටේ බොහොම ප්‍රසිද්ධයි, අපේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට බාර් තිබෙනවා කියන එක. පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 100 දෙනෙකුට බාර් තිබෙනවා කියනවා; පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට මත්පැන් නිෂ්පාදනාගාර තිබෙනවා කියනවා. මේක එච්චර හොඳ දෙයක් නොවෙයි. මා දන්නා විධියට නම් සමගි ජන බලවේගයේ කාටවත් බාර් නැහැ; මත්පැන් නිෂ්පාදනාගාරත් නැහැ. ගරු කථානායකතුමනි, අප දන්නා තවත් කාරණයක් තිබෙනවා. ඒ තමයි, බුද්ධාගම හිස මුදුනින් තියාගෙන ආ මේ ආණ්ඩුව පසුගිය කාලයේ වයින් ස්ටෝර්ස් බලපත්‍ර 150ක් විතර දීලා තිබෙනවා කියන එක. ඒ සංඛ්‍යාව 140ක් ද, 130ක් ද කියලා මම හරියටම දන්නේ නැහැ. නමුත්, බලපත්‍ර විශාල ප්‍රමාණයක් දීලා තිබෙනවා. ගරු කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය විධියට ගරු රාජ්‍ය ඇමතිතුමාගෙන් මම අහන්නේ මේකයි. ඔබතුමන්ලා බදු අය කර ගන්න, ගරු රාජ්‍ය ඇමතිතුමනි. ඒ අය කරගන්නේ මෙන්ඩිස් සමාගමෙන් ද, වයඹ ඩිස්ටිලරීස් සමාගමෙන් ද, අරකෙන් ද, මේකෙන් ද කියන එක අපට ප්‍රශ්නයක් නොවෙයි. ඒ කටයුත්ත අනිවාර්යයෙන් කරන්න. වර්ෂ 2020න් පස්සේ මේ තරම් බාර් විශාල ප්‍රමාණයක් සඳහා බලපත්‍ර ලබා දුන් පදනම මොකක්ද කියලා මම අහනවා. ඒක, මේ රටේ තිබෙන අවශ්‍යතාවද? පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට බාර් තිබෙනවා කියන අවලාදය අද නැඟෙනවා. පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් සමස්තයට -මන්ත්‍රීවරුන් 225 දෙනාටම- තමයි රටේ ජනතාව මේ චෝදනාව කරන්නේ. එම අවලාදයෙන් ගොඩ එන්න කටයුතු කරන්න. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සතුව නියමින් හෝ

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා]

අනියමින් -සෘජුව හෝ වක්‍රව- බාර් හෝ මත්පැන් නිෂ්පාදනාගාර තිබෙනවාද? ඒ කාරණය නිවැරැදි කරලා දෙන්න ඔබතුමාට බැරිද? මොකද, ඒ නැඟෙන චෝදනාව ඔබතුමා ඇතුළු අප සියලු දෙනාට හොඳ නැහැ.

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

ගරු කථානායකතුමනි, මම දන්නේ නැහැ, ගරු නලින් බණ්ඩාර මන්ත්‍රීතුමා අහපු අතුරු ප්‍රශ්නය මොකක්ද කියලා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අසා තිබෙන ප්‍රශ්නයට අපි පැහැදිලිව පිළිතුර ලබා දීලා තිබෙනවා. ගරු කථානායකතුමනි, මෙන්ඩිස් සමාගම බදු නොගෙවා ඉන්න අවස්ථාවක ඔවුන්ගේ ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යන්න ඔවුන්ට ඉඩ දුන්නා, යහ පාලන ආණ්ඩුව. අනෙක් අතට, බදු ගෙවපු ආයතනයේ ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යෑම නැවැත්වුවා. ඒ ආයතනයේ කටයුතු නැවැත්වීම තුළ පවුල් 130කට විතර රැකියා අහිමි වුණා.

ගරු කථානායකතුමනි, වාර්තාවක් තිබෙනවා. එක එක්කෙනාගේ පෞද්ගලික අවශ්‍යතාව මත ව්‍යාපාර කටයුතු නවත්වා දැමීම නිසා රජයට අය විය යුතු බදු අය නොවීමෙන් රුපියල් බිලියනයකට ආසන්න පාඩුවක් සිදුවෙලා තිබෙනවා කියලා එම වාර්තාවේ සඳහන් වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, නීත්‍යනුකූලව මත්පැන් බලපත්‍ර නිකුත් කරලා තිබෙනවාද කියලා, ඒ කාරණය පිළිබඳව ප්‍රශ්නයක් ඇහුවොත්, අපට උත්තර දෙන්න පුළුවන්. හැබැයි, යහ පාලන ආණ්ඩුව කාලයේ ගෙවල්වල නීති විරෝධී මත්පැන් නිෂ්පාදනාගාර පවත්වාගෙන ගිය අය මේ පාර්ලිමේන්තුව නියෝජනය කළා. ඒ නිසා නීත්‍යනුකූලව සිදුවන කටයුතු පිළිබඳව නිසියාකාරව ප්‍රශ්නයක් ඇහුවොත්, අපට උත්තර දෙන්න පුළුවන්. ගරු මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නයට මම නිවැරදිව පිළිතුරු ලබා දීලා තිබෙනවා, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 8 -1313/2022- (1), ගරු මොහමඩ් මුසම්මිල් මහතා -*[සභා ගර්භය තුළ නැත.]*

## අනුරාධපුර ආයුර්වේද රෝහල ස්ථාපිත කර ඇති ඉඩම: බලෙන් අත්කර ගැනීම
## அநுராதபுர ஆயுர்வேத வைத்தியசாலை நிறுவப்பட்டுள்ள இடம்: கையகப்படுத்தல்
## LAND LOCATING AYURVEDA HOSPITAL IN ANURADHAPURA: ENCROACHMENT

1471/2022

**9. ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)

සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) අනුරාධපුර නගරයේ ආයුර්වේද රෝහලක් ස්ථාපිත කර ඇති බවත්;

(ii) වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම සඳහා එම රෝහලට දිනපතා විශාල පිරිසක් පැමිණෙන බවත්;

(iii) එම රෝහල් ඉඩමේ පිටුපස කොටස කිසියම් පිරිසක් විසින් කම්බි ගසා අත්පත් කර ගෙන ඇති බවත්;

එතුමා දන්නේද?

(ආ) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அநுராதபுர நகரில் ஓர் ஆயுர்வேத வைத்திய சாலை நிறுவப்பட்டுள்ளது என்பதையும்;

(ii) மருத்துவ சிகிச்சைகளைப் பெறுவதற்காகப் பெருந்தொகையானோர் மேற்படி வைத்திய சாலைக்கு தினமும் வருகை தருகின்றனர் என்பதையும்;

(iii) மேற்படி வைத்தியசாலைக்குரிய காணியின் பின்பகுதியை ஒரு சிலர் கம்பி வேலியமைத்துக் கையகப்படுத்தியுள்ளனர் என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) ஆமெனில், அது சம்பந்தமாக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவையென்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health:

(a) Is he aware that -

(i) an Ayurveda hospital has been established in Anuradhapura Town;

(ii) a large number of patients come to the aforementioned hospital daily for treatment; and

(iii) a certain group has encroached the rear side of the land where the hospital is situated by setting up a barbed wire fence?

(b) If so, will he inform this House of the measures that will be taken regarding the matter?

(c) If not, why?

**ගරු සිසිර ජයකොඩි මහතා (දේශීය වෛදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சிசிர ஜயகொடி - சுதேச வைத்திய முறைகளின் மேம்பாடு, கிராமிய மற்றும் ஆயுர்வேத வைத்தியசாலைகள் அபிவிருத்தி மற்றும் சமூக சுகாதார இராஜாங்க அமைச்சர்)
(The Hon. Sisira Jayakody - State Minister of Indigenous Medicine Promotion, Rural and Ayurvedic Hospitals Development and Community Health)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) අනුරාධපුර පළාත් ආයුර්වේද රෝහල අනුරාධපුර නගර මධ්‍යයේ ස්ථාපිත කර ඇත.

(ii) මෙම රෝහලින් ප්‍රතිකාර ලබා ගැනීම සඳහා දෛනිකව රෝගීන් 150ක පමණ ප්‍රමාණයක් පැමිණේ.

(iii) පළාත් ආයුර්වේද රෝහල් ඉඩමේ පිටුපස කොටස කිසිවෙකුත් අත්පත් කරගෙන නොමැති අතර එම ස්ථානයේ ගසා තිබූ කම්බි කණු ඉවත් කර පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව හා රෝහල වටා 2021 වර්ෂයේ සංවර්ධන ප්‍රතිපාදන මඟින් තාප්පයක් ඉදිකර ඇත.

(ආ) පැන නොනඟී.

(ඇ) පැන නොනඟී.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ප්‍රශ්නයට උත්තර ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. තවම ඒ ප්‍රශ්නය යටපත් වෙලා නැහැ, ගරු රාජ්‍ය ඇමතිතුමනි. තවම එය යම්කිසි මට්ටමකින් නැඟෙමින්, යට යමින් තමයි තිබෙන්නේ. ඒ නිසා ඒ ගැන ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

මෙන්න මේ කාරණය ගැනත් මම ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි. මේ දවස්වල වෙළඳපොළේ යම් යම් ඖෂධවල හිඟයක් අපි දකිනවා. දේශීය වෙදකම් ප්‍රවර්ධන රාජ්‍ය ඇමතිවරයා වුණත් ඔබතුමාත් සෞඛ්‍ය අමාත්‍යාංශයට සම්බන්ධයි. අද භාණ්ඩවලට උපරිම මිලක් නියම කරපු ගමන්, අපට ඒ භාණ්ඩවල හිඟයක් දකින්නට ලැබෙනවා. ඊයේ පෙරේදා, සෞඛ්‍ය අමාත්‍යාංශයත් මැදිහත් වෙලා පැරසිටමෝල්වලට උපරිම සිල්ලර මිලක් නියම කළා. වෙළෙඳ පොළේ පැරසිටමෝල් සහ පැනඩෝල්වල හිඟයක් තිබෙන මොහොතක තමයි, එයට උපරිම සිල්ලර මිලක් නියම කර තිබෙන්නේ. මේ නිසා එම ඖෂධවල හිඟයක් මතු වෙන්න පුළුවන්. හිඟයක් ඇති නොවන පරිදි, අපේ රටේ පැනඩෝල් සහ පැරසිටමෝල් අවශ්‍යතාව අනුව ඒවා සපයන්න ඔබතුමන්ලා වැඩ පිළිවෙළක් සකස් කරලා තිබෙනවා ද?

**ගරු සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)

ගරු කථානායකතුමනි, එතුමා අහපු මුල් ප්‍රශ්නය හා සෘජු සම්බන්ධතාවක් එම අතුරු ප්‍රශ්නයේ නැහැ. ඒ නිසා ගරු සෞඛ්‍ය අමාත්‍යතුමා එතුමාගේ ඒ ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙයි.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)

ගරු කථානායකතුමනි, එතුමා ඇසුවේ ඉතා වැදගත් සහ කාලෝචිත ප්‍රශ්නයක්. ගරු මන්ත්‍රීතුමනි, මේ වන කොට අපේ දේශීය නිෂ්පාදන සියයට 30කින් පමණ වැඩි කරන්න හැකියාවක් අපට ලැබී තිබෙනවා. ඒ අතරතුර පැරසිටමෝල් පෙත්තක මිල රුපියල් 1.68 සිට රුපියල් 2.30 දක්වා වැඩි කර තිබෙනවා. ටික කාලයක් යම් ප්‍රශ්නයක් තිබුණා නම්, ඒ ප්‍රශ්නය නිරාකරණය වන වැඩ පිළිවෙළක් දැන් දියත්වෙලා තිබෙනවා. ඉදිරියේ දී යම්කිසි විධියකින් හිඟයක් ඇති වුණොත් ඒ හිඟය ඇති වෙන්න හේතුව තමයි LCs - ණයවර ලිපි - open කිරීමේදී ඇති වන ගැටලුව. ඒ තත්ත්වය වැළැක්වීම සඳහා අපි ප්‍රමුඛත්වය ලබා දී කටයුතු කරමින් සිටිනවා. මූලික වෛද්‍ය පහසුකම් -බෙහෙත්- සඳහා කාර්තුවකට ඩොලර් මිලියන 132ක් අවශ්‍යයි. ඊළඟ කාර්තු දෙකට අවශ්‍ය මුදල් වෙන් කර ගැනීමට මහ බැංකුවේ අධිපතිතුමාත්, මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමාත් සමඟ අපි මේ වන විටත් සාකච්ඡා කරමින් සිටිනවා.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)

ගරු ඇමතිතුමනි, ඒ කාරණය පිළිබඳව අවධානය යොමු කිරීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මොකද, හැමෝටම අවශ්‍ය වන පැනඩෝල් පෙත්තවත් වෙළෙඳ පොළේ ගන්න නැති වුණොත් ජනතාවට ලොකු ප්‍රශ්නයකට මුහුණ දෙන්න සිදු වෙනවා.

ගරු ඇමතිතුමනි, අද සෞඛ්‍ය ක්ෂේත්‍රයට පමණක් නොවෙයි, පොදුවේ හැමෝටම බලපාන ප්‍රශ්න රාශියක් තිබෙනවා. අද රටේ ඉන්ධන නැහැ. ඊළඟට විදුලිය කප්පාදුව සහ ගෑස් හිඟයක් පවතිනවා. ඉන්ධන ප්‍රශ්නය රෝහල්වල ගිලන්රථ සේවයට බලපානවා. විදුලිය කප්පාදු වුණාම ශීතාගාරවලට බලපානවා; මළ මිනී ටික නරක් වනවා. ඒ වාගේම ඖෂධ කල් තබා ගැනීම පිළිබඳ ප්‍රශ්නයත් මතු වනවා. ගෑස් හිඟය නිසා රෝහල්වල සිටින රෝගීන්ට වෙලාවට ආහාර ටික සැපයීමේ අපහසුතා පවතිනවා. ගරු ඇමතිතුමනි, මේ ගැටලු කළමනාකරණය කර ගැනීමට ඔබතුමන්ලා මැදිහත්වෙලා යම්කිසි වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවාද? මේ තත්ත්වය තවත් උග්‍ර වුණොත් ඊට මුහුණ දෙන්නේ මොන ආකාරයෙන්ද කියලා මම දැනගන්න කැමැතියි.

වර්තමානයේ රටේ බොහෝ ප්‍රශ්න පවතිනවා. ඒ නිසා ලබන 15 වැනි දා ජනතාව කොළඹට ඒක රාශි කිරීමේ වැඩ පිළිවෙළක් අපි සූදානම් කර තිබෙනවා. අපි පසුගිය වතාවේ ජනතාව කොළඹට ඒක රාශි කරන්න හදපු වෙලාවේ සෞඛ්‍ය අංශ සහ පොලීසිය මැදිහත්වෙලා ඊට බාධා කළා. නමුත් ඔබතුමන්ලා පසුගිය දිනක අනුරාධපුරයේ රැලි පැවැත්වූවා. ඒ නිසා අද රටේ ජනතාවට දැනෙන ලෙස වැඩි වී තිබෙන මේ ප්‍රශ්න ගැන කථා කරන්න, උද්ඝෝෂණය කරන්න, සෞඛ්‍ය අංශයෙන් අපිටත් බාධා එල්ල නොකරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)

15 වැනිදාට තව කල් තිබෙන නිසා මට ඒ ගැන දැන් කියන්න බැහැ, ගරු මන්ත්‍රීතුමා. මොකද, හෙට-අනිද්දා වන කොට සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ විවිධ වෙනස්කම් වෙන්න පුළුවන්. එසේ නොවුණොත් සාමාන්‍ය තත්ත්වය පවතිනවා. පැය 24ක් ගතවෙලා, ඊළඟ දවසේ සිදුවන දේ ගැන සෞඛ්‍ය අංශයට කියන්න පුළුවන් නම්, මේ ලෝකයම වෙළාගත් කොවිඩ් වසංගතය ගැනත් දැන ගන්න හැකියාවක් තිබෙනවා නේ. එහෙම හැකියාවක් නැති බව ඔබතුමා දන්නවා. ඒ නිසා හෙට දවස ගැන කියන්න අමාරුයි. වර්තමානයේ පවතින තත්ත්වය අනුව, හුඟක් දේවල් නිදහස් කරගෙන යනවා.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)

ගෑස් ප්‍රශ්නය සහ විදුලිය කැපීම ගැන මම ඇසූ ප්‍රශ්නයට ඔබතුමාගේ පිළිතුර මොකක්ද?

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)

මේ වනකොට රෝහල් පද්ධතියට ඒ සම්බන්ධව ප්‍රශ්නයක් මතුවෙලා නැහැ. ඉදිරියේදී ප්‍රශ්නයක් ඇති වන්නට පුළුවන් නිසා ඒ සම්බන්ධව අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතිනවා. විශේෂයෙන්ම එවැනි ප්‍රශ්නයක් ආවොත්, ඒකට මුහුණ දෙන්න පුළුවන් විධියට අපි දැනටමත් කටයුතු කරමින් සිටිනවා. අපේ සෑම ආරෝග්‍යශාලාවකම වාගේ ජෙනරේටර් තිබෙනවා. නමුත්, ඒවා

[ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා]

බොහෝ කාලයක් පාවිච්චි නොකළ නිසා අවශ්‍ය වුණොත් භාවිත කිරීමට ඒවායේ නඩත්තු කටයුතු සිදු කර සූදානම් කර තබාගන්න කියා මම වෙනම කණ්ඩායමක් පිටත් කර යවා තිබෙනවා.

## පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ශ්‍රීලංගම ඩිපෝ: විස්තර
பொலன்னறுவை மாவட்டத்திலுள்ள இ.போ.ச. பேருந்துச் சாலைகள்: விபரம்
SLTB DEPOTS IN POLONNARUWA DISTRICT: DETAILS

1726/2022

**10. ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ඇති ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල ඩිපෝ සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) ඉහත සඳහන් එක් එක් ඩිපෝවේ ධාවනයට සුදුසු තත්ත්වයේ පවතින බස් රථ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉහත සඳහන් එක් එක් ඩිපෝවේ පවතින සේවක පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ දුෂ්කර ගම්මානවලට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස් රථ මඟින් ප්‍රවාහන පහසුකම් ලබා දීමට අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பொலன்னறுவை மாவட்டத்திலுள்ள இலங்கைப் போக்குவரத்துச் சபைக்குரிய பேருந்துச் சாலை களின் எண்ணிக்கை எத்தனை;

(ii) அவற்றின் பெயர்கள் யாவை;

(iii) மேற்படி ஒவ்வொரு சாலையிலும் போக்குவரத் தில் ஈடுபடுத்தக்கூடிய நிலையிலுள்ள பேருந்து களின் எண்ணிக்கை வெவ்வேறாக எத்தனை;

(iv) மேற்படி ஒவ்வொரு சாலையிலும் நிலவுகின்ற ஊழியர் வெற்றிடங்களின் எண்ணிக்கை வெவ் வேறாக எத்தனை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) பொலன்னறுவை மாவட்டத்தின் பின்தங்கிய கிராமங் களுக்கு இலங்கைப் போக்குவரத்துச் சபையின் பேருந் துகள் மூலமாக போக்குவரத்து வசதிகளை ஏற்படுத்திக் கொடுப்பதற்கு அமைச்சு மேற்கொள்ளும் நடவடிக் கைகள் யாவை என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Transport:

(a) Will he inform this House -

(i) the number of depots of the Sri Lanka Transport Board which are located within Polonnaruwa District;

(ii) the names of the said depots;

(iii) the number of buses that are in running condition at each such depot, separately; and

(iv) the number of employee vacancies prevailing at each such depot, separately?

(b) Will he also inform this House of the measures that will be taken by the Ministry to make transport facilities available to remote villages of Polonnaruwa District using buses of the Sri Lanka Transport Board?

(c) If not, why?

**ගරු දිලුම් අමුණුගම මහතා**
(மாண்புமிகு திலும் அமுனுகம)
(The Hon. Dilum Amunugama)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 02කි.

(ii) පොළොන්නරුව ඩිපෝව සහ දියසෙන්පුර උප ඩිපෝව

(iii) පොළොන්නරුව ඩිපෝවේ ධාවනයට සුදුසු බස් රථ - 115

දියසෙන්පුර උප ඩිපෝවේ ධාවනයට සුදුසු බස් රථ - 12

(iv) ඔව්.

<u>පොළොන්නරුව ඩිපෝව</u>

| | | |
|---|---|---|
| රියැදුරු පුරප්පාඩු සංඛ්‍යාව | - | 13 |
| කොන්දොස්තර පුරප්පාඩු සංඛ්‍යාව | - | 32 |
| කාර්මික පුරප්පාඩු සංඛ්‍යාව | - | 10 |
| සනීපාරක්ෂක කම්කරු පුරප්පාඩු සංඛ්‍යාව | - | 01 |

<u>දියසෙන්පුර උප ඩිපෝව</u>

| | | |
|---|---|---|
| රියැදුරු පුරප්පාඩු සංඛ්‍යාව | - | 01 |
| කොන්දොස්තර පුරප්පාඩු සංඛ්‍යාව | - | 03 |

(ආ) ඔව්. පොළොන්නරුව ඩිපෝව මඟින් බස් රථ 120ක් පමණ මාර්ග 60ක් ඔස්සේ දෛනිකව ධාවනය කරන අතර, දිනකට ගමන් වාර 160ක් පමණ ආවරණය කෙරේ. මින් ගමන් වාර 90ක් පමණ ග්‍රාමීය දුෂ්කර මාර්ග වේ.

ඉදිරියේදී නව බස් රථ ලැබුණු පසුව ඒවා දුෂ්කර මාර්ග ඔස්සේ යෙදවීමට බලාපොරොත්තු වේ.

අපි නව බස් රථ 500ක් ඇණවුම් කර තිබෙනවා. ඒවා කුඩා බස් රථ. එම බස් රථ 500 ලැබුණු පසුව ග්‍රාමීය ධාවනය සඳහා යොදවන්නට තමයි අපි බලාපොරොත්තු වන්නේ, ගරු මන්ත්‍රීතුමනි.

(ඇ) අදාළ නොවේ.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවකයන්ට වාර්ෂිකව ඉතිරි වී ඇති නිවාඩු සඳහා මුදල් ගෙවීම 2019 වසරේ නවත්වනු ලැබුවා, ගරු අමාත්‍යතුමනි. නැවතත් 2020.03.12 වන දින චක්‍රලේඛයක් නිකුත් කරලා සභාපතිතුමා විසින් එම මුදල් ගෙවීම අනුමත කළත්, මේ වනතෙක් එම නිවාඩු සඳහා වෙන් කළ මුදල් ගෙවා නැහැ. විශේෂයෙන්ම උතුරු මැද පළාතේ අනුරාධපුරයේත්, ඒ වාගේම පොළොන්නරුව දිස්ත්‍රික්කයේත් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවකයින්ට මේ මුදල් ලබා දී නැහැ.

ගරු ඇමතිතුමනි, මේ මුදල් නැවත ගෙවන්න කටයුතු කරනවාද කියලා මම දැනගන්න කැමැතියි. මොකද, සභාපතිතුමා 2020.03.12වන දා මේ සඳහා අනුමැතිය ලබා දීලා තිබෙනවා.

**ගරු දිලුම් අමුණුගම මහතා**
(மாண்புமிகு திலும் அமுணுகம)
(The Hon. Dilum Amunugama)
ගරු කථානායකතුමනි, මේ කාරණය සම්බන්ධයෙන් කටයුතු කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ මුදල් නොගෙවන්න ප්‍රධාන හේතුව මේකයි. ඔබතුමන්ලා සියලු දෙනා දන්නා පරිදි, මෙවර අය වැයෙන් අනෙක් සියලු අමාත්‍යාංශවලට වාගේම අපේ අමාත්‍යාංශයටත් රුපියල් මිලියන 400ක විතර cut එකක් තිබෙනවා. එම නිසා වාර්ෂික නිවාඩු ඉතිරි වී ඇති සේවකයන්ට ඒ සඳහා ගෙවිය යුතු මුදල සොයා ගන්නේ කොහෙන්ද කියන ප්‍රශ්නය අපට මතු වෙලා තිබෙනවා. ඒ නිසා නොයෙකුත් තැන්වලින් මේ සඳහා මුදල් ඉතිරි කර ගන්න අපට සිදු වෙලා තිබෙනවා. මේ සේවකයන්ට ඒ මුදල් ගෙවීම පිළිබඳව ලබා දුන් තීන්දුව අනුමත වෙලා තිබෙනවා. ඒ සඳහා සභාපතිතුමාගේත් අනුමැතිය ලබා දීලා තිබෙනවා. නමුත්, මූල්‍ය තත්ත්වය පැත්තෙන් දැනට ප්‍රශ්නයක් තිබෙනවා. හැබැයි, අපි කොයි වෙලාවක හෝ ඒ මුදල් ලබා දෙන්න කටයුතු කරනවා.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, පොළොන්නරුව දිස්ත්‍රික්කයට ප්‍රමාණවත් පරිදි බස් රථ ලබා දීලා තිබෙනවා කියලා ඔබතුමා කිව්වා. කොවිඩ් වසංගතයත් එක්ක පොළොන්නරුව දිස්ත්‍රික්කයේ තිබෙන දිඹුලාගල, වැලිකන්ද වාගේ දුෂ්කර ප්‍රදේශවල ධාවනය වන බස්වලට පවා නංවා ගන්නේ සීමිත මගීන් සංඛ්‍යාවක්. පාසල් දරුවන්ටත් මේ ප්‍රශ්නයම ඇති වෙලා ඔවුන්ට දැඩි අපහසුතාවකට මුහුණ දෙන්න සිදු වෙලා තිබෙනවා. රටේ තිබෙන වසංගත තත්ත්වය නිසා ඒ පවතින නීති රීතිවලට අනුව බස් රථ ධාවනය කරනකොට නියමිත වෙලාවට ළමයින්ට පාසලට යන්න බැරි වෙනවා. ඒ වාගේම පාසල අවසන් වෙලා ගෙදරට යන්නත් ඒ දරුවන්ට වැඩි කාලයක් ගතවනවා. මොකද, දැනට තිබෙන බස් රථ සංඛ්‍යාව ඒ ගමනාගමන කටයුතු සඳහා ප්‍රමාණවත් නැහැ, ගරු ඇමතිතුමනි. අපි දන්නේ නැහැ, ඉදිරියේදී මේ වසංගතය අඩු වෙයි ද, වැඩි වෙයි ද කියලා. ඒ නිසා මේ පාසල් දරුවන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරලා මේ සම්බන්ධයෙන් කටයුතු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ගරු ඇමතිතුමනි, මේ මාසයේ 15 වෙනිදා දැවැන්ත උද්ඝෝෂණයක් කරන්න අපි කටයුතු සූදානම් කර තිබෙනවා. ඒ උද්ඝෝෂණයට ජනතාව සහභාගි කරවීම සඳහා මුදල් ගෙවා බස් රථ ලබා ගන්න අපි ඉල්ලීමක් කර තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ඔබතුමා කටයුතු කරයි කියා අපි විශ්වාස කරනවා. කෘෂිකර්ම ඇමතිතුමා කිව්වා, අපි පොළොන්නරුවේදී කළ උද්ඝෝෂණයට 5,000ක පිරිසක්වත් හිටියේ නැහැ කියලා. අපි එදා කළේ උද්ඝෝෂණයක් නොවෙයි. අපි එදා "සමගි ගොවිජන ප්‍රකාශනය" එළි දැක්වූවා. අපි මේ මාසයේ 15 වෙනිදාට මේ රටේ සිටින සියලු දෙනා එක තැනකට එකතු කරනවා. ඒ සඳහා ඔබතුමාගෙන් බාධාවක් ඇති නොවෙයි කියා මම විශ්වාස කරනවා. අපි ගෙවන මුදලට අපට බස් ටික ලබා දෙන්න කියලාත් මේ අවස්ථාවේදී මම ඉල්ලා සිටිනවා.

**ගරු දිලුම් අමුණුගම මහතා**
(மாண்புமிகு திலும் அமுணுகம)
(The Hon. Dilum Amunugama)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් දන්නවා, වර්තමානයේ බස් රථ හිඟයක් තිබෙනවා වාගේම මම දැන් කියපු ආකාරයට රියැදුරු හා කොන්දොස්තර තනතුරුවලත් පුරප්පාඩු තිබෙන බව. එතකොට රියැදුරෙක් නැහැ කියන්නේ, බසයක් ධාවනය වන්නේ නැහැ කියන එකයි. ඒ නිසා අපි ප්‍රථමයෙන්ම මේ පුරප්පාඩු සම්පූර්ණ කරන්න මුදල් අමාත්‍යාංශයෙන් අවසර ඉල්ලා තිබෙනවා. ඒ පුරප්පාඩු සම්පූර්ණ කළාම තත්ත්වය තිබුණාට වඩා හොඳ අතට හැරෙනවා. නව බස් රථ 500 ගෙනාවාම ඒ සියල්ලම අපි යොදවන්න බලාපොරොත්තු වන්නේ දුර ගමන් සේවා සඳහා නොවෙයි, ග්‍රාමීය සේවා සඳහා. අපි නියම කර තිබෙන ගාස්තුව ඔබතුමන්ලා ගෙවනවා නම්, අපි බස් රථ ලබා දෙනවා. එහි ප්‍රශ්නයක් නැහැ. එතකොට අපට ඇත්තටම බලාගන්න පුළුවන්, ඔබතුමන්ලාගේ උද්ඝෝෂණයට කොච්චර පිරිසක් සහභාගි වෙලා ඉන්නවාද කියලා. බස් රථ ලබා දීමේ කටයුත්තේදී අපේ උපරිම සහයෝගය ලබා දෙනවා.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමාගෙන් මටත් ප්‍රශ්නයක් අහන්න තිබෙනවා. අද කාන්තා දිනය නේ. ඒ නිසා මට පොඩි චාන්ස් එකක් දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමියගේ ප්‍රශ්නය මොකක්ද?

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ගරු ඇමතිතුමනි, පසුගිය යහ පාලන ආණ්ඩුව කාලයේ මාතලේට කොළඹින් දුම්රියක් ධාවනය වුණා. ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමාට කියලා අපි ඒ කටයුත්ත බොහොම අමාරුවෙන් කර ගත්තේ. සවස 6.20ට කොළඹට එන්නත්, කොළඹින් 2.30ට පිටත් වෙන විධියටත් තමයි ඒ දුම්රිය යොදවා තිබුණේ. නමුත්, පසුගිය කාලයේදී ඒ දුම්රිය ධාවනය කිරීම නවත්වා තිබෙනවා. ගරු ඇමතිතුමනි, මේ සම්බන්ධයෙන් මම ඔබතුමාට යෝජනාවක් කරන්න කැමැතියි. දැනට කොළඹින් සවස 5.30ට නුවරට දුම්රියක් පිටත් වෙනවා. ඒ දුම්රිය කෙළින්ම මාතලේට යවා මාතලෙන් පාන්දර 3.00ට පිටත්වන්න සලස්වා දෙනවා නම් හොඳයි. ඔබතුමාත් දන්නවා ඇති, පසුගිය කාලයේදී මේ මාර්ගයේ ධාවනය කළ දුම්රිය දෙකෙන් ලොකු ආදායමක් ලැබුණු බව. ඒ නිසා මම ඔබතුමාට යෝජනා කරනවා, පාන්දර 3.00ට මාතලෙන් පිටත් වෙන්න දුම්රියක් ලබා දෙන්න කියලා.

ගරු ඇමතිතුමනි, තවත් කාරණයක් තිබෙනවා කියන්න. මාතලේ දිස්ත්‍රික්කය කියන්නේ සංචාරක පුරවරයක්. විශේෂයෙන්ම නකල්ස් කඳුවැටිය පැත්ත, දඹුල්ල, සීගිරිය ප්‍රදේශ හරහා ගමන් කරන විධියට විශේෂ දුම්රියක් යොදවා, ඉන් පසු ඒ stationsවල ඉඳලා යන විධියට city tours වාගේ බස් රථ

[ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය]

යෙදවීමේ ක්‍රමවේදයක් සකස් කරනවා නම්, ඔබතුමන්ලාට ඒකෙන් හොඳ ආදායමක් ලබා ගන්නත් පුළුවන් වෙයි කියා මම හිතනවා. ගරු ඇමතිතුමනි, මේ වෙනකොට දඹුල්ල, සීගිරිය ප්‍රදේශවල සංචාරක ව්‍යාපාරයේ යෙදුණු ජනතාවත් ලොකු අපහසුතාවකට පත් වෙලා ඉන්න නිසා ඒ පිළිබඳවත් මම ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි.

**ගරු දිලුම් අමුණුගම මහතා**
(மாண்புமிகு திலும் அமுணுகம)
(The Hon. Dilum Amunugama)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියගේ යෝජනාව හොඳයි. නමුත්, අපට තව සති දෙකක විතර කාලයකින් පසු මාතලේට නුවර පැත්තෙන් ධාවනය කරන දුම්රිය සම්පූර්ණයෙන්ම නතර කරන්න වෙනවා. මොකද, මහයියාවේ නව බිංගෙය ඉදිකරන නිසා. එම කටයුත්ත සඳහා ඒ මාර්ගයේ දුම්රිය ධාවනය මාස තුන හතරකට විසන්ධි කරන්න සිදු වෙනවා. හැබැයි, කටුගස්තොට දක්වා විතරක් ඒ මාර්ගයේ දුම්රිය ධාවනය කෙරෙනවා. ඊට පසු අපි ඒ ගමන් වාරය ඔබතුමිය කියන ප්‍රදේශයට යොදවන්නම්.

ඊළඟට, ඔබතුමිය කියපු අනෙක් කාරණයටත් මම පිළිතුරක් දෙන්න ඕනෑ. අපි මේ වෙනකොටත් දුම්රිය සේවයේ සංචාරක ප්‍රවර්ධන අංශයක් වෙනමම ආරම්භ කර තිබෙනවා. මගීන් ප්‍රවාහනය කිරීමට සාමාන්‍ය දුම්රිය ධාවනය කරන අතර, සංචාරකයන්ගෙන් විදේශ විනිමය ඉපැයීමට මේ වෙනකොට අපි නව වැඩ පිළිවෙළක් ආරම්භ කර තිබෙනවා. ඒ අනුව, අපි නව දුම්රියක් මහනුවර සිට ඇල්ල ප්‍රදේශයට ධාවනය කරන්න අවශ්‍ය කටයුතු සකස් කළා. හබරණ දක්වා දුම්රිය මාර්ගය දීර්ඝ කරන නිසා මහයියාවේ නව බිං ගෙය ඉදිකිරීමේ කටයුතු අවසන් වුණාම ඔබතුමියගේ එම ඉල්ලීමත් අපි ඉටු කර දෙන්නම්.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ගරු ඇමතිතුමනි, ඒ සඳහා කොපමණ කාලයක් ගත වෙයිද?

**ගරු දිලුම් අමුණුගම මහතා**
(மாண்புமிகு திலும் அமுணுகம)
(The Hon. Dilum Amunugama)
මාස හයක විතර කාලයක් ගත වෙනවා.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
එම කටයුතු ආරම්භ කරන්නේ කවදාද?

**ගරු දිලුම් අමුණුගම මහතා**
(மாண்புமிகு திலும் அமுணுகம)
(The Hon. Dilum Amunugama)
තව මාසයකින් විතර ආරම්භ කරන්න පුළුවන් වෙයි.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ගරු ඇමතිතුමනි, මට තව ප්‍රශ්නයක් විසඳා ගන්න තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමිය ප්‍රශ්න ඇහුවා නේ. ඔබතුමියට තව මොනවාද විසඳා ගන්න තිබෙන්නේ?

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ගරු කථානායකතුමනි, අද අපේ කාන්තාවන්ට වෙන් වූ දවසක්.

ගරු ඇමතිතුමනි, තව ඉල්ලීමක් තිබෙනවා. ඒ කටයුත්තට මාස හයක්ම ගතවේවිද? මම හිතුවේ, 15වැනි දා පාන්දර train එකෙන් අපට කොළඹ එන්න පුළුවන් වෙයි කියලා. එහෙම නම් අපට බස් ටිකක්වත් දාලා දෙන්න, මාතලේ ඉඳන් එන්න.

**ගරු දිලුම් අමුණුගම මහතා**
(மாண்புமிகு திலும் அமுணுகம)
(The Hon. Dilum Amunugama)
අපි බස් දෙන්නම්. මේ වැඩ අවසන් වුණාට පස්සේ ඔබතුමිය නුවර ඉඳන් කොළඹට දුම්රියෙන් එන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

ප්‍රශ්න අංක 8 -1313/2022- (1), ගරු මොහමඩ් මුසම්මිල් මහතා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, ගරු මොහමඩ් මුසම්මිල් මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු එස්.බී. දිසානායක මහතා (කර්මාන්ත අමාත්‍යතුමා)**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க - கைத்தொழில் அமைச்சர்)
(The Hon. S.B. Dissanayake - Minister of Industries)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මම සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න. ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### කාන්තාවන් මුහුණ දී ඇති ගැටලු
### பெண்கள் முகங்கொடுக்கும் பிரச்சினைகள்
### ISSUES FACED BY WOMEN

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මෙම ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු කථානායකතුමනි, අද -මාර්තු මස 8- ජාත්‍යන්තර කාන්තා දිනයයි. මෙවර කාන්තා දින ලෝක තේමාව වන්නේ, "තිරසර හෙට දිනයක් වෙනුවෙන් අද දින සුරකින ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව"යන්නයි. ගෝලීය දේශගුණික විපර්යාසයන්ගෙන් පීඩා විඳින කණ්ඩායමට මුලින්ම අයත් වන්නේ කාන්තාවන් බවත්, එයින් අත් මිදීමට ඔවුන් ගන්නා ප්‍රයත්න අගය කිරීම හා පිළිගැනීමත් එම තේමාවේ පසුබිමයි.

ලෝකයේ දරිද්‍රතාවෙන් පෙළෙන බිලියන 1.3ක ජනතාවගෙන් සියයට 70ක් කාන්තාවෝය. එමෙන්ම, ඉතා දිළිඳු නාගරික කුටුම්භවලින් සියයට 40ක් ම කාන්තා මූලික කුටුම්භයි. එක්සත් ජාතීන්ගේ දර්ශකවලට අනුව, ලෝක ආහාර නිෂ්පාදනයට කාන්තා දායකත්වය සියයට 50ත්, 80ත් අතර වුව ද, භෝග නිෂ්පාදනයට යොදනු ලබන ඉඩම්වල කාන්තා අයිතිය සියයට 10කටත් අඩු වෙනවා.

ගෝලීය තත්ත්වයන් තුළ තිරසර සංවර්ධනයක් සඳහා කාන්තාවන් සවිබල ගන්වන අවස්ථාවක නිසි පෝෂණය, අධ්‍යාපනය සහ ආරක්ෂාව යන මූලික අවශ්‍යතා හෝ සපුරාගත නොහැකි තත්ත්වයකට අද අප රටේ කාන්තාව පත්ව තිබෙනවා. ලෝක ආහාර වැඩ පිළිවෙළේ මෑතක නිකුත් වූ ජාතික පෝෂණ වාර්තාවට අනුව, ශ්‍රී ලංකාවේ ඉපදෙන දරුවන් පහකට එක් දරුවෙක් නොමේරූ දරුවන් ය. ගරු කථානායකතුමනි, මවගේ පෝෂණ ඌනතාව සහ නොදැනුවත් බව බොහෝ විට මීට හේතු වී තිබෙනවා. එමෙන්ම, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි - Institute of Policy Studies - පර්යේෂණවලට අනුව, කොවිඩ් වසංගතයට පෙර දිළිඳු පවුල්වල වයස අවුරුදු 17 - 18 අතර ගැහැනු දරුවන්ගේ පාසල් හැරයෑම සියයට 53.9ක් වෙනවා. නිදහස් අධ්‍යාපනය හිමි රටක මෙය ඉතාම ඛේදනීය තත්ත්වයක්. එපමණක් නොව, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව 2019දී කරන ලද කාන්තාවන්ගේ යහ පැවැත්ම සම්බන්ධ සමීක්ෂණ වාර්තාවට අනුව සියයට 52ක් වන ශ්‍රී ලාංකික කාන්තා පරපුරෙන් සෑම කාන්තාවන් පස් දෙනෙකුගෙන් එක් අයෙක් යම් ප්‍රචණ්ඩත්වයකට, හිංසනයකට ලක් වී තිබෙනවා. එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදලේ වාර්තාවට අනුව, කොවිඩ් වසංගත කාලය තුළ මෙම තත්ත්වය තවදුරටත් ඉහළ ගොස් තිබෙනවා.

රට තුළ ඇති අධික උද්ධමනය, ආහාර ඇතුළු අනිකුත් මූලික භාණ්ඩ හා සේවාවල හිඟකම සහ ආර්ථික බංකොලොත්භාවය යන කරුණුවලින් ඍජුවම බැට කෑමට ලක්ව ඇති ලංකාවේ කාන්තාවන් සහ ගැහැනු දරුවන් තමන්ගේ මෙන්ම තම පවුල් ඒකකයන්ගේත් වර්තමාන පැවැත්ම හා අනාගත අභිවෘද්ධිය පිළිබඳව පූර්ණ අවිනිශ්චිත තත්ත්වයකට මේ වන විට පත්ව තිබෙනවා.

ඒ අනුව, මෙය ජාතික වැදගත්කමකින් යුතු ගැටලුවක් වශයෙන් සලකා පහත සඳහන් ප්‍රශ්නවලට නිශ්චිත පිළිතුරු හා පැහැදිලි කිරීම් රජයෙන් බලාපොරොත්තු වෙනවා.

1) පවුලක පෝෂණය, සමබර ආහාර වේලක් සැපයීම හා සෞඛ්‍ය යන සෑම කාර්යයක්ම පැවරී ඇත්තේ කාන්තාවන්ගේ හිස මතය. සිය අවශ්‍යතා මෙන්ම සිය පවුලේ පෝෂණ සහ සෞඛ්‍ය අවශ්‍යතා සපුරාලීමට කිරි පිටි, ලාම්පු තෙල්, ගෑස් හා ඖෂධ පෝලිම්වල සිටීමට කාන්තාවන්ට අද සිදුව තිබෙනවා. මේ නිසා කාන්තාව ආර්ථික, ශාරීරික හා මානසික වධහිංසාවලට ලක්වන බව රජය පිළිගන්නේ ද? සිය පවුල පෝෂණය කිරීමට කෙතරම් කාලයක් කාන්තාවන්ට පෝලිම්වල දුක් විඳීමට සිදුවේ ද? මෙම පීඩාකාරී බව නවතාලීමට රජය ගෙන ඇති පියවර කවරේ ද?

2) ගැබිනි මව්වරුන්ගේ පෝෂණ තත්ත්වය නඟා සිටුවීමට හා නොමේරූ දරුවන් බිහි කිරීමේ ප්‍රවණතාව අඩු කිරීම සඳහා සුවිශේෂී වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතු බව රජය පිළිගන්නේ ද? එසේ නම්, එම වැඩ පිළිවෙළ කුමක් ද? වයස අවුරුදු 1-5ත් අතර දරුවන්ගේ පෝෂණ තත්ත්වය නංවාලීමට රජය ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේ ද?

ගරු කථානායකතුමනි, අඩු බර දරුවන්, අඩු උපත් බර දරුවන් වාගේම නීරක්තිය, රක්තහීනතාවය, ක්ෂය වීම, කුරු වීම, මිටි වීම, ශරීර ස්කන්ධ දර්ශකය අඩු වීම යනාදී දර්ශක දිහා බැලුවත් අපේ රටේ තිබෙන්නේ ඉතා ශෝකජනක, ඛේදනීය තත්ත්වයක් කියලා ඔබතුමා හොඳින් දන්නවා.

3) දිළිඳු පවුල්වල ගැහැණු ළමයින්ට අධ්‍යාපනය අහිමිවීම මෙන්ම කොවිඩ් වසංගතයත් සමඟ සමස්ත දරු පරපුරේම අධ්‍යාපන කටයුතු අඩපණ වීමේ මානසික පීඩනය වැඩිපුරම බලපෑවේ මව්වරුන්ටයි. දිළිඳු පවුල්වල ගැහැණු දරුවන් බොහෝ විට අධ්‍යාපනයෙන් දුරස්ව ඇති බව රජය පිළිගන්නේ ද? මේ පිළිබඳව විමර්ශනය කොට මෙම දරුවන් නිසි අධ්‍යාපනයක් ලැබීම සඳහා පාසල් වෙත යොමු කිරීමේ වැඩ පිළිවෙළක් රජය සතුවේ ද? ඒ කුමක් ද?

4) මෙරට කාන්තාව ස්වයං රැකියා, කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත, ග්‍රාමීය කෘෂි කර්මාන්තයට ඍජුව ව්‍යවසායකත්වය සහ ශ්‍රම දායකත්වය දක්වයි. කොවිඩ් වසංගතය, විදේශ විනිමය හිඟකම සහ අවිද්‍යාත්මක කාබනික නාඩගම හමුවේ මෙම ජීවනෝපායන්ගේ බිඳ වැටීම කාන්තාවන්ගේ ආදායම් අහිමිවීමටත්, විරැකියාව ඇතිවීමටත් හේතු වී තිබෙනවා. මෙම කර්මාන්ත බිඳ වැටීම නිසා ආදායම් සහ රැකියා අහිමි වූ කාන්තාවන් සඳහා යම් සහනයක් ලබා දීමට සුවිශේෂී වැඩ පිළිවෙළක් රජය සතුවේ ද? ඒ කුමක් ද?

5) පසුගිය වසර දෙක තුළ ගෘහස්ථ හිංසනය සම්බන්ධ සිදුවීම් කොපමණ වාර්තා වී තිබේද? ගෘහස්ථ හිංසනය නිසා සිදු වූ මරණ කීයක් ඒ අතර වීද? කොවිඩ් තත්ත්වය හමුවේ මෙම සිදුවීම්වල වර්ධනයක් සිදුව ඇති බව රජය පිළිගන්නේ ද? ගෘහස්ථ හිංසනය වැළැක්වීම සඳහා පශ්චාත් වෘත්තීය මානසික හේතු නිසා ගෘහස්ථ හිංසනය සිදු කරන පුද්ගලයන් පුනරුත්ථාපනයට, හිංසනයට ලක්වූ කාන්තාවන් රැකවරණයට ආරක්ෂිත නිවාස ඇති කිරීම හා තොරතුරු ලද වහාම මේ සම්බන්ධ නීතිය නොපමාව බලාත්මක කිරීම වැනි ප්‍රතිකර්ම ගැනීමට රජය තවමත් ප්‍රමාද ඇයි? නොඑසේනම්, මෙම තත්ත්වය වැළැක්වීමට හා පාලනයට ගෙන ඇති විකල්ප ක්‍රියාමාර්ග මොනවා ද?

6) පසුගිය කාලවකවානුවේ දී සිදුවූ ගෘහස්ථ ගෑස් සිලින්ඩර ආශ්‍රිත පිපිරීම් නිසා ශාරීරිකව මෙන්ම මානසිකව වැඩි වශයෙන්ම පීඩාවට පත් වූයේ කාන්තාවන් බව රජය පිළිගන්නේ ද? එසේ නම්, මොවුන් සඳහා වන්දි ලබාදීමට නිශ්චිත මැදිහත් වීමක් රජය විසින් සිදු කර තිබේ ද? මේ වනවිට ඒ සඳහා ක්‍රියාත්මක වන වැඩ පිළිවෙළේ ප්‍රගතිය කුමක් ද?

[ගරු සජිත් ප්‍රේමදාස මහතා ]

ගරු කථානායකතුමනි, අප විසින් ජනාධිපතිවරණයේදීත්, මහ මැතිවරණයේදීත් ඉදිරිපත් කරන ලද කාන්තා අයිතීන් සුරක්ෂා කිරීමේ ප්‍රඥප්තිය මේ අවස්ථාවේදී මම **සභාගත*** කරනවා.

වර්තමාන රජයෙන් මා ඉල්ලීමක් කරනවා. කරුණාකර ඒ යෝජනා දිහා බලා ඒවා ක්‍රියාත්මක කරන්නට කටයුතු කරන්න.

ඒ විතරක් නොවෙයි. මැතිවරණ ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීමක් ගැන මේ මොහොතේ සාකච්ඡා වනවා. ඇත්ත වශයෙන්ම පසුගිය කාලයේ සියයට 25ක අනිවාර්ය කාන්තා මන්ත්‍රී නියෝජනත්වයක් ලබාදීම එවකට හිටපු අපේ රජය කළ හොඳ, ප්‍රශස්ත ක්‍රියාවක් හැටියට අපි පිළිගන්නවා. එය එලෙසම පවත්වාගෙන යන්නට කටයුතු කරන්න කියාත් මේ අවස්ථාවේදී මා මතක් කරනවා.

ගරු කථානායකතුමනි, අවසාන වශයෙන්, කාන්තා කටයුතු අමාත්‍යාංශය ආරම්භයේ සිට කළ කටයුතු, එහි ඉතිහාසය සඳහන් ලේඛනයක් මා **සභාගත*** කරනවා.

ඒ ඉතිහාසය ගැන බලන විට අද කාන්තා කටයුතු අමාත්‍යාංශයට ලැබී තිබෙන්නේ කුඩම්මාගේ සැලකිල්ලක්. අද ඒ විෂයය සඳහා කැබිනට් අමාත්‍යවරයෙක් නැහැ; කැබිනට් අමාත්‍යාංශයක් නැහැ. රාජ්‍ය අමාත්‍යාංශයක් යටතේයි ඒ විෂයය තිබෙන්නේ. ඒ යටතේ තමයි මේ විෂයය ගැසට් කරලා තිබෙන්නේ. ජාත්‍යන්තර කාන්තා දිනය සමරන අද දවසේ මම බොහොම කාරුණිකව යෝජනා කරනවා, කාන්තා කටයුතු සඳහා වෙනම ම කැබිනට් අමාත්‍යාංශයක් පත් කරලා, ඒ සඳහා සුදුසු කුසලතාව, නිපුණතාව, දක්ෂතාව තිබෙන කාන්තාවක් රාජ්‍ය පාර්ශ්වයෙන් පත් කරන්න කටයුතු කරන්න කියලා.

ස්තුතියි.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා (මහාමාර්ග අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து - நெடுஞ்சாலைகள் அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Johnston Fernando - Minister of Highways and Chief Government Whip)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27 (2) යටතේ ගරු විපක්ෂ නායකතුමා ඉදිරිපත් කළ ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම ඉදිරියේදී සිදු කරනවා. විශේෂයෙන්ම ලෝක කාන්තා දිනය නිමිත්තෙන් පවත්වනු ලබන උත්සවයට කැබිනට් ඇමතිතුමාත්, අනික් සියලුදෙනාත් සහභාගි වෙනවා. විපක්ෂ නායකතුමා අවසාන වශයෙන් කිව්වා, කාන්තා කටයුතු සම්බන්ධයෙන් රාජ්‍ය ඇමතිවරයකු තමයි පත් කරලා තිබෙන්නේ කියලා. හැබැයි, අපේ ජනාධිපතිතුමාගේ ප්‍රතිපත්තිය අනුව ඒ ඒ අමාත්‍යාංශවලට සහ අනිකුත් රාජ්‍ය අමාත්‍යවරුන්ට අයිති විෂයයන් ගැසට් කරලා ලබා දීලා තිබෙනවා. දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමාගේ අමාත්‍යාංශය යටතේයි මේ විෂයය තිබෙන්නේ. ඒ රාජ්‍ය ඇමතිතුමා යටතේ මේ විෂයය ගැසට් කරලා තිබෙනවා. ඇමතිතුමා ඇවිල්ලා මේ ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙයි.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

# II

## පැන්ඩෝරා පත්‍රිකා පිළිබඳ විමර්ශනවල ප්‍රගතිය
## "பெண்டோரா பேப்பர்ஸ்" பற்றிய விசாரணையின் முன்னேற்றம்
## PROGRESS OF INVESTIGATIONS INTO PANDORA PAPERS

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)

ගරු කථානායකතුමනි, මෙම ප්‍රකාශය කිරීමට අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

ආන්දෝලනයට තුඩු දුන් පැන්ඩෝරා පත්‍රිකා මඟින් අනාවරණ වූ ශ්‍රී ලාංකිකයන් සම්බන්ධව මෙරටදී ආරම්භ කරන ලද විමර්ශනවල ප්‍රගතිය ජනතාවට දැන ගන්නට නොලැබීම පිළිබඳව ගැටලුසහගත තත්ත්වයක් තිබෙනවා.

ගරු කථානායකතුමනි, අපට විශාල ඩොලර් හිඟයක් තිබෙන වෙලාවක, අත්‍යවශ්‍ය භාණ්ඩ ගෙන්වා ගැනීමටත් නොහැකිව තිබෙන වෙලාවක අපේ රටේ මහ ජනයාගේ ධනය විශාල ප්‍රමාණයක් ඉතා කුඩා වළල්ලක් අතට කේන්ද්‍රගතවෙලා තිබෙනවා. ඒ පිළිබඳව ඉතා පැහැදිලිව හෙළිදරව් වූ අවස්ථා ගණනාවක් තිබුණත්, අවසාන වශයෙන් මෑතකදී එයාර් ලංකා බස් ගනුදෙනුව පිළිබඳව ලන්ඩන්වලදී කරන ලද පරීක්ෂණයකින් තොරතුරු හෙළිදරව් වුණු බව ඔබතුමා දන්නවා, ගරු කථානායකතුමනි. ඒ වාගේම ඇමෙරිකාවේ රහස් ඔත්තු සේවා නිලධාරියකු පිළිබඳව කරන පරීක්ෂණයේදීත් අපේ රටේ මුදල් විශාල ප්‍රමාණයක් එම නිලධාරින්ට ලබා දුන් බව හෙළිදරව් වුණා. මෑත කාලයේදී සිද්ධ වුණු නැවත හෙළිදරව් වීම තමයි, මේ Pandora Papers හරහා සිදු වුණේ. අපේ රටේ මහ ජනයාගේ ධනය ඉතා කුඩා පිරිසක් -අතළොස්සක් - අතේ විශාල වශයෙන් ගොඩගැහිලා තිබෙනවා. වැදගත් කරුණක් තමයි පැන්ඩෝරා පත්‍රිකා හරහා එළියට ආවේ. ඒ නිසා මේ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් කිරීම වැදගත් කියලා අපි කල්පනා කළා.

පසුගිය 2021 වසරේ ඔක්තෝබර් 03වැනි දා ගවේෂණශීලී මාධ්‍යවේදීන්ගේ ජාත්‍යන්තර සාමූහිකය නම් සංවිධානයක් විසින් ලෝකයේ රටවල් 35ක හිටපු ජනාධිපතිවරුන්, අගමැතිවරුන් මෙන්ම ඇමතිවරුන්, විනිසුරුවරුන්, නගරාධිපතිවරුන් ඇතුළු රාජ්‍ය නිලධාරින් 400කට වැඩි ප්‍රමාණයකගේ අයථා වත්කම් උපයා ගැනීම්වලට අදාළ වාර්තාවක් එළිදක්වා තිබුණා. එම සංවිධානය ප්‍රකාශ කර තිබුණේ ඔවුන් විසින් රහසිගතව සිදු කරන ලද විමර්ශනයකින් අනතුරුව සත්‍යතාව තහවුරු කර ගත හැකි වූ සිදුවීම් ඇසුරෙන් මෙම වාර්තාව එළිදක්වන ලද බවයි.

පැන්ඩෝරා පත්‍රිකා නමින් ප්‍රසිද්ධ වූ මෙම ලියවිලි මඟින් ශ්‍රී ලංකාවේ හිටපු නියෝජ්‍ය අමාත්‍යවරියක වූ නිරුපමා රාජපක්ෂ හා ඇයගේ සැමියා වූ තිරු නඩේසන්ට අදාළ අනාවරණයක්ද සිදු කර තිබුණා. ඒ අනුව ඔවුන් දෙදෙනා ලේඛනවල පමණක් සඳහන් ව්‍යාජ සමාගමක් මඟින් අතිවිශාල ධනයක් හසුරුවා ඇති බවත්, ලන්ඩන් හා සිඩ්නි නගරවල සුඛෝපභෝගී නිවාස මිලදී ගෙන ඇති බවත් සඳහන් වුණා.

නීතියෙන් සැඟවීමේ හැකියාව ඇති විදේශ රටවල ව්‍යාජ සමාගම් හා භාර මඟින් ලංකාවේ ආණ්ඩුව සමඟ ගනුදෙනු කරන සමාගම්වල උපදේශක කොන්ත්‍රාත් ලබාගෙන ඇති බවත්, එම භාර මඟින් උපයන මුදල්වලින් වටිනා කලා නිර්මාණ මිලදී ගෙන ඇති බවත් අනාවරණ වී තිබුණා. තිරු නඩේසන්ගේ දීර්ඝ කාලීන ගණකාධිකරණ ආයතනය වන සිංගප්පූරුවේ ඒෂියාසිටි ට්‍රස්ට්

සමාගමේ රහසිගත විද්‍යුත් ලිපි අනුව ඔහුගේ සමස්ත ධනය ඩොලර් මිලියන 160කට වැඩි බවද ඔවුන් විසින් ගණන් බලා තිබුණා. ගරු කථානායකතුමනි, එතකොට ඒක තමයි පැහැදිලි හෙළිදරව්ව. පසුගිය කාලයේ ජාත්‍යන්තරය යම් ගනුදෙනු පිළිබඳ පරීක්ෂණයක් සිදු කළා. ඒ පරීක්ෂණයේදී කවර හෝ කෙනෙක් ලංකාවෙන් හෙළිදරව් වෙන්න පටන්ගත්තා. එසේම පසුගිය ආණ්ඩුවල ප්‍රබල රාජ්‍ය නිලධාරියෙකු වූ, දැනට බ්‍රිතාන්‍යයේ වාසය කරන රාමලිංගම් පාස්කරලිංගම්ට අදාළව අයථා උපයා ගැනීම් ඔහු විසින් බ්‍රිටිෂ් වර්ජින් දූපත්වල පිහිටුවා වන ලද සමාගම් හා භාර මඟින් විවිධ ආයෝජන සිදු කර ඇති බවටත්, බ්‍රිතාන්‍යයේ දේපොළ මිලදී ගැනීම් සිදු කර ඇති බවටත් පැන්ඩෝරා පත්‍රිකාවල අනාවරණ කර තිබුණා. මේ අනාවරණ පිළිබඳව සමාජයේ ඇති වූ පුළුල් සංවාදය නිසා මෙන්ම, නිරුපමා රාජපක්ෂ හිටපු නියෝජ්‍ය අමාත්‍යවරිය වත්මන් ආණ්ඩුවේ ප්‍රධානීන් සමඟ සමීප ඥාති සබඳතාවක් තිබීම හේතුවෙන්,- *[බාධා කිරීමක්]*

විශේෂයෙන්ම ජනාධිපතිවරයා, අගමැතිවරයා, මුදල් අමාත්‍යවරයා, තරුණ හා ක්‍රීඩා අමාත්‍ය, සංවර්ධන සම්බන්ධීකරණ සහ අධීක්ෂණ අමාත්‍ය සහ ඩිජිටල් තාක්ෂණ හා ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා, වාරිමාර්ග අමාත්‍ය, රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍ය සහ ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා, කාබනික පොහොර නිෂ්පාදන, ප්‍රවර්ධන හා සැපයුම් නියාමන සහ වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවලු, පලතුරු, මිරිස්, ලූනු හා අර්තාපල් වගා ප්‍රවර්ධන, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා යනාදී වර්තමානයේ පාලනය හොබවන කණ්ඩායමේ ඉතාම සමීප ඥාතිවරියක් සහ ඥාතියෙක්. ඒ නිසාම මේ පිළිබඳව කුතුහලය, සැකය වර්ධනය වෙනවා. ජනාධිපතිවරයා වෙනුවෙන් ජනාධිපතිවරයාගේ නීති අධ්‍යක්ෂ ජනරාල්වරයා එම අනාවරණයෙන් දින 03කට පසුව ඔක්තෝබර් 06වෙනි දා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉල්ලීමක් කර මාසයක් ඇතුළත ඒ පිළිබඳ වාර්තාවක් ලබා දෙන ලෙස ජනාධිපතිවරයා නියෝග කර ඇතැයි ප්‍රකාශ කළ බව මාධ්‍ය වාර්තා කළා.

වැදගත් දේ ඒකයි, ගරු කථානායකතුමනි. ඒ උණුසුම ආපු වෙලාවේම ජනාධිපතිවරයා විසින් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට කිව්වා මාසයක් ඇතුළත මේ පිළිබඳව වාර්තාවක් ලබා දෙන්න කියලා. ඒ ඔක්තෝබර් 03වන දා. එතකොට මාසයක් සම්පූර්ණ වෙනවා නොවැම්බර් 03වන දාට. දෙසැම්බර්, ජනවාරි, පෙබරවාරි පහු වෙලා දැන් මාර්තු. ඒ කියන්නේ ඒ දින වකවානු පහුවෙලා මාස හතරකටත් වැඩි කාලයක් ගත වී තිබෙනවා. ගරු කථානායකතුමනි, ඒ නිසා අපේ රටේ ජනතාවට පොදු සාධාරණ සැකයක්, අදහසක් තිබෙනවා යම් සිදුවීමක් සිදු වුණාට පසුව කමිටු පත් කිරීම, පරීක්ෂණ ආයතනවලට යොමු කිරීම ප්‍රශ්නය කාලය විසින් යටපත් කර ගැනීමට දරන උත්සාහයක්ද කියලා. යම් සිදුවීමක් සිදු වූ වහාම කමිටු පත් කිරීම, කොමිෂන් පත් කිරීම, අදාළ ආයතනවලට යොමු කිරීම සුලබ දසුනක් බවට පත් වී තිබුණා. නමුත් අපි හැම දාමත් දැකලා තිබෙනවා ඒවා කාලය විසින් යටපත් කරලා තිබෙන බව.

කෙසේ වුවද, එවැනි විමර්ශනයක් සිදු වී අවසන් වූ බවට හෝ එහි වාර්තාවක් නිකුත් වූ බවට හෝ ඊට අනුකූල නෛතික ක්‍රියාවලියක් ආරම්භ වූ බවට මේ දක්වා දැනගන්නට නැහැ. විශේෂයෙන් මෙම අයථා ඉපයීම්වලට අදාළ පුද්ගලයින් ආණ්ඩුවේ නායකයින්ගේ සමීපතම ඥාතීන් වී ඇති අවස්ථාවක ආණ්ඩුවේ මෙම පරීක්ෂණ ක්‍රියාවලිය පිළිබඳව ජනතාව තුළත්, අප තුළත් තිබෙන්නේ බලවත් සැකයක්.

ඒ විතරක් නොවෙයි. මේ චූදිතයින්ගේ නම්වලට, මේ සඳහන් වූ අයගේ නම්වලට සමහර දේපොළ තිබුණා. අපි දන්නවා මල්වාන ඉඩමේ අයිතිකරු තිරු නඩේසන්. නමුත්, අධිකරණයේ නඩුවක් තිබෙනවා, එම නිවස අයිති වර්තමාන මුදල් අමාත්‍යවරයා වන බැසිල් රාජපක්ෂ මහතාටද කියලා. දැනට බැසිල් රාජපක්ෂ මහත්මයාට හිමිකම් තිබෙනවා යැයි කියන නිවසක ඉඩම තිබුණේද මෙම පුද්ගලයන්ගේ නමටයි. ගරු කථානායකතුමනි, එම නිසා රාජපක්ෂවරුන්ගේ මෙම සමීපතම ඥාතීන් හරහා ආණ්ඩුවේ සමහර බලධාරීන්ගේ දේපොළ සඟවා තැබුවාද කියන සැකය පවා තිබෙනවා.

මෙම තත්ත්වය තුළ මතුවන පහත ගැටලුවලට ගරු අමාත්‍යවරයා පිළිතුරු ලබා දෙනු ඇතැයි මා බලාපොරොත්තු වෙනවා.

01. පැන්ඩෝරා පත්‍රිකාවලින් සිදු කරන ලද අනාවරණ සම්බන්ධයෙන් රජයේ කවර හෝ ආයතනයක් මඟින් විධිමත් විමර්ශනයක් සිදු කරන ලද්දේද?

02. එසේ නම්, ඒ කවර ආයතනයක් විසින්ද? එයින් එම පැන්ඩෝරා අනාවරණ පිළිබඳව කුමන හෝ තහවුරු කර ගැනීම් සිදු කර ගෙන තිබේද?

03. පැන්ඩෝරා පත්‍රිකාවලින් සිදු වූ අනාවරණ පිළිබඳව කවර වූ හෝ නීතිමය ක්‍රියාමාර්ගයක් ආරම්භ වී තිබේද?

04. පැන්ඩෝරා පත්‍රිකාවලින් කරන ලද අනාවරණ සම්බන්ධව ආණ්ඩුවේ ස්ථාවරය කුමක්ද?

බෙහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නය අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත යොමු කළ පසු, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් ඒ සම්බන්ධයෙන් උත්තරයක් එවා තිබෙනවා. මම ඒක කියවන එක තමයි කරන්නේ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)
ඔබතුමා වගකීම භාර ගන්නවාද, ගරු ඇමතිතුමා?

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)
නැහැ, මම භාර ගන්නේ නැහැ. මම එය කියවන්නම්. එම ලිපියේ මෙසේ සඳහන් වෙනවා:

"ශීර්ෂගත කරුණට අදාළව එවා ඇති අංක MOJ/L12/Parliamentary Questions/2020(MISC) දරන 2022.03.07 දිනැති ලිපිය හා බැඳේ.

ඒ අනුව, ඉහත කී ලිපියෙන් වූ විමසුම්වලට අදාළව පහත වාර්තාව ඉදිරිපත් කරමි.

ජනාධිපති කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල් (නීති) නීතිඥ හරිගුප්ත රෝහණදීර මහතා විසින් මෙම කොමිෂන් සභාව වෙත එවා ඇති අංක PS/LAD/1/9/2021(III) දරන 2021.10.06 දිනැති ලිඛිත පැමිණිල්ල පාදකව අංක බීසී/1659/2021 දරන විමර්ශනය ආරම්භ කර ඇත. ඒ යටතේ, තිරුකුමාර් නඩේසන් මහතා සහ හිටපු ගරු නියෝජ්‍ය අමාත්‍ය නිරුපමා රාජපක්ෂ මහත්මිය සම්බන්ධයෙන් පැන්ඩෝරා පත්‍රිකාවල සඳහන් වන බවට ජනමාධ්‍යයන්හි පළ වූ තොරතුරු සම්බන්ධයෙන් විමර්ශනයක් ආරම්භ කර ඇත.

තවද, පැන්ඩෝරා පත්‍රිකාවල නම් සඳහන් වන තවත් ශ්‍රී ලාංකිකයෙකු වන හිටපු අග්‍රාමාත්‍ය උපදේශකවරයෙකු වන රාමලිංගම් පාස්කරලිංගම් මහතා සම්බන්ධයෙන් පසුව අවස්ථාවක විවිධ ජනමාධ්‍යයන්හි කරුණු පළ වී ඇති අතර, ඒ සම්බන්ධයෙන් විමර්ශනය සඳහා අංක බීසී/0073/2022 දරන විමර්ශනය ආරම්භ කර ඇත.

[ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා]

එමෙන්ම, පැන්ඩෝරා පත්‍රිකාවල සඳහන් වන බවට විවිධ ජනමාධ්‍යයන්හි පළ වී ඇති තොරතුරු පදනම් කරගනිමින් විවිධ තැනැත්තන් විසින් මෙම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද ලිඛිත පැමිණිලි පදනම්ව පහත සඳහන් ගොනු විවෘතව ඇත. පහත සඳහන් ගොනු සියල්ලෙහිම විෂයකරුවන් ලෙස දක්වා ඇත්තේ තිරුකුමාර් නඩේසන් මහතා සහ හිටපු ගරු නියෝජ්‍ය අමාත්‍ය නිරූපමා රාජපක්ෂ මහත්මිය සම්බන්ධයෙන් බවට නිරීක්ෂණය වේ. එම සෑම පැමිණිල්ලක් මඟින්ම ඉල්ලා ඇත්තේ පැන්ඩෝරා පත්‍රිකාවල ඇත්තේ තිරුකුමාර් නඩේසන් මහතා සහ හිටපු ගරු නියෝජ්‍ය අමාත්‍ය නිරූපමා රාජපක්ෂ මහත්මිය සම්බන්ධයෙන් සඳහන් කරුණු පිළිබඳව විමර්ශනය කරන ලෙසය. එනමුත්, පැන්ඩෝරා පත්‍රිකාවල සඳහන් වන බවට ජනමාධ්‍යයන්හි පළ වී ඇති තොරතුරු පමණක් එම සියලුම පැමිණිලි මඟින් ඉදිරිපත් කර ඇති බවට නිරීක්ෂණය වේ.

i. අංක බීසී/1678/2021 දරන ගොනුව:-

43 වන නීති ප්‍රතිසංස්කරණ ජාතික ව්‍යාපාරයේ සුජිත් දුමින්ද පීරිස් යන අය විසින් ඉදිරිපත් කර ඇති ලිඛිත පැමිණිල්ලක් පදනම්ව මෙම විමර්ශනය ආරම්භ කර ඇති නමුත්, ඔහු විසින් එම පැමිණිල්ල කර ඇත්තේ පැන්ඩෝරා පත්‍රිකාවලින් සිදු කරන ලද හෙළිදරව් කිරීම පදනම් කර ගනිමින් බවට විමර්ශනයේදී අනාවරණය වී ඇත.

ii. අංක බීසී/1679/2021 දරන ගොනුව:-

මෙම විමර්ශනයට පාදක වී ඇති ලිඛිත පැමිණිල්ල මෙම කොමිෂන් සභාව වෙත යොමු කර ඇත්තේ ජනතා නීතිඥයෝ නැමති සංවිධානය විසිනි.

iii. අංක බීසී/1680/2021 දරන ගොනුව:-

මෙම විමර්ශනයට පාදක වී ඇති ලිඛිත පැමිණිල්ල මෙම කොමිෂන් සභාව වෙත යොමු කර ඇත්තේ එක්සත් ජාතික ස්වයං රැකියා වෙළෙඳ ව්‍යාපාරිකයන්ගේ සමිතියේ ලේකම් එම්.එන්.එම්.ඉස්මත් යන අය විසිනි.

iv. අංක බීසී/1681/2021 (A) දරන ගොනුව:-

මෙම විමර්ශනය ආරම්භ කර ඇත්තේ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කිහිප දෙනෙකු විසින් 2021.10.06 දිනැතිව එවා ඇති ලිඛිත පැමිණිල්ලක් පදනම්ව බවට නිරීක්ෂණය වේ.

ඉහත කරුණු ඉදිරිපත් කරමින් උක්ත ලිපියෙහි සඳහන් වන අංක 01 සිට 03 දක්වා දක්වා වූ ප්‍රශ්න සඳහා පිළිතුරු සංක්ෂිප්තව පහතින් දක්වමි.

පැන්ඩෝරා පත්‍රිකාවලින් සිදු කරන ලද අනාවරණයන් සම්බන්ධයෙන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් ඉහත සඳහන් අයුරින් විමර්ශන සිදු කරන බැව් ප්‍රශ්න අංක 01 සහ 02 සඳහා පිළිතුරු ලෙස දන්වා සිටිමි.

තවද, ප්‍රශ්න අංක 03 සඳහා පිළිතුරු ලෙස මෙතෙක් ඉහත කී කිසිදු විමර්ශනයක් අවසන්ව නොමැති බවත්, එම විමර්ශන කටයුතු සිදු වෙමින් පවතින බවත් කාරුණිකව දන්වා සිටිමි.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නියමය පරිදි,

අධ්‍යක්ෂ ජනරාල්. "

ස්තුතියි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)

ගරු කථානායකතුමනි, මම හතරවැනි ප්‍රශ්නයකුත් අහලා තිබෙනවා. නමුත්, ඒකට පිළිතුරක් ලබා දුන්නේ නැහැ. ඔබතුමා ඉදිරිපත් කළේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් ඔබතුමාට හෝ ආණ්ඩුවට එවා තිබෙන පිළිතුර. එහෙම නේද, ගරු ඇමතිතුමනි?

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)

ඔව්.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)

ඊළඟට, මගේ ප්‍රධාන ප්‍රශ්නය වුණේ මේකයි, ගරු ඇමතිතුමා. ජනාධිපති කාර්යාලයේ නීති පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල්වරයා ඒ වෙලාවේ මාධ්‍යයට ප්‍රකාශයක් කර තිබුණා, ජනාධිපතිතුමාගේ නියෝගය පරිදි එතුමා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ඒ ඉල්ලීම යවන ලද බවත්, විශේෂයෙන්ම ජනාධිපතිතුමාට මාසයක් ඇතුළත වාර්තාවක් ලබා දිය යුතු බවත්. ඔක්තෝබර් 03වන දා තමයි මේ ප්‍රකාශය කරන්නේ.

එහෙම නම්, නොවැම්බර් 03වන දා වෙනකොට වාර්තාවක් ලැබිය යුතුයි. දැන් සිදු වෙලා තිබෙන්නේ කුමක්ද? ජනාධිපතිතුමා විසින් ලබා දී තිබෙන නියෝගය තමයි මාසයක් ඇතුළත වාර්තාවක් දෙන්න කියන එක. නමුත්, ඒක ලබා දීලා නැහැ. මේ නිසා අපට සාධාරණ සැකයක් ඇති වෙනවා, ගරු කථානායකතුමනි. ඒ වෙලාවේ සමාජයේ විශාල ආන්දෝලනයක් ඇති වුණාම, කඩිනමින් මෙම වාර්තාව ලබා දෙන්න කියලා ජනාධිපතිවරයා මතයක් සමාජගත කළා. නමුත් කාලය විසින් එය යට යන්න ඉඩ හැරියා. සාමාන්‍යයෙන් ජනාධිපතිතුමාගේ පසුවිපරම හොඳයි කියලා නේ හුඟක් අය කියන්නේ. මම දන්නේ නැහැ, මෙහෙම වුණේ මොකද කියලා. ඔක්තෝබර් මාසයේ 03වන දා සිට මාසයක් ගතවුණාම, නොවැම්බර් මාසයේ 03වැනි දාට වාර්තාව දෙන්න ඕනෑ. එහෙම නම් නොවැම්බර් මාසයේ 3වැනි දායින් පසුව දැන් මාස හතරකට වඩා වැඩි කාලයක් ගත වෙලා තිබෙනවා. ජනාධිපතිවරයා එක අවස්ථාවකදී හෝ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවෙන් අහලා තිබෙනවාද, "මා මාසයකින් ඉල්ලා සිටි වාර්තාව ලැබී නැහැ, කවදාද මට ලබා දෙන්නේ?" කියලා. මොකද, දැන් මාස හතරක් ගත වෙලා තිබෙනවා. ජනාධිපතිතුමා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවෙන් විසින් එවැනි ඉල්ලීමක් කර තිබේද කියලා මම දැන ගන්න කැමතියි.

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)

ගරු කථානායකතුමනි, ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු ඇමතිතුමා ඒකට පිළිතුරු දෙනවා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු කථානායකතුමනි, ඇත්තටම මේ ප්‍රශ්නය ඇහුවාම, මමත් ජනාධිපති ලේකම් කාර්යාලයෙන් මේ ගැන සොයා බැලුවා. ඇමතිතුමාට තමයි පිළිතුරු දෙන්න තිබුණේ.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ මතය තමයි මාසයකින් වාර්තාව ඉල්ලුවා නම්, දුන්නේ නැත්තේ ඇයි කියන එක. විපක්ෂයේ හිටපු මන්ත්‍රී, රන්ජන් රාමනායක මැතිතුමා ඉල්ලීමක් කරලා තිබෙනවා, සාක්ෂි ඉදිරිපත් කරන්න. ඊට පස්සේ සාක්ෂි ඉදිරිපත් කරන්න කල් ඉල්ලා තිබෙනවා. ඊළඟට, එතුමාගේ නීතිඥ මහත්මයාට කොවිඩ් හැදිලා කියා ලියුම් එවා තිබෙනවා ලු. දැනට දවස් තුනහතරකට කලින් තමයි එතුමාගේ දිවුරුම් පෙත්සම එවා තිබෙන්නේ. ඒ හින්දා තමයි පමා වෙලා තිබෙන්නේ. ඔබතුමා දන්නේ නැහැ, ඔබතුමා ඒ පැත්තේ නොවන හින්දා. ඒක තමයි වෙලා තිබෙන්නේ. ඒකයි පමා වෙලා තිබෙන්නේ. ජනාධිපතිතුමාගේ පසුවිපරම ඉතාම හොඳයි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)

ගරු කථානායකතුමනි, ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමා කියපු පරිදි, මේ පරීක්ෂණය පමා වෙලා තිබෙන්නේ රන්ජන්

රාමනායක හිටපු මන්ත්‍රීතුමාගේ කටඋත්තරය පමා වීම නිසායි. නමුත් දැන් දිවුරුම් ප්‍රකාශයකින් දැනුම් දීලා තිබෙනවා නේ. එහෙම නම් මම හිතන විධියට ලබන සතියේ මේක දැනගන්න පුළුවන් වෙයි.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ඔව්.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)
බොහොම හොඳයි. ඒ කියන්නේ, මේක ප්‍රමාද වී තිබෙන්නේ රන්ජන් රාමනායක මහත්මයාගේ කටඋත්තරය නිසා නම්, දැන් රන්ජන් රාමනායක හිටපු මන්ත්‍රීතුමා දිවුරුම් ප්‍රකාශයක් හරහා එම කරුණු ප්‍රකාශ කර තිබෙන බව ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා කියනවා. එහෙම නම් පමාවට හේතු අවසන් වී තිබෙනවා. ඒ නිසා ලබන සතියේ ඒ පිළිබඳ වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. එහෙම නේද?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු කථානායකතුමනි, අනුර දිසානායක මැතිතුමා පැටලෙන්න යන්නේ නැහැ. ඒ ගැන මම එතුමාට ස්තුතිවන්ත වෙනවා. මම හිතන විධියට එතුමා මේ කරුණු දැනගෙන හිටියේ නැහැ. මේ ප්‍රශ්නය ආවාම මමත් ඊයේ මේ ගැන හෙව්වා. වාර්තාව ලබා දෙන ලෙස ජනාධිපතිතුමා නියෝග කර තිබුණත්, අර පමාව වෙලා තිබෙනවා. කොවිඩ් හැදිලා කියලා සති ගණන් කල් අරගෙන තිබෙනවා. ඒක කරන්නේ නැතිව හිටියා නම් කියයි, තිබුණු සාක්ෂි වසන් කරලා වාර්තා එව්වා කියලා. වාර්තාව එව්වාට පස්සේ බලමු, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අමාත්‍යාංශ නිවේදන, ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන ඇමතිතුමා. ගරු ඇමතිතුමා, කෙටියෙන් කියලා අවසන් කරන්න.

## මියන්මාරයෙන් සහල් ආනයනය කිරීම පිළිබඳ මාධ්‍ය වාර්තා: වෙළෙඳ අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## மியன்மாரிலிருந்து அரிசி இறக்குமதி செய்வது பற்றிய ஊடக அறிக்கைகள்: வர்த்தக அமைச்சரினது கூற்று
## MEDIA REPORTS ON IMPORT OF RICE FROM MYANMAR: STATEMENT BY MINISTER OF TRADE

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා (වෙළෙඳ අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன - வர்த்தக அமைச்சர்)
(The Hon. (Dr.) Bandula Gunawardana - Minister of Trade)
ගරු කථානායකතුමනි, මියන්මාරයෙන් සහල් ආනයනය කිරීම සම්බන්ධයෙන් මාධ්‍යවල පළ වූ සාවද්‍ය ප්‍රකාශ පිළිබඳ කරුණු පැහැදිලි කිරීමට අවස්ථාව ලබා දීම ගැන මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු කථානායකතුමනි, විවෘත වෙළෙඳ පොළේ සහල් හිඟ වීම සම්බන්ධයෙන් 2021.06.21 දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ගනු ලැබූ අංක 21/විවිධ (034) තීරණයට අනුකූලව ශ්‍රී ලංකාවේ බුරුම තානාපතිතුමා මා සමඟ 2021.08.23 වන දින වෙළෙඳ අමාත්‍යාංශයේදී පවත්වන ලද සාකච්ඡාවේදී, දෙරට අතර මිත්‍රත්වය තහවුරු කරමින් දැනට ශ්‍රී ලංකාවේ පවතින සහල් අර්බුදයට යම් විසඳුමක් ලෙස සහල් මෙට්‍රික්ටොන් 150,000ක් මියන්මාර් සහල් මණ්ඩලය - Myanmar Rice Federation - මඟින් ලබා දීමට එකඟ වන ලදී. එහිදී, සුදු සහල් වර්ගයේ මෙට්‍රික්ටොන් එකක් CIF Colombo - මිල රක්ෂණය හා ගැල් කුලිය - මිල ගණන් අනුව ඇමෙරිකානු ඩොලර් 460කට ලබා දිය හැකි බවටත්, මේ සඳහා දින 90ක ණය පහසුකමක් ලබා දීමටත් එකඟ වූ අතර, ගෙවීම් පියවීම චීන මුදලින් - Yuanවලින් - කළ හැකි බවට ද තවදුරටත් එකඟ වන ලදී. ඊට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශය මම **සභාගත*** කරමි.

ඒ අනුව මියන්මාරයෙන් ආනයනය කිරීමට අපේක්ෂිත සුදු සහල් වර්ගයේ නියැදියක් සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව වෙත ලබා දී, එම නියැදිය බතලගොඩ වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය - RRDI - හා කාර්මික තාක්ෂණ ආයතනය - ITI - වෙත යොමු කර ඇත.

මෙම සහල් ආනයනය වෙනුවෙන් වැය වන මුදල චීන මුදලින් - Yuanවලින් - ගෙවීම් කිරීමට හැකි බැවින්, ඩොලර් පිළිබඳ ගැටලුවක් ද පැන නොනඟින බව ඒ අවස්ථාවේ තීරණය විය. ඒ අනුව රජයෙන්, G2G ක්‍රමය යටතේ සහල් ආනයනය කිරීම සම්බන්ධයෙන් බුරුම තානාපතිතුමා, වාණිජ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සහ ශ්‍රී ලංකා සතොස සභාපති ඇතුළු නිලධාරීන් සමඟ මගේ ප්‍රධානත්වයෙන් 2021.09.28 දින වෙළෙඳ අමාත්‍යාංශයේදී නැවත සාකච්ඡා පවත්වන ලදී. එහිදී දෙරට අතර බුරුමය වෙනුවෙන් බුරුමයේ වාණිජ අමාත්‍යාංශයේ ලේකම් සහ ශ්‍රී ලංකාව වෙනුවෙන් වෙළෙඳ අමාත්‍යාංශයේ ලේකම් විසින් ගිවිසුම්ගත වීමට යටත්ව ණයවර ලිපි විවෘත කර සහල් ආනයනය කිරීමට තීරණය විය.

ආනයනය කිරීමට අපේක්ෂිත සහල් තොගයෙන් කොටසක් ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ගබඩාවල ආරක්ෂණ තොගයක් වශයෙන් පවත්වා ගැනීමටත්, පාරිභෝගික ජනතාවට දැරිය හැකි මිලකට ලංකා සතොස අලෙවිසැල් ජාලය හරහා සහල් සැපයීම නොකඩවා සිදු කිරීමේ කටයුතු කළමනාකරණය කර ගැනීමටත් සැලසුම් සකස් කර ඇත.

මා විසින් මියන්මාර් රජය සමඟ දිගින් දිගට සිදු කළ සාකච්ඡාවල ප්‍රතිඵල අනුව, සුදු සහල් වර්ගයේ මෙට්‍රික්ටොන් එකක් CIF Colombo මිල ගණන් අනුව ඇමෙරිකානු ඩොලර් 460කට කලින් එකඟ වූ මිල ඇමෙරිකානු ඩොලර් 445 දක්වා අඩු කර ලබා ගැනීමට හැකි විය. කැබිනට් මණ්ඩලය විසින් කැබිනට් පත්‍රිකාවෙන් අනුමත කර තිබුණු මුදල ඇමෙරිකානු ඩොලර් 460යි. මා එම කැබිනට් පත්‍රිකාව **සභාගත*** කරනවා.

නමුත් දෙවැනි වරට කරන ලද සාකච්ඡාවල ප්‍රතිඵලයක් වශයෙන් තව ඇමෙරිකානු ඩොලර් 15ක් අඩු කර ඇමෙරිකානු ඩොලර් 445කට සුදු සහල් ලබා ගැනීමට හැකි වුණා. ඒ අනුව, මා විසින් ඉදිරිපත් කළ අංක අ.ම.ප. 21/2053/313/073 හා 2021.11.15 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2021.11.29 දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ගනු ලැබූ තීරණය හා ඒ

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා]

සම්බන්ධයෙන් අංක MF/TIP/CO/2021/10-17 හා 2021.11.29 දිනැති ගරු මුදල් අමාත්‍යතුමාගේ නිරීක්ෂණය කෙරෙහි අවධානය යොමු කර, එම තීරණය ක්‍රියාවට නංවමින් මියන්මාරයේ වාණිජ අමාත්‍යාංශය යටතේ මියන්මාර් වෙළෙඳ ප්‍රවර්ධන සංවිධානය - Myanmar Trade Promotion Organization - සමඟ සහල් ආනයනය සම්බන්ධයෙන් ගරු නීතිපතිතුමාගේ අංක CL/210/2021 හා 2021.12.09 දිනැති ලිපිය මඟින් ලබා දී ඇති නිරීක්ෂණ සැලකිල්ලට ගෙන ද්විපාර්ශ්වික ගිවිසුමකට 2022.01.07වැනි දින එළඹ ඇත. එම අදාළ ලේඛන මම **සභාගත*** කරනවා. ගරු කථානායකතුමනි, එම ගිවිසුම ප්‍රකාරව මෙම වර්ෂය තුළ වෙළෙඳ අමාත්‍යාංශය යටතේ පවතින ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව - STC - මඟින් මියන්මාරයෙන් සුදු සහල් මෙට්‍රික්ටොන් ලක්ෂයක ප්‍රමාණයක් මෙට්‍රික්ටොන් එකක් ඇමෙරිකානු ඩොලර් 445කට මෙට්‍රික්ටොන් 20,000 බැගින් ආනයනය කිරීමට කටයුතු සිදු කරමින් පවතී. නමුත් කිසිදු සහල් තොගයක් මේ දක්වා ගෙනැවිත් නැත.

ගරු කථානායකතුමනි, මියන්මාරයෙන් ශ්‍රී ලංකාවට සහල් ආනයනය කිරීම සම්බන්ධයෙන් එරට පුවත්පත්වල පළ වූ ප්‍රකාශ පිළිබඳ මියන්මාර් තානාපති කාර්යාලය විසින් එහි සත්‍ය අසත්‍යතාව පහත දැක්වෙන පරිදි පැහැදිලි කර ඇති බව මෙම ගරු සභාවට ඉදිරිපත් කරමි.

"මියන්මාරයෙන් ශ්‍රී ලංකාවට සහල් ආනයනය කිරීමෙන් ඉහළ මිලක් උපයා ගත හැකි" යනුවෙන් පෞද්ගලික ආයතනයකට අයත් Global New Light නම් වූ වෙබ් අඩවියේ 2022.02.20 වැනි දින පළ කරන ලද ලිපියේ සඳහන් වන කරුණු ශ්‍රී ලංකාවේ මාධ්‍ය මඟින් ප්‍රචාරය කර ඇති බව ශ්‍රී ලංකාවේ මියන්මාර් තානාපති කාර්යාලය විසින් හඳුනා ගන්නා ලදී.

තානාපති කාර්යාලය විසින් මේ සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි සත්‍යතාව පැහැදිලි කිරීමක් කර ඇත.

1. මෙම ලිපිය රාජ්‍ය ආයතනයක් හෝ මියන්මාර් සහල් සම්මේලනය මඟින් පළ කරන ලද්දක් නොවේ. බයින්ටනෝන්ග් සහල් තොග ගබඩාවේ සහල් වෙළෙන්දෙකු වන තාන් ඕ සමඟ නිදහස් මාධ්‍යවේදියෙකු විසින් කරන ලද සම්මුඛ සාකච්ඡාවක් අනුව ලියන ලද්දකි.
2. මෙම ලිපියේ සඳහන් කරුණු නිවැරදි නොවේ. මන්ද යත්, සත්‍ය වශයෙන්ම ටොන් එකකට ඩොලර් 340-350 වනුයේ, මියන්මාර් සහල් නිෂ්පාදකයාගේ සිට මියන්මාර් වරාය දක්වා වන ගාස්තුව හෙවත් Free on Board - FOB - මිල ගණන් වන අතර, ඩොලර් 440 යනු CIF Colombo මිල ගණන් ය. මේ මිල ගණන් රක්ෂණ ගාස්තු හා ගැල් කුලිය ඇතුළත් මිල ගණන් වේ. අනෙකුත් ගාස්තු ද ඇතුළත් වේ. අනෙක් රටවලට මියන්මාරයෙන් සහල් අපනයනය කිරීම වෙනුවෙන් වන ගාස්තු හා සසඳන විට මෙය ඉතා සාධාරණ මිලකි.
3. එමෙන්ම, එම ලිපිය මඟින් සාවද්‍ය ලෙස පෙන්වා දී ඇත්තේ අනෙකුත් රටවලට සාපේක්ෂව ශ්‍රී ලංකාවට අපනයනය කෙරෙන සහල් වර්ගය බාධාවකින් තොරව අපනයනය කෙරෙන බවයි. නමුත් සත්‍ය වශයෙන්ම, ශ්‍රී ලංකාවට මියන්මාරයෙන් අපනයනය කරනු ලබන්නේ නිසි ලෙස ඇඹරුම් කරන ලද, පොලිෂ් කරන ලද, වෙන් කරන ලද සහ නිසි තාක්ෂණයෙන් තුන්වන පාර්ශ්වයකින්ද තත්ත්වය සහතික කළ සියයට 5ක් කැඩුණු සුදු සහල්ය.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

"මේ පිළිබඳව වැඩිදුර විස්තර අවශ්‍ය වන්නේ නම්, myanembcb@gmail.com හරහා අප සමඟ සම්බන්ධ විය හැකිය" කියලා තානාපති කාර්යාලය නිවේදනයක් නිකුත් කර තිබෙනවා. එම නිවේදනයත් මා **සභාගත*** කරනවා.

ස්තුතියි.

## ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතාගේ පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම
## மாண்புமிகு கெஹெலிய றம்புக்வெல்லவினது சொந்த விளக்கம்
## PERSONAL EXPLANATION BY HON. KEHELIYA RAMBUKWELLA

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා (සෞඛ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கெஹெலிய றம்புக்வெல்ல - சுகாதார அமைச்சர்)
(The Hon. Keheliya Rambukwella - Minister of Health)

ගරු කථානායකතුමනි, ප්‍රථමයෙන්ම, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ කරුණු පැහැදිලි කිරීමට මා තීන්දු කළේ, මගේ නිල නිවාසයේ විදුලි බිලක් සම්බන්ධව ගරු විජිත හේරත් මන්ත්‍රීතුමාත්, සමාජ මාධ්‍ය තුළත්, බොහෝ අයත් විවිධ මත ඉදිරිපත් කළ නිසායි. ඒ නිසා ඒ ගැන නිවැරදි කරුණු ඉදිරිපත් කිරීම මගේ යුතුකමක් හා වගකීමක් කියලා මා හිතුවා.

පළමුවෙන්ම මම ලංකා විදුලිබල මණ්ඩලයේ සභාපතිතුමාට ලියපු ලියමන කියවන්නම්. ඒ සඳහා මට අවසර ලබා දෙන්න, ගරු කථානායකතුමනි.

"Chairman
Ceylon Electricity Board (CEB) ....."

"<u>Ref: Change of Occupant Name and Arrears of Electricity Bills Issued for Residence No. 400/53 M, Sarana Road, Colombo 07</u>

Reference is made to the above subject matter.

I came into occupation at 400/53 M, Sarana Road, Colombo 07 in 2015 approximately around the month of April. The electricity bills that were sent to my residence were paid in full in the first few months. However, when it came to my attention that there is an unusual variance from month to month ranging from approximately 30,000-150,000 LKR and over, I wrote to the CEB seeking clarification and requested the CEB to check the accuracy of the meters to ensure there was no misreading. Regrettably, the CEB did not respond nor took any action with regard to the matter, as a result, there was an accumulation of bills. The position of discrepancy still stands as of date even after many phone conversations seeking clarity have been made subsequent to three letters written to the CEB. Furthermore, I have not been in occupation of the said residence from the month of January, 2022, despite that I have received invoices for the months of January, 2022 and February, 2022 to a total amounting approximately 85,000 LKR, which is so obviously erroneous as nobody was in residence.

In addition to the above matter, I have also brought to the notice of the CEB that the invoices issued for this residence are in the name of a previous resident of the house. This continues to be the status quo to date, as recent as the invoice for the month of February, 2022, despite numerous clarifications and reminders to change the recipient's name to my name.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

Within the first few months of my occupation of the residence, I wrote to all the institutions and government offices for a change of the name of occupant, which they have all promptly responded and acted upon, except the CEB, resulting in this entire confusion. Given this error, my accountants have advised that they cannot make a tax exemption claim for which I am entitled to, therefore, as a result of the CEB inaction, I stand to involuntarily forego tax exemptions that I am rightfully entitled to. I must also emphasize that if the CEB can address a letter requesting for me to pay the arrears in my name, then, they are obviously aware that I am the new resident at the said address and should not have any issues addressing the invoices in my name.

This unfortunate incident has led to an unnecessary social media and Parliamentary attention directly affecting my reputation and goodwill. It is a fact that there is an outstanding payment due, however, I have taken all steps to rectify the situation while the CEB has not cooperated with any of the efforts made. Due to the negative energy created, I decided to pay Rs. 7.1 million owed to the CEB as an interim solution to the problem. Moreover, I would also like to mention that the receipt I received for the payment of Rs. 7.1 million is also in the previous resident's name and not mine. Therefore, I insist that the CEB take necessary action to accept the errors made and rectify the negative consequences that I had to endure created by this situation.

Awaiting your prompt response."

Hon. Speaker, I have sent three letters dated 20th May, 2015, 10th August, 2015 and 10th May, 2016. What I have here with me is the latest receipt that I received after the payment of Rs. 7.1 million, which is under the name of Major General L.H.S.C. Silva. I will table all these later. So, this is what I received.

My accountants, Ernst & Young, categorically told me that they cannot make a tax exemption because on my taxable income, this is a deductible. All expenses are deductibles. So, they said they cannot do it because this is under somebody else's name. I explained this in detail. In spite of that, last week, I paid that amount and the payment was made under somebody else's name. That is one matter.

The second matter is the variance that I spoke of. It starts from Rs. 30,000, then Rs. 21,000 and goes up to Rs. 141,000. Then, in the month of September, 2020 it had gone up to Rs. 766,000 and in the month of January, 2021, it was Rs. 360,000. That is a four-room house with three air-conditioners, two with inverters functioning. This entire confusion could have been resolved, had the CEB responded.

Now, I have a new problem. I have now moved into a new official residence, of which, I understand, the Hon. Patali Champika Ranawaka was the previous resident. I got a water bill today addressed to the Hon. Patali Champika Ranawaka, with no insult to him, to the tune of Rs. 688,762.58. In spite of that, I got another bill for my new residence at No. 121, Wijerama Mawatha, Colombo 07, a staggering Rs. 49,168,000.54, with no insult to individuals, under the name Festus Perera! So, now, I will be held responsible for that too. Even if I write to the CEB, if they do not respond, they will keep on sending me these bills. I received this bill this week. Sir, I am **tabling*** all these bills and documents.

Sir, please give me 10 minutes to explain this situation. This has been going on for a while; from time to time, they have been talking about the electricity bills and water bills. So, there must be an end to this. I want to speak to the Hon. Patali Champika Ranawaka about this and also write to the CEB once again saying that since I am the new resident now, to bill these in my name because my accountants, as you know, cannot legally deduct somebody else's dues from my taxable income. I have been insisting on this. This new bill amounts to over Rs. 49  million, almost Rs. 50 million, and will continue under my name now.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

All right. You have explained it now and submitted the documents.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய றம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)

Sir, I tabled all that because ඉතාම වැරදි මතයක්

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)

ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ පෞද්ගලික නිවසකද, රජයේ නිවසකද මේ ප්‍රශ්නය තිබෙන්නේ?

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய றம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)

රජයේ නිවසක.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)

ඔබතුමා රැඳී සිටින රජයේ නිවසේ බිල තමයි මේ එන්නේ, නේද?

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய றம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)

ඔව්. රජයේ නිවසට මම බිල ගෙව්වා.

ගරු කථානායකතුමනි, මගේ ජල බිල ගැන මම කියන්න ඕනෑ. මම විවිධ සමාජ ආයතනවල සාමාජිකයෙක්. 2015 දී මම ඒ සෑම එකකටම ලිව්වා, මම තමයි අලුත් resident කියලා. එතකොට මගේ bills ඔක්කෝම එතැනට එන්න පටන් ගත්තා. ඉතින්, මම මේක නොකිව්වා නම් ඉතාම අසාධාරණයි. මොකද, මතවාදය යන්නේ වෙනත් විධියකට. ඔබතුමාත් මේ ප්‍රශ්නය අහලා තිබුණා. මේ ප්‍රශ්නය අහපු එක සාධාරණයි. මේ බිල ගත්තොත්, *[බාධා කිරීමක්]* Please give me a minute, Sir. Again, I say, with no insult to any of the individuals, that the bill received under the name of the Hon. Festus Perera amounts to Rs. 49 million. This will continue; fom tomorrow, the bills will come under the same name, but to my address. Rs. 49 million!

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

I hope the CEB would take proper action on this issue. Thank you.

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremasinghe)

ගරු කථානායකතුමනි, මගේ වරප්‍රසාද ප්‍රශ්නය ඉදිරිපත් කරන්න ඉස්සෙල්ලා මම එක කාරණයක් කියන්න කැමැතියි. මම දන්නා විධියට ෆෙස්ටස් පෙරේරා මැතිතුමා 1977 ඉඳලා 1994 දක්වා ඇමතිවරයා වශයෙන් කටයුතු කළා. කොහොම වුණත්, ඒ කාලයේ අය කරන්න තිබුණා නේ. නමුත්, දැන් ඒ මුදල් අය කරන්න බැහැ. එක අයකර ගන්න ඕනෑ නම්, ලංකා විදුලිබල මණ්ඩලයට කියන්න අනික් ලෝකයට යන්න කියලා.

මට මෙතැන ඉදිරිපත් කරන්න තිබෙන්නේ වෙනත් වරප්‍රසාද ප්‍රශ්නයක්. මටත්, ඒ වාගේම මේ සභාවේ මන්ත්‍රීවරුන් කිහිප දෙනෙකුටත් 1978 අංක 4 දරන පනත යටතේ විශේෂ ජනාධිපති කොමිසමට මේ සතියේ සහභාගි වෙන්න කියලා දැනුම් දී තිබෙනවා. මගේ නීතිඥයන් මගින් මම දැනුම් දුන්නා, "මට එතැනට පැමිණෙන්න අපහසුයි, පාර්ලිමේන්තුවට ප්‍රමුඛත්වය දෙන්න ඕනෑ" කියලා. අනෙක් මන්ත්‍රීතුමන්ලාටත් ආරක්ෂාව ලබා දෙන්න ඕනෑ. විශේෂයෙන්ම සියලුම මන්ත්‍රීවරුන් එක සැරේ කැඳවන්නේ නැතිව වුවමනා අවස්ථාවේ දී අදාළ මන්ත්‍රීතුමා කැඳවනවා නම් හොඳයි. එතකොට ප්‍රශ්න සම්පූර්ණයෙන් කියන්න පුළුවන්. අනෙක් කාරණය තමයි, මම පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමාට කියන්න කැමැතියි, පාර්ලිමේන්තුව රැස්වන දවස් සියල්ලම කොමිසමට දැනුම් දෙන්න කියලා. ඒක, එක ප්‍රශ්නයක්.

දෙවැනි කාරණය මෙයයි. ජනාධිපතිතුමා මේ කොමිසම පත් කරලා තිබෙන්නේ, 2021 ජනවාරි 29වැනිදා ගැසට් පත්‍රයෙන් සහ 2021 අප්‍රේල් 1වැනිදා ගැසට් පත්‍රයෙන්. මීට ඉස්සෙල්ලා තිබුණු කොමිසමේ වාර්තාව තමයි මේ සඳහා පදනම් කරගෙන තිබෙන්නේ. ඒක තමයි උපාලි අබේරත්න මැතිතුමාගේ සභාපතිත්වයෙන් තිබුණු කොමිෂන් සභාව. ඒ කොමිෂන් සභා වාර්තාව ගැන ජිනීවාවල තිබෙන මානව හිමිකම් මණ්ඩලයෙන් දැන් ප්‍රශ්න කරලා තිබෙනවා. මේ ගැන නීතිමය ප්‍රශ්න කිහිපයක් ඇති කරලා තිබෙනවා. ඉතින්, දැන් රජයට සිදුවෙලා තිබෙනවා, ඒවාට පිළිතුරු දෙන්න. මම හිතන විධියට, මේ අවුරුද්දේ සැප්තැම්බර් මාසයේදී පිළිතුරු දෙන්න වෙයි. මට පෙනෙන විධියට මේක දිගට යන ප්‍රශ්නයක්. ඉතින්, මේ වාර්තාව පදනම් කරගෙන තිබෙන ගැසට් එක බැලුවොත්, ඇත්ත වශයෙන්ම මෙහි වලංගුභාවය මොකක්ද? By taking this Commission Report, you have tainted the warrant of the Commission. මම කියන්නේ මේකයි. ඉස්සෙල්ලාම රජය කියන්න ඕනෑ, මේ සම්බන්ධයෙන් කරන්නේ මොකක්ද කියලා. ඊළඟට, මේ ප්‍රශ්නය ජාත්‍යන්තර පාර්ලිමේන්තු සංගමයටත් යයි. මේ ගැන රජය කියන තෙක් මේ කොමිසම ක්‍රියාත්මක කරලා හරියන්නේ නැහැ. මොකද, උපාලි අබේරත්න මැතිතුමාට විරුද්ධව ඒ ගොල්ලෝ සඳහනක් කරලා තිබෙනවා. විශේෂයෙන්ම 2022 පෙබරවාරි 25වැනිදා මානව හිමිකම් මණ්ඩලයෙන් සහ ඊට ඉස්සෙල්ලා A/HRC/46/20 වාර්තාවෙනුත්, ඒ දෙකෙන්ම කරුණු කියලා තිබෙනවා. ඉතින්, මෙහෙම තත්ත්වයක් උඩ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු කැඳවලා ප්‍රශ්න කරන එකෙන් වැඩක් වෙන්නේ නැහැ. මේ ගැන ඉස්සෙල්ලා කියන්න ඕනෑ. සැක පහළ කරලා තිබෙනවා. ඒකට පදනමක් නැත්නම්, මන්ත්‍රීවරු අරගෙන ගිහින් ප්‍රශ්න අහන්නේ කොහොමද? මේකෙන් අපේ වරප්‍රසාදත් කැඩෙනවා. ඒකයි මම විශේෂයෙන්ම මේක මතු කළේ. ආණ්ඩුව වෙනුවෙන් අධිකරණ ඇමතිතුමාත්, විදේශ ඇමතිතුමාත් මේ ගැන කියන්න වුවමනායි.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමා, පොඩ්ඩක් ඉක්මන් කරන්න. දැන් කාලය වැඩියෙන් ගතවෙලා තිබෙන්නේ.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

ගරු කථානායකතුමනි, එතුමා සඳහන් කළා වාගේම, මට ඒ කොමිෂන් සභාවෙන් summons ලැබිලාත් නැහැ. නමුත් මමත් කැඳවලා තිබෙනවා එතැනට. සඳහන් කරලා තිබෙනවා, "පැමිණ නැත්තේ ඇයි?" කියලා. ඒ නිසා, අධිකරණමය ක්‍රමවිධි මෙතැන ක්‍රියාත්මක නොවන බවත් සඳහන් කරන්න අවශ්‍යයි.

**ගරු චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)

நன்றி, கௌரவ சபாநாயகர் அவர்களே! மன்னார் மாவட்டத்தின் சிறந்த காற்பந்தாட்ட வீரரும் இலங்கை தேசிய காற்பந்தாட்ட அணி வீரரும் மன்னார் பனங்கட்டுக்கொட்டுவைச் சேர்ந்த விக்டர் அண்ணனுடைய மருமகனுமாகிய வை. டக்ஸன் பியூஸ்லஸ் அவர்கள் 26.02.2022 அன்று மாலைதீவில் அகால மரணமடைந்தார். அமரர் டக்ஸன் பியூஸ்லஸுக்கு இந்தச் சபையினூடாக அஞ்சலி செலுத்துவதோடு, அவருடைய குடும்பத்தினருக்கும் நண்பர்களுக்கும் எனது ஆழ்ந்த கவலையைத் தெரிவித்துக்கொள்கின்றேன். நன்றி.

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා**
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(The Hon. Field Marshal Sarath Fonseka)

ගරු කථානායකතුමනි, ඊයේ දිනයේදී මේ සභාවේ මන්ත්‍රීවරයකු මැර කණ්ඩායමක් සමඟ ගිහින් විපක්ෂයේ ප්‍රබලම දේශපාලන පක්ෂයේ මූලස්ථානයට පහර දී ඇති බව දන්නවාද කියලා මම මේ සභාවෙන් අහන්න කැමැතියි. ඔවුන් සමගි ජන බලවේගයේ කාර්යාලයට හා එම පරිශ්‍රයට ඇතුළු වී, දේපළවලට හානිකොට තිබෙනවා; කිහිපදෙනෙකුට පහර දී තිබෙනවා. හොඳ වෙලාවට එය සිදු වෙලා තිබෙන්නේ උදේ පාන්දර. අපේ කාර්යාලයේ සෙනඟ සිටි වෙලාවක එය සිදු වුණා නම්, මොන වාගේ අවසාන ප්‍රතිඵලයක් ලැබෙන්න තිබුණාද කියලා ඔබතුමා දන්නවා. හොඳ වෙලාවට අපි එතැන සිටියේ නැහැ. එතැනදී කුණු බිත්තර ප්‍රහාරයකුත් එල්ල කරලා තිබෙනවා. මේ කුණු බිත්තර සෙල්ලම වර්තමාන රාජ්‍ය අනුග්‍රහයේ සංකේතයක් බවට පත්වෙලා තිබෙනවා. තමුන්නාන්සේලාගේ රජය මේවාට යන අයට කුණු බිත්තර quota එකක් දෙනවා කියලා තමයි අපට ආරංචි වුණේ. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සලය මානව හිමිකම් ගැන කථා කරන වෙලාවේ, රාජ්‍ය අනුග්‍රහය ඇතිව අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයේ මූලධර්ම කෙලෙසන එක කනගාටුවට කරුණක්. මානව හිමිකම් යටතේ තිබෙන ප්‍රධානම කාරණා තමයි, ප්‍රජාතන්ත්‍රවාදය සහ නීතියේ සාධාරණත්වය. මේ කරුණුවලට ප්‍රතිචාර දැක්වීමේදී ඔබතුමන්ලා ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීමටත්, නීතියේ සාධාරණත්වය ඉෂ්ට කිරීමටත් ක්‍රියා කරනවාද කියා අපි උපේක්ෂාවෙන් බලාගෙන ඉන්නවා.

අපි දන්නවා, අද ජාත්‍යන්තර කාන්තා දිනය බව. අඩු ගණනේ මේ කාල පරිච්ඡේදයේදීවත් කාන්තාවන්ට ගරු කරන්න කියා ආදර්ශ දීමට හැකි විධියට කටයුතු කිරීමට දේශපාලන බලවේග පරිස්සම් වෙන්න ඕනෑ. මේ දිනවල අපි දකිනවා, මැරයන් පිරිසක් හිරුනිකා ප්‍රේමචන්ද්‍ර හිටපු ගරු මන්ත්‍රීතුමියගේ ගෙදර වටලා, ඔවුන්ට මරණ තර්ජන එල්ල කරනවා. එලෙස මරණ තර්ජන එල්ල කරන්න ආපු අය කවුද කියලා CCTV camerasවල

සටහන් වෙලා තිබෙනවා. කොළොන්නාවේ කුඩු විකුණන ගැනු, කොළොන්නාවේ ඉන්න කුඩුකාරයෝ මේවාට සහභාගි වනවා කියලා අපට විස්තර ලැබිලා තිබෙනවා. හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මැතිනියගේ ගෙදර කුඩා දරුවන් තුන් දෙනෙකු ඉන්නවා. ඒ, එක දරුවෙකුට කිරි දෙන්න ගේ ඇතුළට යන්න බැරිව එතුමිය ඊයේ එළියට වෙලා හිටියා. මේවා මානව හිමිකම් පැත්තෙන් බැලුවත් ඉතා පහත්, දාමරික වැඩ හැටියටයි අපි දකින්නේ. එතුමිය ලිපියක් බාර දීමට ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමියලා සහ නගර සභා මන්ත්‍රීතුමියලා කීප දෙනෙකු සහ තවත් උගත් කාන්තාවන් පිරිසකුත් එක්ක ජනාධිපතිතුමා හමුවන්න එතුමාගේ නිවසට යන්න උත්සාහ කළා. ඒ සිදුවීම නිසා තමයි එතුමියගෙන් මේ විධියට පළි ගන්නේ. එතුමිය ඉතා සංවර විධියට එතැන නිහඬ විරෝධයක් පා ජනාධිපතිතුමාට ලිපියක් බාර දෙන්න උත්සාහ කළා. එතුමිය එතැනදී නරක ආකාරයට හැසිරුණා කියලා කිසි දෙයක් අපට ආරංචි වුණේත් නැහැ; එවැනි දෙයක් වාර්තා වෙලාත් නැහැ. කාන්තාවකට කඩු, කිනිසි අරගෙන ගිහිල්ලා, තර්ජනය කරන නපුංසකයන්ට සමගි ජන බලවේගයේ කාන්තාවන් බය නැහැ. මම දන්නවා, හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මැතිනියත් යකඩ කාන්තාවක් බව. එතුමිය කවදාවත් ඒ වාගේ මැරයන්ට බයේ හිස නමාගෙන ඉන්න කාන්තාවක් නොවෙයි. ඒවා කරන අය ගැන සියලු තොරතුරු අපි දන්නවා. අපි බලාපොරොත්තු වනවා, තමුන්නාන්සේලා මේවාට විරුද්ධව නීතියේ සාධාරණත්වය ක්‍රියාත්මක කරයි කියලා. එහෙම නොවුණොත්, හරි කලට, හරි වෙලාවට ඔවුන්ට ඒවාට නිසි පිළිතුරු ලැබෙන වගත් අපි මතක් කරන්න කැමැතියි.

ඊළඟට අපි දැක්කා, චමුදිතගේ ගෙදරට අසූචි ප්‍රහාර එල්ල කළ ආකාරය. දැන් හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මැතිනියගේ ගෙදරටත් අසූචි ප්‍රහාරයක් එල්ල කරලා තිබෙනවා. දැන් පොහොට්ටුවේ සංකේතය "අසූචි"ද කියලා අපට අහන්න සිදුවෙලා තිබෙනවා. ඉස්සර පොහොට්ටුවක් නහය ළඟට ගන්නකොට සුවඳයි. දැන් පොහොට්ටුවෙන් එන්නේ අසූචි ගඳ විතරයි කියන එක කනගාටුවෙන් වුණත් මම ප්‍රකාශ කරන්න ඕනෑ. රටම සා ගින්නේ පෙළෙන, රජයට පළි ගහමින් ජනතාව පෝලිම්වල ඉන්න, අපේ රට ලෝකයට ණය වී බංකොලොත්වෙලා ඉන්න වෙලාවක මැර බලයෙන් ජනතාව පෙළීමට සහ බය කිරීමට රාජ්‍ය අනුග්‍රහය පාවිච්චි කිරීම ඉතා නිවට වැඩක් හැටියටයි අපි දකින්නේ. මේක තමයි තමුන්නාන්සේලා අදහන නිවට, බියගුලු දේශපාලන සංස්කෘතිය. ඒ ගැන අපි කනගාටු වනවා. මේ රටේ ජනතාවගෙන් අපි ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, මේ තත්ත්වය තේරුම් ගෙන මේ සංස්කෘතිය වෙනස් කිරීමට පෙළ ගැහෙන්න කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා**
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(The Hon. Field Marshal Sarath Fonseka)
මට තව විනාඩියක් ලබා දෙන්න, ගරු කථානායකතුමනි.

බලය තිබෙනකොට මැරකම් කරලා, එහෙම නැත්නම් දාමරික වැඩ කරලා, ඊට පස්සේ නීතිය ක්‍රියාත්මක වනකොට කියනවා, "දේශපාලන පළිගැනීම්" කියලා. ඒ නිසා අපි සියලු දෙනාට මෙන්න මේ කාරණය මතක් කරනවා. ඔබතුමන්ලා වීදුරු ගෙවල්වල ඉඳගෙන ගල් ගහන්න එපා. මොකද, ඒවාට අන්තිමේදී තමන්ටත් මුහුණ දෙන්න සිදු වනවා.

ගරු කථානායකතුමනි, අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න කැමැතියි. රටේ ජනතාව අද දුක් විඳිනවා. රට තුළ ඩොලර් නැහැ කියලා තමුන්නාන්සේලා දන්නවා. එම නිසා මුළු රටම අගතියට පත් වෙලා තිබෙනවා. ඒ සියල්ල අතර තමුන්නාන්සේලා ජනතාව මර්දනය කරන්න හදනවා.

දැන් ගරු බන්දුල ගුණවර්ධන අමාත්‍යතුමාත් කිව්වා, මියන්මාරයේ CIF value එක නිසා තමයි හාල් මෙට්‍රික්ටොන් එකකට ඩොලර් සියයක් වැඩි වෙන්නේ කියලා. මියන්මාරයෙන් හාල් මෙට්‍රික්ටොන් එකක් අපනයනය කිරීමට වැය වන cost එක ඩොලර් 350යි. Cost එක නැතිව insurance and freight value එක ටොන් එකකට ඩොලර් සියයක් වැඩි වනවා කියන එක අපි විශ්වාස කරන්නේ නැහැ, ගරු ඇමතිතුමනි. ඉන්දියාවේ නැනෝ යූරියා මිලිලීටර 500ක විකුණුම් මිල ඩොලර් 6.25ක් ලෙස තිබියදී තමුන්නාන්සේලා ඩොලර් 24ක් ගෙවා එය අපේ රටට ගේනවා. ලෝක වෙළෙඳ පොළේ Sinopharm vaccine එකක මිල ඩොලර් 10යි. නමුත්, තමුන්නාන්සේලා Sinopharm vaccine එක ඩොලර් 15ට ගේනවා. මසකට ඩොලර් මිලියන 650ක්ව තිබුණු විදේශ ප්‍රේෂණ දැන් ඩොලර් මිලියන 380ට අඩුවෙලා තිබෙනවා. එම නිසා දැන් තිබෙන තත්ත්වය භයානකයි. එහෙම තිබියදීත් 2020ට වඩා 2021දී තමුන්නාන්සේලා ආනයනය සඳහා වැය කර තිබෙනවා, වැඩිපුර ඩොලර් කෝටි 200ක්. දැන් රටේ පවතින ඩොලර් හිඟයට තමුන්නාන්සේලා උත්තර දෙනවාද, මේක ගණන් නොගෙන හිතුමතයට ක්‍රියා කරනවාද කියන එකත් අපට ප්‍රශ්නයක්.

මේවා සිද්ධ වෙද්දි ජනතාව මර්දනය කරන්න එපා; ජනතාවට හිරිහැර කරන්න එපා; ප්‍රජාතන්ත්‍රවාදය විනාශ කරන්න එපා. ඒවාට ගරු කරමින් මේ ප්‍රශ්නවලට පිළිතුරු සොයන්න කියා මම ඉල්ලා සිටිනවා.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)
ගරු කථානායකතුමනි, ගරු සරත් ෆොන්සේකා මන්ත්‍රීතුමා මගේ නම සඳහන් කළා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ දැනගැනීම සඳහා ඉස්සෙල්ලාම මම මේ කාරණය කියන්න ඕනෑ. බුරුම තානාපති කාර්යාලය විසින් නිකුත් කර තිබෙන නිවේදනයට අදාළව ඒ සියලු ලිපිලේඛන මම සභාගත කර තිබෙනවා. Websitesවල අංකත් එතැන තිබෙනවා. මිල රක්ෂණය, ගැල් කුලිය ගැන කියනකොට කොවිඩ්-19 වසංගතයෙන් පස්සේ කන්ටේනර් ගාස්තු හා නැව් ගාස්තු ලෝකය පුරාම අසාමාන්‍ය ලෙස විශාල ප්‍රමාණයකින් වර්ධනය වෙලා තිබෙනවා. ඒ නිසා අපට මේ මිලට වඩා අඩුවෙන් ඒ දේවල් ගේන්න බැහැ. අපි කැබිනට් මණ්ඩලය අනුමත කරපු මුදලට වඩා ඩොලර් 15ක් අඩුවෙන් තමයි අරන් තිබෙන්නේ. තමුන්නාන්සේලාට ඒ හා සම්බන්ධිතව විමර්ශනයක් කර ගන්න අවශ්‍ය නම්, ඒ අදාළ සියලු ලිපිලේඛන, කැබිනට් පත්‍රිකා සහ තානාපති කාර්යාලවල ලේඛන මම ඉදිරිපත් කර තිබෙනවා. ඔබතුමන්ලාත් කවදා හරි දවසක රජයක් කරන්න බලාපොරොත්තු වෙනවා නම්, විදේශ සම්බන්ධතා පවත්වාගෙන යාමේදී තානාපති කාර්යාලවල ප්‍රකාශන යනාදියට සවන් දෙන්න, වග කියන්න පුරුදු වෙන්න කියාත් මම ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමනි, දැන් වෙලාව අනුව අපි කොහොමද දිනට නියමිත කටයුතු පටන් ගන්නේ?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, ඔබතුමා අද දිනට නියමිත කටයුතු ඉදිරිපත් කරන්න. දිවා ආහාර විවේකයෙන් පස්සේ ඔබතුමාගේ කථාව ආරම්භ කරන්න.

න්‍යාය පත්‍රයේ අංක 1 දරන යෝජනාව ඉදිරිපත් කිරීම, ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමා.

# බුද්ධිමය දේපළ (සංශෝධන) පනත් කෙටුම්පත
## புலமைச் சொத்து (திருத்தம்) சட்டமூலம்
## INTELLECTUAL PROPERTY (AMENDMENT) BILL

*දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.*
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

[අ.භා. 12.31]

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා (වෙළෙඳ අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன - வர்த்தக அமைச்சர்)
(The Hon. (Dr.) Bandula Gunawardana - Minister of Trade)

ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

දිවා ආහාර විවේකය සඳහා සභාවේ කටයුතු පස්වරු 1.30 දක්වා තාවකාලිකව අත්හිටුවනවා.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා. 1.30ට නැවත පවත්වන ලදී.***
*அதன்படி, அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப.1.30 மணிக்கு மீண்டும் ஆரம்பமாயிற்று.*
*Sitting accordingly suspended till 1.30 p.m. and then resumed.*

**සහකාර මහ ලේකම්**
(உதவிச் செயலாளர் நாயகம்)
(Assistant Secretary-General)

කරුණාකර කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු මන්ත්‍රීවරයෙකුගේ නමක් යෝජනා කරන්න.

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)

"ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)

*විසින් ස්ථිර කරන ලදී.*
*ஆமோதித்தார்.*
*Seconded.*

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය මූලාසනාරූඪ විය.***
*அதன்படி, மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. (MRS.) ROHINI KUMARI WIJERATHNA *took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 24ක කාලයක් තිබෙනවා.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අදට යෙදී තිබෙන ලෝක කාන්තා දිනයේදී, කාන්තාවක් මූලාසනයේ සිටින අවස්ථාවක බුද්ධිමය දේපළ නීති සංග්‍රහය සඳහා සංශෝධන ඉදිරිපත් කරන්න ලැබීම පිළිබඳව මම සතුටු වෙනවා. ඒ වාගේම, මගේ පුරාණ දයාබර ශිෂ්‍යයකු වූ හිටපු මන්ත්‍රීවරයකු වන කවිරත්න මැතිතුමාගේ ආදරණීය බිරිඳ වන ඔබතුමිය මූලාසනයේ ඉන්න අවස්ථාවේ මේ පනත් කෙටුම්පතේ සංශෝධනය ඉදිරිපත් කරන්න ලැබීම පිළිබඳවත් මා සතුටු වෙනවා.

බුද්ධිමය දේපළ නීති සංග්‍රහය මේ ගරු සභාව විසින් සම්මත කරලා තිබෙන්නේ බොහෝ කරුණු කාරණා රාශියක් ඒ තුළ ඇතුළත් කරලායි. වෙළෙඳ ලකුණු, සේවා ලකුණු, පේටන්ට් බලපත්‍ර, කාර්මික සැලසුම්, ප්‍රකාශන හිමිකම යනාදිය පිළිබඳ නීතිමය විධිවිධාන ඇතුළත් පනත් කෙටුම්පත තමයි, බුද්ධිමය දේපළ නීති පනත. ඒ නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා මගේ අමාත්‍යාංශය යටතේ බුද්ධිමය දේපළ නීති කාර්යාංශයක් තිබෙනවා. ඒ කාර්යාංශය මඟින් තමයි ඒ අදාළ කටයුතු කරන්නේ. ඒ අධ්‍යක්ෂ ජනරාල්තුමිය සහ විෂයානුබද්ධ අවබෝධයක් සහිත නිලධාරින් විසින් තමයි ඒ කටයුත්ත කරගෙන යන්නේ.

ඒ තුළ විශාල කාර්ය භාරයක් ඉෂ්ට වෙනවා. මක්නිසාද යත්, ජාත්‍යන්තර වශයෙන් තිබෙන වෙළෙඳ ලකුණු, සේවා ලකුණු, කාර්මික සැලසුම්, නව නිපැයුම් සඳහා පේටන්ට් බලපත්‍ර, ඒවා ලබා ගැනීමේ ක්‍රියාවලිය, ප්‍රකාශන අයිතිය යන කරුණු සහ ඒවා සම්බන්ධ ඇති වන ආරාවුල් සම්බන්ධයෙන් අන්තර්ජාතික වශයෙනුත් ජාත්‍යන්තර බුද්ධිමය දේපළ නීති අංශ සමඟ ඒකාබද්ධ වෙලා කටයුතු කරන වඩා ස්වාධීන ආයතනයක් වන නිසා.

මේ පනතට සංශෝධනයක් ඉදිරිපත් කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ අපේ රටේ භූගෝලීය දර්ශක - Geographical Indications - පිළිබඳ නීතිමය විධි විධාන මේ පනතේ මීට පෙර ඇතුළත් වෙලා තිබුණේ නැති නිසායි. අපට පුළුවන්කම ලැබුණා, අපේ රටේ කුරුඳු සඳහා රටක් වශයෙන් විශාල ජයග්‍රහණයක් ලබන්නට. "ශ්‍රී ලංකා පිරිසිදු කුරුඳු" සඳහා වෙන කාටත් නැති පූර්ණ අයිතිය ශ්‍රී ලංකාවට පමණක්ය කියන කාරණය යුරෝපා ආර්ථික සංගමය විසින් පිළිගෙන තිබෙනවා. අපේ රටේ පවතින ජෛව පද්ධතිය තුළ, මේ රටේ තිබෙන පස, මේ රටේ කාලගුණික දේශගුණික තත්ත්වය, අපේ කුරුඳුවල රසය යනාදිය පදනම් කරගෙන, "Pure Ceylon Cinnamon" කියන නාමය ශ්‍රී ලංකාවට පමණක් ආවේණික එකක් ලෙසත්, ලෝකයේ වෙනත් කිසිම රටකට ඒ පිළිබඳ අයිතිවාසිකම් කිව නොහැකි බවටත් මේ GI Index එක මඟින් පිළිගැනීමක් කරලා තිබෙනවා. එය රටක් වශයෙන් අපි ලබා තිබෙන විශාල ජයග්‍රහණයක්.

ඒ පිළිබඳ වඩා පැහැදිලිව තේරුම් යන ආකාරයට මම එහි ඇති ප්‍රධාන කරුණු කිහිපය සඳහන් කරන්න කැමැතියි. යුරෝපා ආර්ථික සංගමය තුළ ශ්‍රී ලංකා කුරුඳු සඳහා වන භූගෝලීය දර්ශකය ලබා ගැනීමේ කාර්යය වෙනුවෙන් විදේශ කටයුතු අමාත්‍යාංශය, වෙළෙඳ අමාත්‍යාංශය, වාණිජ දෙපාර්තමේන්තුව,

අපනයන සංවර්ධන මණ්ඩලය, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, බුද්ධිමය දේපළ නීති කාර්යාංශය ඇතුළු රාජ්‍ය අංශය හා පුද්ගලික අංශයේ ආයතන සංවිධාන රාශියක් දීර්ඝ කාලයක සිට විශාල ප්‍රයත්නයක් දරලා තිබෙනවා. නම් කීවත් නොකීවත් ඒ සඳහා දායක වූ සියලු බුද්ධිමතුන්ට, විද්වතුන්ට සත් පුරුෂයන්ට රට වෙනුවෙන් මගේ ගෞරවයත්, ස්තුතියත් පුද කරමින් ඒ පිළිබඳ කෙටි අදහස් දැක්වීමක් තමයි මම කරන්න බලාපොරොත්තු වෙන්නේ.

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් කුරුඳු කර්මාන්තයේ නියැළී සිටින සියලු පාර්ශ්වකරුවන් වෙනුවෙන් යුරෝපා සංගමය තුළ ශ්‍රී ලංකා කුරුඳු සඳහා භූගෝලීය දර්ශක ලියාපදිංචිය 2022 වසරේ පෙබරවාරි මස 02වෙනි දින සම්පූර්ණ කරනු ලැබුවා.

අපනයන සංවර්ධන මණ්ඩලය භූගෝලීය දර්ශකය ලබා ගැනීම වෙනුවෙන් කළ සුවිශාල කාර්ය භාරය මම කෙටියෙන් සඳහන් කරන්නම්.

1. 2009 වර්ෂය තුළදී කුරුඳු සඳහා වන සියලු ආකාර ප්‍රවර්ධන හා බුද්ධිමය දේපළ සුරැකීම සඳහා වන හිමිකම කැබිනට් මණ්ඩල අනුමැතියක් මඟින් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයට අයිති වුණා.

2. 2003 අංක 36 දරණ බුද්ධිමය දේපළ පනතේ භූගෝලීය දර්ශකය ලියාපදිංචි කිරීම සඳහා ප්‍රතිපාදන සපයා නැති බැවින්, වර්තමානයේ භූගෝලීය දර්ශකයක් ආරක්ෂා කර ගැනීම සඳහා සහතික කිරීමේ ලකුණක් - Certification Mark - වශයෙන් ලියාපදිංචි කිරීම සිදු කළ යුතු වුණා.

3. ඊට අනුකූලව ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් 2012 වර්ෂය තුළදී කුරුඳු සඳහා වන සන්නාම නාමය - Pure Ceylon Cinnamon, Ceylon Cinnamon - ශ්‍රී ලංකාව තුළ Certification Mark එක යටතේ ලියාපදිංචි කරනු ලැබුවා.

4. යුරෝපා සංගමය මෙම Ceylon Cinnamon භූගෝලීය දර්ශකයක් ලෙස ලියාපදිංචි කිරීම සඳහා සහ යුරෝපා සංගමයට ඉදිරිපත් කළ ලේඛන සකස් කිරීම පිළිබඳ උපදෙස් ලබා ගැනීම සඳහා "බර්නාඩ් ඔකනර්" නම් GI ලියා පදිංචිය සඳහා විශේෂ දක්ෂකමක් ඇති නීතිවේදීතුමෙකුගේ සේවය ලබා ගැනීමට කටයුතු කරනු ලැබුවා. තානාපති කාර්යාලය මඟින් අයදුම්පත් කැඳවා භූගෝලීය දර්ශක සඳහා ජාත්‍යන්තර නීතිය පිළිබඳ හසළ දැනුමක් හා පුළුල් අත්දැකීමක් සහිත "බර්නාඩ් ඔකනර්" නම් සමාගම තෝරා පත් කරගනු ලැබුවා.

5. මෙහිදී යුරෝපා සංගමය තුළ ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍ය වන තාක්ෂණික ලියවිල්ල වන කුරුඳු පිරිවිතරය - specifications and technical dossier - සකස් කිරීම සඳහා UNIDO ආයතනය, WTO ආයතනය යන ජාත්‍යන්තර සංවිධානවල සහයෝගය අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ලබා ගත්තා.

6. කුරුඳු පිරිවිතරය හා තාක්ෂණික ලියවිල්ල සකස් කිරීමෙන් පසු යුරෝපා සංගමය කුරුඳු සඳහා වන භූගෝලීය දර්ශකය ලියා පදිංචිකිරීම සඳහා 2017 වර්ෂයේදී ඉල්ලුම්පතක් ඉදිරිපත් කරනු ලැබුවා. 2020 අප්‍රේල් මාසයේදී යුරෝපා සංගමය විසින් ශ්‍රී ලංකා කුරුඳු භූගෝලීය දර්ශකය සඳහා වන අයදුම්පත ප්‍රසිද්ධ කොට යුරෝපා සංගමයේ ලේඛනවල පළ කරනු ලැබුවා.

7. මෙහිදී 2020 සැප්තැම්බර් මාසය වන තෙක් විරෝධතා දැක්වීමේ කාලයක් ලබා දුන්නා. ඒ අනුව 2020 සැප්තැම්බර් මාසයේදී German Spice Trade Association ආයතනය විසින් ශ්‍රී ලංකා කුරුඳු සඳහා *Cinnamomum zeylanicum* යන නාමය පූර්ණ අයිතිය ශ්‍රී ලංකාවට ලබා දීමට විරෝධය පළ කළ නමුත්, බෙල්ජියමේ පත් කරනු ලැබූ නීතිඥවරයා හරහා අදාළ කරුණු යුරෝපා සංගමයට ඉදිරිපත් කිරීමෙන් එය සමථයකට පත් කර ගනු ලැබුවා.

8. භූගෝලීය දර්ශකය යුරෝපා සංගමය තුළ ලියාපදිංචි අවශ්‍යතා සපුරාලමින් හා භූගෝලීය දර්ශකය ඉදිරියට පවත්වාගෙන යෑම සඳහා 2019 වර්ෂයේදී භූගෝලීය දර්ශක සංගමය - Ceylon Cinnamon Geographical Indication Association - CCGIA - අපනයන සංවර්ධන මණ්ඩලය විසින් පිහිටුවන ලද අතර මේ වන විට සංගමයේ සාමාජිකත්වය ලබා ගැනීම සඳහා දිස්ත්‍රික්ක වශයෙන් වැඩමුළු පවත්වා වැඩසටහන් සංවිධානය කරනු ලැබුවා.

9. භූගෝලීය දර්ශකය සඳහා වන කුරුඳු පිරිවිතරය - specification - CCGIA සාමාජිකත්වයට හඳුන්වා දීම සඳහා සහ අගයදාමය තුළ මෙම පිරිවිතරය අනුගමනය කිරීම සඳහා වන පාලන සැලැස්ම -Control Plan - අදියර තුනක් යටතේ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මාර්ගෝපදේශ සැලසුම් සකස් කිරීම සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් Control Union ආයතනයේ සේවය ලබා ගත්තා.

10. ඒ අනුව, 2022 පෙබරවාරි මස 2වන දින ශ්‍රී ලංකා කුරුඳු සඳහා භූගෝලීය දර්ශකය යුරෝපා සංගමය තුළ ලියාපදිංචිය සම්පූර්ණ කරන ලදී.

අපි ඉතිහාසයේ පෘතුගීසින්ට, ලන්දේසින්ට හා ඉංග්‍රීසින්ට යටත්ව සිට ලැබූ නිදහසින් පසුව ලද විශාලතම ජයග්‍රහණය ලෙස මෙය සනිටුහන් විය යුතු වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, බුද්ධිමය දේපළ පනතේ භූගෝලීය දර්ශකයක් ලියාපදිංචි කිරීම සඳහා ප්‍රතිපාදන සහ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ කාර්යභාරය මෙවායි.

වර්තමානයේ ක්‍රියාත්මක වන 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනතේ භූගෝලීය දර්ශකයක් ලියාපදිංචි කිරීම සඳහා නීති ප්‍රතිපාදන සපයා නොතිබෙන බැවින් මණ්ඩලය විසින් එම පනතේ වෙළෙඳ ලකුණ යටතේ භූගෝලීය දර්ශකයක් ආරක්ෂා කිරීම - protection - පිණිස සහතික සලකුණක් - Certification Mark එකක් - ලියාපදිංචි කිරීමේ හැකියාවක් ඇති බැවින්, ඒ යටතේ Ceylon Cinnamon Lion Logo ලියාපදිංචි කිරීමට කටයුතු කරන ලදී.

යුරෝපා සංගමයේ රෙගුලාසි අංක 1151/2012 අනුව තුන්වන පාර්ශ්වයක් විසින් භූගෝලීය දර්ශකයක් ලියාපදිංචි කිරීම සඳහා යොමු කරන්නේ නම්, අදාළ රටේ එකී භූගෝලීය දර්ශකයක් ආරක්ෂා කර ගැනීමට නීතිමය ක්‍රියා මාර්ගයක් ගෙන තිබිය යුතුය. එය සහතික සලකුණක් වශයෙන් ලියාපදිංචි කර තිබීම ඔවුන් පිළිගන්නා ලදී.

මේ වන විට මීට සමගාමීව දේශීය වශයෙන් භූගෝලීය දර්ශකයක් ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන බුද්ධිමය දේපළ කාර්යාලය විසින් නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේ ද සහාය ඇතිව සකසා ඉදිරිපත් කර ඇති අතර, එම නව ප්‍රතිපාදන පනතට අලුතින් ඇතුළත් කිරීමට කටයුතු කිරීම සඳහා කැබිනට් අනුමැතිය ලැබුණි. එම ප්‍රතිපාදන පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමෙන් භූගෝලීය දර්ශකය ලියාපදිංචි කිරීමේ නීතිමය ප්‍රතිපාදන බුද්ධිමය දේපළ නීතියට අලුතින් ඇතුළත් වෙනවා.

[ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා]

ඒ පිළිබඳ මම වෙනම සටහනක් ඉදිරිපත් කරනවා. ඒ අනුව ලංකාව සතු භූගෝලීය දර්ශක මෙම නව නීති යටතේ ලියාපදිංචි කිරීමට අවකාශය හිමි වෙනවා. තවද, මේ යටතේ අලුත් නිෂ්පාදන භූගෝලීය දර්ශක ලෙස ලියාපදිංචි කිරීම සඳහා අවස්ථාවක් ලැබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගරු ලසන්ත අලගියවන්න රාජ්‍ය ඇමතිතුමාගේ විනාඩි 16ක කාලයෙනුත් කිසියම් ප්‍රමාණයක් මම පාවිච්චි කරනවා. මොකද, එතුමා හදිසි රාජකාරි කටයුත්තක් සඳහා පිටත්ව යන නිසා.

භූගෝලීය දර්ශක ලබා ගැනීමෙන් කුරුඳු කර්මාන්තයට හිමිවන ප්‍රතිලාභ.

1. දේශීය වශයෙන් ආවේණික වූ නිෂ්පාදන සහ නිෂ්පාදන ක්‍රමවේද සඳහා ලබාගත හැකි ඉහළම බුද්ධිමය දේපළ සුරක්ෂිතතාව මේ තුළින් හිමි වෙනවා.

2. ශ්‍රී ලංකා කුරුඳු, ශ්‍රී ලංකාවට ආවේණික නිෂ්පාදනයක් වන අතරම එහි සැකසුම් ක්‍රමවේද මේ තුළින් සුරක්ෂිත වෙනවා.

3. ග්‍රාමීය වශයෙන් ව්‍යාප්තව සිටින කුරුඳු ගොවීන්, එකතු කරන්නන්, නිෂ්පාදකයන් සහ අපනයනකරුවන් ඇතුළු කුරුඳු සැපයුම් ජාලය අවසාන නිෂ්පාදනය තුළ නියෝජනය කිරීමට හැකි වෙනවා.

4. ඒ තුළින් ග්‍රාමීය ප්‍රදේශ තුළ නිෂ්පාදනය ව්‍යාප්ත කරවීම හා ග්‍රාමීය සංවර්ධනයට අවස්ථාව උදා වෙනවා.

5. දේශීය වටිනාකම එකතු කළ නිෂ්පාදන ධාරිතාව ඉහළ නැංවීමට හැකි වීම සහ ඒ තුළින් අපනයන ආදායම ඉහළ නැංවීමට හැකි වෙනවා.

6. භූගෝලීය දර්ශක පිරිවිතරයට අනුකූලව කුරුඳු සැකසීම තුළින් ගුණාත්මක තත්ත්වයෙන් ඉහළ කුරුඳු වෙළඳ පොළට සැපයීමට හැකි වෙනවා.

7. විදේශ වෙළඳ පොළ තුළ කුරුඳු සඳහා වූ තරගකාරී අනෙකුත් රටවල් අබිබවා සත්‍ය කුරුඳු ලෙස ලංකා කුරුඳු අලෙවි කිරීමට සහ ඉහළ ආදායමක් ලබා ගැනීමට මඟ පැදෙනවා.

8. කුරුඳු සඳහා ඉදිරි වර්ෂවලදී ඇමෙරිකානු ඩොලර් බිලියනයක ආදායමක් අපේක්ෂා කරනවා.

ගරු මන්ත්‍රීවරුනි, ශ්‍රී ලංකා කුරුඳු ලෝකයේ අන් කිසිදු රටක කුරුඳුවලට වඩා ගුණාත්මකභාවයෙන් ඉහළ, එකම, නියම කුරුඳු වර්ගය -සත්‍ය කුරුඳු- කියන සහතිකය තමයි GI දර්ශකය තුළින් අපට ලැබෙන්නේ. ඒ තුළින් අපේ අපනයනකරුවන්ට ශ්‍රී ලංකා පිරිසිදු කුරුඳු කියන සහතික ලාංඡනය සහිතව එතෙර වෙළඳ පොළට කුරුඳු යැවීමෙන් දැනට ලබා ගන්නා මිලට වඩා තෙවැනි පාර්ශ්වයක ගුණාත්මක සහතිකය ලැබීම නිසා ඉහළ මිලක් ලබා ගන්නට පුළුවන්කම ලැබෙනවා. ඒ වාගේම Cassia හෝ වෙනත් දෙයක් ව්‍යාජ ලෙස වෙළඳ පොළේ අලෙවි වනකොට, කිසිවිටෙකත් ශ්‍රී ලංකා කුරුඳු කියා බාල කළ කුරුඳු අලෙවි කරන්නට අවස්ථාව ලැබෙන්නේ නැහැ. එහෙම කළොත්, අපට ඒ පිළිබඳ නීතිමය ක්‍රියා මාර්ගවලට යන්නට මේ පනත් සංශෝධනය මඟින් අවස්ථාව ලැබෙනවා. ඒ නිසා ශ්‍රී ලංකාවේ කුරුඳු කර්මාන්තය අලුත් දිශානතියකට ගමන් කරන අතරම, අපේ රටේ ඉතා විශාල විදේශ විනිමය උපයන ප්‍රධාන අපනයන ද්‍රව්‍යයක් බවට කුරුඳු පහසුවෙන් පරිවර්තනය වෙනවා. කුරුඳු නිෂ්පාදකයන්ට තනි තනිව කර ගත නොහැකි, ආණ්ඩුව මැදිහත් වෙලා, අදාළ පාර්ශ්ව සමඟ කළ දීර්ඝ කාලීන ව්‍යායාමයක් තුළින් ලබාගත යුතු ජයග්‍රහණයක් තමයි අපි මේ ලබාගෙන තිබෙන්නේ. ඒ නිසා දේශපාලන, පක්ෂ, පාට භේදවලින් තොරව රටට ආදරය කරන සියලු සත්පුරුෂයන් විසින් මේ ලබාගත් ජයග්‍රහණයට අදාළ නීතිය සම්මත කර ගැනීම සඳහා අනුග්‍රහය ලබා දෙනවාට කිසිම සැකයක් නැහැ.

ඊළඟට භූගෝලීය දර්ශකය ලබා ගැනීම සඳහා දායක වූ ආයතන සහ සංවිධාන පිළිබඳ කෙටියෙන් හෝ සටහනක් කිරීම වැදගත් වෙනවා.

ලෝක වෙළඳ සංවිධානය -

යුරෝපා සංගමය තුළ ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍ය වන තාක්ෂණික ලියවිල්ල වන කුරුඳු පිරිවිතරය - specifications / technical dossier - සකස් කිරීම සඳහා තාක්ෂණික දායකත්වය ලබා දුන්නේ World Trade Organization එකයි.

යුරෝපා සංගමයේ ශ්‍රී ලංකා නියෝජිත - Delegation of the European Union in Sri Lanka -

එක්සත් ජාතීන්ගේ කර්මාන්ත සංවර්ධන ආයතනය - UNIDO - හරහා අවශ්‍ය තාක්ෂණික උපදෙස් ලබා දුන්නා.

ලෝකයේ බොහෝ රටවලට මේ දර්ශකය හිමි කර ගැනීම සඳහා අන්තර්ජාතික වෙළඳාම තුළ එයට අදාළ ආයතනවල සහයෝගය ලැබෙන්නට ඕනෑ. ඒ සහයෝගය හා තාක්ෂණික සහයෝගය ලබා දීම සම්බන්ධයෙන් World Trade Organization එකට සම්බන්ධ සියලු පාර්ශ්වයන්ට හා අපේ එහි නියෝජිතවරුන්ට අපේ ගෞරවය, ස්තුතිය පුද කරනවා.

එක්සත් ජාතීන්ගේ කර්මාන්ත සංවර්ධන ආයතනය - UNIDO

යුරෝපා සංගමය තුළ ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍ය වන තාක්ෂණික ලියවිල්ල වන කුරුඳු පිරිවිතරය සකස් කිරීම සඳහා තාක්ෂණික දායකත්වය සැපයීය. තවද, ශ්‍රී ලංකාව තුළ භූගෝලීය දර්ශකය ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍ය නීති කෙටුම්පතක් සම්පාදනය කිරීම සඳහා ජාතික බුද්ධිමය දේපළ කාර්යාංශය වෙත උපදේශන සේවා ලබා දුන්නේ UNIDO එක විසිනි.

**විදේශ කටයුතු අමාත්‍යාංශය**

බෙල්ජියම් තානාපති කාර්යාලය හරහා යුරෝපා සංගමය සමඟ අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු ඉටු කිරීමට විදේශ කටයුතු අමාත්‍යාංශයේ නිලධාරීන් විශාල සහායක් අපට ලබා දුන්නා.

**වාණිජ දෙපාර්තමේන්තුව**

වෙළඳ අමාත්‍යාංශය යටතේ පවතින වාණිජ දෙපාර්තමේන්තුව, යුරෝපා සංගමය සම්න්ධීකරණ කටයුතුවලදී සහ ජාත්‍යන්තර ආයතනවලින් භූගෝලීය දර්ශක විෂයයට අදාළ විශේෂඥ සහාය ලබා ගැනීම සඳහා දායකත්වයක් සැපයුවා.

**අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

කුරුඳු සඳහා වන භූගෝලීය දර්ශකය කුරුඳු කර්මාන්තයේ අගය දාමය තුළ ක්‍රියාත්මක කරවීම සඳහා කුරුඳු වගාකරුවන් ලියාපදිංචි කිරීමට අවශ්‍ය සහයෝගය ලබා ගැනීමට අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සමඟ අවබෝධතා ගිවිසුමක් -MoU - අත්සන් කළා. මෙහිදී සාමාජිකයන්ගේ ස්වයං පාලනය,

අභ්‍යන්තර පාලනය, බාහිර පාලනය යනාදී පිළිවෙත් යනුවෙන් අදියර තුනක් යටතේ පාලනය ක්‍රියාත්මක කළා. බාහිර පාලනය අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් සිදු කිරීමට නියමිතයි. මීට සමගාමීව අපනයන සංවර්ධන මණ්ඩලය, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සමඟ එක්ව දිස්ත්‍රික්ක 13ක දිස්ත්‍රික්ක සංගම් සංවිධාන කරලා තිබෙනවා. ජාතික සංගමයේ කටයුතු මෙම මාසය තුළදී ක්‍රියාත්මක කිරීමට යෝජනා වෙලා තිබෙනවා.

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව දේශීය වශයෙන් අගය දාමය තුළ භූගෝලීය දර්ශක ක්‍රියාත්මක කරවීම සඳහා කුරුඳු කර්මාන්තයේ නියැළී සිටින සියලු පාර්ශ්වකරුවන් සංවිධාන කිරීමට හා භූගෝලීය දර්ශකයේ බාහිර පාලන පිළිවෙත් ක්‍රියාත්මක කිරීමට මූලිකත්වය ගෙන ක්‍රියාකරනු ලබනවා.

**ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය**

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය කුරුඳු සඳහා ශ්‍රී ලංකා ප්‍රමිතිය වන SLS 81 සම්පාදන කටයුතු සඳහා දායකත්වය සැපයූ අතර GMP, GAP ප්‍රමිති සකස් කිරීමට අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට සහාය දැක්වූවා.

**කාර්මික තාක්ෂණික ආයතනය - ITI**

කාර්මික තාක්ෂණ ආයතනය විසින් පැවති පර්යේෂණ දත්ත සහ කුරුඳු පිළිබඳ තාක්ෂණික සහාය ලබා දුන්නා.

**කුළුබඩු සංගමය - SAPPTA**

කුළුබඩු සංගමය - Spice Council - කුළුබඩු ආශ්‍රිත නිෂ්පාදන වෙළඳ සංගමය යන ආයතනවල නියෝජිතයන්ගේ සහාය ලබා ගන්නා ලද අතර කුරුඳු පිරිවිතරය සකස් කිරීම සඳහා සහාය ලබා දුන්නා. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී ශ්‍රී ලංකා කුරුඳු සංගමයේ සාමාජිකයන් සහ එහි සභාපතිවරුන් දැක්වූ සහයෝගය ඉතා අගය කොට දැක්විය යුතුයි. මේ සමඟම SAPPTA ආයතනය සහ ආශ්‍රිත කුරුඳු සංගම්ද මේ සඳහා දායකත්වය ලබා දුන්නා.

ශ්‍රී ලංකාවේ කුරුඳු අගය දාමය තුළ භූගෝලීය දර්ශකය ක්‍රමවත් ආකාරයෙන් දියත් කිරීම සඳහා වන සියලු අමාත්‍යාංශ හා සියලු රාජ්‍ය සහ පෞද්ගලික ආයතනවල පූර්ණ දායකත්වය ඉදිරියේදී ඉතා ඉහළින් අපේක්ෂා කරනවා; අගය කරනවා; ඔවුන්ට ආරාධනය කරනවා.

ලංකාවේ භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීමට අදාළ සම්පූර්ණ ක්‍රමවේදය ඇතුළත් කිරීම සඳහා අද 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනතට සංශෝධන ඉදිරිපත් කරනවා. ඒ සංශෝධනවලටත් අදාළ තවත් සංශෝධන කිහිපයක් තිබෙනවා. ඒවා කාරක සභා අවස්ථාවේදී කුඩා වචනවලට කරනු ලබන සංශෝධන. ඒ සංශෝධන කිහිපය මම ගරු මන්ත්‍රීතුමන්ලාගේ මේසය මත තබා තිබෙනවා.

"බුද්ධිමය දේපළ" යනු මිනිසා සිය බුද්ධිය මෙහෙයවා කරනු ලබන නිර්මාණයන්ය. වෙළඳ ලකුණු, නව නිපැයුම්, කාර්මික සැලසුම්, ප්‍රකාශන හිමිකම්, හෙළිදරව් නොකරන ලද තොරතුරු, භූගෝලීය දර්ශක මෙවැනි බුද්ධිමය දේපළවලට නිදසුන්. එසේම, 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනතේ විධිවිධාන අනුව වෙළෙඳ අමාත්‍යාංශය යටතේ පිහිටුවා ඇති ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය, බුද්ධිමය දේපළ පරිපාලනය හා ලියාපදිංචිය සිදු කරන එකම රජයේ දෙපාර්තමේන්තුවයි.

2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත යටතේ භූගෝලීය දර්ශකය යන්නෙන්, යම් භාණ්ඩයක යම් නිශ්චිත තත්ත්වයකට, කීර්තියකට හෝ වෙනත් ආවේණික ලක්ෂණයකට එහි භූගෝලීය ප්‍රභවය හේතු වන්නා වූ අවස්ථාවක, ඒ භාණ්ඩය ඒ යම් රටක දේශසීමා තුළ හෝ ඒ දේශසීමා තුළ වූ පළාතකින් හෝ ප්‍රදේශයකින්, පිහිටි බිමකින් හෝ මූලාරම්භ වන බව හැඳින්වෙන දර්ශකයක් අදහස් වේ. එම භූගෝලීය ප්‍රදේශයට ආවේණික දේශගුණය, පස ආදී පාරිසරික සාධක සහ හෝ මිනිස් ක්‍රියාකාරකම් නිසා ප්‍රස්තුත භාණ්ඩයට, නිෂ්පාදිතයට වාණිජ වටිනාකමක් ලැබේ.

Ceylon Tea සහ Ceylon Cinnamon ශ්‍රී ලංකාවේ මූලාරම්භ වූ ප්‍රධානතම භූගෝලීය දර්ශක ලෙස සහතික ලකුණු යටතේ ලියාපදිංචි වී ඇත. Ceylon Pepper සහ Ceylon Cashew වැනි නම්වලින් හැඳින්වෙන ශ්‍රී ලංකාවට ආවේණික නිෂ්පාදිතවලින් අපනයන ආදායම් උත්පාදනය වන අතර, ශ්‍රී ලංකාවේ ආර්ථිකයට ප්‍රබල දායකත්වයක් දැනටමත් සපයයි. එවැනි භාණ්ඩ ඉදිරියේ දී ශ්‍රී ලාංකික භූගෝලීය දර්ශක ලෙස ලියාපදිංචි කිරීමට හැකියාවක් ඇත.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අමාත්‍යතුමනි, ඔබතුමාට නියමිත වෙලාවෙන් තව මිනිත්තුවක කාලයක් තිබෙනවා.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මගේ වෙලාවෙන් පසුව තව විනාඩි 16ක් මට ලැබෙනවා. එයින් විනාඩි 06ක් මම දැන් ගන්නවා. විනාඩි 10ක් පසුවට ඉතිරි කර ගන්නවා.

මෙලෙස ශ්‍රී ලංකාවේ ආර්ථිකයට වැදගත් දායකත්වයක් ලබා දෙන භූගෝලීය දර්ශක එනයින්ම ලියාපදිංචි කිරීමට නිශ්චිත ක්‍රමවේදයක් බුද්ධිමය දේපළ පනතෙහි ඇතුළත්ව නොතිබුණි. එබැවින්, ඒවා ලියාපදිංචි කිරීමට සිදු වූයේ වෙළෙඳ ලකුණු විෂය යටතේ සහතික ලකුණු ලෙසය.

විදේශීය භූගෝලීය දර්ශක ද සහතික ලකුණු ලෙස ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචිය ලබා ගෙන ඇත. දේශීය මෙන්ම විදේශීය වෙළෙඳ පොළ තුළ දී ව්‍යාජ අනුකරණ හේතුවෙන් විශේෂයෙන් තේ හා කුරුඳු වැනි ශ්‍රී ලංකා භූගෝලීය දර්ශකයන්ට දැඩි තරගකාරිත්වයකට මුහුණ දීමට සිදු වී ඇති බැවින්, තරගකාරි පාර්ශ්ව විසින් අයථා පරිහරණය වැළැක්වීම සඳහා, ඒවා භූගෝලීය දර්ශක ලෙස ශ්‍රී ලංකාවේ පළමුව ලියාපදිංචි කිරීමට අවශ්‍ය බව තේ, කුරුඳු ආදී ශ්‍රී ලංකා භූගෝලීය දර්ශක අපනයනකරුවන් විසින් පසුගිය වසර කිහිපය තුළ දිගින් දිගටම පෙන්වා දෙනු ලැබුවා. විදේශීය රටවලින් ඉදිරිපත් කරන එම රටවලට ආවේණික විවිධ භූගෝලීය දර්ශක මත පදනම් වූ භාණ්ඩ හා කෘෂිකාර්මික නිෂ්පාදන ද -උදා:-Scotch Whisky සහ Swiss Cheese- භූගෝලීය දර්ශක ලෙස ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කිරීමට මෙතෙක් අවකාශ නොතිබුණි. මේ පනත් සංශෝධනයෙන් පස්සේ විදේශීය GI හිමි භාණ්ඩයක් තිබෙනවා නම්, ඒ භාණ්ඩයත් ලංකාව තුළ අලෙවි කිරීමේ දී ලියාපදිංචි කිරීමට පුළුවන්කම ලැබෙනවා.

ශ්‍රී ලංකාව තුළ භූගෝලීය දර්ශක ලියා පදිංචි කිරීම පුළුල් හා නිශ්චිත නීතිමය රාමුවක් යටතේ ඉදිරි කාලයේ දී ස්ථාපනය කරනතුරු, භූගෝලීය දර්ශක ලෙස හැඳින්විය හැකි ප්‍රධානතම භාණ්ඩ වන තේ හා කුරුඳු නිෂ්පාදකයන් හා අපනයනකරුවන් මුහුණ දෙන ගැටලු විසඳීම සඳහා ආරම්භයක් ලෙස මෙන්ම අන්තර්කාලීන විධිවිධාන ලෙස, බුද්ධිමය දේපළ පනතේ අදාළ වගන්ති සංශෝධනය කිරීම සඳහා ඉදිරිපත් කළ අංක 15/0336/625/111 හා 2015.03.23 දිනැති අමාත්‍ය මණ්ඩල

[ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා]

සංදේශය සඳහා 2015.04.08 දිනැතිව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගන්නා ලදී. ඉන් අනතුරුව, "ශ්‍රී ලංකාවට ආවේණික භූගෝලීය දර්ශකවල ආරක්ෂාව තහවුරු කිරීම සඳහා 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත සංශෝධනය කිරීම" මැයෙන් අංක 16/2074/723/054 දරන 2016.10.04 දිනැතිව අමාත්‍ය මණ්ඩලය වෙත සංදේශයක් ඉදිරිපත් කරන ලදී. ඒ සඳහා 2016.10.18 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ද, අනතුරුව 2018.03.22 වන දින පාර්ලිමේන්තු අනුමැතිය ද ලැබුණි. ඒ අනුව, 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත් 161 වන වගන්තිය සංශෝධනය කරමින් 2018 අංක 07 දරන බුද්ධිමය දේපළ (සංශෝධන) පනත බලාත්මක විය.

ඉන් අනතුරුව ශ්‍රී ලංකාව තුළ භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීමේ පුළුල් හා නිශ්චිත නීති රාමුවක් සහ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම සඳහා කෙටුම්පත් සැකසීම සුදුසු බවට නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව සහ නීතිපති දෙපාර්තමේන්තුව 2019 වර්ෂයේ දී ලබා දුන් උපදෙස් අනුව, "2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත සංශෝධනය කිරීම සඳහා වන සංකල්ප පත්‍රිකාව" යන මැයෙන් අංක අමප/20/1499/313/019 සහ 2020.09.28 දින දරන කැබිනට් මණ්ඩල සංදේශයක් වෙළඳ ඇමතිවරයා වන මා විසින් 2020.10.12 දින අමාත්‍ය මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කරන ලදුව, නීති රාමුව කෙටුම්පත් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුණි.

ඒ අනුව ශ්‍රී ලාංකික අපනයනකරුවන්ගේ අදහස් අන්තර්ගත කරමින් ද ලෝක බුද්ධිමය දේපළ සංවිධානයේ -World Intellectual Property Organization - හා එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන සංවිධානයේ - United Nations Industrial Development Organization - තාක්ෂණික සහයෝගිතාව ලබා ගනිමින් ද නීති කෙටුම්පත් සම්පාදක විසින් අදාළ නීති සංශෝධනය කෙටුම්පත් කර, ගරු නීතිපතිතුමා විසින් අංක B/82/2021 හා 2021.09.24 දින ලබා දුන් නිෂ්කාසනය අනුව, අංක L.D.O 8/2020 හා 2021.12.23 දිනැතිව අවසන් කෙටුම්පත නිකුත් කර ඇත. අනතුරුව 2022.02.10 වන දින රජයේ ගැසට් පත්‍රයේ එකී පනත් කෙටුම්පත පළ කර ඇත. ඒ අනුව දශක දෙකක පමණ කාලයක සිට, දීර්ඝ කාලීන ක්‍රියාවලියක් ලෙස විවිධ ආණ්ඩු යටතේ කර ගෙන ආ වැඩ පිළිවෙළක් අවසන් කරමින්, ජාතික කුරුඳු නිෂ්පාදකයන්ට හා ජාතික ආර්ථිකයට වඩා වැදගත් මෙහෙවරක් කරන්න අදාළ වන ලෙස කුරුඳු සඳහා වන GI දර්ශකයට අදාළ සංශෝධනය ඇතුළත් පනත් කෙටුම්පත සම්මත කරගැනීම සඳහා සහාය වෙන ලෙස ඉල්ලා සිටිමින් මගේ වචන කිහිපය මෙයින් සමාප්ත කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට ගරු නිරෝෂන් පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 7ක කාලයක් තිබෙනවා.

[අ.භා.2.00]

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳ විවාදයට එක්වීමට අවස්ථාව ලැබීම ගැන සතුටු වෙනවා.

බුද්ධිමය දේපළ පනත තුළින් ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපළ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ බලාත්මක කිරීම සිදු වෙනවා. මෙහි වගකීම ජාතික බුද්ධිමය කාර්යාලයට පැවරී තිබෙනවා. ඒ වාගේම බුද්ධිය මෙහෙයවා කරන නිර්මාණවලින් මතු වන අයිතිවාසිකම් ආරක්ෂා කිරීම ද බුද්ධිමය දේපළ ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම ද රටක් හැටියට අපට ඉතා වැදගත් වෙනවා. රටේ ආර්ථිකය නව නිර්මාණ තුළින් ඉදිරියට ගෙන යැමත් ඒ තුළින්,-

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමා.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට විනාඩියකට අවසර දෙන්න. මගේ කථාවේදී ලේඛන දෙකක් සභාගත කරන්න අදහස් කරගෙන සිටියත්, මට එය අමතක වුණා. ඒවා තමයි, සිංහල විශ්වකෝෂයේ සත්වැනි කාණ්ඩයේ කුරුඳු ගැන සඳහන් කොටසක් සහ "කුරුඳු වගාව හා සකස් කිරීම" නමින් කෘෂිකර්ම, ඉඩම් හා වන සම්පත් අමාත්‍යාංශයේ අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ප්‍රකාශනය. එම ලේඛන දෙක මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනතට අද දින කරනු ලබන සංශෝධන තුළින් භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීමේ පද්ධතියක් හඳුන්වා දෙනවා. මා හිතන හැටියට, ආර්ථික වශයෙන් අපට මෙය වැදගත් වෙනවා.

අද ආර්ථිකය ගැනත් කථා කරන්නට අපි බලාපොරොත්තු වෙනවා. මෙය, මේ රටේ ජනතාව විශාල ජීවන බරකින් පසු වන වෙලාවක් බව අපි දන්නවා. තෙල් පෝලිම්, ගෑස් පෝලිම් ඇතුළු පෝලිම් යුගයක් නිර්මාණය කරන්න මේ රජය අද සමත් වෙලා තිබෙනවා. එයට ප්‍රධාන හේතුව විදේශ විනිමය හිඟය -ඩොලර් හිඟය- කියලා තමයි රජය ප්‍රකාශ කළේ. අපි ඒක දන්නවා. ඊයේ රෑ ශ්‍රී ලංකා මහ බැංකුව ඩොලරයකට රුපියල් 230ක් නියම කළා. මෙච්චර කල් කිය කියා සිටියේ ඩොලරයක් රුපියල් 200ක් පමණ වනවා කියලායි. අපි දන්නවා, සාමාන්‍යයෙන් එළියේ ඩොලරයක් හුවමාරු වන්නේ රුපියල් 260කට බව. මට මතක හැටියට, බන්දුල ගුණවර්ධන ඇමතිතුමාත් එසේ ප්‍රකාශ කළා. අපි කොච්චර කිව්වත් ඒවා පිළිගත්තේ නැතිව, රුපියල් 260කට ඩොලරයක් හුවමාරු වන අවස්ථාවක ඩොලරයේ අගය රුපියල් 230ක් කියලා ඊයේ රෑ කිව්වාම මේ ප්‍රශ්නය විසඳෙනවාද කියලා මා මේ අවස්ථාවේ රජයෙන් අහනවා. විශේෂයෙන්ම මේ රටේ සංචිත

***** *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

විනාශ කරගෙන, ශ්‍රී ලංකා මහ බැංකුවේ තිබෙන රන් සංචිතයත් විකුණලා, ඒ ඔක්කොම නැති කරගෙන, ශ්‍රේණිගත කිරීම තුළින් මේ රට පහළටම ඇද දමලා අන්තිමේදී අපේ රුපියල බාල්දු කරන්න මේ රජය සමත් වුණා.

අද වන කොට රුසියාව යුක්රේනය ආක්‍රමණය කරමින් තිබෙනවා. අද ලෝක වෙළෙඳ පොළේ බොර තෙල් බැරලයක මිල ඇමෙරිකානු ඩොලර් 130ක් දක්වා ඉහළ ගිහින් තිබෙනවා. රුපියල බාල්දු කිරීමේ බර, ලෝක වෙළෙඳ පොළේ ඉන්ධන මිල වැඩි වීමේ බර හෙට අනිද්දා වන කොට අපේ රටේ ජනතාවට දෙන්න රජය ලෑස්ති වෙනවා. ඒ වාගේම ඉදිරියේදී විදුලි ගාස්තුව සංශෝධනය කරන්නට සැලසුම් කරගෙන යනවා කියලා ආරංචි මාර්ගවලින් අපට දැන ගන්න ලැබී තිබෙනවා. ඉන්ධන මිල ඉහළ යෑමත්, ගල් අඟුරු මිල ඉහළ යෑමත්, ඩොලරයේ අගය රුපියල් 230 දක්වා වැඩි වී රුපියල බාල්දු වීමත් නිසා ඉතාම දුෂ්කර තත්ත්වයක සිටින ජනතාවට විදුලි බිලෙනුත් විදුලි සැර වදින්න නියමිතයි. අපේ රටට ආනයනය කරන සියලු භාණ්ඩ වර්ගවල මිල ගණන් මේ තුළින් ඉහළ යනවා. අපි ඩොලර්වලින් ගත්ත ණය, රුපියල්වලින් ගෙවන්න තිබෙන නිසා ඉදිරියේදී ජනතාවට තවත් බදු පනවන්න රජය සැලසුම් කරන්න පටන්ගෙන තිබෙනවා. මා හිතන හැටියට, මේ තුළින් මේ රටේ ජනතාවට සිද්ධ වෙන්නේ, ගහෙන් වැටුණු මිනිහාට ගොනා ඇන්නා හා සමාන දෙයක්. ඒ ගොනා තමයි ශ්‍රී ලංකා මහ බැංකුවේ ගොනා. මහ බැංකුවේ ගොනා අපේ රටේ සංචිත විනාශ වන කල්, ශ්‍රේණිගත කිරීම්වලින් අපේ රට පහළට ඇද වැටෙන කල් බලාගෙන සිටියා. අපගේ විදේශ ශ්‍රමිකයන් උපයා ගත් ඩොලර්, යූරෝ බැංකු මාර්ගයෙන් නැතිව -කරන්න දෙයක් නැති හින්දා- වෙනත් මාර්ගවලින් මේ රටට ගෙනෙන්න සිද්ධ වුණු හින්දා තමයි ඩොලර් හිඟයක් ඇති වුණේ. මෙය මේ රජය විසින්, මහ බැංකුව විසින් නිර්මාණය කරන ලද ප්‍රශ්නයක් හැටියට තමයි අපි දකින්නේ. ඒ හින්දා මෙහි වගකීම සහ බර ජනතාවට දෙන්න එපා කියලා තමයි අපට මේ වෙලාවේ රජයට කියන්න සිද්ධ වෙන්නේ. මේ බර දිගින් දිගටම මේ රටේ ජනතාවට දෙන්න පටන් ගන්නා නිසා අපි මාර්තු මාසයේ 15වන දා ජනතාව කොළඹට ගෙනැල්ලා දැවැන්ත උද්ඝෝෂණයක් කරන බව මම මේ අවස්ථාවේදී මතක් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

මා කියන්න බලාපොරොත්තු වන අනෙක් කාරණය තමයි, අපේ රටේ සිදු වූ පාස්කු ඉරු දින ප්‍රහාරය පිළිබඳ විමර්ශන. කාදිනල්තුමා පාස්කු ප්‍රහාරය පිළිබඳ සාධාරණ විමර්ශනයක් දිගින් දිගටම ඉල්ලනවා අපි දැක්කා. එතුමා කිව්වා, ඒ සම්බන්ධයෙන් ලංකාවේදී සාධාරණයක් ඉටු වුණේ නැත්නම් කතෝලික සභාව ඇතුළු ඒ සියලුදෙනා ජාත්‍යන්තරයට යනවා කියලා. කාදිනල්තුමා දැන් ජිනීවා ගිහින් තිබෙනවා. ජිනීවාහි, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සලය ඉස්සරහට ගිහින් එතුමා ඉල්ලා තිබෙනවා, එම ප්‍රහාරය පිළිබඳ සාධාරණ පරීක්ෂණයක් කරන්න කියලා.

හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ඊයේ රෑ "හිරු" නාලිකාවට ගිහින් කියනවා අපි දැක්කා, එතුමාගේ නම ජනාධිපති කොමිෂන් සභා වාර්තාවට දැම්මේ මේ රජය බව. මේ රජය අද උදේ වනතුරුත් ඒකට උත්තරයක් දුන්නේ නැහැ. ඒක ඉතාම බරපතළ ප්‍රකාශයක්. මෛත්‍රීපාල සිරිසේන හිටපු ජනාධිපතිතුමා මේ රජය තුළ ඉඳගෙන, මේ රජයට සහයෝගය දක්වමින්, මේ රජයට සහයෝගය දක්වන ප්‍රධාන පක්ෂයක් වන ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරමින් ඒ වාගේ බරපතළ ප්‍රකාශයක් කිරීම තුළින් පාස්කු ඉරු දින ප්‍රහාරය පිළිබඳ අපේ රටේ කෙරෙන විමර්ශනය වාගේම, ඒ විමර්ශන කොමිෂන් සභාවේ වාර්තාවත් බෙහෙවින්ම හෑල්ලු වුණා කියල තමයි අපට මේ අවස්ථාවේ ප්‍රකාශ කරන්න සිදුව තිබෙන්නේ. ඒ නිසා රජය ඒ පිළිබඳ ප්‍රතිචාර දක්වා, පාස්කු ඉරු දින ප්‍රහාරය පිළිබඳ ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ වාර්තාව සම්බන්ධයෙන් තිබෙන සැක දුරු කරන්නට කටයුතු කරනවාද? හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා මේ රජයේ ඉඳගෙන ඒ වාගේ ප්‍රකාශ කරන්නේ ඇයි කියලා අපි එතුමාගෙනුත් ප්‍රශ්න කරන්න ඕනෑ. මේ ආණ්ඩුව ආරක්ෂා කරන ගමන් ඒ වාගේ බරපතළ චෝදනාවක් මේ ආණ්ඩුවේ ඉන්න නායකයන්ට කිරීම තුළින් එතුමාගේ දේශපාලන විශ්වාසවන්තභාවය පිළිබඳත් අපට මහත් සැකසහිත බවක් ඇති වන බව මේ අවස්ථාවේ ප්‍රකාශ කරන්න මට සිදු වෙනවා. ඒ හින්දා ඒ පාස්කු ඉරු දින ප්‍රහාරය පිළිබඳ සාධාරණ පරීක්ෂණයක් දැන්වත් කරන්න කියලා රජයට බල කරමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි අටක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.08]

**ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ரஞ்சித் பண்டார)
(The Hon. (Prof.) Ranjith Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, බුද්ධිමය දේපළ (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳ කාරක සභා අවස්ථාවේදී බුද්ධිමය දේපළ පනතට කරනු ලබන සංශෝධන මේ උත්තරීතර සභාවට ඉදිරිපත් කරලා මේ උත්තරීතර සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා පැවැත්වෙන විවාදයට මා සහභාගි වන්නේ ඉතාම සතුටින්.

ශ්‍රී ලංකා රජය 2003 වර්ෂයේදී බුද්ධිමය දේපළ පනත සම්මත කර ගත්තා වාගේම, බුද්ධිමය දේපළ සංවර්ධනය කිරීම සඳහා මෑත වර්ෂවලදී පියවර කිහිපයක් ගත්තා. ශ්‍රී ලංකාව ලෝක වෙළඳ සංවිධානයේ සාමාජිකයෙකු වන අතර, පැරිස්, බර්න් සම්මුති, පේටන්ට් සහයෝගිතා ගිවිසුම සහ වෙළඳ ලකුණු නීති ගිවිසුම ආදි ගිවිසුම් ගණනාවක පාර්ශ්වකාරයෙක්. 2003 බුද්ධිමය දේපළ පනත ප්‍රකාශන හිමිකම් සහ අදාළ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමටත්, කාර්මික සැලසුම්, පේටන්ට් බලපත්‍ර, වෙළඳ සන්නාම, සේවා සන්නාම සහ වෙළඳ නාම වැනි විවිධ විෂයයන්ට අදාළව බුද්ධිමය දේපළ ආරක්ෂා කිරීමටත් අප විසින් යොදා ගනු ලබනවා.

මෑත වර්ෂවල ශ්‍රී ලංකාවේ සමස්ත බුද්ධිමය දේපළවලට අදාළ පරිසර පද්ධතිය අපි ක්‍රමානුකූලව වැඩි දියුණු කරගෙන තිබෙනවා. කෙසේ වෙතත්, ඵලදායී උපාය මාර්ගික ප්‍රතිපත්තියක් නොමැතිකම නීති ක්‍රියාත්මක කිරීම සහ නීති ක්‍රියාත්මක කිරීමේ ආයතන අතර සම්බන්ධීකරණය සම්බන්ධයෙන් ඇති සමහර ගැටලු අප තවදුරටත් නිරාකරණය කර ගත යුතු වෙනවා. බුද්ධිමය දේපළ අයිතියට ප්‍රමාණවත් ආරක්ෂාවක් නොමැතිකම නිසා ශ්‍රී

[ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා]

ලංකාව තුළ අපට මුහුණ දීමට සිදු වී තිබෙන සමහර ගැටලු පහසුවෙන් හඳුනා ගන්න අපට පුළුවන්.

මෘදුකාංග, චිත්‍රපට, ඇඳුම් පැළඳුම්, පාරිභෝගික නිෂ්පාදන නියෝජනය කරන විවිධ භාණ්ඩ හා සේවා සම්බන්ධයෙන් ගැටලු ඇති වෙනවා. අපි දන්නවා, ඕනෑම විදේශ වෙළෙඳ පොළක සමාගම් නාම බුද්ධිමය දේපළ අයිතිය ආරක්ෂා කිරීම සඳහා පොදු මූලධර්ම කිහිපයකට යටත්වයි ක්‍රියාත්මක වන්නේ කියලා. ඒ අනුව, අපි තවදුරටත් මේ පනත් කෙටුම්පතෙහි වැදගත්කම පිළිබඳ කරුණු සලකා බැලුවොත් අපට පෙනෙනවා, අපේ රට තුළ තිබෙන සමහර සුවිශේෂී තත්ත්වයන්ට මෙය අනුකූල විය යුතු බව. රටක් ලෙස අපට උරුම වූ සුවිශේෂී තත්ත්ව ගණනාවක් තිබෙනවා. මේ පිළිබඳව ගරු වෙළෙඳ ඇමතිතුමා එතුමාගේ කථාවේදී දීර්ඝ වශයෙන් කරුණු ඉදිරිපත් කළා. බුද්ධිමය දේපළ අයිතිය පිළිබඳ පනත් කෙටුම්පතට අප නතු කරගත යුතු දැ මේ මූලික වටිනාකම් රාමුවට අපි සම්බන්ධ කරගත යුතුයි. අද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇති සංශෝධන මඟින් මේ අවශ්‍යතාව යම් ප්‍රමාණයකට ආවරණ වන බව තමයි මාගේ විශ්වාසය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ලෝක සමාජ, ආර්ථික, දේශපාලන පරිසරය අපි හිතනවාටත් වඩා වේගයෙන් අද වෙනස් වෙමින් පවතින බව අප දකිනවා. මේ වෙනස අද වඩාත් කැපී පෙනෙන ආකාරයට කරළියට පැමිණ තිබෙන බව අපට පෙනෙනවා. සෝවියට් දේශය, නැත්නම් රුසියාව, යුක්රේනය සමඟ ඇති කරගෙන තිබෙන මේ අර්බුදය තුළින් මෙය අපි හිතුවාට වඩා වේගයෙන් කරළියට පැමිණ තිබෙනවා. 1991 වසරේ එවකට සෝවියට් දේශයේ හිටපු ජනාධිපතිවරයා පෙරෙස්ට්‍රොයිකාව ඉදිරිපත් කරමින් කරන ලද සංශෝධන හරහා නැඟෙනහිර යුරෝපයේ රටවල් සෝවියට් සමූහාණ්ඩුවෙන් බෙදී වෙන් වුණා. ඒ නිසාම එදා අපි සලකා බැලූ ගෝල දෙකක් - bipolar - කියන එක වෙනස් වෙනවා. ඇමෙරිකාව ලෝකයේ ප්‍රධාන බලවතා බවට පත් වුණා. අද රුසියාව සමඟ ආසියාව, -ජපානය හැර- අප්‍රිකාව සහ ලෝකයේ වෙනත් රටවල් එකට ගොනු වෙලා තිබෙන බව අපට පෙනෙනවා. යුරෝපාකරයේ සමහර රටවල් සහ ඇමෙරිකා එක්සත් ජනපදය එක තැනකට තල්ලු වෙලා තිබෙනවා. ඒ නිසා ලෝක බලතුලනයේ එක්තරා විධියක වෙනසක් සිදු වෙමින් පවතිනවා. මේ නිසාම අපි ක්‍රියාවට නංවන සමහර ප්‍රතිපත්ති ක්‍රියාදාමවලත් විශාල වෙනසක් ඇති වන්නට පුළුවන් බව අපට පෙනෙනවා. මීට පෙර කථා කළ ගරු නිරෝෂන් පෙරේරා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද සමහර අදහස් තුළ මේ කාරණා ගැබ්ව තිබුණා. එතුමා කියන්න උත්සාහ කළා, සමහර දේවල් පිළිබඳ අපි ගනු ලබන තීන්දු-තීරණ අප හිතනවාට වඩා වේගයෙන් ගත යුතුව තිබෙන බව. ඒ නිසා මේ පාර්ලිමේන්තුව තුළ අපි කරන විවාද තුළ ඉස්මතු විය යුත්තේ, මෙවැනි ඉදිරිගාමී වැඩ පිළිවෙළ පිළිබඳ කාරණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ නිසාම මේ ගරු සභාව තුළ අපි සාකච්ඡාවට ගත යුත්තේ, මේ රටේ ඉදිරි ගමන තීරණාත්මක ලෙස තීන්දු කළ හැකි ප්‍රතිපත්තිමය තීරණ පිළිබඳව පමණයි කියන්න මා මෙය අවස්ථාවක් කර ගන්නවා. එසේ නැතිව එකිනෙකාට බැන අඬගසා ගැනීම මඟින් මේ රට අද පත් වී තිබෙන බැරෑරුම් තත්ත්වයෙන් ගොඩ ගැනීමට අපට පුළුවන්කමක් නැහැ.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් තිබෙනවා.

[பி.ப. 2.16]

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று சர்வதேச மகளிர் தினமாகும். எங்களுடைய நாட்டிலே மொத்தச் சனத்தொகையில் 52 சதவீதம் மகளிர்! அதேபோல, மொத்த வாக்காளர்களில் 56 சதவீதம் மகளிர்! இன்று இந்த நாட்டிலே ஏற்பட்டிருக்கின்ற டொலர் பிரச்சினையுடன் பொருளாதாரத்தில் ஏற்பட்டிருக்கின்ற சரிவையும் நாங்கள் காண்கின்றோம்.

இந்த மகளிர் தினத்திலே நான் இங்கு ஒரு விடயத்தை ஞாபகப்படுத்த வேண்டும். அதாவது, இந்த நாடு சுதந்திர மடைந்ததிலிருந்து இன்றுவரை நாட்டினுடைய பொருளா தாரத்தைக் கட்டியெழுப்புவதற்கு அளப்பரிய பங்காற்றி வருபவர்கள் மலையக சமூகத்தைச் சேர்ந்த எங்களது தாய்மார் களும் சகோதரிகளுமாவர். இந்த நாட்டுக்கு ஆடை ஏற்றுமதிமூலமாக டொலர் வருமானம் வருவதற்கு முன்னர், உல்லாசப் பயணத்துறைமூலம் டொலர் வருமானம் வருவதற்கு முன்னர், வெளிநாட்டு வேலைவாய்ப்புமூலம் டொலர் வருமானம் வருவதற்கு முன்னர், இந்த நாட்டின் பொருளா தாரத்தைக் கட்டியெழுப்புவதற்குரிய டொலர் வருமானத்தை உழைத்துத் தந்ததில் முக்கிய பங்காளிகளாக இருந்தவர்கள் எங்களுடைய தாய்மார்களான மலையகப் பெண்கள்தான். அதற்காக அவர்கள் இரத்தம் சிந்தி நாள்தோறும் தொழிலில் ஈடுபட்டார்கள். ஆனால், இந்த நாடு அவர்களுக்கு என்ன செய்திருக்கின்றது? இந்த நாட்டிலேயிருந்த அரசாங்கங்கள் என்ன செய்திருக்கின்றன? இன்றும்கூட, அவர்கள் தொழில் செய்கின்ற இடங்களிலே சாதாரண மலசலகூட வசதி, ஓய்வறை போன்ற வசதிகள்கூட இல்லாத ஒரு நிலைமையே காணப்படுகின்றது. அந்த மலையகப் பெண்களுக்குக் காட்டப்பட்ட பாகுபாடு - வேறுபாடு - இந்த மோசமான அரசாங்கத்தினது வீழ்ச்சிக்கு ஒரு காரணமோ? என எண்ணத் தோன்றுகின்றது. விசேடமாக, இன்று இந்த நாட்டிலே -

මම විශේෂයෙන්ම කියන්න කැමැතියි, අද වෙනකොට කිලෝග්‍රෑම් 12.5ක ලාෆ් ගෑස් සිලින්ඩරයක මිල රුපියල් 640කින් වැඩි කරලා රුපියල් 3,510ට විකුණන බව. වෙළෙඳ ඇමතිතුමාත් මේ ගරු සභාවේ සිටින අවස්ථාවේ මම දැනගන්න කැමැතියි, ඒ සඳහා අනුමැතියක් ලබා දීලා තිබෙනවාද කියලා. රජය විසින් කිසිම වාර්තාවක් ඉදිරිපත් කරලා නැහැ, ගෑස් මිල වැඩි කර තිබෙනවා කියලා. නමුත් අද ගෑස් සිලින්ඩරයක් අළෙවි වෙන්නේ රුපියල් 3,510ට. අපට ආරංචි විධියට ලිට්‍රෝ ගෑස් හෙට වෙනකොට ලැබෙයි. ජනතාව වෙනුවෙන් අපි අහන්න ඕනෑ, මේ විධියට ගෑස් මිල වැඩි කළේ කවුද, නැත්නම් එසේ මිල වැඩි කිරීමේ බලය තිබෙන්නේ කාටද කියලා. රජයක් හැටියට ඒ පිළිබඳ හරියාකාර විස්තර ඉදිරිපත් කරන්න ඕනෑ. මේ නිසා විශාල කළු කඩ ව්‍යාපාරයක් අද රට තුළ නිර්මාණය වෙලා තිබෙන බව අපි දන්නවා. මේකට හේතුව වන්නේ රජය විසින් පසුගිය කාලය පුරා ගත් තීරණවල, ප්‍රතිපත්තිවල තිබෙන අඩුපාඩුකම්. ඒ අඩුපාඩුකම් සමඟ රුපියලේ අගය සම්පූර්ණයෙන්ම කඩා වැටී තිබෙන බව අද අපි දකිනවා. ඊයේ වෙනකොට ඩොලරයේ අගය රුපියල් 230 දක්වා ඉහළ ගිහින් රුපියල පහත වැටී තිබෙනවා. රුපියලේ අගය දිගින් දිගටම පහත වැටෙන කොට, අපේ ආර්ථිකයට එයින් මේ තරම් දුර බලපෑමක් එන්න කලින් අපි කිව්වා, මේ පිළිබඳව තීරණයක් ගන්න කියලා. නමුත් ඒ සෑම අවස්ථාවකදීම රජය කල් මරමින් කටයුතු කළ නිසා, ඒ සම්පූර්ණ කඩා වැටීම සිදු වුණාට පසුව ආයෙත් මුලටම යන බවක් අපි දැක්කා. ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය වැටීමත් ඒ අනුව තමයි සිදු වෙලා තිබෙන්නේ.

අද ජාත්‍යන්තර කාන්තා දිනය. අද වෙනකොට මේ රටේ කාන්තාවන් සම්පූර්ණයෙන්ම පීඩාවට පත් වෙලා සිටින බව අපි දන්නවා. දෛනිකව තම පවුල බලා ගැනීම, අවශ්‍ය ආහාර ටික හදා ගැනීම, දරුවන්ට අවශ්‍ය අධ්‍යාපනය ලබා දීම යන මේ සියලු කටයුතු කාන්තාවන් විසින් සිදු කළ යුතුව තිබෙනවා. නමුත් අද ගෑස් නැහැ; විදුලිය නැහැ; ඩීසල්-පෙට්‍රල් නැහැ. අද මේ තත්ත්වයට රට පත් වෙලා තිබෙනවා. මේවායේ මිල වැඩි කරන්නේ කවුද? එහෙම නැත්නම් මේවා පිළිබඳ වගකීම ගන්නේ කවුද? ඒවාට පිළිතුරු ලබා දෙන්න කියලා අපි රජයට බල කරනවා. සමඟි ජන බලවේගය හැටියට අපි ලබන 15 වැනි දා කොළඹට රැස් වෙනවා. එදින කොළඹට ඇවිත් එයට සහයෝගය ලබා දීලා, මේ රජයට එරෙහිව, මේ කළු කඩ ව්‍යාපාරයට එරෙහිව, මේ සිදු කරන මිල වැඩි කිරීම්වලට එරෙහිව, මේ සිදු කරන ප්‍රෝඩාවට එරෙහිව නැඟී සිටින්න කියා අපි කාන්තාවන්ගෙන් විශේෂ ඉල්ලීමක් කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (මහාචාර්ය) චරිත හේරත් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.21]

**ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) சரித்த ஹேரத்)
(The Hon. (Prof.) Charitha Herath)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද බුද්ධිමය දේපළ (සංශෝධන) පනත් කෙටුම්පත දෙවන වර කියැවීමේ විවාදයට සහභාගිවන්නට ලැබීම ගැන මා ඉතා සන්තෝෂයට පත් වෙනවා. විශේෂයෙන්ම රටක ඉතාම වැදගත් ක්ෂේත්‍රයක් තමයි බුද්ධිමය දේපළ - intellectual property - කියන්නේ.

අපි නිදහස ලබා ගත්තා කියලා උදන් ඇනුවාට, රටක් විධියට බුද්ධිමය දේපළ අතින් ශක්තිමත් නීති පද්ධතියක් සහ ශක්තිමත් අයිතිවාසිකමක් පිළිබඳව අපට කියන්න බැරි වුණොත්, අපි ඒ නිදහස ලබා ගැනීමේ ඒ තරම් අර්ථයක් නැහැ. ගරු වෙළෙඳ ඇමතිතුමාත් මේ වෙලාවේ ගරු සභාවේ සිටිනවා. එතුමා මේ විෂය සම්බන්ධව මේ රටේ ඉතා වැදගත් බුද්ධිමය දායකත්වයක් ලබා දුන් ඇමතිවරයෙක්.

විශේෂයෙන්ම, භෞතික සීමා, එහෙම නැත්නම් locations සම්බන්ධ කාරණය මුල් කරගෙන බුද්ධිමය දේපළ පනතට මෙම සංශෝධනය කිරීමට මැදිහත් වීම ගැන මා ඉතාම සතුටට පත් වෙනවා. හැබැයි, ඊට එහා ගිය බරපතළ වැඩ කොටසක් මේ විෂය සම්බන්ධව තිබෙනවා.

මේ විෂය, කර්තෘ භාග - copyright - සම්බන්ධ නීතිය සහ බුද්ධිමය දේපළ සම්බන්ධ නීතිය කියන්නේ අපේ රටේ වැඩ නොකළ ක්ෂේත්‍රයක්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. එම නිසා අපට මෙහි විශාල වැඩ කොටසක් කරන්න තිබෙනවා. අපේ රටේ විශ්වවිද්‍යාල පද්ධතිය නියෝජනය කළ, ඒ වාගේම නියෝජනය කරන කෙනකු විධියට මා කියනවා, රට තුළට මුදල් ගලාගෙන එන, රට තුළට ගෞරවයක් ලබාදෙන ආකාරයට අපේ රට තුළ බිහිවන නව නිර්මාණවලට මේ රට තුළ නීත්‍යානුකූල තත්ත්වයක් ලබා දෙන්න අපට බැරි වෙලා තිබෙන බව. 'බුද්ධිමය දේපළ' කියන සංකල්පයත් එක්ක ගැට ගැහුණු විශාල කරුණු රැසක් මේ ඩිජිටල් අවකාශය බිහිවීමත් සමඟ ඇවිත් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, පුද්ගලයකුගේ physical existence එකට වඩා වැදගත් වෙන්නේ ඩිජිටල් පැවැත්මයි කියලා ඔබතුමියත් දන්නවා ඇති. ඔබතුමියට, ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමාට, අපට වැදගත් වන්නේ භෞතිකව - physically - කොච්චර හොඳට හිටියාද, නැද්ද කියන එක නොවෙයි. විශේෂයෙන්ම digitally අපේ පැවැත්ම කරගෙන යන්නේ කොහොමද කියන එකයි වැදගත් වන්නේ. ඒ නිසා තමයි මේ කාලයේ ඔබතුමිය, අපේ අනිකුත් මන්ත්‍රීතුමන්ලා ඇතුළු අප කාටත් අපේ ඩිජිටල් පැවැත්ම නිර්මාණශීලිව කරගෙන යන්න විශාල මහන්සියක් දරන්න සිදු වෙලා තිබෙන්නේ, විශාල මැදිහත්වීමක් කරන්න සිදු වෙලා තිබෙන්නේ. ඒ නිසා අපි මේ බුද්ධිමය දේපළ පනතට සංශෝධන ගේන විට අලුත් තත්ත්ව සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතුයි. මම ගරු ඇමතිතුමාට කියන්න කැමැතියි, විශේෂයෙන්ම copyright law and social media කියන විෂය අපි තවම ස්පර්ශ කරලාවත් නැති බව. අපි කොම්පියුටර් තාක්ෂණය ගැන, දත්ත ගැන, information ගැන, communication ගැන සමහර නීති-රීති හදලා තිබෙනවා. හැබැයි, කර්තෘ භාග නීතිය සහ සමාජ මාධ්‍ය - copyright law and social media - සම්බන්ධ විෂයය ගැනත් අපි රටක් විධියට විශාල වශයෙන් සාකච්ඡා කළ යුතුයි. ඒ වාගේම අපි මේ සඳහා නෛතික පද්ධති සකස් කළ යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ රටේ තරුණ සමාජයට තමන්ගේ බුද්ධියෙන් ඩිජිටල් ලෝකය ඇතුළේ ශක්තිමත්ව තම ව්‍යාපාර කරන්න පුළුවන් platforms, එහෙම නැත්නම් ඒ ක්ෂේත්‍රය අපි නෛතිකව හදලා දෙන්න ඕනෑ. මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන අපේ වගකීමක් වෙනවා, ඈත ගම්වල සිටින තරුණ තරුණියන් ඩිජිටල් අවකාශය ඇතුළේ කරන්න බලාපොරොත්තු වන ව්‍යාපාරික කටයුතුවලට ඉඩ හදලා දෙන්න පුළුවන් නීති හදන එක. අද වෙනකොට රටක් විධියට අපට PayPalවත් අනුමත කර ගන්න බැරි වෙලා තිබෙනවා. -මම මේ එක ආණ්ඩුවක් ගැන නොවෙයි කියන්නේ- මේ නිසා අද රටක් විධියට අපි ඩිජිටල් අවකාශයේ තරගයෙන් පස්සට ගිහින් තිබෙනවා. මේ වනකොට ඉන්දියාව, චීනය වාගේ අපට ආසන්න රටවල් මේ ක්ෂේත්‍රය සමඟ වේගයෙන් ඉදිරියට ඇවිත් තිබෙනවා. අපේ රටේ එහෙම නොවන්නේ අපේ තරුණ දරුවන්ගේ බුද්ධියේ ප්‍රශ්නයක් නිසා නොවෙයි. ඒ විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වූ අපේ නෛතික වපසරිය මේ ආයතනය නියෝජනය කරන මන්ත්‍රීවරු විධියට අපි පළල් කරපු නැති නිසායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමාත් ඉන්න වෙලාවේ මම කියන්නේ විශේෂයෙන්ම සමාජ මාධ්‍ය හා සම්බන්ධ කරගත් copyright law පිළිබඳව අලුත් කතිකාවක් අපි ආරම්භ කළ යුතුව තිබෙන බවයි. ඒ සඳහා අපට ඩිජිටල් කටයුතු සම්බන්ධ ඇමතිවරයෙකුත් ඉන්නවා. ඒ වාගේම ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමාත් ඉන්නවා. ඔබ දෙපළට පුළුවන්, මේ ප්‍රශ්නය ගැන පළල් සාකච්ඡාවක් කරලා අපේ රටේ තරුණ දරුවන්ට බය නැතිව මේ ඩිජිටල් අවකාශය තුළ ඔවුන්ගේ ව්‍යාපාරික කටයුතුවලට අවශ්‍ය බුද්ධිමය මැදිහත්වීම කරන්න පුළුවන් තැනකට ගෙන යන්න. විශේෂයෙන්ම ඉන්දියාව සහ චීනය වැනි විශාල රටවල් දෙකක් ආසන්නයේ අපි සිටින නිසා අපට ඒ සඳහා ලොකු ඉඩකුත් ලැබී තිබෙනවා. හැබැයි, අපට ඒ ඉඩ පාවිච්චි කරන්න පුළුවන් වෙන්නේ අපේ නෛතික තත්ත්වය වර්ධනය වුණොත් තමයි.

අද ජාත්‍යන්තර කාන්තා දිනය. අද මේ රටේ කාන්තාවන් විශාල වශයෙන් ඩිජිටල් අවකාශය තුළ අයිතිවාසිකම් පිළිබඳ ප්‍රශ්නයකට ලක් වෙලා සිටිනවා. අද කාන්තාවන්ට අපහාස කිරීම්, උපහාස කිරීම්, පහර දීම්, යටපත් කිරීම් විශාල වශයෙන් සිදු වෙනවා. මේවා නවත්වන්න පුළුවන් වෙන්නේ අප අතර

[ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා]

එකඟතාවක් ඇති වුණොත් පමණයි. මේ සඳහා අපි නිර්මාණාත්මකව ඉදිරිපත් කරන සමහර එකතු කිරීම් නෛතිකව සිදු කරන්නේ කොහොමද කියා සොයා බැලිය යුතුයි.

මම මේ අවස්ථාවේදී වාර්තා වීම පිණිස මෙම කරුණ කියන්න ඕනෑ. Berne Convention for the Protection of Literary and Artistic Works කියලා එකක් තිබෙනවා. මේකට කියන්නේ Berne Convention කියලා. අද වන විට මේ Berne Convention එකට මුළු ලෝකයේම විශාල ඉඩක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඇමෙරිකා එක්සත් ජනපදය Copyright Act of 1976 කියලා විශාල වැදගත්කමකින් යුතු පනතක් ගෙනාවා. ඒ වාගේම එක්සත් රාජධානිය Copyright, Designs and Patents Act කියලා වැදගත් පනතක් 1988දී ගෙනාවා.

ඒ වාගේම 1968දී ඕස්ට්‍රේලියාවත් Copyright Act කියලා ඉතා වැදගත් පනතක් ගෙනාවා. ඇමෙරිකාව, ඕස්ට්‍රේලියාව සහ එංගලන්තය කියන රටවල් තුනෙහි තිබෙන ඒ පනත් තුනෙහි විශාල වැදගත්කමක් අපටත් තිබෙනවා. ගරු ඇමතිතුමාට මම මේ කරුණු කියන්නේ ඩිජිටල් අවකාශය, බුද්ධිමය දේපළ සහ copyright law සම්බන්ධව අපි කරන සාකච්ඡාවට යම්කිසි ශක්තියක් ලබා ගැනීමටයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ගරු මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමාගේ කාලයෙන් තව විනාඩි 10ක කාලයක් ඔබතුමාට දෙන්න පුළුවන්. ඔබතුමා ඒ කාලය ගන්නවාද?

**ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) சரித்த ஹேரத்)
(The Hon. (Prof.) Charitha Herath)
ගන්නවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද අපේ රට අධ්‍යාපනය පැත්තෙන් සහ වෙළෙඳ ක්ෂේත්‍රය පැත්තෙන් විශාල වෙනස්කම් රාශියකට ගමන් කරමින් ඉන්න බව මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා. ඉන්දියාව සහ චීනය වාගේ අපේ රටට විදේශ ප්‍රාග්ධනය ගලා එන රටවල් අපේ රට වටා තිබෙනවා. අද මේ බුද්ධිමය දේපළ පනත සංශෝධනය කිරීමෙන් අපට ඒ රටවල් එක්ක ගනුදෙනු කරන්න පුළුවන් මාවතක් ගැන තමයි එක පැත්තකින් ගරු ඇමතිතුමා සාකච්ඡා කරන්නේ. අපට අනන්‍ය වූ අපනයන භාණ්ඩවල පේටන්ට් අයිතිය අපටම තියාගෙන ඉස්සරහට යන්න පුළුවන් බුද්ධිමය දේපළ අයිතියක් අප සතුව තියාගන්න එක ගැනයි එතුමා සාකච්ඡා කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි හැමදෙනාම වාගේ Pizza Hut එකෙන් පීසා ගත්තාට ඒකේ පේටන්ට් අයිතිය තිබෙන්නේ ඉතාලියට. නමුත්, අද අපේ රටේ අපි නිර්මාණය කරපු ආහාරයක් තිබෙනවා, 'කොත්තු' කියලා. මම මේක කියන්නේ ඉතා වැදගත් කාරණයක් නිසායි. අපි පීසා කනවා වාගේ මේ varieties of *Kottu* නැත්නම් විවිධාංගීකරණය වූ කොත්තු කවදා හරි ලෝකයටත් යන්න පුළුවන්. අපේ රටේ මඩකලපුවෙන් 'කොත්තු' ආරම්භ වුණා කියලා තමයි අපි පිළිගන්නේ. නමුත්, අද වනතුරු කවුරුවත් මේ ආහාරයට පේටන්ට් අයිතිය අරගෙන නැහැ. අද අපේ රටේ විවිධ වර්ගයේ කොත්තු තිබෙනවා. ඒ වාගේම ඒකට විවිධ වර්ගයේ එකතු කිරීම්, අඩුකිරීම් කරලා තිබෙනවා. ලෝකයේ දියුණු රටවලත් මේ ආහාරය තිබෙනවා. නමුත්, මේ ආහාරයේ පේටන්ට් අයිතිය ලංකාවට නැහැ. එය වෙන රටකටවත් තිබෙනවාද කියලා මම දන්නේ නැහැ. ජාත්‍යන්තර වශයෙන් මේ පේටන්ට් අයිතිය ලබා ගන්නේ කොහොමද කියන එක ගැන අපට නීතියකුත් නැහැ. මම මේ කියන්නේ පීසාවලට කොත්තු replace කරනවා කියන සරල අදහසක් ගැන නොවෙයි. නමුත්, අපේ රටේ recipe එකකට අපි හදපු කෑම, එහෙම නැත්නම් මඩකලපුවෙන් ආරම්භ වෙච්ච මේ කෑම අද 'අයිස්ක්‍රීම් කොත්තුව' දක්වා වර්ධනය වෙලා තිබෙනවා. ඒ අනුව, මේක වෙනස් වූ ආහාරදාමයක් බවට පත් වෙලා තිබෙනවා. හැබැයි, පීසාවල පේටන්ට් අයිතිය ඉතාලියට තිබුණාට, හැම්බර්ගර්වල පේටන්ට් අයිතිය ඇමෙරිකාවට තිබුණාට, කොත්තුවල පේටන්ට් අයිතිය අපට නැහැ. ගරු ඇමතිතුමනි, එහෙම වෙලා තිබෙන්නේ මේ ආහාරය සම්බන්ධව පළල් සංවාදයක් අපේ රටේ නැති නිසායි. මම මේ උදාහරණයක් පමණයි කිව්වේ.

ඒ විතරක් නොවෙයි. අපේ විශ්වවිද්‍යාල පද්ධතිය මේ පිළිබඳව ඉතා වැදගත් එකතු කිරීම් කරලා තිබෙනවා. නමුත්, ඒ අය තමතමන්ගේ විශ්වවිද්‍යාල ඇතුළේ හදපු සමහර උපකරණ, සමහර නවෝත්පාදන ඉදිරියට ගෙනයන්න බැරි වෙලා තිබෙනවා. එහෙම වෙලා තිබෙන්නේ ඇයි? අපේ රටේ නවෝත්පාදනය සම්බන්ධව අමාත්‍යාංශ තිබෙනවා; නවෝත්පාදනය සම්බන්ධ අපට අදහසුත් තිබෙනවා. හැබැයි, ඒ නිර්මාණශීලිත්වය වර්ධනය වන වේගයට අපි නෛතික තත්ත්වය වර්ධනය කර ගන්නේ නැහැ. එම නිසා අපට මේවා විශාල ප්‍රශ්න විධියට තිබෙනවා. මම කලින් කියපු Berne Convention for the Protection of Literary and Artistic Works කියන Convention එක වාගේම, Agreement on Trade-Related Aspects of Intellectual Property Rights කියලා තව Agreement එකක් තිබෙනවා. අපේ ඉදිරි සාකච්ඡා සඳහා මේ දෙකම ලබා ගන්න ඕනෑ දේවල් විධියට මා මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

මම කලින් කියපු සමාජ මාධ්‍ය ඩිජිටල් අවකාශය තුළ අද අපි සිදු කරන මේ මැදිහත්වීම ඇතුළේ විශාල ව්‍යාපාරික ඉඩක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ ළඟදි මම රිදීගම ප්‍රදේශයේ පාසලකට ගිහිල්ලා ඒ පාසලේ සිටි දරුවකුගෙන් ඇහුවා, "ඔය දරුවා මොකක්ද කරන්නේ?" කියලා. Twitter social media platform එකේ business එකක් කරනවා කියලා රිදීගම, බලවත්තල කියන ඈත ගමක පාසලක ඉන්න ඒ දරුවා මට කිව්වා. මම පුදුමයට පත් වුණා. මේ සභාවේ ඉන්න ගරු මන්ත්‍රීතුමන්ලා 225දෙනාගෙන් Twitter accounts තිබෙන කී දෙනෙකු ඉන්නවාද කියලා මම දන්නේ නැහැ.

ඒක අත්‍යවශ්‍ය සාධකයක් නොවෙන්න පුළුවන්. නමුත් රිදීගම, බලවත්තල ඈත ගමේ තරුණ දරුවා Twitter platform එක හරහා ව්‍යාපාරයක් කරනවාය කියලා මට කිව්වා. හැබැයි, ඒ දරුවාට සල්ලි ගන්න බැරි වෙලා තිබෙනවා, PayPal නැති නිසා. ඒ නිසා යහළුවෙකුගේ account එකට - ඩුබායිවලට - තමයි හම්බ වෙන ඒ සල්ලි ටික යන්නේ කිව්වා. මේක කියන කාරණය තේරෙනවාද කියන්න මා දන්නේ නැහැ. මේ ඩිජිටල් අවකාශය ඇතුළේ අපි කරන ගනුදෙනු, අපි කරන ව්‍යාපාර ශක්තිමත්ව කරන්න පුළුවන් වෙන්නේ, අපි මේ ආයතනය ඇතුළේ ඉදිරිගාමී නෛතික තත්ත්වයක් හැදුවොත් විතරයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, කොයි පක්ෂය බලයේ සිටියත් media සම්බන්ධ නීති හදනකොට අපි හැම තිස්සේම බලන්නේ, media පාලනය කරන්නේ කොහොමද කියලායි. Mediaවල අය යම් තරමකට ටිකක් හෝ නිශ්ශබ්ද කරන්නේ කොහොමද කියලා තමයි කොයි ආණ්ඩු හිටියත් බලන්නේ. හැබැයි, අද ඩිජිටල් අවකාශයේ ඊට වඩා වෙනස්, ඉදිරිගාමී, ධනාත්මක මැදහත් තැනකට නීතිය ගෙන යන්න පුළුවන් වෙලා තිබෙනවා. අද අපි කාටවත් නීති දමලා

තොරතුරු එන එක වහන්න බැහැ. "තොරතුරු" අද මුළු සමාජය තුළ විකාශනය වූ බරපතළ දෙයක් බවට පත් වෙලා තිබෙනවා. මම ඒකයි කිව්වේ, අපේ physical existence එකට වඩා digital existence එක වැදගත් වන ලෝකයකට අපි ඇවිල්ලා තිබෙනවා කියලා. මෙතැන ඉන්න කොයි මන්ත්‍රීතුමා වුණත් තමන්ගේ digital existence එක අමතක කළොත්, තමන්ගේ physical existence එකේ කොච්චර හොඳ මහත්මයෙක්, නෝනා කෙනෙක් වුණත් ඒ පුද්ගලයාගේ පැවැත්ම නිමා වෙනවා. එහෙම වෙලා තිබෙන්නේ අද ලෝකය අලුත් තැනකට ගමන් කරලා තිබෙන නිසායි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ නිසා විශේෂයෙන්ම බුද්ධිමය දේපළ සම්බන්ධව, copyrights සම්බන්ධව අපේ ගරු අමාත්‍යතුමා දරපු මේ උත්සාහය ඉතාම වැදගත් කියලා මා විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම මේ රටේ ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශයේ ලේකම්වරයා වශයෙන් වැඩ කළා. අපේ රටේ කලා ක්ෂේත්‍රයේ විශාල ප්‍රශ්නයක් තිබෙනවා, බුද්ධිමය දේපළ සම්බන්ධව. තමන්ට හිමි ගීතය තමන්ගේ ගීතය නොවී වෙන කෙනෙකුගේ ගීතය විධියට download වෙන, ringing tone එකකට යන තත්තවයක් තිබෙනවා, ගරු ඇමතිතුමනි. මේක ඉතා වැදගත් ප්‍රශ්නයක්. රෝහණ වීරසිංහ මැතිතුමා වාගේ මේ රටේ වැදගත් සංගීතවේදීන්ට මේ ප්‍රශ්නයට මුහුණ දෙන්න වෙලා තිබෙනවා. යම් කෙනෙක් ගීතයක් හැදුවාට, ඒ ගීතයේ ඩිජිටල් අයිතිය වෙන කෙනෙක් ගත්තොත්, ඊට පසුව ඒ ගීතය හදපු පුද්ගලයාට ඒ ගීතයේ අයිතිය ලැබෙන්නේ නැහැ. ලෝකයේ කොච්චර පිරිසක් ඒ ගීතය download කළත්, ඒ ringing tone එක ලබා ගත්තත්, ඒ බුද්ධිමය අයිතිය ඒ ගීතය හදපු පුද්ගලයාට නැත්නම්, ඒක ප්‍රශ්නයක්. ඒ නිසා අද අපේ රටේ කලාකරුවන්ගේ වටිනා බුද්ධිමය සහ කලාත්මක වස්තු විෂයයන්, කලාත්මක දේපළ ඔවුන්ගෙන් ඈත් වෙලා ගිහිල්ලා තිබෙනවා. එය චිත්‍රපට කර්මාන්තයේත් එහෙමම තිබෙනවා. ඩී.බී. නිහාල්සිංහ මැතිතුමා ඉන්න කාලයේ අපි මේ සම්බන්ධව යමක් කරන්න විශාල මහන්සියක් දැරුවා. නමුත් ඒක කරන්න අපට බැරි වුණා. ඒ වාගේම අපේ රටේ ඉන්න සමහර කලාකරුවන් මේ සඳහා යම්කිසි මැදිහත්වීමක් සිදු කළා. නමුත් තවම ඒක හරියට කර ගන්න බැරි වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඉන්දියාව අද වනකොට මුළු නැඟෙනහිර ලෝකයේම - Eastern World එකේම - ගීත සාහිත්‍යයෙන් ඉදිරියට ඇවිල්ලා තිබෙනවා. එහෙම වෙන්න හේතුවක් තිබෙනවා. ඒ අය සාම්ප්‍රදායික ගීත සාහිත්‍යය තුළ ඉන්නවා වාගේම property rights තුළ, ඩිජිටල් අවකාශය ඇතුළේ මේ ගීත සාහිත්‍යය ඒ ගොල්ලන්ගේ එකක් කර ගන්නේ කොහොමද කියලා නීති හදන්න ලෝක් සභාවට පුළුවන්කම තිබුණා. ඒ නිසා අපේ පාර්ලිමේන්තුවෙන්, අපේ පැත්තෙන් අපි මේ ඩිජිටල් අවකාශය ඇතුළේ අපේ අයිතිය තහවුරු කරගෙන, අපේ දූ දරුවන්ට නවෝත්පාදනය හරහා ලෝකයේ වැදගත් එකතු කිරීමක් කරන්න, රටට මුදල් ලබා ගන්න, රටේ නම රටින් එළියට ගෙන යන්න පුළුවන් තැනට හැකිවන විධියට නෛතික තත්ත්වය දියුණු කරන්න වැඩ කළ යුතු කාලයක බුද්ධිමය දේපළ පනත සංශෝධනය කිරීම පිළිබඳව මාගේ සන්තෝෂය සහ ස්තුතිය පළ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි ඇත්තටම ඩිජිටල් අවකාශය සහ බුද්ධිමය දේපළ copyright law කියන නීති පද්ධතිය සම්බන්ධව අපි කරන සාකච්ඡාව මීට වඩා වෙනස් තැනකින් ආරම්භ කරන්න නම්, සමහර පිළිගැනීම් වෙනස් කරන්න වෙනවා කියලා මා හිතනවා. අපි පුංචි රටක් වුණාට අද මේ රටට තනියෙන් මොකුත් කරන්න බැහැ. අපි පුංචි රටක්. හැබැයි, මේ රට අද ලෝකයත් එක්ක ගනුදෙනු කරන තැනට ගිහිල්ලා තිබෙනවා. එහෙම වෙලා තිබෙන්නේ, මේ අලුත් ලෝක තත්ත්වය ඇතුළේ ප්‍රාග්ධනය සංසරණය වන නිසාම නොවෙයි.

"ප්‍රාග්ධනය සංසරණය වෙනවා, ශ්‍රමය සංසරණය වෙනවා, එම නිසා මේක ගෝලීයයි" කියලා තමයි ඉස්සර අපි කිව්වේ. ප්‍රාග්ධනයයි, ශ්‍රමයයි සංසරණය වන නිසා පමණක් නොවෙයි මේක ගෝලීය. මෙය මුළු ලෝකය තුළම, ගෝලීය තත්ත්වය තුළම තොරතුරු - information - ගලනය සහ තොරතුරු ගලනය කිරීමේ මාවත් ගෝලීයකරණය වීම නිසා අපට තනිවම ඉන්න බැරි, අපි ලෝකයත් එක්ක ගැට ගැහුණු රටක් බවට පත්වෙලා තිබෙනවා. එවැනි තත්ත්වයකට ආපු රටක් විධියට අපි මේ රටේ නෛතික පද්ධතිය ඊට ගැළපෙන තත්ත්වයට හදන්නට ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ සඳහා මම උදාහරණයක් කියන්නම්. අපි පෝච්චියක මල් පැළයක් සිටුවනවා. හැබැයි, පෝච්චියට ඔරොත්තු දෙන්නේ නැති ප්‍රමාණයට මල් පැළය වැඩුණොත්, අපි ඒක බිම සිටුවන්න ඕනෑ. එහෙම නැත්නම් පෝච්චිය කැඩෙනවා. ඒ මල් පැළය පෝච්චියෙන් එළියට හැදෙනවා වාගේ අපි රටක් විධියට අපේ තරුණ දරුවන්ට ලොකුවට හැදෙන්න ඉඩ දෙන්නේ නැත්තේ ඒ සඳහා ගැළපෙන නීති අපි හදලා නැති නිසායි. එම නිසා, විශේෂයෙන්ම 2003 අපේ පැරණි ආණ්ඩුව කාලයේ හදපු පනතට අලුතින් පොඩි සංශෝධනයක් හරි ඉදිරිපත් කරලා මේ සංවාදය ඉදිරියට ගේන්න වෙළෙඳ ඇමතිතුමා දරපු උත්සාහයට මගේ ස්තුතිය ප්‍රකාශ කරන ගමන්, අපේ රටේ ඉතාම වැදගත් කලාපයක සංවාදයක් මේ හරහා විවෘත කරගෙන අපි අපේ දරුවන්ට ඩිජිටල් අවකාශය තුළ නවෝත්පාදනය සහ නව ව්‍යාපාර කරන්න පුළුවන් නෛතික තත්ත්වයක් හදන්න කටයුතු කළ යුතුයි. ඒක කළ හැකි ආයතනය වශයෙන් මේ පාර්ලිමේන්තුවේ පක්ෂ සියල්ලම එකට එකතුවෙලා වැඩ කරමු කියා යෝජනා කරමින් මගේ වචන ස්වල්පය නිමා කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.39]

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද ගරු ඇමතිතුමා ඉදිරිපත් කර තිබෙන බුද්ධිමය දේපළ (සංශෝධන) පනත් කෙටුම්පතේ අඩංගු කරුණුවලට අපේ එකඟතාව පළ කරනවා.

ඒ වාගේම, විශේෂයෙන්ම කලා ක්ෂේත්‍රයේ බොහෝ පිරිසක් මුහුණ දී තිබෙන ගැටලුවක් පිළිබඳව ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවනවා. ගායක ගායිකාවන් සම්බන්ධයෙන් ගත්තොත්, ඒ අයගේ ගීතවල අයිතිය තවමත් ඔවුන්ට ලැබිලා නැහැ. අපි බොහෝ වෙලාවට බුද්ධිමය දේපළ පනත් හදලා තිබෙන්නේ කොහේ හෝ විදේශ රටක තිබෙන එකක කාබන් කොපියක් විධියට. එවැනි එකක් තමයි ලංකාවට ආදේශ කරලා තිබෙන්නේ. යම් යම් අලුත් ඇතුළු කිරීම් කළා වුණත්, ඇත්තටම මුල් පිටපත විදේශ රටවල හදපු එකක්. විදේශ රටවල සංස්කෘතියයි, අපේ රටේ සංස්කෘතියයි සම්පූර්ණයෙන්ම වෙනස්. අපේ රටේ තිබෙන බුද්ධිමය දේපළ පනතට අනුව, දැනටත් ඕනෑම ගීතයක නෛතික අයිතිය තිබෙන්නේ ගීත රචකයාට සහ සංගීත අධ්‍යක්ෂවරයාට පමණයි. ගායකයාට හෝ ගායිකාවට ඒ අයිතිය නැහැ. මේක බලවත් අසාධාරණයක්. ගායක ගායිකාවන්ගේ පැත්තෙන් මේ දුක්ගැනවිල්ල කාලයක් තිස්සේ විවිධ ආණ්ඩුවලට ඉදිරිපත් කරලා

[ගරු විජිත හේරත් මහතා]

තිබෙනවා. නමුත්, තවමත් බැරිවෙලා තිබෙනවා ඒ සංශෝධනය නියමාකාරයෙන් කර ගන්න. අපි දන්නවා, සාමාන්‍යයෙන් අපේ රටේ, අපේ සංස්කෘතිය තුළ අපි කාගේ හෝ සිංදුවක් අහනකොට එම ගීතය ගායනා කරන ගායකයාගේ නමින් තමයි අපට ඒක මතක් වෙන්නේ. මේක අභයලාගේ ගීතය, සුනිල් එදිරිසිංහ මහත්මයාගේ ගීතය, නන්දා මාලනී මහත්මියගේ ගීතය කියලා ඒ විධියට තමයි ජන ව්‍යවහාරයේ පවතින්නේ. නමුත්, නෛතික අයිතිය ගත්තොත්, ඒක එහෙම නොවෙයි. ඒ නිසාම විවිධ ගැටලුවලට මුහුණ දීලා තිබෙනවා. ගීතයක් ප්‍රචාරය කිරීමේදී ගායක ගායිකාවන්ට යම් පංගුවක් ලැබී තිබෙනවා. නමුත්, නෛතික අයිතිය ගීත රචකයාට, සංගීත අධ්‍යක්ෂවරයාට වාගේම ඒ ගායකයාට හෝ ගායිකාවටත් ලැබෙන පරිදි මෙම පනත සංශෝධනය විය යුතුයි කියන යෝජනාව නැවත ඔබතුමාගේ අවධානයට යොමු කරනවා.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා ඉතා වැදගත් කරුණක් මතු කරන්නේ. විෂය භාර අමාත්‍යවරයා වශයෙන් ගීතවල කර්තෘභාගය පිළිබඳ ප්‍රකාශන හිමිකම සම්බන්ධයෙන් මම ගැසට් නිවේදනයක් නිකුත් කරලා, එම සංගම් සමඟ සාකච්ඡා කරලා, ගීතයක ප්‍රකාශන හිමිකම පිළිගෙන ගීත රචකයාට එක කොටසකුත්, සංගීතඥයාට එක කොටසකුත්, ඊළඟට ගායකයාට හෝ ගායිකාවට එක කොටසකුත් කියලා සමාන ලෙස කොටස් තුනකට බෙදලා තමයි කර්තෘභාගය ගෙවන්න කටයුතු කරලා තිබෙන්නේ. ඔබතුමා අදහස් කරන "අයිතිය" කියන එකෙන් මොකක්ද කියන්නේ කියලා මට වැටහෙන්නේ නැහැ.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

ගරු ඇමතිතුමනි, ගුවන්විදුලියේ හෝ රූපවාහිනියේ ගීතයක් ප්‍රචාරය වීමේදී ඔබතුමා කියන තත්ත්වය තිබෙනවා. නමුත්, ගරු චරිත හේරත් මන්ත්‍රීතුමා මතු කළා වාගේ, යම් ගායකයකුගේ හෝ ගායිකාවකගේ ගීතයක් තවත් කෙනෙකු ගායනා කරනකොට, එතැනදී එහි අයිතිය පිළිබඳව අර කියන ගායකයාට හෝ ගායිකාවට පෙනී සිටින්නට බැහැ. එම නිසා එතැන නෛතික ගැටලුවක් තිබෙනවා.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)

ඒ පිළිබඳව මම ඔබතුමා එක්ක කථා කරන්නම්, ගරු මන්ත්‍රීතුමා.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලීමක් මේ කරන්නේ. මම හිතන්නේ ගායක ගායිකාවන්ගේ පැත්තෙනුත් දිගටම මේ ගැන ඉල්ලීම් කරනවා. ගීත ප්‍රචාරයේදී ඒ වාර ගණන අනුව යම්කිසි දීමනාවක් ලැබෙනවා. යම් ගීතයක් දවසකට අවස්ථා ගණනාවක් ප්‍රචාරය වුණාම ගුවන් විදුලි සංස්ථාවෙන් පුංචි මුදලක් ලැබෙනවා. ඇත්තටම ඒ මුදල රුපියල් ශතවලින් බැලුවාම සොච්චම් මුදලක්. ඒ මුදල ප්‍රමාණවත් නැහැ. ඒක වෙනම ප්‍රශ්නයක්. නමුත් ගීත රචකයාට සහ අධ්‍යක්ෂවරයාට විතරක් අයිතිය තිබෙනකොට තවත් කෙනෙකු යොදවලා, ඒ ගීතය ගායනා කරන්න පුළුවන්. එතකොට මුල් ගායකයාට ඒ ගීතයේ අයිතිය හිමි වන්නේ නැහැ. එහෙම වෙච්ච අවස්ථාවලට උදාහරණ ගොඩක් තිබෙනවා. එම නිසා කරුණාකරලා ඒ සම්බන්ධයෙන් මැදිහත් වෙන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද ජාත්‍යන්තර කාන්තා දිනය. අද අපේ රටේ කාන්තාවන් ප්‍රශ්න ගණනාවකට මුහුණ දීලා තිබෙනවා. අද ගෑස් නැහැ; විදුලිය නැහැ. කාන්තාවන් මේ අර්බුදයට මුහුණ දීලා තිබෙන්නේ ඇත්තටම ආණ්ඩුවේ බුද්ධිය පිළිබඳ ප්‍රශ්නයක් නිසායි. බුද්ධිමය දේපළ පිළිබඳව කථා කරනකොට විශේෂයෙන් අපට ආණ්ඩුවේ බුද්ධිය පරීක්ෂා කරන්න සිදුවෙලා තිබෙනවා. මොකද, දිගින් දිගටම බිත්තර ප්‍රහාර සිදු වනවා. සජබ ප්‍රධාන කාර්යාලයටත් ඊයේ උදෑසන බිත්තර ප්‍රහාරයක් එල්ල වුණා. අපි ඒ ප්‍රහාරය සම්පූර්ණයෙන්ම හෙළා දකිනවා. එවැනි අමනෝඥ වැඩ කරන්නේ ආණ්ඩුවේ බුද්ධිය නැති වෙලාද? දැන් මේ ආණ්ඩුවේ බුද්ධියට මොකද වෙලා තිබෙන්නේ? *[බාධා කිරීමක්]* කළ ගෙඩියක් වාගේ ඔළු ගෙඩියක් තිබුණාට බිත්තරයක් විතර වෙච්ච මොළ ගෙඩිය නිසා දැන් බුද්ධියත් අඩු වෙලා තිබෙනවා. ඒ නිසා හැම තැනම දැන් බිත්තර ප්‍රහාර තමයි සිදු වන්නේ. කලගෙඩිහේනෙත් බිත්තර ප්‍රහාරයක් සිදු වුණා; ඊයේ-පෙරේදාත් බිත්තර ප්‍රහාර සිදු වුණා. මේ ආණ්ඩුව, බිත්තර ආණ්ඩුවක් බවට පත් වුණේ කොහොමද? ඒ නිසා බුද්ධිමය දේපළ පනත සංශෝධනය කරන්න කලින් ආණ්ඩුවේ බුද්ධිය පරීක්ෂා කරන ක්‍රියාමාර්ගයකට ඉක්මනට ගියොත් හොඳයි. මොකද, මේ ප්‍රශ්නය දිගින් දිගටම සිදු වුණොත් ඒක බරපතළ ප්‍රශ්නයක් වනවා. අන්තිමට ආණ්ඩුවේ බුද්ධිය හීනවෙලා, ඥානා අක්කාගේ බුද්ධියට අනුව තමයි ආණ්ඩුව රට පාලනය කරන්නේ. දැනට ඒ තත්ත්වයට අපේ රට පත්වෙලා තිබෙනවා. ඒක ඉතා අවාසනාවන්ත තත්ත්වයක්. අන්තිමට මේ රට ඥානා අක්කාගේ මොළ ගෙඩියේ ප්‍රමාණයට සාපේක්ෂව පාලනය කරන තැනකට ආවොත්, රටේ අනාගතයට අබ සරණයි! කියලා තමයි කියන්න වෙන්නේ. ඒ නිසා වහාම මේ බිත්තර ප්‍රහාර නතර කරන්න. බිත්තරයක් මට්ටමට මේ ආණ්ඩුවේ මොළ ගෙඩිය පහතට වැටීම පිළිබඳව අපි කනගාටු වනවා. බුද්ධිමය දේපළ ආරක්ෂා කරද්දී, රටේ ජනතාවගේ බුද්ධිය ආරක්ෂා කරන්න පෙරාතුව ආණ්ඩුවේ බුද්ධිය පරීක්ෂා කරන විධිමත් පරීක්ෂණයක් වහාම පවත්වලා, බුද්ධිය නිවැරැදි තැනකට ගෙනෙන්න කටයුතු කරන්න කියා මම අවධාරණය කරනවා. විශේෂයෙන්ම අපේ රටේ ගායක ගායිකාවන්ගේ ගීතවල නෛතික අයිතිය තහවුරු වන විධියට බුද්ධිමය දේපළ පනත සංශෝධනය කරන්න ඉදිරි පියවර ගැනීමට හැකියාව ලැබේවායි කියා ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නලින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 18ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.46]

**ගරු නලින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு நலின் பர்னாந்து)
(The Hon. Nalin Fernando)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් කටයුතු කරන්න කලින් -2000 වර්ෂයේ ඉඳලා- වෙළෙඳ අමාත්‍යාංශයේ විවිධ තනතුරු දැරුවා. ආයතන ප්‍රධානියෙක් විධියට මට ඒ සම්බන්ධයෙන් අත්දැකීමක් තිබෙනවා.

බුද්ධිමය දේපළ පනත සම්බන්ධයෙන් අපි ඒ අවස්ථාවේදී සාකච්ඡා කළා. ඒ එක් අවස්ථාවක ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා වෙළෙඳ අමාත්‍යවරයා වශයෙන් කටයුතු කළා. අවුරුදු ගණනකට පස්සේ, අද මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙනැල්ලා තිබෙනවා. මේක මම හිතන විධියට 2011 වර්ෂයේ ඉඳලා සාකච්ඡා කරන පනත් කෙටුම්පතක්. මේ පනත් කෙටුම්පත කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරලා, අවුරුදු 12ක්, 13ක් මේ සම්බන්ධව කටයුතු කිරීමෙන් පසුව තමයි අද අපි දෙවන වර කියවීම සඳහා මේ ගරු සභාවට ඉදිරිපත් කර තිබෙන්නේ. අන්තර්ජාතික වෙළෙඳාමත්, ඒ හා සම්බන්ධව කරන කටයුතුවලදීත් අපිට මේ පනත විශාල වශයෙන් වැදගත් වනවා. මේ රටේ අපනයනය පිළිබඳව විපක්ෂය වාගේම ආණ්ඩු පක්ෂය අද විශාල වශයෙන් කථා කරනවා.

විපක්ෂය කියන්නේ, මීට ඉස්සෙල්ලා ආණ්ඩු කරපු පක්ෂයක්. අවුරුදු ගණනක් රට පාලනය කරලාත්, මේ පනත ඉස්සරහට ගේන්න එතුමන්ලා කිසිම වෙලාවක කටයුතු කරලා නැහැ. විශේෂයෙන්ම 2015 සිට 2019 දක්වා වූ අවුරුදු 5කට ආසන්න කාලය තුළත් එතුමන්ලා මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේ නැතිව කල් ඇරියා. එම නිසා මේ පනත් කෙටුම්පත ප්‍රමාදවීම සම්බන්ධයෙන් යම් වගකීමක් මේ විපක්ෂයත් ගන්න ඕනෑය කියන එක අපි මතක් කළ යුතුයි. 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනතට භූගෝලීය දර්ශකය ලියා පදිංචි කිරීමේ සංශෝධන ගෙන එන වෙලාවේ මම විශේෂයෙන් මේ කාරණය මතක් කරනවා. අද මේ පනත් කෙටුම්පත සම්මත වුණාට පස්සේ අපට විශාල වගකීමක් තිබෙනවා, දේශීය ව්‍යාපාරිකයාට සහන සලසන්නේ කොහොමද කියන කාරණය සලකා බලලා ඒ සඳහා යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න. අපේ දේශීය ව්‍යාපාරවලට සම්බන්ධ භාණ්ඩ පිළිබඳව ඇති වන නීතිමය ගැටලු එක්ක, නීතිමය ප්‍රශ්නවලදී අන්තර්ජාතික වශයෙන් අපි කොහොමද අපේ අපනයනකරුවන්ට මේ අවස්ථාව ලබා දෙන්නේ කියන එක පිළිබඳවත් සලකා බලා ඒ සඳහා ප්‍රතිපාදන සලසා දිය යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ අපනයනයට සම්බන්ධ ගැටලු සහ අපනයනයට තිබෙන බාධා සම්බන්ධයෙන් පසුගිය කාලයේ අපි විශාල වශයෙන් සාකච්ඡා කළා. අද මේ පනත් කෙටුම්පත සම්මත වුණාට පස්සේ, අපට යම් භාණ්ඩයක් අපේ භූගෝලීය දර්ශකය යටතේ ලියා පදිංචි කර ගන්න අවස්ථාව තිබෙනවා වාගේම, ලෝකයේ අනෙක් රටවලටත් මේ පනත මඟින් ඒ අවස්ථාව ලැබෙනවා. එතකොට දැනට ලෝකයේ විශාල ලෙස දියුණු වෙච්ච රටවලට, විශාල ආර්ථිකයක් තිබෙන රටවලට, ඉතාම දියුණු කර්මාන්ත ඇති රටවලට, ඉතාම දියුණු භාණ්ඩ හා සේවා සපයන සමාගම්වලට මේ හරහා අපේ රටේ ආර්ථිකයට, අපේ රටේ භාණ්ඩවලට යම් ඇතුළුවීමක් කරන්න පුළුවන්. අපි වාගේ කුඩා රටකට මේ වාගේ පනතක් ගෙනාවාම, ඒ පනත හරහා අපේ රටට වන බලපෑම ගැනත් අපි කල්පනා කරන්න ඕනෑ. එම නිසා අපි මේ පනත් කෙටුම්පත් හදද්දී නීතිපති දෙපාර්තමේන්තුව, බුද්ධිමය දේපළ පිළිබඳ කාර්යාංශය ඇතුළු සියලු ආයතන එක්ක දීර්ඝ වශයෙන් සාකච්ඡා කළා. මෙහිදී මතු වන ප්‍රායෝගික ගැටලු දන්නේ මේ රටේ ව්‍යාපාර කරන, එහෙම නැත්නම් මේ රටේ ඉන්න අපනයනකරුවන් බව අපි අමතක කරන්න හොඳ නැහැ. මොකද, අපි පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවෙන් අනුමත කරලා, පාස් කරලා දුන්නාම, ඒක බිම් මට්ටමට, ගම් මට්ටමට ගියාට පස්සේ, ඒ හරහා මතුවන ගැටලුවලට මුහුණ දෙන්න සිද්ධ වෙන්නේ අහිංසක, දුප්පත් මිනිසුන්ටයි. පසුගිය කාලයේ අපි ඒක දැක්කා. මම උදාහරණයක් කියන්නම්. මුතුරාජවෙල සංරක්ෂණය සඳහා අපි පාර්ලිමේන්තුවට පනත් කෙටුම්පතක් ඉදිරිපත් කළා. මේ පනත් කෙටුම්පතින් මුතුරාජවෙලට හෙක්ටෙයාර 11,000ක් ගැසට් කරලා ඒ භූමිය නාගරික සංවර්ධන අධිකාරියට පවරලා දුන්නා. නමුත්, අද ඒ ප්‍රදේශවල ගමක සාමාන්‍ය මිනිහෙකුට වැසිකිළියක්වත් හදා ගන්න බැරි වෙලා තිබෙනවා. අද ඒ අය දවසකට සියදහස් ගණනක් නාගරික සංවර්ධන අධිකාරියට යනවා, ඒ සඳහා අනුමැතිය ඉල්ලන්න. මේ සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරිය තවම නිවැරදි තීන්දුවක් නොදී දිගට හරහට ඒ මිනිස්සු රස්තියාදු කරනවා. ඒ පනත තිබෙනවා. නමුත් ඒකෙන් කිසිම වැඩක් වෙලා නැහැ. හැබැයි, මිනිස්සු දුක් විඳිනවා. විශේෂයෙන්ම අපේ ජාඇල, වත්තල, කටාන, මීගමුව ආදී ප්‍රදේශවල මිනිස්සු මේ නිසා අද ඉතාම අසරණ තත්ත්වයට පත්වෙලා සිටිනවා. විශේෂයෙන්ම මෙවැනි පනත් කෙටුම්පතක් සම්මත කිරීම හරහා, අපි අන්තර්ජාතික වෙළඳාම යටතේ සිදු කරන ගනුදෙනුවකදී ඉතාම සුපරීක්ෂාකාරී වෙන්න ඕනෑ කියලා අපි කියන්නේ ඒ නිසායි. මමත් ව්‍යාපාරිකයෙක් නිසා මේ පිළිබඳව අවබෝධයක් තිබෙනවා. මෙවැනි පනත් කෙටුම්පතක් සම්මත කළාට පස්සේ ව්‍යාපාරිකයන්ට වෙන අසාධාරණකම් අපි දැක තිබෙනවා. භූගෝලීය දර්ශක ලියා පදිංචිය තුළින් අපට යන්න පුළුවන් කුරුඳු සඳහා පමණයි. ශ්‍රී ලංකාවේ කුරුඳු සම්බන්ධයෙන් අපට දැන් හොඳ අවස්ථාවක් තිබෙනවා. අපේ අනෙකුත් භාණ්ඩවලට තවම ඒ අවස්ථාව නැහැ.

එතකොට අපි කල්පනා කරන්න ඕනෑ, එක භාණ්ඩයක් පමණක් අපි අතේ තියාගෙන මෙවැනි පනත් කෙටුම්පතකට අපේ අනුමැතිය දුන්නාට පස්සේ, ඊළඟට මේ ප්‍රශ්නය ජයග්‍රහණය කරන්නේ කොහොමද කියන එක ගැන. ඒක තමයි මේ ආයතනවලට තිබෙන වගකීම. අපටත් මේ සම්බන්ධ විශාල වගකීමක් තිබෙනවා. විශේෂයෙන් මේ බුද්ධිමය දේපළ (සංශෝධන) පනත් කෙටුම්පත සම්මත වුණාට පස්සේ මේ සම්බන්ධව කටයුතු කරන ආයතන දිගටම ඔවුන්ගේ කටයුතු කරද්දී, කල්පනාකාරී වෙන්න ඕනෑ. එහෙම නැති වුණොත් ප්‍රශ්න එද්දී අපට උත්තර බඳින්න තැනක් නැතුව යනවා. අපි නැවත මතක් කරන්න ඕනෑ, පසුගිය කාලයේ සිටම අපනයනකරුවන්ට විශාල ප්‍රශ්න තිබුණු බව. දැනට වඩා විශාල ප්‍රශ්න තිබුණා. මොකද, අපි හැම දෙයක්ම කළේ ප්‍රමාද වෙලා. අද කරන්න ඕනෑ දේ තව අවුරුදු 10කින්, 15කින් පසුව තමයි කළේ. ඒ නිසා තමයි අද මේ ප්‍රශ්නය ඇති වෙලා තිබෙන්නේ. කෙසේ වෙතත්, අද මේ බුද්ධිමය දේපළ (සංශෝධන) පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙනෙන වෙලාව වන විටත් අපි අවුරුදු 10, 12ක් ප්‍රමාද වෙලා තිබෙනවා. නමුත් ප්‍රමාද වෙලා හෝ මේ පනත් කෙටුම්පත අද ගෙන ආ එක ගැන මම බුද්ධිමය දේපළ සම්බන්ධ ආයතනයටත්, විශේෂයෙන් බන්දුල ගුණවර්ධන ඇමතිතුමාටත් ස්තුතිවන්ත වෙනවා.

වෙළඳ අමාත්‍යාංශය යටතේ මේ හා සම්බන්ධ තවත් ආයතනයක් තිබෙනවා, Export Development Board - EDB - කියලා. අපනයන කටයුතුවලට සම්බන්ධ, එහෙම නැත්නම් මේ රටේ තිබෙන ව්‍යාපාරවලට සම්බන්ධ ආයතන ඒ EDB එකත් එක්ක සම්බන්ධ වනවා. අපට පුළුවන් බුද්ධිමය දේපළ පනත යටතේ අපි ලබා ගන්නා මේ වරප්‍රසාද ආයෝජකයන් එක්ක බෙදා ගන්න. එහිදී, ගරු ඇමතිතුමාට තිබෙන වාසිය තමයි ඒ ආයතන දෙකම තිබෙන්නේ එතුමා යටතේ වීම. එතකොට ඒ අයට සාකච්ඡා කරලා මේ සම්බන්ධ තව ගැටලු තිබෙනවා නම්, ඒ ගැටලුත් නිවැරදි කරගෙන ඉදිරියට යන්න හැකියාව තිබෙනවාය කියන එක මම විශ්වාස කරනවා. අපි මේ පනත් කෙටුම්පත අනුමත කළාට පස්සේ මේ ආයතන රෙගුලාසි හදනවා, කොහොමද මේ ක්‍රියාවලිය ඉස්සරහට ගෙනියන්නේ කියලා. අන්න ඒ ක්‍රියාවලිය ගෙනියන වැඩ පිළිවෙළ ඉතාම ශක්තිමත්ව හදන්න ඕනෑ. එහෙම වුණොත් තමයි අපට මේ වැඩ පිළිවෙළ සාර්ථක කර ගන්න පුළුවන් වෙන්නේ. එහෙම නැති වුණොත් එක පැත්තකට වාසි වෙන්නත්, අපේ රටේ අපනයනකරුවන්ට, අපේ රටේ නිෂ්පාදකයාට අවාසි තත්ත්වයක් උදා වෙන්නත් පුළුවන්.

[ගරු නලින් ප්‍රනාන්දු මහතා]

විශේෂයෙන් අපි මේ වාගේ අන්තර්ජාතික වෙළඳාමට සම්බන්ධ අන්තර්ජාතික ප්‍රඥප්ති එක්ක එකතු වෙලා වැඩ කරද්දී කල්පනාකාරී වෙන්න ඕනෑ. මේවාට සම්බන්ධ ආයතනවල සේවය කරන අපේ රටේ නිලධාරින් වාගේම විදේශ සේවාවල ඉන්න අපේ රාජ්‍ය නිලධාරින් විශේෂයෙන් මේ ගැන අවධානය යොමු කරන්න ඕනෑ. අපි මීට පෙරත් මේ වාගේ ගිවිසුම්වලට, ප්‍රඥප්තිවලට එකතු වෙලා තිබෙනවා. නමුත් ඒවායේ ප්‍රතිඵල අපට ලැබිලා නැහැ. ඒ නිසා විශේෂයෙන් මම මතක් කරන්න කැමැතියි, මේ පනතෙන් පස්සේ වන සිදුවීම් ජාලය හරියාකාරව අපි මෙහෙයවා ගන්න කටයුතු කරන්න ඕනෑ බව.

විශේෂයෙන් අන්තර්ජාතික වෙළඳාම සම්බන්ධයෙන් වාණිජ දෙපාර්තමේන්තුවට - Department of Commerce සමඟ - සම්බන්ධ වෙලා කටයුතු කරන නිලධාරින් විශාල ප්‍රමාණයක් මුළු ලෝකය පුරාම ඉන්නවා. ඒ අය දැනුවත් කරන්න ඕනෑ. අපේ රටේ නිෂ්පාදකයාට තිබෙන ගැටලුවලදී ඒ අය මැදිහත් වෙන්න ඕනෑ. එහෙම මැදිහත් වුණොත් විතරයි මේ පනතින් අපි බලාපොරොත්තු වෙන දේ ඉෂ්ට කර ගන්න පුළුවන් වෙන්නේ. මම සියලු දෙනාගෙන්ම ඉල්ලන්නේ අපි මේ පනත් කෙටුම්පත් සම්මත වුණාට පසුව ඒ ගැන පසුවිපරමක් කරන්න ඕනෑ කියන එකයි. පනත් කෙටුම්පත් කොච්චර මේ පාර්ලිමේන්තුවට ගෙනැල්ලා සම්මත කළත්, ඒවා ගැන පසු විපරමක් කරන්නේ නැහැ. නමුත් අපි හිතනවා, අපි මේ කරපු දේවල්වලින් ප්‍රතිඵල ලැබෙයි කියලා. නමුත් අපි දිගින් දිගටම කල්පනා කරලා බැලුවොත්, සමහර අවස්ථාවල ප්‍රතිඵල අනික් පැත්තටයි යන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම නැවත වාරයක් සියලුදෙනාට ස්තුතිය ප්‍රකාශ කරනවා, ප්‍රමාද වී හෝ මේ පනත් කෙටුම්පත ගෙන ඒම පිළිබඳව. අද මේ බුද්ධිමය දේපළ (සංශෝධන) පනත් කෙටුම්පත සම්මත කිරීමත් සමඟ විශේෂයෙන් අපේ රටේ අපනයනකරුවාට අපනයන සම්බන්ධයෙන් තිබෙන ගැටලුවලදී යම් සහනයක් ලබාගන්න හැකියාව ලැබෙනවා. ඒ නිසා අපේ රටේ වෙළඳ භාණ්ඩවල තිබෙන අනන්‍යතාව තහවුරු කරගෙන, අන්තර්ජාතික වෙළඳාම හරහා අපේ රටේ නාමය ප්‍රවර්ධනය කරන්න අවශ්‍ය පූර්ණ ශක්තිය ලබාගෙන අපේ ආර්ථිකයට යම් ශක්තියක් ලබා දෙන්න හැකියාව ලැබෙයි කියන බලාපොරොත්තුව ඇතිව මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු වීරසුමන වීරසිංහ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු සිරිපාල ගමලත් මහතා (මහවැලි කලාප ආශ්‍රිත ඇළවේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சிறிபால கம்லத் - மகாவலி வலயங்களை அண்டியுள்ள கால்வாய்கள் மற்றும் குடியிருப்புகள் பொது உட்கட்டமைப்பு வசதிகள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Siripala Gamalath - State Minister of Canals and Common Infrastructure Development in Settlements in Mahaweli Zones)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "ගරු වීරසුමන වීරසිංහ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

**ගරු ජානක වක්කුඹුර මහතා (උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි බෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜானக வக்கும்புர - கரும்பு, சோளம், மர முந்திரிகை, மிளகு, கறுவா, கராம்பு, வெற்றிலை உள்ளிட்ட சிறு பெருந்தோட்டப் பயிர்ச்செய்கை அபிவிருத்தி மற்றும் அதுசார்ந்த கைத்தொழில்கள் மற்றும் ஏற்றுமதி மேம்பாட்டு இராஜாங்க அமைச்சர்)
(The Hon. Janaka Wakkumbura -State Minister of Development of Minor Crops including Sugarcane, Maize, Cashew, Pepper, Cinnamon, Cloves, Betel Related Industries and Export Promotion)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු වීරසුමන වීරසිංහ මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. (MRS.) ROHINI KUMARI WIJERATHNA *left the Chair and* THE HON. WEERASUMANA WEERASINGHE *took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මයන්ත දිසානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හයක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.59]

**ගරු මයන්ත දිසානායක මහතා**
(மாண்புமிகு மயந்த திசாநாயக்க)
(The Hon. Mayantha Dissanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ මුළු රටම අගතියට පත්වෙලා තිබෙන මොහොතක තමයි මෙවැනි ඉතා වටිනා පනත් කෙටුම්පතක් පිළිබඳව අපි සාකච්ඡා කරන්නේ. විශේෂයෙන්ම ගෑස් පෝලිම්, ඉන්ධන පෝලිම්, පාන් පෝලිම්, හාල් පෝලිම්, සීනි පෝලිම් වාගේම විදුලිය කැපීමකුත් අද රටේ පවතින අවස්ථාවකයි බුද්ධිමය දේපළ (සංශෝධන) පනත් කෙටුම්පත ගැන අපි පාර්ලිමේන්තුවේ කථා කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ලෝකය අලුත් යුගයක් ආරම්භ කර තිබෙනවා. කොවිඩ්-19 ලෝක වසංගතය තිබුණත් අද රටවල් දියුණුවෙලා තිබෙනවා; විදේශ සංචිත වැඩි කරගෙන තිබෙනවා. හැබැයි ලංකාව, තිබුණු විදේශ සංචිතත් අඩු කරගෙන, ඩොලර් හිඟයක් ඇති කරගෙන, දේශපාලන සහ ආර්ථික වශයෙන් විශාල අර්බුදයකට අද පත්වෙලා තිබෙනවා.

අපි නිදහස පිළිබඳව කථා කරනවා. අපි දැක්කා පසුගිය දිනක හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මැතිනියට එල්ල වුණු ප්‍රහාරය. ඒ වාගේම පාර්ලිමේන්තුවේ විපක්ෂය නියෝජනය කරන වැඩිම කණ්ඩායම ඉන්න සමගි ජන බලවේගයේ ප්‍රධාන කාර්යාලයට ඊයේ ප්‍රහාරයක් එල්ල වුණා. අද අපි බුද්ධිමය දේපළ නීති ගැන කථා කරමින් රට

ඉස්සරහට ගෙන යෑම ගැන කථා කරනවා. හැබැයි, පාර්ලිමේන්තුවේදී විතරක් මෙහෙම කථා කරලා මදි. ආණ්ඩුව තම දේශපාලන ප්‍රතිගාමීන්ට ප්‍රහාර එල්ල නොකර දේශපාලනය කිරීමේ අයිතිය ලබා දෙන්න, නිදහස ලබා දෙන්න ඕනෑ. ඒ වාගේම කථා කිරීමේ අයිතිය, මාධ්‍ය නිදහස පිළිබඳ දේවල් ගැන අපි අනිවාර්යයෙන්ම කථා කරන්න ඕනෑ. මේ රට ලද නිදහස අවුරුදු 74ක් තිස්සේ සමරන අපි ඇත්තෙන්ම අද මොන ස්ථානයේ ද ඉන්නේ කියලා සාකච්ඡා කරන්න ඕනෑ. මේ රටට තවදුරටත් මේ විධියටම ඉදිරියට යන්න ඉඩ හරිනවා ද, අපි පැදුරෙන් බිමට වැටෙන්න යනවා ද කියන කාරණා ගැන අපි සාකච්ඡා කරන්න ඕනෑ. ආණ්ඩු පක්ෂයයි, විපක්ෂයයි මේ රට ගැන හිතලා, කථා කරලා, යම්කිසි එකඟතාවකට ඇවිල්ලා කටයුතු කරන්න ඕනෑ.

හෙට Personal Data Protection Bill එක පාර්ලිමේන්තුවේදී දෙවන වර කියැවීමේ විවාදයට ගැනෙනවා. එම උපදේශක කාරක සභාවේ ඉඳලායි දැන් මම ආවේ. Personal Data Protection Bill එක වුණත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මීට වැඩිය පුළුල්ව සාකච්ඡා කරලා, අදහස් විමසලා ගෙනෙන්න ඕනෑ. මෙවැනි පනත් කෙටුම්පත් ආණ්ඩුව හදිසියෙන් ගෙනෙන්නේ නැතුව තවදුරටත් සාකච්ඡා කරලා, අදහස් විමසලා ඉදිරිපත් කළා නම් හොඳයි කියා මම මූලාසනය වෙත යෝජනා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මාර්තු 15වන දා සමගි ජන බලවේගයේ අපි විශාල උද්ඝෝෂණයක් කරන්න බලාපොරොත්තු වනවා. මීට පෙර අපි ජනතාව කොළඹට ගෙනැල්ලා උද්ඝෝෂණයක් කරන්න ගියා. එවිට ආණ්ඩුව හය වුණා. කොළඹ වටලයි කියා හයවෙලා, කොළඹට ඇතුළු වන මාර්ග වැහුවා. අපේ සාමාජිකයන් බස්වල එන කොට, ඒක වළක්වලා ඇත්තෙන්ම ප්‍රජාතන්ත්‍රවාදය මර්දනය කරන්න ආණ්ඩුව උත්සාහ කළා. හැබැයි, මාර්තු 15වන දා අපි කරන්න බලාපොරොත්තු වන උද්ඝෝෂණයට ඒ වාගේ දේවල් කරන්න එපා කියලා මම මේ අවස්ථාවේ ආණ්ඩුවෙන් ඉල්ලනවා.

නව ප්‍රවාහන ඇමතිවරයා වශයෙන් අපේ මිත්‍ර ගරු දිලුම් අමුණුගම මැතිතුමා පත් වුණා. අපි එතුමාගෙන් ඉල්ලා සිටිනවා, සල්ලි ගෙවලා බස්වලින් ඇවිත් අප කරන්න යන ඒ උද්ඝෝෂණය කරන්න ප්‍රජාතන්ත්‍රවාදී රාමුව තුළ ඉඩ දෙන්න කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම විපක්ෂයේ සිටින ප්‍රධාන කණ්ඩායම හැටියට සමගි ජන බලවේගයේ අපේ නායක ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ ප්‍රධානත්වයෙන්, අපේ පක්ෂයේ මහ ලේකම් ගරු රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන්, we have championed the cause of the people. We have challenged the proposed Surcharge Tax on EPF and ETF and the Government has changed course because of that. The Supreme Court intervened in this. But, it is not necessary all the time to go to the Supreme Court to get the Government to react; the Government must also listen to the Opposition. ආණ්ඩුව අනිවාර්යයෙන් විපක්ෂයට ඇහුම් කන් දෙන්න ඕනෑ. මේ අමාරු කාලයේ අපි දේශපාලනය ගැන කථා කරන්න පමණක් නොවෙයි, රට දියුණු කරන්නත්, රට වෙනුවෙන් වැඩ කරන්නත් කැමැතියි. ආණ්ඩුව තනි මතයට වැඩ කරන්න යනවා නම් මේ රටේ අනාගතය සහ ඉරණම කුමක්ද කියලා විශේෂයෙන්ම අපේ තරුණ තරුණියන් අද ප්‍රශ්න කරනවා. ඒ නිසා තමයි පාස්පෝර්ට් පෝලිම්වල, වීසා පෝලිම්වල අපේ තරුණ තරුණියන් විශාල වශයෙන් ඉන්නේ. මේ පිළිබඳව ආණ්ඩුව මීට වඩා පුළුල්ව කථා කරනවා නම්, ක්‍රියා කරනවා නම් හොඳයි කියා මම මේ අවස්ථාවේ කියනවා.

විශේෂයෙන්ම අද බුද්ධිමය දේපළ (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව සාකච්ඡා කරන කොට non-fungible token පිළිබඳ, ඒ කියන්නේ අන්තර්ජාලය හරහා තිබෙන assets පිළිබඳත් අපි සාකච්ඡා කරන්න ඕනෑ. අපි මේ රටේ ජනතාවට මීට වඩා පුළුල්ව ඒ අවස්ථාව ලබා දෙන්න ඕනෑ. එහෙම අවස්ථා ලබා දෙන්නේ නැත්නම් මේ රට කොහේටද යන්නේ කියන එක ගැන අපි නැවත වරක් කථා කරන්න ඕනෑ. ඒ වාගේම piracy කියන එක ගත්තාම, piracy of intellectual property සම්බන්ධව බැලුවාම, ජාත්‍යන්තර නීතිවලට ගරු කරන්නේ නැතිව තමයි මෙතෙක් කල් ලංකාව වැඩ කරලා තිබෙන්නේ. මේ වාගේ නීති ගෙනෙන එක හොඳයි. නමුත්, මේ වාගේ නීති ගෙනාවාට මේවා ක්‍රියාත්මක කරන්න යන්නේ කොහොමද කියන කාරණය අපි සාකච්ඡා කරන්න ඕනෑ. අද බෙහෙත් පිළිබඳත් විශාල අර්බුදයක් තිබෙනවා. අපි licence අරගෙන ලංකාවේ බෙහෙත් නිෂ්පාදනය කරන්න යනවා නම්, ඒකත් මේ නීතිය යටතට එන්න ඕනෑ කියන කාරණය මම මේ අවස්ථාවේ කියන්න කැමැතියි.

දැන් විදුලිය කපනවා. නොකියාම විදුලිය කපනවා. ජනතාව අඳුරේ ඉන්නේ. ඒ වාගේ යුගයක මේ වාගේ පනත් කෙටුම්පත් පිළිබඳව විශේෂයෙන්ම තවදුරටත් අවධානය යොමු කරන්න ඕනෑ කියන කාරණය මේ අවස්ථාවේ කියන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, තවත් විනාඩි තුනක කාලයක් ඔබතුමාට ලැබෙනවා.

**ගරු මයන්ත දිසානායක මහතා**
(மாண்புமிகு மயந்த திசாநாயக்க)
(The Hon. Mayantha Dissanayake)
මට එතරම් කාලයක් අවශ්‍ය නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මම තවත් කාරණයක් කියන්න ඕනෑ. මේ සභාවේ අද කථා කරනවා, ජාතික ආණ්ඩුවක් පිළිබඳව. මේ අවුරුදු එක හමාරක පමණ කාලය තුළ අපි ආණ්ඩුවට අපේ යෝජනා ඉදිරිපත් කළා. විශේෂයෙන්ම කොරෝනා වසංගතය පිළිබඳව අපි යෝජනා ඉදිරිපත් කළා, දේශපාලනය කරන්නේ නැතිව ජනතාව බේරාගන්න ඕනෑ කියන අදහසින්. මේ රටේ ජනතාවගෙන් 18,000කට වඩා මිය ගිහින් තිබෙනවා, කොරෝනා වසංගතයෙන්. ඒ හැම මරණයකටම ආණ්ඩුව වග කියන්න ඕනෑ කියන එකත් මම මේ අවස්ථාවේ කියනවා. අපේ නායක ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා කිව්වා, මිනිසුන්ට අනිවාර්යයෙන් masks ලබා දෙන්න කියලා. ඒක ඇහුවේ නැහැ. ඊට පසුව අපි කිව්වා, එන්නත්කරණ කටයුත්ත කරන්න කියලා. ඒක ඇහුවෙත් නැහැ. අපි ආණ්ඩුවට බොරුවට චෝදනා කරනවා නොවෙයි. ආණ්ඩුවක් හැටියට මීට වඩා විශාල වගකීමක් භාර ගන්න ඕනෑ. මේ රටේ අනාගතය සහ ආර්ථිකය පිළිබඳව අපි මීට වඩා පුළුල්ව කථා කරන්න ඕනෑ, ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමනි. එහෙම සාකච්ඡා කරලා ආර්ථිකය දියුණු කරන්නේ කොහොමද කියන කාරණය ගැන අපි අනිවාර්යයෙන් එකඟතාවකට එන්න ඕනෑ. පාස්පෝර්ට් සහ වීසා පෝලිම්වල සිටින දහස් ගණන් දූ දරුවන්ගේ අනාගතය පිළිබඳව අපි මීට වඩා කථා කරන්න ඕනෑ කියන එක මම මේ අවස්ථාවේදී කියන්න ඕනෑ.

මම online තාක්ෂණය පිළිබඳව කථා කළා. අනිවාර්යයෙන් බුද්ධිමය දේපළ (සංශෝධන) පනත් කෙටුම්පත යටතේ online ක්‍රමවේද පිළිබඳත් අපි සාකච්ඡා කරන්න ඕනෑ. මේ පනත් කෙටුම්පත සංශෝධනය කරන්න අවශ්‍ය වෙයි කියා මා සිතනවා. ලංකාව ඇත්තටම 21වන ශත වර්ෂයට අනුව ගමන් කරන්න හදනවා නම්, ඊට ගැළපෙන තාක්ෂණය අපේ ලංකාවට ලබා දෙන්න යනවා නම් කළ යුතු දෙයක් තිබෙනවා.

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ )
(The Hon. Namal Rajapaksa )

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කාලය ගන්නේ එතුමාගේ කාලයෙන් නොවෙයි, අපේ කාලයෙන්. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා එන්නත්කරණය සහ කොවිඩ් මර්දනය ගැන කථා කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එන්නත්කරණය ගත්තොත්, WHO එක vaccines අනුමත කළ වහාම අපි ඒවා මිලදී ගන්න පටන්ගත්තා.

ඒ වාගේම තමයි, ලෝකයේ පාවිච්චි කරන හැම vaccine එකක්ම අපේ රටේ එන්නත්කරණය සඳහා අපි උපයෝගී කර ගත්තා. ඒ විතරක් නොවෙයි, අපේ රට ලෝකයේ එන්නත්කරණය සිදු කළ රටවල් අතරින් ප්‍රමුඛතම රටක් බවට පත් වුණා. ගරු මන්ත්‍රීතුමනි, කොවිඩ් හින්දා සිදු වෙච්ච මරණවලට ආණ්ඩුව වග කියන්න ඕනෑ කියලා ඔබතුමා යෝජනා කරනවා නම්, ඒ වාගේම ඔබතුමා යෝජනා කරන්න ඕනෑ කොවිඩ් නිසා මැරෙන්න දෙන්නේ නැතිව මේ රටේ ජනතාව එන්නත් කර බේරා ගැනීමේ වග කීම ඉටු කිරීමේ ගෞරවය ආණ්ඩුවට හිමි වෙන්න ඕනෑ කියලාත්.

**ගරු මයන්ත දිසානායක මහතා**
(மாண்புமிகு மயந்த திசாநாயக்க)
(The Hon. Mayantha Dissanayake)

ගරු ඇමතිතුමනි, ජනතාව එන්නත්කරණය කරන්න කියලා අපි කිව්වේ එන්නත්කරණය ලංකාවේ ක්‍රියාත්මක කරන්නත් ඉස්සෙල්ලා. ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේලා එහිදී කිව්වේ, "ඩොලර් නැහැ" කියලා.

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)

ගරු මන්ත්‍රීතුමනි, එන්නත්කරණය සම්බන්ධයෙන් අපි පැහැදිලි මතයක හිටියා. ඒ තමයි, WHO එක අනුමත කළාම ඒ එන්නත් මිලදී ගන්නවාය කියලා. ඔබතුමන්ලාගේ විපක්ෂ නායකතුමා බෙහෙත් වට්ටෝරු පවා දුන්නා. අපි ඒ බෙහෙත් වට්ටෝරු බෙදන්න ගියා නම් අද මේ රට තිබෙන තැන ගැන අමුතුවෙන් කියන්න ඕනෑ නැහැ. මම ඔබතුමා එක්ක විවාදයක් කරනවා නොවෙයි, මේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි අපි වග කීමකින් කියන්න ඕනෑ, මේ ගරු සභාව සහ රටේ ජනතාව නොමඟ යවන්න ඉඩ දෙන්න බැහැ කියන එක. ආණ්ඩුවක් විධියට අපි, අපේ සෞඛ්‍ය අංශය, ත්‍රිවිධ හමුදාව, රාජ්‍ය යන්ත්‍රණය සහ මේ රටේ මහ ජනතාව ඉතාම වග කීමකින්, විනයානුකූලව එන්නත්කරණ ව්‍යාපාරය සාර්ථක කර ගන්න දායක වුණාය කියන එක මතක් කරන්න ඕනෑ.

**ගරු මයන්ත දිසානායක මහතා**
(மாண்புமிகு மயந்த திசாநாயக்க)
(The Hon. Mayantha Dissanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ කාරණය සම්බන්ධයෙන් විවාදයකට යනවා නොවෙයි.

දැනට අපේ රටේ ජනතාවගෙන් සියයට 80ක්, 85ක් එන්නත්කරණය කර තිබෙනවා කියලා ආණ්ඩුව කියනවා. ආණ්ඩුවේ ඒ දත්ත නිවැරදි නම්, එය ඉතා හොඳයි. ඒ වාගේම, එන්නත්කරණය අතින් අපේ රට ආසියාවේ සහ මේ කලාපයේ ඉදිරියෙන් තිබෙනවා නම්, ඒ ගැනත් අපි සන්තෝෂ වෙනවා. හැබැයි, වග කියන විපක්ෂයක් හැටියට අපි තමයි එදා පාර්ලිමේන්තුවේදී මුලින්ම කිව්වේ, "එන්නත්කරණය අනිවාර්යෙන් කරන්න. Masks ලබා දෙන්න. ජනතාවට අවශ්‍ය කරන ඒ සහන ලබා දෙන්න" කියලා. හැබැයි, ඒක පිළිගත්තේ නැහැ. ඒකයි මෙතැනදී මගේ point එක. මම කියන්න හදන්නේ, අපි ඉදිරිපත් කරන තර්ක ආණ්ඩු පක්ෂය පිළිගන්නේ නැහැ කියන එකයි; එහෙම පිළිගෙන කටයුතු කරනවා නම් වඩාත් හොඳයි කියන එකයි.

මේ බුද්ධිමය දේපළ (සංශෝධන) පනත් කෙටුම්පතට පවා අපි සංශෝධන ඉදිරිපත් කරන කොට, ආණ්ඩුව ඒවා පිළිගන්නේ නැත්නම්, ආණ්ඩුවේ තනි මතයට විතරක් කටයුතු කරනවා නම් විපක්ෂය විධියට මෙවැනි විවාදවලට එකතු වෙලා අපේ අදහස් ඉදිරිපත් කිරීමේ ඵලය මොකක්ද? රටේ ජනතාව ඔබතුමන්ලාට තුනෙන් දෙකේ බලයක් දීලා තිබෙනවා. නමුත්, හැම එකකටම ඒ තුනෙන් දෙකේ බලය පාවිච්චි කරලා කටයුතු කරන්න යනවා නම්, ඇත්තෙන්ම මේ රටේ අනාගතයට සහ මේ රටේ ආර්ථිකයට අබ සරණයි!

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි හැම දෙයක්ම දේශපාලන කෝණයකින් බලන්න හොඳ නැහැ. අපි ඇත්තෙන්ම මේ රටට ආදරෙයි. අපි මේ රටේ අනාගතය වෙනුවෙන් කටයුතු කරන්න ලෑස්තියි. අපි වග කිව යුතු විපක්ෂයක් හැටියටයි කටයුතු කරන්නේ. මේ ගරු සභාවේ ඇමතිවරු ඉන්නවා. සමහර ඇමතිවරු ඉතා හොඳින් කටයුතු කරනවා. ඒ අවස්ථාවල අපි නැඟිටලා කියා තිබෙනවා, "ඇමතිතුමා අමාත්‍යාංශය කරන ආකාරය හොඳයි" කියලා. නමුත්, කුමක් හෝ වැරැද්දක් වනවා නම්, ඉදිරිපත් කරපු පනත් කෙටුම්පතක දෝෂයක් තිබෙනවා නම් වග කිව යුතු විපක්ෂයක් හැටියට මේ රටේ ජනතාව වෙනුවෙන් අපට අයිතියක් තිබෙනවා, අපට වග කීමක් තිබෙනවා, මේ පාර්ලිමේන්තුවේ දී ඒවා අනිවාර්යෙන් පෙන්වා දෙන්න. ආණ්ඩුව ඒවා පිළිගන්නවා ද නැද්ද කියන එක වෙනම කතන්දරයක්. හැබැයි, ආණ්ඩුව තනි මතයකට අනුව යන්න හදනවා නම්, මා පැවසූ පරිදි මේ රටේ අනාගතය සහ ඉරණම ගැන අපි නැවත වතාවක් කථා කරන්න ඕනෑ.

ගෑස් පිළිබඳ ගැටලු සම්බන්ධයෙන් ආණ්ඩුව දෙන විසඳුම් මොනවාද? ඉන්ධන නැති නිසා, ඩීසල් නැති නිසා අස්වැන්න නෙළා ගන්න බැරිව මේ රටේ ගොවි ජනතාව බලාගෙන ඉන්නවා. ඒකට දෙන විසඳුම මොකක්ද කියන එකත් මේ අවස්ථාවේ දී අහන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු මයන්ත දිසානායක මහතා**
(மாண்புமிகு மயந்த திசாநாயக்க)
(The Hon. Mayantha Dissanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මීට වඩා දීර්ඝව කථා කරන්නේ නැහැ. මම තර්ක කිරීමක් හැටියට නොවෙයි මේ කරුණු ඉදිරිපත් කළේ.

අවසාන වශයෙන්, මම ආණ්ඩුවෙන් නැවත වරක් ඉල්ලා සිටිනවා, මේ රටේ තිබෙන දැවැන්ත ප්‍රශ්න පිළිබඳව මීට වඩා පුළුල් ලෙස විපක්ෂය එක්කත්, අනෙකුත් පක්ෂ එක්කත් කථා කරලා විසඳුම් ලබා දෙන්න කියලා. එසේ කටයුතු කළ යුතු කාලයක් තමයි උදා වෙලා තිබෙන්නේ. තවදුරටත් මේ විධියට ගියොත් මොකද වෙන්නේ? දැනටමත් ආණ්ඩුවේ මැති ඇමතිවරු කිහිප දෙනෙක් ඉවත් වෙලායි තිබෙන්නේ. ඉතින් ඒ ගැටලුවත් අනිවාර්යෙන් ආණ්ඩුවට බලපා තිබෙනවාය කියන කාරණය මම මේ අවස්ථාවේ පෙන්වා දෙනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ජානක වක්කුඹුර රාජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.11]

**ගරු ජානක වක්කුඹුර මහතා (උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි බෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜானக வக்கும்புர - கரும்பு, சோளம், மர முந்திரிகை, மிளகு, கறுவா, கராம்பு, வெற்றிலை உள்ளிட்ட சிறு பெருந்தோட்டப் பயிர்ச்செய்கை அபிவிருத்தி மற்றும் அதுசார்ந்த கைத்தொழில்கள் மற்றும் ஏற்றுமதி மேம்பாட்டு இராஜாங்க அமைச்சர்)
(The Hon. Janaka Wakkumbura -State Minister of Development of Minor Crops including Sugarcane, Maize, Cashew, Pepper, Cinnamon, Cloves, Betel Related Industries and Export Promotion)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බුද්ධිමය දේපළ (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධව කථා කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. අපේ රටේ භෝග සඳහා, විශේෂයෙන් කුරුඳු සඳහා පෙබරවාරි මාසයේ 02වන දා භූගෝලීය දර්ශකයත් එක්ක බුද්ධිමය දේපළ අයිතිය ලංකාවට ලැබිලා තිබෙනවා. ඒ ගැන රටක් හැටියට අපි සතුටු වෙන්න ඕනෑ. අවුරුදු ගණනාවක උත්සාහයකින් පස්සේ කුරුඳු ශාකයේ බුද්ධිමය දේපළ අයිතිය අපට ලැබුණා. ඒ වාගේම, ඉදිරි කාලය තුළ ගම්මිරිස් සහ අන්නාසි සඳහාත් බුද්ධිමය දේපළ අයිතිය ලබා ගන්න අපි බලාපොරොත්තු වෙනවා.

බුද්ධිමය දේපළ අයිතිය අපේ රටට ලැබුණු නිසා අපේ රටේ කුරුඳුවලට ලොකු ඉල්ලුමක් ලබා ගන්නත්, කුරුඳු ශාකයේ උපත සිදු වුණේ අපේ රටේය කියන එක ඔප්පු කරගන්නත් අපට පුළුවන්කමක් ලැබිලා තිබෙනවා. ඒ එක්කම ලෝකයේ ගොඩක් රටවලට අපේ රටේ නිෂ්පාදන යවලා මේ රටට වැඩි මුදලක් ගෙනෙන්නත්, ඒ වාගේම අපේ ගොවි ජනතාවට ඒ සඳහා අවශ්‍ය පහසුකම් සපයා දෙන්නත් අපි බලාපොරොත්තු වෙනවා. තමන් වගා කරන භෝගය පිළිබඳව දැනුවත් කරලා, ඒ සඳහා අවශ්‍ය උපදෙස් ලබා දීලා, සහනාධාර ලබා දෙන්නත් කටයුතු කරනවා. කුරුඳු සඳහා වන බුද්ධිමය දේපළෙහි අයිතිය ගන්න අපට අධිකරණයටත් යන්න සිදු වුණා. අපේ නමින් ලෝකයේ වෙනත් රටක විකිණීමක් කළොත් දැන් අපට පුළුවන් ඒ පිළිබඳව නීත්‍යානුකූලව කටයුතු කරන්න. බුද්ධිමය දේපළ පනතට අද ගෙන එන සංශෝධන තුළින් මේ රටේ කෘෂි කර්මාන්තයේ යෙදෙන අයට ලොකු වාසියක් ලැබිලා තිබෙනවා. ඉදිරි කාලයේදී "කොලොන්න ගම්මිරිස්" කියන නමටම ඒ අයිතිය ලබා ගන්න අපි බලාපොරොත්තු වෙනවා. පසුගිය කාලයේ බන්දුල ගුණවර්ධන ඇමතිතුමා, අපේ රමේෂ් පතිරණ ඇමතිතුමා ඇතුළු සියලුදෙනා එකතු වෙලා මහන්සි වෙලා ඒ සඳහා කටයුතු කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටට එතනෝල් ගෙනෙන එක මීට අවුරුදු දෙකකට කලින් අතිගරු ජනාධිපතිතුමාගේ නියමයෙන් නතර කළා. අද පුවත් පතක තිබෙනවා මම දැක්කා, "රටේ එතනෝල් හිඟයක් එනවා. ඒක නිසා එතනෝල් පිට රටින් ගෙනෙන්න ඉඩ දෙන්න වෙයි" කියලා. සියලුදෙනාම කියනවා, මේ රටට පිට රටින් අනවශ්‍ය භාණ්ඩ ගෙනෙන්න එපා කියලා. ඒ අස්සේ එතනෝල් පිට රටින් ගෙන්වන එකත් අත්‍යවශ්‍ය දෙයක් හැටියට පෙන්වන්න හදනවා. දේශීය නිෂ්පාදනයට අවශ්‍ය එතනෝල් ප්‍රමාණය අපි හදලා තිබෙනවා. යම් යම් වෙලාවලදී ඒක අඩු වැඩිවීමක් සිදු වෙනවා. රටේ අවශ්‍යතාව එතනෝල් ලීටර් මිලියන 22යි. පසුගිය කාලයේ අවශ්‍යතාව එතනෝල් ලීටර් මිලියන 36ක් හැටියට පෙන්වලා තිබුණා. එතනෝල් ලීටර් මිලියන 36ක් හැටියට පෙන්වලා තිබුණේ, රටින් ගෙන්වන්න තිබෙන වුවමනාව නිසායි. හැබැයි, අපි ඒ ගැන සොයා බලා කටයුතු කරපු නිසා අවුරුදු දෙකක් සඳහා මේ රටේ නිෂ්පාදන අවශ්‍යතාව ඉෂ්ට සිද්ධ කරන්න අපට පුළුවන්කමක් ලැබිලා තිබෙනවා. එම නිසා රටින් එතනෝල් ගෙන්වන්න අවශ්‍යතාවක් නැහැ. ලංකාවේ ආයතන පහකින් එතනෝල් නිෂ්පාදනය කරනවා. හෙට - අනිද්දා වන කොට තවත් අලුත් සීනි කර්මාන්තශාලාවක් ඇතිමලේ හැදෙනවා. ඒ කර්මාන්තශාලාවේත් නිෂ්පාදනය කරනවා. ගොඩක් අය උත්සාහ කරනවා, මේ වෙලාවේ රටින්ම බඩු ගෙනෙන්න ඕනෑ කියන තැනකට රට තල්ලු කරන්න. යම් යම් අය එහෙම හිතුවාට අපි ඊට වඩා වෙනස් මතයක ඉන්නේ. මම අද උදේත් ඒ ආයතන සියල්ලටම කථා කරලා බැලුවා. පසුගිය දවස්වල නිෂ්පාදනයේ පොඩි ප්‍රශ්නයක් තිබුණා. දැන් ඒ ප්‍රශ්නය නිරාකරණය වෙලා තිබෙනවා. ඒක නිසා රටට අවශ්‍ය ප්‍රමාණය රට තුළම නිෂ්පාදනය කරලා පවත්වාගෙන යන්න අපි බලාපොරොත්තු වෙනවා. කවුරු හරි එහෙම උත්සාහයක් ගන්නවා නම්, එම උත්සාහයට අපි ඉඩ තියන්නේ නැහැ. මොකද, මේ රටේ කර්මාන්ත ක්ෂේත්‍රයේ දියුණුවක් දකින්න පුළුවන්කමක් ලැබුණේ පිට රටින් භාණ්ඩ ගෙන්වන එක නතර කරපු නිසා. එදා සීනි කර්මාන්තය පහළටම වැටිලා තිබුණා. ඒ වැටුණු තැනින් උඩට ගන්න පුළුවන් වුණේ ආනයනය නතර කරපු නිසා.

අපි බලාපොරොත්තු වෙනවා, රටේ අවශ්‍ය ප්‍රමාණයට වැඩිය එතනෝල් නිෂ්පාදනය කරන්න. ඉන්දියාව එතනෝල් වෙන රටකට විකුණන්නේ නැහැ. ඒ අය ඩීසල් වෙනුවට ඒවා පාවිච්චි කරනවා. අපි බලාපොරොත්තු වෙනවා, ඉදිරියේදී වැඩි ප්‍රමාණයක් එතනෝල් නිෂ්පාදනය කරන්න පුළුවන්කමක් ලැබුණොත්, ඒවා මේ රටේ ඉන්ධන ප්‍රශ්නයට විසඳුමක් හැටියට ගන්න. අද ලෝකයේ රටවල් කිහිපයක් ඒක කරනවා. මේ රටේ ගොවියා අධෛර්යට පත් කරන්න, නැවත වරක් මේ කර්මාන්තය කඩා වැටෙන තැනකට පත් කරන්න යම් පිරිසක් ඉල්ලීමක් කරලා තිබෙනවා. අපි බලාපොරොත්තු වෙන්නේ නැහැ, නැවත වරක් එතනෝල් පිට රටින් ගෙන්වන්න. හැබැයි, මේ රටේ ලොකු ප්‍රශ්නයක් ඇති වෙලා එතනෝල් නිෂ්පාදනය කරන්න බැරිම වුණොත් තමයි අපි ඒවා පිට රටින් ගෙන්වන්න ඉඩ දෙන්නේ. අපේ රටේ කර්මාන්ත දියුණු වෙනවා දකින්න බැරි පිරිසක් කර්මාන්ත කඩා වට්ටන්න හදනවා. ගොවීන් ලවා උද්ඝෝෂණ කරවලා, යම් ප්‍රශ්න ඇති කරන්න හදනවා. අපි පසුගිය කාලයේ මේ රටේ ගොවි ජනතාවගේ ප්‍රශ්න විශාල ප්‍රමාණයක් විසඳුවා. ඒ වාගේම මේ වෙන කොටත් මගේ සෙවණගල ප්‍රදේශයේ සුළු පිරිසක් උද්ඝෝෂණයක් කරනවා. උක් ගොවියෝ 8,000කට වැඩි පිරිසක් ඉන්නවා. සියයක්, එකසිය පනහක් වාගේ පිරිසක් තමයි යම්කිසි ප්‍රශ්නයක් පිළිබඳව උද්ඝෝෂණ කරන්නේ. රටේම උක් ගොවීන්ගේ ප්‍රශ්නය විසඳෙන ආකාරයට යම් සාධාරණ විසඳුමක් ලබා දෙන්න මම බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බුද්ධිමය දේපළ පනත සංශෝධනය හරහා අපේ රටේ භෝග වර්ග රාශියකට බුද්ධිමය දේපළ අයිතිය ලබා ගන්න පුළුවන්. ඉන්දියාව භෝග වර්ග රාශියකට GI සහතිකය අරගෙන තිබෙනවා. අපේ භූගෝලීය දර්ශකයත් අනුව බුද්ධිමය දේපළ අයිතිය ගන්න පුළුවන් සෑම භෝගයකටම ඒ අයිතිය ලබා ගන්න අපි බලාපොරොත්තු වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Next, the Hon. Sivagnanam Shritharan. You have 15 minutes.

[பி.ப. 3.18]

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, யாழ்ப்பாண மாவட்ட வலிகாமம் தென்மேற்குப் பிரதேச சபையினுடைய பண்டத்தரிப்பு வட்டாரத்தைப் பிரதிநிதித்துவப் படுத்துகின்ற கௌரவ உறுப்பினரான அருள்குமார் ஜோன் ஜிப்ரிக்கோ அவர்கள் கடந்த 2022.03.03ஆம் திகதி இரவு 7.35 மணியளவில் இளவாலைப் பொலிஸில் ஒரு முறைப்பாட்டைச் செய்திருந்தார். அதாவது, அன்றையதினம் இரவு 7.30 மணிக்கு தன்னுடைய வீட்டிலே நடந்த ஒரு கட்சி சார்ந்த நபர்களுடைய நடவடிக்கை தொடர்பிலேதான் அம்முறைப்பாடு செய்யப் பட்டது. அவருடைய வீட்டிற்கும் அந்தப் பொலிஸ் நிலையத்திற்குமிடையில் கிட்டத்தட்ட ½ கிலோமீற்றர் - 500 மீற்றர் - தூரம்தான் இருக்கும். அவ்வாறு இருந்தும்கூட, இறுதிவரை பொலிஸார் அந்த இடத்திற்கு வருகை தரவும் இல்லை; அதுபற்றிய விசாரணைகளை மேற்கொள்ளவும் இல்லை.

அதற்குப் பின்னர், எதிர்த்தரப்பினர் முறைப்பாடு செய்தார்கள் என்று கூறி 2022.03.05ஆம் திகதி சனிக்கிழமை பொலிஸார் கௌரவ உறுப்பினரான அருள்குமார் ஜோன் ஜிப்ரிக்கோ அவர்களையும் அவருடைய சகோதரி உட்பட குடும்பத்தினரையும் பொலிஸ் நிலையத்திற்கு அழைத்து, அவர்களை மிக மோசமாகத் தாக்கியிருக்கிறார்கள். இதனால், யாழ்ப்பாணப் பல்கலைக்கழக மாணவியான அவருடைய சகோதரி உணர்வற்ற நிலையில், யாழ்ப்பாண வைத்திய சாலைக்கு ambulanceஇலே கொண்டுசெல்லவேண்டிய நிலைக்குத் தள்ளப்பட்டார். அந்தளவுக்கு அங்கே மிகப் பெரிய அடாவடியை, அராஜகத்தை இளவாலைப் பொலிஸார் அன்றைய தினம் மேற்கொண்டிருக்கிறார்கள்.

ஓர் அரச உத்தியோகத்தராகவும் கௌரவ உறுப்பின ராகவும் இருந்து மக்கள் பணியாற்றுகின்ற எங்களுடைய பண்டத்தரிப்பு வட்டாரத்தைப் பிரதிநிதித்துவப்படுத்துகின்ற அருள்குமார் ஜோன் ஜிப்ரிக்கோவிற்கு நடந்த இந்த அநியாயத்தை, அவர்மீதான பொலிஸாருடைய அடாவடியை நான் இந்தச் சபையிலே பதிவுசெய்கிறேன். தயவுசெய்து, இந்த நிகழ்விற்கு நீதியான ஒரு விசாரணை வேண்டும். ஏனென்றால், அங்கு அராஜகங்களும் வன்முறைகளும் தொடருகின்றன. கட்சி சார்ந்து அரசியல் ஆதாயங்களை மையமாக வைத்து, அரசோடு இருந்து கோலோச்சுகின்ற சில அரசியல் கட்சிகள், அரசினுடைய சில அல்லக்கைகள் நடாத்துகின்ற அடாவடிகள் யாழ்ப்பாண மண்ணிலே மிக மோசமாக நடைபெற்றுக் கொண்டிருக்கின்றன. அரச அதிகாரிகள் மீது மாத்திரமன்றி, எதிர்க்கட்சியில் இருந்து மக்களுக்குப் பணியாற்றுகின்றவர்கள் மீதும் பொலிஸ் அராஜகம் தொடருகின்றது. எனவே, பாதிக்கப்பட்டவர்களுக்கு நீதி கிடைக்க வழிசெய்யுங்கள் என்பதைத்தான் நான் இந்த இடத்திலே பதிவுசெய்கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, மிக முக்கியமாக இன்னுமொரு விடயத்தைப் பதிவுசெய்ய விரும்புகிறேன். கிளிநொச்சி மாவட்டத்தில் பூநகரி பிரதேச செயலாளர் பிரிவிலே பொன்னாவெளி என்கின்ற ஒரு பழம்பெரும் கிராமம் உண்டு. அது நீண்டகால பாரம்பரிய வரலாற்றைக் கொண்டது. ஒரு காலத்திலே வன்னி என்று சொல்லப்படுவதற்கு அடிப்படையாக இருந்த அந்தக் கிராமத்திலேயிருந்த மக்கள் காலமாற்றங்கள் மற்றும் குடிநீர் போன்ற வசதிகள் இன்மை காரணமாக இடம்பெயர்ந்து, பூநகரியினுடைய பல பகுதிகளிலே வாழ்ந்தார்கள். இப் பொழுதும் சில குடும்பங்கள் அங்கே வாழ்ந்து கொண்டிருக் கின்றன. இந்தப் பொன்னாவெளிக் கிராமத்திற்கு அருகில் இருக்கின்ற வேரவில், வலைப்பாடு, பாலாவி, கிராஞ்சி போன்ற பேரூர்கள் பூநகரிப் பிரதேசத்தினுடைய எல்லையாக பெருமளவு நிலப்பரப்பிலே காணப்படுகின்றன.

2012-2015ஆம் ஆண்டு வரையான காலப்பகுதியில் யாரென்றே தெரியாத சில நபர்கள் அந்த இடங்களிலே ஆராய்ச்சிகளை மேற்கொண்டார்கள். அவர்கள் என்ன ஆராய்ச்சி செய்கின்றார்கள்? என்று கேட்டபொழுது, யாரும் அதுபற்றிச் சொல்லவில்லை. 'சீமெந்துக்கு கல்லெடுக்கப் போகிறோம்' என்றார்களாம். நான்கூட, நேரடியாக அந்த இடத்துக்குச் சென்று பார்த்தேன். அங்கு ஆராய்ச்சி செய்கின்றவர்கள் சொன்னார்கள், "நாங்கள் மண்ணை - நிலத்தை ஆராய்ச்சி செய்கிறோம். ஆனால், எதற்கென்று எங்களுக்கும் தெரியாது" என்று. இவ்வாறு தொடர்ந்து நடந்த ஆராய்ச்சியின்போது, பல குழாய்க் கிணறுகள் 300 அடி வரை ஆழமாகத் தோண்டப்பட்டன. அதுமாத்திரமன்றி, அந்தக் குழாய்க் கிணறுகளிலிருந்து உப்பு நீர் வெளியிலே எடுக்கப்பட்டு தரைக்குப் பாய்ச்சப்பட்டன. மக்களுடைய எதிர்ப்பு மற்றும் அரசியல் ரீதியான நடவடிக்கைகள் காரணமாக - எமது கோரிக்கைக்கு அமைய அந்த நடவடிக்கைகள் 2017ஆம் ஆண்டளவில் இடைநிறுத்தப் பட்டன. இப்பொழுது, மீண்டும் அந்தப் பகுதிகளிலே 'ஆராய்ச்சி' என்ற பெயரில் குழுவொன்று இந்நடவடிக்கையில் இறங்கி இருக்கிறது.

வலைப்பாட்டுக் கிராமத்தினுடைய எல்லைப் பகுதிகளிலும் வேரவில் கிராமத்தினுடைய எல்லைப் பகுதிகளிலும் அதனைச் சுற்றியிருக்கின்ற பொன்னாவெளிக் கிராமத்திலும் மிக இரகசியமாக, நுட்பமான முறையில் அவர்கள் தங்களுடைய ஆய்வுகளை மேற்கொள்கிறார்கள். இதனால், அந்தப் பகுதி யிலே வாழுகின்ற மக்கள் மிகவும் அச்சமடைந் திருக்கிறார்கள். கிராஞ்சி, வேரவில், வலைப்பாடு, பாலாவி போன்ற கிராமங் களில் வாழுகின்ற மக்களுடைய அடிப்படை வாழ்வா தாரமானது, கடலோடு இருக்கிறது; தென்னைப் பயிர்ச் செய்கையோடு இருக்கிறது; விவசாயத்தோடு இருக்கிறது. வேரவில் கிராமமாளது ஒரு விவசாயக் கிராமமாகும். அங்கே இருக்கின்ற மக்கள் விவசாயத்தை நம்பித்தான் வாழ்ந்து கொண்டிருக்கிறார்கள். கிராஞ்சி கிராமமாளது தென்னைப் பயிர்ச்செய்கைக்குரிய ஒரு கிராமமாகும். வலைப்பாடு கிராம மாளது கடற்றொழிலை மையமாகக் கொண்ட ஒரு கிராம மாகும். ஆராய்ச்சி' என்ற பெயரில் மேற்கொள்ளப்படுகின்ற இந்நடவடிக்கையால், தங்களுடைய கிராமங்களைவிட்டுச் செல்லவேண்டி வருமோ என்ற அச்சத்தோடு, மிகவும் துரதிருஷ்டவசமான ஒரு சூழ்நிலைக்குள் அந்தக் கிராம மக்கள் இருக்கிறார்கள். அவர்கள் இது சம்பந்தமாக எனக்கும் சம்பந்தப்பட்டவர்களுக்கும் எழுத்து மூலம் அறிவித்திருக் கிறார்கள். யார் இதனைச் செய்கிறார்கள்? ஏன் இவ்வாறு செய்யப்படுகிறது? என்று பிரதேச செயலாளரைக் கேட்டால், அவர் தனக்குத் தெரியாது என்று சொல்கிறார். அரசாங்க அதிபர் மட்டத்தில் இதுபற்றிய எந்த விளக்கமும் இல்லை. அரசாங்க அதிபரும் தனக்குத் தெரியாது என கையை விரிக்கிறார். ஆனால், அங்கு வருபவர்கள் யார்? அந்த மக்கள் கேட்கின்ற கேள்விகளுக்கு என்ன பதில்?

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, மக்கள் வாழ்கின்ற ஒரு பிரதேசத்தில் அந்த மக்களுடைய எண்ணங் களையும் அவர்களுடைய வாழ்க்கைக் கால நடைமுறை களையும் தூக்கியெறிந்துவிட்டு, அந்தக் கிராமங்களிலே வாழுகின்ற மக்களுக்குச் சொல்லாமல், அங்கு என்ன ஆராய்ச்சிதான் நடைபெறுகிறது? அது எதற்காக மேற்கொள்ளப்படுகிறது? இதனைச் செய்பவர்கள் யார்? ஏன், அரசாங்கம் இது பற்றி உரிய பிரதேச செயலாளருக்கு அறிவிக்கவில்லை? ஏன், இது பற்றி அரசாங்க அதிபர் மட்டத்தில் பேசப்படவில்லை? ஏன், அந்த மக்களுக்கு இது பற்றிய ஒரு தெளிவு ஏற்படுத்தப்படவில்லை? நள்ளிரவில் ஒரு கொள்ளைக்காரன்போல வந்து, இந்த நிறுவனங்கள் அங்கு இவ்வாறான நடவடிக்கைகளில் ஈடுபடுவதை அங்குள்ள மக்கள் பயத்தோடு பார்க்கிறார்கள். எனவே, கிளிநொச்சி மாவட்டத்தினுடைய பூநகரி பிரதேச செயலாளர் பிரிவில் இருக்கின்ற மிக முக்கிய கிராமங்களான வேரவில், கிராஞ்சி, வலைப்பாடு மற்றும் பாலாவி ஆகிய கிராமங்களிலே காலங்காலமாக, பரம்பரை பரம்பரையாக, வரலாற்று ரீதியாக வாழ்ந்து வருகின்ற மக்கள் அச்ச உணர்வில்லாமல் - பயமில்லாமல் - தங்களுடைய மண்ணிலே வாழக்கூடிய சூழல் உருவாக்கப்பட வேண்டும். அதற்கான உறுதிமொழி இந்த அரசாங்கத்தால் அவர்களுக்கு வழங்கப்பட வேண்டும். எதற்காக இந்த ஆராய்ச்சி மேற்கொள்ளப்படுகின்றது? யாரால் மேற்கொள்ளப்படுகிறது? என்பதை சம்பந்தப்பட்ட அமைச்சு உடனடியாகத் தெளிவுபடுத்த வேண்டுமென்பதை நான் இந்தச் சீருயர்ந்த சபையிலே ஒரு கோரிக்கையாக முன்வைக்கின்றேன்.

இதேபோல, இன்னுமொரு விடயத்தையும் நான் இங்கே சொல்ல விழைகிறேன். அண்மையிலே மன்னார் மாவட்டத் தினுடைய மன்னார் தீவிலும் இதே மாதிரியான ஒரு விடயம் கையாளப்பட்டது. மன்னார் தீவில் கனிய மணல் அகழ்வில் ஈடுபடுவதற்கான பாரிய திட்டமொன்று இருப்பதாக நாங்கள் பத்திரிகைகளில் வெளிவந்த செய்திகளினூடாக அறிய முடிகிறது. "மன்னார் தீவிலே 38 துளைகள் இடும் செயற் பாடுகள் முழுமையாக நிறைவடைந்துள்ளதோடு, ஏனைய செயற்பாடுகளும் வெற்றிகரமாக மேற்கொள்ளப்பட்டு வருகின் றமை மகிழ்ச்சியளிக்கின்றது" என்று அவுஸ்திரேலியா நாட் டைச் சேர்ந்த Titanium Sands Limited எனும் தனியார் நிறுவனமானது, 2022.01.11ஆம் திகதி வெளியிட்டுள்ள ஊடக அறிக்கையில் குறிப்பிட்டுள்ளது. இந்த நிறுவனம் மன்னாரில் இவ்வாறானதோர் ஆராய்ச்சியை மேற்கொள்கின்றதா? என்று மன்னார் அரசாங்க அதிபரைக் கேட்டால், அது பற்றி தனக்குத் தெரியாது என்கிறாரே! மன்னார் தீவிலே இதனுடன் சம்பந்தப் பட்ட பிரதேசத்துக்குப் பொறுப்பாக இருக்கின்ற பிரதேச செயலாளர் தனக்கு இது பற்றித் தெரியாது என்று சொல்கி றாரே! அப்படியானால், யார் இதனைச் செய்கிறார்கள்? இது அவுஸ்திரேலியா நாட்டைச் சேர்ந்த கம்பனியாக இருந்தால், நாங்கள் அந்த நாட்டு அரசாங்கத்திடம்கூட ஒரு கோரிக்கையை முன்வைக்கத் தயாராக இருக்கின்றோம்.

மிகப் பெரிய யுத்தத்தையும் அதனால் பல அவலங்களையும் சந்தித்த மக்கள் வாழ்கின்ற மிக முக்கியமான ஒரு பிரதேசத்திலே, அம்மக்களுடைய எந்தவித அனுமதியு மில்லாமல், அவர்கள் குடிபெயரக்கூடிய வகையிலே இந்த நடவடிக்கை மேற்கொள்ளப்படுகின்றதா? இது ஓர் அபாயகரமான சூழலை அந்த மக்களுக்கு ஏற்படுத்தி யிருக்கிறது. மிக முக்கியமாக, Titanium Sands Limited நிறுவனத்துக்கு ஆய்வுக்கான உரிமம் எதனையும் நாம் வழங்கவில்லை என்றும் அந்நிறுவனத்தின் நடவடிக்கைகள் அனைத்தும் சட்டரீதியற்றவை என்றும் புவிச்சரிதவியல் அளவை மற்றும் சுரங்கப் பணியகம் நேரடியாகச் சுட்டிக்காட்டியுள்ளது. புவிச்சரிதவியல் அளவை மற்றும் சுரங்கப் பணியகம் அதற்கான அனுமதி கொடுக்கவில்லை யென்று சொல்கின்றது. ஆனால், உரிய அனுமதியோடுதான் இதனைச் செய்கிறோமென்று Titanium Sands Limited நிறுவனம் சொல்கின்றது. இந்த நாட்டிலே இதற்கு யார் அனுமதி கொடுப்பது? யார் இதனை மேற்கொள்கின்றார்கள்? இதற்கான காரணம் என்ன? தயவுசெய்து, இதனை இந்த உயர்ந்த சபையினூடாவது சம்பந்தப்பட்ட அமைச்சர் சொல்லவேண்டும்.

அண்மையிலே சனாதிபதி அவர்கள் மன்னாருக்குப் போயிருந்தார். அவர் என்ன காரணத்துக்காகப் போனார் என்பதற்கு அப்பால், அவர்கூட இதற்குப் பின்புலத்தில் இருப்பதாகப் பேசப்படுகின்றது. குறிப்பாக, உள்ளூரைச் சேர்ந்த ஐந்து நிறுவனங்களுக்கே அனுமதி வழங்கி யிருப்பதாகவும் அவுஸ்திரேலிய நிறுவனத்துக்கு அனுமதி வழங்கவில்லை என்றும் புவிச்சரிதவியல் அளவை மற்றும் சுரங்கப் பணியகம் சொல்கின்றது. ஆகவே, இது ஒரு பகற்கொள்ளை! அதிகளவில் தமிழர்கள் வாழ்கின்ற பிரதேசங்களில் அவர்களுடைய எண்ணங்களைப் பிரதி பலிக்காமல் அவர்களை நிராகரித்துவிட்டு, அந்த நிலங்களிலே அவர்களுடைய வாழ்வுரிமையைப் பறிக்கின்ற வகையில் ஒரு சதித்திட்டம் அரங்கேறுவதையே எங்களால் பார்க்க முடிகின்றது. இத்திட்டத்தின்படி, மன்னார் தீவிலுள்ள 3,600 சதுர மீற்றர் பரப்பளவுக்குள் 300 துளைகளை இடுவது இலக்காகும். அதனைவிட, ஏற்கனவே இடப்பட்டுள்ள 38 துளைகளில் 33 துளைகள் 02 சதுர மீற்றர் பரப்பளவில் 12 மீற்றர் ஆழத்தைக் கொண்டிருக்கின்றன. அந்த மண்ணிலே பல்வேறுபட்ட வளங்கள் இருப்பதை அடையாளப் படுத்தித்தான் இவையெல்லாம் மேற்கொள்ளப்படுகின்றன. 2002 சதுர கிலோமீற்றர் பரப்பளவைக்கொண்ட மன்னார் மாவட்டத்தில் மன்னார் தீவின் பரப்பளவு 143 சதுர கிலோமீற்றராகும். நீளம் 26 கிலோமீற்றராகவும் அகலம் 6 கிலோமீற்றராகவும் காணப்படுகின்ற இந்த மன்னார் தீவுக்குள் தலைமன்னார், பேசாலை ஆகிய பிரதான பிரதேசங்கள் உள்ளடங்கியுள்ளன. அங்கே காணப்படுகின்ற பெறுமதிமிக்க கனிய வளங்களான இல்மனைட், லுகோக்சின், சிர்க் கோனியம், ரூட்டில், டைட்டேனியம் ஒக்சைட், கிரனைட், சிலிமனைட், ஆர்த்தோகிளேஸ் போன்றவற்றை அடையாளங் கண்டு, அவற்றை எடுப்பதற்கான மிகப்பெரிய வேலைத் திட்டமே இங்கு மேற்கொள்ளப்படுவதாகச் சொல்லப்படு கின்றது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, உலகில் இல்மனைட் எனும் கனிய வளப் படிவுள்ள இடங்களில் இலங்கையில் இருக்கின்ற மன்னார் தீவு 4ஆவது இடத்தில் இருப்பதாகச் சொல்லப்படுகிறது. அங்கு இக்கனிய வளம் மிகப் பெரியளவில் இனங்காணப்பட்டிருக்கின்றது. அதனடிப்படை யில், தமிழர் வாழுகின்ற அந்தப் பகுதியிலே இருக்கின்ற கனிய வளத்தைக் கபளீகரம் செய்வதற்குத்தான் முயற்சிதான் முன்னெடுக்கப்படுகின்றது. அந்த இடத்திலே ஏதாவது பயிரை உற்பத்தி செய்யவோ அல்லது மக்கள் வாழவோ முடியாதவாறு மிகமோசமான முறையில் இந்த ஆய்வு நடவடிக்கைகள் முன்னெடுக்கப்படுகின்றன என்பதைத்தான் எங்களால் அவதானிக்க முடிகின்றது. ஆகவே, இந்த நடவடிக்கை உடனடி யாக நிறுத்தப்படவேண்டும். மன்னார் தீவில் 53 மில்லியன் டொன் கனிய வள மண் உள்ளதாகக் கூறப்படுகின்றது. இக்கனிய வளங்களை அபகரிப்பதற்காக அந்தப் பகுதிகளிலே வாழுகின்ற மக்களை வாழவிடாமல் செய்து, அவர்களை அங்கிருந்து இடம்பெயர வைப்பதற்கான முழுமுயற்சிகளும் மேற்கொள்ளப்படுவதை இந்நடவடிக்கைகளினூடாக நாங்கள் பார்க்கிறோம்.

[ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා]

முல்லைத்தீவு மாவட்டத்தினுடைய கொக்கிளாய், கொக்குத்தொடுவாய், கருநாட்டுக்கேணிப் பகுதிகளிலும் இவ்வாறு இல்மனைட் அகழ்ந்து எடுக்கப்படுகின்றது. இப்பொழுது, யாழ்ப்பாண மாவட்டத்தினுடைய வடமராட்சிக் கிழக்கு நாகர் கோவில் மற்றும் அம்பன் பகுதிகளிலும் இல்மனைட் வளம் இருக்கின்றதா என்பதை அறிய, யாரென்று அடையாளங்காண முடியாத நபர்கள் ஆய்வுகளுக்குச் செல்கின்றார்கள். இவ்வாறு ஆய்வு செய்யப்படுகின்ற பிரதேசங்களிலே இருக்கின்ற கனிய வளங்களை இனங்கண்டு, அவற்றை அபகரிப்பது அவர்களுடைய நோக்கமாக இருக்கின்றது. அரசாங்கத்தினுடைய தகவலின் அடிப்படையில், வடக்கு மாகாணத்தில் மக்கள் வாழுகின்ற பிரதேசங்களில் 40 சதவீதமான நிலங்கள் ஒதுக்கக் காடுகளுக்கென ஒதுக்கப்பட்டிருக்கிறது. ஒருபுறத்தில், 40 சதவீதமான நிலங்கள் ஒதுக்கக் காடுகளாக இனங்காணப்பட்டிருக்கின்றது. மறுபுறத்தில், தொல்பொருள் திணைக்களம் மக்களின் காணிகளைப் பிடித்து, அதில் அவர்களை விவசாயம் செய்ய விடாமல் தடுத்து அவர்களுடைய வாழ்வாதாரத்துக்குத் தீங்கு விளைவித்துக்கொண்டிருக்கின்றது.

மட்டக்களப்பு மாவட்டத்திலுள்ள மாதவனை, மயிலத்தமடு போன்ற இடங்களின் இருக்கின்ற மேய்ச்சல் தரை தொடர்பான பிரச்சினைக்கு நேற்றைய தினம் வழக்குமூலம் ஒரு நீதிமன்ற ஆணையைப் பெறமுடிந்தது. கௌரவ சுமந்திரன் அவர்கள் இங்கே இருக்கின்றார்; அவருக்கும் இந்த விடயம் தெரியும். இந்த அரசாங்கம் மக்களுடைய பிரச்சினைகளைப் பற்றிச் சிந்திப்பதாக இல்லை. எல்லாப் பிரச்சினைகளுக்கும் நாங்கள் நீதிமன்றம் செல்லவேண்டும். சட்டத்தின் அடிப்படையில்தான் எல்லாப் பிரச்சினைகளுக்கும் தீர்வு கிடைக்குமென்றால், இந்த நாட்டிலே வாழுகின்ற இன்னொரு தேசிய இனத்தினுடைய நியதி என்ன? அவர்களுடைய வாழ்க்கை நிலைமை என்ன? அவர்களுடைய கதி என்ன? தயவுசெய்து இது தொடர்பாகச் சற்று சிந்தியுங்கள்! சிங்கள மக்களே! சிங்களத் தலைவர்களே! முதலில் நீங்கள் பரந்துபட்டு யோசியுங்கள்! இனவாதச் சகதிக்குள் நின்று திரும்பத் திரும்பச் சிந்திக்க வேண்டாம். எங்களிடம் இருக்கின்ற வளங்கள் சூறையாடப்படுகின்றன. மயிலத்தமடு, மாதவனை, குறுந்தூர்மலை, வெடுக்குநாறிமலை, உருத்திரபுரம் சிவன்கோவில், நெடுந்தீவு வெடியரசன் கோட்டை உட்பட பல இடங்கள் இவ்வாறு கபளீகரம் செய்யப்பட்ட வருகின்றது; அதற்கான முயற்சிகள் இந்த அரசாங்கத்தால் மேற்கொள்ளப்பட்டு வருகின்றது. இது மிகமோசமான ஒரு நடவடிக்கையாகும். இவ்வாறெல்லாம் நாங்கள் பாதிக்கப்படுகின்ற அதேநேரம், இருக்கின்ற வளங்களையும் சுரண்டுவதற்கு பல வெளிநாட்டுக் கம்பனிகளுக்கு அரசாங்கம் தேவையான உதவிகளையும் வழங்கி வருவதை நாங்கள் பார்க்கின்றோம்.

மன்னார் தீவு, பொன்னாவெளி, நாகர் கோவில் போன்ற இடங்கள் இல்மனைட் மண் வளம் உடைய பிரதேசங்களாகும். அங்கிருக்கின்ற வளம் உறிஞ்சி எடுக்கப்படுகின்றது. ஏற்கெனவே, முல்லைத்தீவு மாவட்டத்திலே கொக்கிளாய், கொக்குத்தொடுவாய் போன்ற இடங்களில் இல்மனைற்றிற்காகக் கூடுதலாக மண் அகழ்ந்து எடுக்கப்பட்டிருக்கின்றது. புல்மோட்டையில் அந்த வளம் இல்லை என்கின்ற செய்திகளும் உண்டு. இவற்றையெல்லாம் கடந்துதான் இப்பொழுது ஏனைய இடங்களில் இருக்கின்ற மண் அகழப்பட்டு கனிய வளம் சுரண்டப்படுகின்றது. ஆகவே, தயவுசெய்து தமிழர் வாழுகின்ற நிலங்களில் இருக்கின்ற வளங்களைச் சுரண்டாது, அவர்கள் நிம்மதியாக வாழக்கூடிய சூழலை உருவாக்குங்கள்! இராணுவப் படைகளையும் பொலிசாரையும் குவித்து அராஜகங்கள் புரிகின்ற அதேநேரம், அவர்களுடைய நிலங்களைப் பறித்தல் மற்றும் வளங்களைச் சுரண்டுதல் போன்ற செயற்பாடுகள் மூலமாக இந்த அரசாங்கம் மறைமுகமாகக் கட்டமைக்கப்பட்ட ஓர் இன அழிப்பு யுத்தத்தை நடாத்துகின்றது என்பதைத்தான் எங்களால் அறியமுடிகின்றது. ஆகவே, இதற்கு ஒரு நீதி வேண்டும் என்பதை வலியுறுத்தி நிறைவுசெய்கின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Next, the Hon. J. C. Alawathuwala. You have seven minutes.

[අ.භා. 3.34]

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බුද්ධිමය දේපළ (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳ සාකච්ඡා වන මේ වෙලාවේ, භූගෝලීය දර්ශක මත ඉදගෙන අපේ රටේ අපටම ආවේණික යම් යම් භෝග නිෂ්පාදනය කරන නිෂ්පාදකයන්ටත්, බුද්ධිමය දේපළ සම්බන්ධයෙන් කටයුතු කරන අයටත් මෙහිදී විශේෂ අවස්ථා ලැබෙන බව කියන්න ඕනෑ. ගරු ඇමතිතුමා මතක් කළා වාගේ අපේ රටේම දෙයක් තමයි කුරුඳු කියන්නේ. අපේ රටේ තිබෙන තත්ත්වයේ කුරුඳු - cinnamon - ලෝකයේ කොහේවත් නැහැ. මැලේසියාවේ තිබෙන්නේ "cassia" නමින් හඳුන්වන වෙනත් වර්ගයක්. අපටම ආවේණික එවැනි දේවල්වලට විශේෂ අවස්ථාවලදී නිසි ස්ථානය ලබා ගැනීම සහ අගයක් ලැබීම ඉතාම වැදගත්.

ඒ කාරණාව වැදගත් වනවා වාගේම, රටේ තිබෙන වර්තමාන තත්ත්වය සම්බන්ධයෙන් වෙළෙඳ අමාත්‍යාංශයේ සාකච්ඡා පවත්වන මේ අවස්ථාවේ, අපට ඒ ගැන කථා නොකර මඟ හරින්න බැහැ. මේ වනකොට අපේ රටේ සමස්ත ජනතාව අපහසුතා රැසකට මැදිවෙලා සිටින බව පැහැදිලිවම කියන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වනකොට විශාල පිරිසක් තම තමන්ගේ එදිනෙදා ජීවිතයේ අත්‍යවශ්‍ය කාරණා ඉටු කර ගන්න බැරි තැනට පත්වෙලා තිබෙනවා. මේකේ වගකීම කවුද ගන්නේ? ඒක තමයි අද තිබෙන ප්‍රධානම ප්‍රශ්නය. මේ රටේ පාලකයන් හැටියට විශේෂයෙන් ජනාධිපතිතුමාගේ සිට කැබිනට් මණ්ඩලයේ හිටපු, ඉන්න ඇමතිවරු දක්වා කිසිම කෙනෙක් මේ වගකීම භාර ගත්තේ නැහැ. අද මොකක්ද සිදුවෙලා තිබෙන්නේ? අද අපේ රටේ ජනතාවට සිද්ධවෙලා තිබෙනවා, තමන්ට අවශ්‍ය ඉන්ධන ටික ගන්න දින ගණන් පෝලිම්වල ඉන්න. ඒ ඉන්ධන හිඟය නිසා අද පැය ගණනක් විදුලිය කපනවා. ඒ නිසා අපේ රටේ නිෂ්පාදන ක්‍රියාවලිය සම්පූර්ණයෙන් ඇණහිට තිබෙනවා. විදුලිය කැපීම නිසා කර්මාන්තශාලා විශාල ප්‍රමාණයක් ක්‍රියාත්මක කර ගන්න බැහැ. ජෙනරේටරයක් තිබුණත් ඒකට අවශ්‍ය ඉන්ධන නැහැ. මේ නිසා අපේ රටේ නිෂ්පාදන ක්‍රියාවලිය සම්පූර්ණයෙන්ම ඇණහිටලා තිබෙනවා. නමුත් එහෙම දෙයක් සිද්ධ වෙලා නැහැ වාගේ තමයි අද රජයේ මැති ඇමතිතුමන්ලා කථා කරන්නේ. නමුත් එදිනෙදා ජීවිතය ගත කරන්න බැරුව, එදිනෙදා ජීවිතය ගැට ගහගන්න බැරුව ජනතාව ඉතාම අපහසු තත්ත්වයකට පත්වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගොවියා සම්බන්ධයෙන් කථා කළොත්, ගොවියාට අවශ්‍ය වෙලාවට පොහොර ලැබුණේ නැහැ. ඒ නිසා ගොවියාගේ නිෂ්පාදන ක්‍රියාවලිය සියයට 40කින් හෝ සියයට 50කින් අඩු වුණා. දැන් නුවරඑළියේ එළවලු ගොවියාට

මොකක්ද සිද්ධවෙලා තිබෙන්නේ? ඔවුන් නිෂ්පාදනය කරපු එළවලු ටික ගලවාගෙන වෙළෙඳ පොළට ගෙන යන්න විධියක් නැහැ. ප්‍රවාහනය සඳහා අවශ්‍ය ඉන්ධන නැතුව අද ඒ එළවලු විනාශවෙලා තිබෙනවා. නුවරඑළිය ප්‍රදේශයේ එළවලු විකුණා ගන්න බැරුව විනාශ වනකොට, අනිකුත් ප්‍රදේශවල එළවලු මිල ඉතා ඉහළ ගිහින් තිබෙනවා. මේ ඉන්ධන ප්‍රශ්නය ඒ හැම දෙයටම බලපා තිබෙනවා. අපට තිබෙන ඉන්ධන සංචිත ප්‍රමාණය ජනවාරි, පෙබරවාරි මාසවලදී අවසන් වනකොට මේ තත්ත්වය උදා වෙනවා කියලා අපි දන්නවා. එහෙම නම්, ඒකට අවශ්‍ය පියවර ගන්න නේද, රජයක් තිබෙන්නේ? කැබිනට් මණ්ඩලයක් තිබෙන්නේ?

ඒ වගකීම ගන්නේ නැතිව අද සම්පූර්ණයෙන්ම රට අඩාළ වෙලා තිබෙනවා. ඒ තත්ත්වය එක් අංශයකට නොවෙයි, සෑම අංශයකටම බලපා තිබෙනවා. ඒ නිසා අද සෑම අංශයක්ම අඩාළ වෙලා, අක්‍රිය වෙලා තිබෙනවා. අපි කියනවා රජය මේ වගකීම භාර ගත යුතුයි කියලා. ඒ විතරක් නොවෙයි, ඇති වෙලා තිබෙන මේ අවාසනාවන්ත තත්ත්වයට වගකියන්නත් ඕනෑ. එම නිසා තමයි අද රටේ ජනතාවට ජීවත් වෙන්න බැරිව තිබෙන්නේ.

මහ බැංකුවේ අධිපතිවරයා -කබ්රාල් මහතා- රටේ ජනතාවට බොරු ප්‍රකාශ ගණනාවක් කර තිබෙනවා. පෙබරවාරි මාසයේ 09 වැනි දා කිව්වා, "අත්‍යවශ්‍ය භාණ්ඩ ගෙන්වීම සඳහා අපට ඩොලර් හිඟයක් නැහැ" කියලා. මහ බැංකුවේ අධිපතිවරයා තමයි එහෙම කිව්වේ. එහෙම කියලා, දවස් 30ක් යන්න කලින් -මාර්තු මාසයේ- කියනවා "මහ බැංකුවට ඩොලර් මවන්න බැහැ" කියලා. මෙවැනි තත්ත්වයක් තමයි මහ බැංකුව තුළ තිබෙන්නේ. මහ බැංකුව අද දේශපාලනීකරණයට ලක් වෙලා තිබෙනවා. මේ ආණ්ඩුවේ හිටපු රාජ්‍ය ඇමතිවරයෙක් තමයි අද මහ බැංකුවේ අධිපතිවරයා බවට පත් කර තිබෙන්නේ. ඒ තමයි කබ්රාල් මහත්මයා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇමෙරිකානු ඩොලර් මිලියන 500ක ස්වෛරීත්ව බැඳුම්කර පිළිබඳව අපේ හර්ෂ ද සිල්වා මැතිතුමාත් පාර්ලිමේන්තුව තුළ ප්‍රශ්න කළා. ඒ ණය ගෙවන්න මහ බැංකුව ඉතා උනන්දු වුණා. නමුත් රටට අත්‍යවශ්‍ය ඉන්ධන ටික ගේන්න අවශ්‍ය වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න මහ බැංකුවවත්, එයට වග කිවයුතු අයවත් උනන්දු වුණේ නැහැ. එහි විපාකය කාටද ගෙවන්න වෙලා තිබෙන්නේ? අද ඒ පව ගෙවන්න වෙලා තිබෙන්නේ මේ රටේ සමස්ත ජනතාවට. මෙවැනි තත්ත්වයක් තුළ රටේ ජනතාව දවස් ගණන් පෝලිම්වල ඉඳගෙන මොකක්ද කියන්නේ? අද ඔවුන් ආණ්ඩුවට සාප කරනවා; මැති ඇමතිවරුන්ට සාප කරනවා. අපි පැහැදිලිවම ආණ්ඩුවට කියනවා හරියට කරන්න බැරි නම්, රටේ ජනතාව එදිනෙදා ජීවත් කරවන්න බැරි නම් පුළුවන් අයට ආණ්ඩුව භාර දෙන්න ඕනෑ කියලා. එහෙම නැතිව තවදුරටත් ජනතාවට පව් දෙන්න එපා. රටේ ජනතාව අද විශාල පාපයක් තමයි ගෙවන්නේ. ආණ්ඩුවට ඡන්දය දීපු අයත්, ඡන්දය නොදීපු අයත් -සමස්ත ජනතාව- අද මේ පීඩාවට මුහුණ පා තිබෙනවා.

කොවිඩ් - 19 වසංගතය ලෝකයේ හැම රටකටම බලපා තිබෙනවා. නමුත් ඒ කිසිම රටකට මෙවැනි අවාසනාවන්ත තත්ත්වයක් උදා වෙලා නැහැ. මේ රටේ ජනතාව දීර්ඝ කාලයක් ගෑස් නැතිව පෝලිම්වල හිටියා. ගෑස් ටැංකි පුපුරලා ජීවිත හානි වුණා; ආබාධ තත්ත්වයට පත් වුණා; දේපළ හානි වුණා. ඒ පිළිබඳව පාර්ලිමේන්තුව තුළ කොපමණ කථා කළාද? නමුත් මේ වනතුරු ඒ සඳහා කිසිම ක්‍රියාමාර්ගයක් අරගෙන නැහැ.

ඉදිරියේදී නැවතත් ගෑස් හිඟයක් ඇති වෙනවා. ගෑස් හිඟයක් නැවතත් ඇති වෙනවාය කියලා ගෑස් සමාගම් කියනවා. ඒ වාගේම මිලත් වැඩි කරනවා. මොනවා කළත් අඩුම ගණනේ ඒවා ලබා ගැනීමේ පහසුව ජනතාවට ලබා දිය යුතුයි. මේ තත්ත්වය තුළ රටේ ජනතාව පීඩාකාරී, මානසික, අවුල් සහගත තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. මේ තත්ත්වය තුළ ගොවියා විතරක් නොව කුඩා ව්‍යාපාරිකයාත්, මධ්‍යම පන්තියේ ව්‍යාපාරිකයාත්, නිෂ්පාදකයාත් ඇතුළු මේ හැම කෙනාටම ප්‍රශ්න පැන නැඟී තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2022 මාර්තු 15වැනි දාට අපි කොළඹ නගරයට ජනතාව ගේනවා. ගොවියා, කම්කරුවා, පෙට්‍රල් පෝලිමේ ඉන්න අය ඇතුළු අපහසුතාවට පත් වෙලා සිටින සියලුදෙනාට අපි ආරාධනා කරනවා, මාර්තු 15වැනි දාට කොළඹ නගරයට ඇවිල්ලා ජනතා විරෝධී -ජනතාව ගැන හිතන්නේ නැති- මේ ආණ්ඩුව පළවා හරින්න අවශ්‍ය මූලික පියවර ගන්න කියලා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු යූ.කේ. සුමිත් උඩුකුඹුර මැතිතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.42]

**ගරු යූ.කේ. සුමිත් උඩුකුඹුර මහතා**
(மாண்புமிகு யூ.கே. சுமித் உடுகும்புர)
(The Hon. U.K. Sumith Udukumbura)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බුද්ධිමය දේපළ (සංශෝධන) පනත් කෙටුම්පත ඉදිරිපත් කරපු අද අපි දැක්කා මීට කලින් කථා කළ මගේ හිතවත්, සමගි ජන බලවේගයේ කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ජේ.සී. අලවතුවල මැතිතුමා අපේ ආණ්ඩුවට නොයෙක් ආකාරයෙන් චෝදනා කළ ආකාරය.

හැබැයි, අපි විශේෂයෙන් එතුමාට මතක් කරලා දෙන්න ඕනෑ ලෝක කොවිඩ් වසංගතය අපේ රටේ ජනතාවට විශාල පීඩනයක්, අම්හිරි අත්දැකීමක් වුණ බව. ඔබතුමාගේත්, මගේත් වාගේම මුළු රටේම ජනතාවගේත් ජීවිත ආරක්ෂා කරන්න අවශ්‍ය එන්නත්කරණ වැඩ පිළිවෙළ අපේ ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ නායකත්වයෙන්, ඉතාම නිවැරදි කළමනාකරණයකින් යුතුව ඉටු කර තිබෙනවා. ලෝකයේ රටවල් 192ක් අතරින් එන්නත්කරණය සාර්ථක වුණු රටවල් 5න් එකක් බවට අපේ රට පත් වුණා කියලා මාධ්‍ය වාර්තා කරනවා අපි දැක්කා. අපේ රජය ත්‍රිවිධ හමුදාව, පොලීසිය, සෞඛ්‍ය ක්ෂේත්‍රය, දේශපාලනඥයන් සහ රාජ්‍ය නිලධාරින් කියන හැමෝම එකතු කරගෙන, පසුගිය අවුරුදු දෙකක කාල සීමාව තුළ රට මුහුණ දුන් දරුණු වසංගත රෝගයෙන් ජනතාව බේරා ගන්න අවශ්‍ය වැඩ පිළිවෙළ ඉතාම නිවැරදිව ක්‍රියාත්මක කළා. රටක් හැටියට අපි කොවිඩ් රෝගයෙන් මිදිලා, ජනතාවත් බේරාගෙන ක්‍රමානුකූලව මේ රට යථා තත්ත්වයට පත් කරගෙන ඉස්සරහට යද්දී විපක්ෂය කළේ රටේ ජනතාවට අවශ්‍ය කාර්ය භාරය නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ කාල සීමාව තුළ විපක්ෂය අපේ රජයේ වැඩසටහන් සියල්ලම කකුලෙන් ඇද්දා. එන්නත ගේන්න හදපු අවස්ථාවේ කිව්වා, "එන්නත් ගේන්න මුදල් නැහැ. එන්නත් ගන්න ලෝකයේ ගිහින් සිඟමන් යදිනවා" කියලා. එන්නත ගෙනාවාම කිව්වා, "ශ්‍රී ලංකාව චීනයේ රසායනාගාරයක් කර ගන්න එපා" කියලා. එන්නත් ටික ගහද්දී ඒකට අවශ්‍ය සහයෝගය දුන්නෙත් නැහැ. විපක්ෂය පුළුවන් තරම් බැලුවේ මේ වැඩ පිළිවෙළ කඩාකප්පල් කරලා, කොරෝනා බෝ කරලා ජනතාව අපහසුතාවට පත් කරන්නයි. ඒ අවස්ථාවේ වග කිව යුතු විපක්ෂයක් හැටියට නොවෙයි ඒ අය කටයුතු කළේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බුද්ධිමය දේපළ (සංශෝධන) පනත් කෙටුම්පත තුළින් අපේ රටට අත් වෙන වාසි මොනවාද

[ගරු යූ.කේ. සුමිත් උඩුකුඹුර මහතා]

කියලා අපි දන්නවා. අද Ceylon Tea, Ceylon Cinnamon සහ Ceylon Pepperහි "Ceylon" නාමයට ලෝකයේම පිළිගැනීමක් තිබෙනවා. අපට ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය තුළින් "Ceylon" සන්නාමය අභිමානවත් විධියට ඉස්සරහට අරගෙන යන්න පුළුවන්. එම නිසා ජාත්‍යන්තර මෙන්ම අභ්‍යන්තර වෙළෙඳ ව්‍යාපාර කටයුතුවලදීත් අපට විශාල ශක්තියක් එක්ක කටයුතු කරගෙන යන්න පුළුවන්.

අද අපි ජාත්‍යන්තර කාන්තා දිනය සමරනවා. අද වැනි දවසක මම විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ, කාන්තාවට අවශ්‍ය රැකවරණය හා ආරක්ෂාව ලබා දුන්නේ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා බව. යුද්ධ කාල සීමාව තුළ අපේ කාන්තාවන්ට වෙච්ච අසාධාරණය අපට අමතක කරන්න බැහැ. මේ මහ පොළොවේ ජීවත් වන අපේ අම්මලාට යුද බිමට ගිය තමන්ගේ දරුවා අහිමි වුණා; බිරින්දෑවරුන්ට තමන්ගේ ස්වාමියා අහිමි වුණා; සහෝදරයන්ට තමන්ගේ සහෝදරයා අහිමි වුණා; දියණියන්ට තමන්ගේ පියා අහිමි වුණා. ඒ අනුව බැලුවාම කාන්තාවන්ට බලවත්ම අසාධාරණය වුණේ යුද්ධ කාල සීමාව තුළයි. හැබැයි, මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාට පින් සිද්ධ වෙන්න යුද්ධය අවසන් කරලා අපේ කාන්තාවන්ට නිසි රැකවරණය, ආරක්ෂාව ලබා දෙන්න පුළුවන් තත්ත්වය උදා කර තිබෙනවා. ඒ යුද ජයග්‍රහණයට නිවැරදි නායකත්වය ලබා දුන්නේ මහින්ද රාජපක්ෂ මැතිතුමාය කියන එක අද මේ කාන්තා දිනය සමරන මොහොතේ අපි විශේෂයෙන් මතක් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද උදේ කථා කළ විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් හිරුනිකා ප්‍රේමචන්ද්‍ර හිටපු මන්ත්‍රීතුමිය ගැන කියනවා මම අහගෙන හිටියා. ඇත්තටම ලජ්ජයි! සජිත් ප්‍රේමදාස මහත්මයා අද එතුමාගේ පක්ෂයේ කාන්තා නායිකාව විධියට ඉස්සරහට අරගෙන තිබෙන්නේ හිරුනිකා මහත්මිය. හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය පසුගිය කාල සීමාව තුළ රන්ජන් රාමනායක හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා සමඟ කළ සංවාදවල ඒ හඬ පටවලට අපි සවන් දුන්නා. අඩුම ගණනේ අම්මා කෙනෙකුටයි, දියණියකටයි එකට වාඩි වෙලා ඒ හඬ පට අහන්න බැහැ. ඒ තරම් අසභ්‍ය, අමු තිත්ත කුණුහරුප, සදාචාරයට පටහැනි වචන පාවිච්චි කරමින් තමයි ඒ අය කථා කරලා තිබෙන්නේ. විරුද්ධ පාර්ශ්වයේ වාඩි වෙලා ඉන්නවා අපේ ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය. ඒ වාගේ හොඳ, වැදගත් මන්ත්‍රීවරියන් ඉන්නවා.

හැබැයි, සජිත් මහත්මයාගේ පක්ෂය විනාශ කරන්න ඉස්සරහට ඇවිත් තිබෙන, ඉතාම පහත් දේශපාලනය කරන හිරුනිකා හිටපු මන්ත්‍රීතුමිය වැනි අය ගැන අපට මේ ගරු සභාවේ කියන්නත් ලජ්ජයි කියන එක විශේෂයෙන් මතක් කරන්න කැමැතියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නවතිනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.48]

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනතට ගෙනැවිත් තිබෙන සංශෝධන පිළිබඳව ගරු ඇමතිතුමා කථා කළා. ඒ යටතේ කියැවුණා, ව්‍යාජ අනුකරණ නැවැත්වීම ගැන. ඒ වාගේම සලකුණු, වෙළෙඳ නාම, ලකුණු ගැනත් අවධානය යොමු කළා. මම මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. මේ ආණ්ඩුවේ තිබෙන බුද්ධිමය දේපළ තමයි "ඩොලර් කළු කඩය" එහෙම නැත්නම් "යූරෝ කළු කඩය" කියන එක අපි මේ වෙලාවේ බොහොම කනගාටුවෙන් සඳහන් කරනවා. මොකද, අද අපේ රටේ බරපතළ ගැටලුවක් විධියට ඩොලර් අර්බුදය තිබියදී පසුගිය පෙබරවාරි 08වන දා මහ බැංකු අධිපතිවරයා කිව්වේ, "අපිට ඩොලර් ප්‍රශ්නයක් නැහැ" කියලායි. එතුමා මාර්තු මාසයේ 02වන දා කිව්වා, මහ බැංකුවට ඩොලර් මවන්න බැහැ කියලා. මේ විහිළුව මොකක්ද කියලා අපි මහ බැංකු අධිපතිතුමාගෙන් අහනවා. මේ කථාව ජනතාවගේ බුද්ධියට නිගාවක් නොවෙයි ද, මෙය බුද්ධිය හොරාකෑමක් නොවෙයි ද කියලා බුද්ධිමය දේපළ (සංශෝධන) පනත් කෙටුම්පත ගැන කථා කරන මේ වෙලාවේ මම වෙළෙඳ ඇමතිතුමාගෙන් අහනවා. මේ ඩොලර් හිඟය නිසා අත්‍යවශ්‍ය ආහාර පාන, බෙහෙත්, අඩුම තරමින් පැනඩෝල් පෙත්තක්වත් අද හොයා ගන්න බැරි තැනට මේ රට පත්ව තිබෙනවා. අත්‍යවශ්‍ය බෙහෙත් වර්ග 60ක් මේ වනකොට වෙළෙඳ පොළේ සොයා ගන්න බැරි තත්ත්වයකට අද රට ගෙනැවිත් තිබෙනවා.

ඉස්සර නම් ලංකාව කිව්වාම "Ceylon Tea" නාමය ගැන කිව්වා. දැන් සලකුණ තමයි ගරු ඇමතිතුමනි, කිරි පිටි පෝලිම. අන්න! දැන් එය ලංකාවේ සලකුණ වෙලා තිබෙනවා. ඊළඟට ඉන්ධන පෝලිම, ඩීසල් පෝලිම, පෙට්‍රල් පෝලිම, භූමි තෙල් පෝලිම තිබෙනවා. හැබැයි, ජනාධිපතිතුමා යනකොට ඒ පාරේ තිබෙන පෝලිම අයින් කරනවා. ඊළඟට, පාන් පෝලිම, ගෑස් පෝලිම, සිමෙන්ති පෝලිම, යකඩ පෝලිම තිබෙනවා. වෙළෙඳ ඇමතිතුමනි, මට ඔබතුමා කියපු කවියක් මතක් වෙනවා. ඒ තමයි, "කාගේ ගැණු කාට ගියත් - අපේ නමට ලැබෙයි ළමයි" කියන කවිය. ඊයේ ඔබතුමන්ලා අනුන්ගේ දරුවෙකුට උප්පැන්නයක් දුන්නා. 2019 මාර්තු 24වන දා යහ පාලන ආණ්ඩුවෙන් මුල්ගල තියපු සිමෙන්ති කම්හල තමුන්නාන්සේලා විවෘත කරලා ඒක තමුන්නාන්සේලාගේය කියලා ඔන්න දරුවා කුල වද්දා ගෙන තිබෙනවා. අසූව් නැවට ඩොලර් මිලියන 6.7ක් ගෙව්වා. නමුත්, ගෙන්වපු පොහොර ඇටයක්වත් අපි ඇහැට දැක්කේ නැහැ. මෙන්න අපේ රටට දැන් තිබෙන සලකුණු. විමල් වීරවංශ හිටපු ඇමතිතුමාට අනුව මට කියන්න තිබෙන්නේ, මේ පෙන්නුම් කරන්නේ කැත -අවලස්සන- ඇමෙරිකානුවාගේ බුද්ධිය කියලායි. වියත් මගේ බුද්ධියෙන් හදලා දීපු බුද්ධිමය දේපළ සහ සලකුණ තමයි ඒක. කුණු බිත්තරයක් තරම් මොළයක් තිබෙන, බුද්ධියෙන් තොර හිස් ඔළුගෙඩි ටික විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අත ඔසවලා ගෙනැවිත් දුන් සලකුණ තමයි මේ.

ගරු චමල් රාජපක්ෂ ඇමතිතුමා මේ වෙලාවේ ගරු සභාවේ සිටිනවා. මම ඔබතුමාට මතක් කරන්න ඕනෑ, මේ වෙලාවේත් ලග්ගල මහවැලි කලාපයේ ජනතාව ගස් උඩ නැඟලා උද්ඝෝෂණයක යෙදී සිටින බව. මෙන්න! අද අපේ සලකුණ; අපේ රටට ඇති වෙලා තිබෙන තත්ත්වය. ජනතාව ඇයි ගස් උඩට නැඟලා ඉන්නේ? ඔවුන්ගේ දරුවන්ට කන්න දෙන්න විධියක් නැහැ; කුඹුරට වතුර ටික දීලා නැහැ; කුඹුර හදලා දීලා නැහැ. ඒ මිනිස්සු ජලාශ හදන්න තමන්ගේ දේපළ පූජා කරපු අය. ඒ අයට වියළි සලාකය දීලා නැහැ. ඒ දරුවන්ට කන්න දෙන්න විධියක් නැහැ ගරු ඇමතිතුමනි. මේ කාරණය මම ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. මෙන්න මේවා නිසා තමයි අද අපේ රට ලෝකයේ කැත නමක් තිබෙන තැනට පත් වෙලා තිබෙන්නේ.

ඒ වාගේම පේටන්ට් බලපත්‍ර ගැන කිව්වා. 2022 පෙබරවාරි 25වන දා ඉඳලා මාර්තු 07වන දා දක්වා දවස් 10ට විතරක් ආණ්ඩුව රුපියල් බිලියන 17.82ක් අච්චු ගහලා තිබෙනවා. වේගයෙන් මුදල්

අච්චු ගැසීමේ පේටන්ට් බලපත්‍රය අපට ගන්න පුළුවන්කම තිබෙනවා, ගරු ඇමතිතුමනි. අද කැම්පස් ටික වහලා තිබෙනවා, පෙර පාසල්, සිනමාශාලා ඇතුළු සියලු ස්ථාන විවෘත කර තිබෙනවා. මෙන්න! අපේ සලකුණ; අපේ බුද්ධිමය දේපළ. මේ රටේ තරුණ පරම්පරාවේ බුද්ධියට මොකක්ද මේ කරන්නේ?

අද කාන්තා දිනය. මම කනගාටු වෙනවා, කාන්තා දිනය පෙනි පෙනී පසු ගිය දවස් ටිකේ සිද්ධ වුණු දේවල් ගැන අද කථා කරන්න වීම ගැන. මහාචාර්ය චරිත හේරත් මන්ත්‍රීතුමා කිව්වා, ඩිජිටල් අවකාශය තුළ අද කාන්තාව දැවැන්ත තර්ජනයකට මුහුණ දී තිබෙනවා කියලා. මම ඒ මන්ත්‍රීතුමාට කියනවා, අද කාන්තාවන්ට අපහාස, උපහාස, පහරදීම් යනාදියත් සිදු වන බව. කාන්තාව තර්ජනයට මුහුණ දී තිබෙන්නේ ඩිජිටල් අවකාශයේ විතරක් නොවෙයි. කාන්තාවගේ ගැටලු කථා කරන්න යන අයටත් අද ගහනවා; තර්ජනය කරනවා; මර්දනය කරනවා; මේ රටේ අසාධාරණය ගැන කථා කළාම මඩ ගහනවාය කියන එක මම එතුමාට කියනවා. මේ පාර්ලිමේන්තුව ඇතුළේ මම වාචික හිංසනයකට ලක් වුණු කෙනෙක්. නමුත් ගරු කථානායකතුමාට අද වෙනකම් බැරි වුණා, ඒ අදාළ මන්ත්‍රීවරයාට විරුද්ධව කිසිම ක්‍රියා මාර්ගයක් ගන්න. මෙන්න! අපේ රටේ පාර්ලිමේන්තුවේ සලකුණ. මේ තැනට අපි අද වැටී තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාලයකට ඉස්සර නම් ලංකාවේ කාන්තාව දේශපාලනයේ වැදගත් සලකුණක් -ලකුණක්- බවට පත් වුණා. ලෝකයේ පළමු අගමැතිනිය, චන්ද්‍රිකා කුමාරතුංග හිටපු ජනාධිපතිතුමිය ලංකා සන්නාමය ලෝකයට ගෙන ගිය අය. නමුත්, අද මොකක්ද වෙලා තිබෙන්නේ? ලංකාවේ පළාත් පාලන නියෝජිතවරියන් 2,002ක් සිටිනවා. එයින් වැඩි හරිය ඉන්නේ පොහොට්ටුවේ; තමුන්නාන්සේලාගේ පක්ෂයේ.

හිරුනිකා ප්‍රේමචන්ද්‍ර හිටපු මන්ත්‍රීතුමිය මිරිහානේ පිහිටි ජනාධිපතිවරයාගේ නිවස ඉදිරිපිටට ගිහින් උද්ඝෝෂණයක් කළා. වැඩිම වුණොත් එතැන 150 දෙනෙක් ඉන්න ඇති. මොකද, එතැනට බස් අරගෙන යන්න විධියක් නැහැ. අන්තිමට මිරිහාන හන්දියේ ඒ බස් ටික නැවැත්තුවා. පුටින්ට ඇඳපු

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

අන්න, දැන් දෙවැනි දවසටත් හිරුනිකා හිටපු මන්ත්‍රීතුමියගේ ගෙදරට මැරයෝ යවා තිබෙනවා. දෙවැනි දවසටත් මැරයෝ යවා තිබෙනවා. අපේ පක්ෂ කාර්යාලයට මැරයෝ එවනවා; කුණු බිත්තර ගහනවා. කටින් පුටින් වුණාට කිසිම තනතුරක් නැති හිරුනිකා ප්‍රේමචන්ද්‍රටත් පජාතියි කියන එක අපි කියන්න ඕනෑ. ඒ නිසායි ඒ විධියට කළේ. මේ ජරා වැඩේ නවත්වන්න කියලා මම ආණ්ඩුවට කියනවා. හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මැතිනිය එතැනට ගියේ තමන්ගේ දේවල් කියන්න නොවෙයි. මේ රටේ අද ගෑස් සිලින්ඩර ආශ්‍රිත පිපිරීම් නිසා කාන්තාවන් මැරෙනවා; දරුවන්ට කන්න දෙන්න විධියක් නැතුව පියවරු ගෙල වැළ ලා ගන්නවා. ගෙදර ආදායම නැති වෙලා තිබෙනවා; කිරි ටික ගන්න පෝලිමේ ඉන්න වෙලා තිබෙනවා; ගෑස් ටික ගන්න පෝලිමේ ඉන්න වෙලා තිබෙනවා; වැඩට යන්න ප්‍රවාහන පහසුකම් නැති වෙලා තිබෙනවා; විදුලිය නැති වෙලා තිබෙනවා. මෙන්න මේ වාගේ දැවැන්ත ප්‍රශ්න ගණනාවකට අපේ කාන්තාවන් අද මුහුණ දීලා තිබෙනවා. මෙන්න මේ ප්‍රශ්න ටික කියන්න තමයි හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මැතිනිය මිරිහානේ තිබෙන ජනාධිපතිතුමාගේ ගෙදර ළඟට ගියේ. අදට කාන්තා දිනය යෙදී තිබෙන බව පෙරේදා වෙනකොට දන්නවා. මේ බව දැන දැනත් ලජ්ජා නැතිව මොනවාද කළේ? මම දන්නවා, හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මැතිනිය රාජපක්ෂ මහත්වරුන්ගේ හුරතලය මැද හැදිච්ච දරුවෙක් බව. ඒ දරුවා මරන්න, තර්ජනය කරන්න ඊයේ දවසේත් මැරයෝ යැව්වා. පළමුවැනි දවසේත් යවලා, දෙවැනි දවසේ කඩු පොලු එක්ක මැරයෝ යවනවා. ඒකෙන් නවතින්නේ නැහැ. අපේ SJB පක්ෂ කාර්යාලයට කුණු බිත්තර ප්‍රහාරයක් එල්ල කරනවා. හරක් වාගේ හැසිරෙන උගත් යැයි කියා ගත්

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ඒකට ගිය එක ගැන අපි කනගාටු වෙනවා. මොකද, ඒ ක්‍රියාව තුළ අද වියත් මග බොහොම පහළට වැටී තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමියට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කථාව අවසන් කරනවා.

අපි ආණ්ඩුවට කියනවා, මේ මස 15වැනි දා අපි කොළඹට එන බව. අපි මේ රටේ කාන්තාවන් එකතු කරගෙන ඇවිල්ලා කොළඹ වටලනවා, අපේ කාන්තාවන් විඳින දුක ගැන කියන්න. පුළුවන් නම් නවත්වන්න කියලා අපි ජනාධිපතිතුමාට කියනවා. ඒ වාගේම හිරුනිකා ප්‍රේමචන්ද්‍ර හිටපු මන්ත්‍රීතුමියට මම කියනවා, ඔබතුමියට වැරදුණා. ඔබතුමියට යන්න තිබුණේ මිරිහානට නොවෙයි. ඔබතුමියට යන්න තිබුණේ අනුරාධපුරයේ ඥානක්කා ළඟටයි කියලා. මොකද,

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

වෙන අය කියන ඒවා අහන්නේ නැහැ. අහන්නේ ඥානක්කා කියන ඒවා විතරයි. ඒ නිසා ඥානක්කාට මම කියනවා, සාස්තරයක් අහන්න ආපු වෙලාවට, 'මේ රටේ දරුවන්ට බොන්න කිරි ටික නැහැ. මේ රටේ කාන්තාවන් දුක් විඳිනවා. මේ රටේ මිනිසුන් කන්න නැතුව දුක් විඳිනවා, පෝලිම්වල දුක් විඳිනවා. ආර්ථිකය කඩා වැටී තිබෙනවා' කියලා ජනාධිපතිතුමාට මතක් කරන්න කියලා.

ඒ වාගේම ජනාධිපතිතුමාට මම කියනවා, ගරු ජනාධිපතිතුමනි,

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

දමන්න, ගාල් කරන්න කියලා.

එහෙම නැත්නම් මට මතක් වෙනවා, වේදිකා නාට්‍යයක තිබෙන කවියක්. ඒ කවිය මේ රටේ ජනතාව ඔබතුමාට කියයි කියා සඳහන් කරමින්, ඒ කවිය කියලා මගේ කථාව නතර කරනවා.

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ඔබතුමාට ඡන්දය දුන් මේ රටේ හැටනවලක්ෂය එහෙම කියන්න කලින් ඔන්න ඔය

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ගන්න කියා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු කනක හේරත් රාජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.58]

**ගරු කනක හේරත් මහතා (සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් වතු ආශ්‍රිත භෝග වගා සහ කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கனக ஹேரத் - கம்பனித் தோட்டங்களை மறுசீரமைத்தல், தேயிலை மற்றும் இறப்பர் தோட்டங்கள் சார்ந்த பயிர்ச்செய்கை, தொழிற்சாலைகளை நவீனமயப்படுத்தல் மற்றும் தேயிலை மற்றும் இறப்பர் ஏற்றுமதி மேம்பாட்டு இராஜாங்க அமைச்சர்)
(The Hon. Kanaka Herath - State Minister of Company Estate Reforms, Tea and Rubber Estates Related Crops Cultivation and Factories Modernization and Tea and Rubber Export Promotion)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි.

අද ලෝක කාන්තා දිනය. එම නිසා මම මේ අවස්ථාවේ විශේෂයෙන් මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරියන් ඇතුළු සියලු කාන්තාවන්ට අපේ උණුසුම් සුබ පැතුම් පිරිනමනවා. මෙවැනි දිනයකදීත් අපේ රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය ඉතාම සැර පරුෂ ආකාරයෙන් කථා කිරීම පිළිබඳව, විශේෂයෙන් ජනාධිපතිතුමාට ඒ ආකාරයෙන් අපහාස කිරීම පිළිබඳව අපි කනගාටු වෙනවා.

2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනතට අද සංශෝධන ඉදිරිපත් කර තිබෙනවා. ලෝක බුද්ධිමය දේපළ සංවිධානයේ සාමාජික රටවල් 189න් එක රටක් හැටියට ශ්‍රී ලංකාව සිටියත්, පසුගිය කාලය තුළ ශ්‍රී ලංකාව තුළ තිබෙන බුද්ධිමය දේපළ එම ක්ෂේත්‍රයේ පිළිගැනීමක් නැති තත්ත්වයට පත් වෙලා තිබුණේ අපේ අණ පනත් ටික හරියාකාරව ඉදිරිපත් කරලා ක්‍රියාත්මක වුණේ නැති නිසායි. ඒ නිසා තමයි බුද්ධිමය දේපළ (සංශෝධන) පනත් කෙටුම්පත මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා අද එය අනුමත කර ගැනීමට නියමිතව තිබෙන්නේ. මේ සඳහා කල්ගත වුණත්, මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම පිළිබඳව ගරු බන්දුල ගුණවර්ධන අමාත්‍යතුමාට අපේ ස්තුතිය පුද කරනවා. බුද්ධිමය දේපළ සඳහා උදාහරණ හැටියට නව නිපැයුම්, කාර්මික සැලසුම්, ප්‍රකාශන හිමිකම්, හෙළිදරව් නොකරන ලද තොරතුරු, විශේෂයෙන්ම භූගෝලීය දර්ශක ආදිය සඳහන් කරන්න පුළුවන්. ඉතාම වැදගත්, කාලෝචිත සංශෝධන පනත් කෙටුම්පතක් තමයි මේ ඉදිරිපත් කරලා තිබෙන්නේ. මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් අපේ කථිකයන් බොහෝ දෙනා විවිධ පාර්ශ්ව ගැන කථා කළා. අපේ කලාකරුවන්ට සිදු වන අසාධාරණය පිළිබඳත් කථා කළා.

අපේ නව නිපැයුම් ඉදිරිපත් කරන කොට ඒ සඳහා නිවැරදි සැලසුමක්, නිවැරදි වැඩ පිළිවෙළක් නැති නිසා අපට ඒ බොහෝ නව නිපැයුම් සඳහා නිසි තැන නොලැබී ගිහින් තිබෙනවා. ගම් මට්ටමේ ඉන්න අපේ තරුණ තරුණියන්, දරුවන්, විශේෂයෙන් විශ්වවිද්‍යාලවල පවා නව නිපැයුම් කර තිබුණත් ඒවා සම්බන්ධයෙන් හරියාකාර වැඩ පිළිවෙළක්, ප්‍රතිපත්තියක් නැති නිසා ඒවාට නිසි තැන ලබාගැනීමේ අවස්ථාව අපේ රටට අහිමි වෙලා, ඒ හේතුවෙන් අපට ආර්ථික වශයෙනුත් බලපෑමක් සිදු වෙලා තිබෙනවා.

අප මෙහිදී විශේෂයෙන් භූගෝලීය දර්ශක ගැන කථා කළොත්, අපට සතුටට පත් වෙන්න පුළුවන් කාරණාවක් තිබෙනවා. 2009 වර්ෂයේ Ceylon Cinnamon GI Status ලබා ගැනීම සඳහා වන කටයුත්ත ආරම්භ කරලා, ඒ පිළිබඳ විශාල වැඩ කොටසක් ක්‍රියාත්මක කරලා වර්ෂ ගණනාවකට පස්සේ පසුගිය වර්ෂයේදී එම භූගෝලීය දර්ශකය ලබා ගන්න අපට හැකියාව ලැබුණා. මේක තමයි වැදගත් වෙන්නේ. එපමණක් නොවෙයි. අද වන කොට තේ සඳහා "Pure Ceylon Tea" කියන සන්නාමය වාගේම අපේ ලකුණ, "සිංහ ලකුණ" වෙනුවෙන් වන වැඩ පිළිවෙළත් අපි ආරම්භ කර තිබෙනවා. එපමණක් නොවෙයි. අපේ රටේ Ceylon Papper, Ceylon Cashew සම්බන්ධයෙනුත් එම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කළ යුතුයි. ඒ සියල්ලට මේ පනත වැදගත් වෙනවා.

ලෝකයේ හොඳම කුරුඳු තිබෙන රට, ලෝකයේ වැඩිම මිලකට අලෙවි වන තේ තිබෙන රට අපේ රට බව අපි දන්නවා. නමුත් පසුගිය කාල වකවානුව තුළ අපේ නම යොදාගෙන කුරුඳුවලට Cassia එකතු කරලා "Ceylon Cinnamon" නමින් ඉදිරිපත් කළා. ඒ වාගේම තමයි තේවලටත්. අපි පසුගිය වර්ෂයේදී තේවලින් බිලියන 1.4ක පමණ අපනයන ආදායමක් ලබා ගත්තා. නමුත් එක තේ ගහක් වවන්නේ නැති, එක තේ කර්මාන්තශාලාවක් නැති සමහර රටවල් අපේ රටේ නම අනවශ්‍ය විධියට භාවිත කරලා මිශ්‍ර කිරීමෙන් පමණක් තේවලින් බිලියන 5,000ක පමණ ආදායම් ලබා ගන්නා අවස්ථා තිබෙනවා.

මා ඉහත කී පරිදි අපේ තේ සඳහා භූගෝලීය දර්ශකය ලබාගැනීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීම සඳහා අපේ අමාත්‍යාංශය විශේෂයෙන්ම කටයුතු කරගෙන යනවා. අපේ වැවිලි අමාත්‍යාංශය CIRAD එක සමග ගිවිසුමක් අත්සන් කළා, මේ වර්ෂය මුලදී. මේ සඳහා මැදිහත් වුණේ ප්‍රංශ තානාපති කාර්යාලය. එහිදී අපට තාක්ෂණික සහාය ලබා දීම සඳහා යුරෝ මිලියන එකක් ලබා දෙන්න එම තානාපති කාර්යාලයේ මැදිහත්වීම හරහා ප්‍රංශ රජය කටයුතු කර තිබෙනවා. අපේ ගරු වැවිලි අමාත්‍යතුමාත්, CIRAD එකත් ඒ ගිවිසුම අත්සන් කළා. එමඟින් අපි බලාපොරොත්තු වෙනවා ඒ වැඩ පිළිවෙළ ඉතා කඩිනමින් ක්‍රියාත්මක කරන්න. එහිදී මේ පනත් කෙටුම්පත ඉතා වැදගත් වෙනවා. මේ පනත් කෙටුම්පත සම්මත වුණාට පස්සේ එය මේ රටේ නීතියක් බවට පත් වෙනවා. ඒ නිසා ඒක වැදගත් කාරණාවක් හැටියටයි අපි දකින්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අපේ "Pure Ceylon Tea" ගැන මා කියන්න ඕනෑ. තේ ගොවියෙකු හැටියට ඔබතුමා මටත් වඩා හොඳින් අපේ තේ පිළිබඳව දන්නවා. අපේ අනන්‍යතාව තිබෙන්නේ "Pure Ceylon Tea"වලට පමණක් නොවෙයි. "Pure Ceylon Tea" සඳහා අනන්‍යතාව ජාත්‍යන්තර මට්ටමින් අපට තිබෙනවා වාගේම, ප්‍රාදේශීය මට්ටමින් ද අපේ තේ සඳහා මුළු ලෝකය පුරා අනන්‍යතාවක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් දන්නා "රුහුණ තේ" එයට උදාහරණයක්. රුහුණ, නුවරඑළිය, Kandy, දිඹුලුව, සබරගමුව ආදි වශයෙන් ඒ සියල්ල සඳහා වෙන වෙනම භූගෝලීය දර්ශක ලබා ගැනීමට අපට හැකියාව ලැබෙනවා. මෙහිදී ප්‍රධාන වශයෙන් භූගෝලීය දර්ශකවලට ආවේණික දේශගුණ තත්ත්වය, පස, පරිසරය ආදි සාධක වැදගත් වනවා. අපි තේ සඳහා වන වැඩ පිළිවෙළ දැනටමත් ආරම්භ කරලායි තිබෙන්නේ. ඒ වැඩසටහන තුළින් තේ සඳහා භූගෝලීය දර්ශක ඉදිරි වර්ෂ කිහිපය තුළ කඩිනමින් ලබා ගන්න අපි බලාපොරොත්තු වෙනවා. මෙම වැඩසටහන යටතේ ප්‍රථමයෙන්ම යුරෝපා සංගමයේ certification එක, එහි අදාළ සාමාජිකත්වය ලබාගෙන ඉන් පසුව අනෙකුත් රටවලට ඒ GI Status ලබාගෙන අපේ අනන්‍යතාව තහවුරු කරලා වෙනත් විධියකින් අපේ ප්‍රමිතිය සහ අපේ අනන්‍යතාව ආරක්ෂා කර ගැනීමට අපට හැකියාව ලැබෙනවා. මෙය වැදගත් වන්නේ,

"Pure Ceylon Tea" සඳහා වාගේම අපේ සිංහ ලකුණ වෙනුවෙන්. මේ පනත් කෙටුම්පත සම්මත වුණාට පස්සේ මෙම වැඩ පිළිවෙළ යටතේ එක් එක් කලාපවල තේවල තිබෙන ගුණාත්මකභාවයේ වෙනස්කම් ඔප්පු කිරීම සඳහා වන වැඩ කටයුතු අපි ක්‍රියාත්මක කරනවා. එයින් පසුව, අපේ රටේ තේ වගා කරන හැම තැනකම නිෂ්පාදනය කරන තේවලට තිබෙන ආවේණික ලක්ෂණ හඳුනා ගැනීමට අපි බලාපොරොත්තු වෙනවා.

මෙසේ භූගෝලීය දර්ශක ලබා ගැනීමේ අවශ්‍යතාවක් තිබෙන්නේ ඇයි කියලා කෙනෙකු අහන්න පුළුවන්. එහි වාසි මං කියන්නම්. එකක් තමයි, අද අපේ රටේ තිබෙන ප්‍රමිතියෙන් යුත් තේ එකට වැඩි වටිනාකමක් ලැබීම. තේ වෙන්දේසියේදී ලෝකයේම වැඩිම මිලක් ලබා දෙන්නේ අපේ රටේ තේ, එහෙම නැත්නම් "Ceylon Tea" සඳහායි. නමුත් අපේ ඒ තේ වෙනත් රටවලට ගිහින් මිශ්‍ර වෙලා අවසානයේදී වටින්නේ නැති තත්ත්වයට පත් වෙනවා. මේ සහතිකය ලබා ගැනීම තුළින් එහි ප්‍රමිතිය ආරක්ෂා කර ගන්න අපට හැකියාව ලැබෙනවා. කුරුඳුවලින් වාගේම තේවලිනුත් අද ලැබෙන මුදලට වඩා වැඩි මුදලක් ලබා ගන්න, තරගකාරිත්වයෙන් ඉදිරියට යන්න අපට හැකියාව ලැබෙනවාය කියන එක මම මේ අවස්ථාවේ ඉතා සතුටින් සඳහන් කරන්න කැමැතියි. වෙළෙඳ අමාත්‍යාංශයේ වාගේම, කාර්මික සංවර්ධන මණ්ඩලයේ මැදිහත්වීම තුළින් ඉදිරි කාලයේදී අපේ මේ වැඩසටහන්වලට පූර්ණ සහයෝගය අපට ලබා දෙන්න කියා අපි ගරු වෙළෙඳ අමාත්‍යතුමාගෙන්, එම අමාත්‍යාංශයේ සියලු නිලධාරින්ගෙන් වාගේම කාර්මික සංවර්ධන මණ්ඩලයේ සියලු නිලධාරින්ගෙන් ඉල්ලා සිටිනවා. අපි මේ අවස්ථාවේ අපේ විශේෂ ස්තුතිය ප්‍රංශ රජයට සහ එම තානාපති කාර්යාලයට පුද කරනවා, අපට යුරෝ මිලියනයක මුදලක් ලබා දීලා මේ වැඩසටහන ආරම්භ කරන්න කටයුතු කිරීම පිළිබඳව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාත්‍යන්තර කාන්තා දිනය සමරන අද අපට, අපේ රටට ශක්තියක් වූ, අපේ ජනගහනයෙන් බහුතරයක් වන කාන්තාවන් සියලුදෙනාට සියලු ශක්තිය ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මා නවතිනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

The next speaker is the Hon. Shanakiyan Rajaputhiran Rasamanickam. You have five minutes.

[பி.ப. 4.08]

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! இன்று சர்வதேச மகளிர் தினமென்பதால், முதலில் உலக மெங்கும் வாழும் அனைத்து மகளிருக்கும் மகளிர் தின நல்வாழ்த்துக்களைச் சொல்லிக்கொள்கிறேன். இன்றைய தலைப்புத் தொடர்பில் பேசுவதைவிட, இந்த நாட்டுக்கு அந்நியச் செலாவணியைப் பெறுவதற்கான வழிவகைகளைப் பற்றிப் பேசுவது சிறப்பாக இருக்கும் என்று கருதினாலும் தற்போது நாட்டு மக்கள் முகங்கொடுத்திருக்கும் பாரிய பிரச்சினைகளான மின்வெட்டுப் பிரச்சினை மற்றும் எரிபொருள் இல்லாத பிரச்சினை என்பன பற்றி ஒருசில விடயங்களைச் சொல்வது பொருத்தமானதாக இருக்குமென நான் நினைக்கின்றேன். மட்டக்களப்பு மாவட்டத்தின் பெரிய கல்லாறுப் பிரதேசத்திலே மின்வெட்டு தொடர்பில் ஓர் எதிர்ப்பு நடவடிக்கையை மேற்கொள்ளப்போவதாக அண்மையிலே நான் முகநூலிலே பதிவிட்டிருந்தேன். அப்பதிவை இட்டு ஐந்து நிமிடத்துக்குள் இளைஞர்கள் அணி அணியாகத் திரண்டு வந்து, அந்த இடத்திலே பாரிய எதிர்ப்பைக் காட்டினார்கள்.

அமைச்சர்கள் மற்றும் அரசாங்கத் தரப்புப் பாராளுமன்ற உறுப்பினர்கள்கூட, தனியாகக் கூட்டங்களை நடத்தி அரசாங்கத்துக்கு ஆலோசனை சொல்லும் அளவுக்கு நிலைமை மாறியிருக்கிறது. அரசாங்கத்திலிருக்கும் முக்கிய நபரான முன்னாள் சனாதிபதியுடன் ஒருசில அமைச்சர்கள் உட்பட 31 பாராளுமன்ற உறுப்பினர்கள் இணைந்து ஒரு கூட்டத்தை நடத்தி சனாதிபதி அவர்களுக்கும் நிதி அமைச்சருக்கும் மத்திய வங்கியின் ஆளுநருக்கும் சில ஆலோசனைகளை வழங்கியதை நாங்கள் அண்மையிலே பார்த்தோம். அவ்வாறு ஆலோசனை வழங்கிய இரண்டு அமைச்சர்களை அமைச்சுப் பதவியிலிருந்து நீக்கியதையும் நாங்கள் பார்த்தோம்.

தமிழ் மக்களுடைய வாக்குகளால் தெரிவுசெய்யப்பட்டு வடக்கு, கிழக்கைப் பிரதிநிதித்துவப்படுத்தும் அரசுடன் இணைந்திருக்கும் பாராளுமன்ற உறுப்பினர்களாக இருக்கலாம், இராஜாங்க அமைச்சர்களாக இருக்கலாம், மாவட்ட அபிவிருத்திக் குழுத் தலைவர்களாக இருக்கலாம், இன்று நாட்டிலே மக்கள் பெரும் கஷ்டங்களுக்கு மத்தியில் வாழ்ந்துகொண்டிருக்கின்ற சூழ்நிலையில், அவர்கள் மௌனம் காப்பதுதான் கவலையாக இருக்கிறது. தாங்கள் பிரதிநிதித் துவப்படுத்தும் மக்கள் கஷ்டப்படுகின்றபொழுது, அந்த மக்களுடைய வேதனையைப் புரிந்துகொண்டு கோட்டாபய ராஜபக்ஷ அவர்களை சனாதிபதியாக்குவதற்கு உழைத்த முக்கிய அமைச்சர்கள் அரசாங்கத்துக்கு ஆலோசனைகளை வழங்குவதைப் பார்க்கக்கூடியதாக இருக்கின்றது. இன்று அரசாங்கத்துடன் இருக்கின்ற வடக்கு, கிழக்கைச் சேர்ந்த தமிழ்ப் பிரதிநிதிகள் அரசாங்கத்துக்கு ஆலோசனை வழங்கும் அளவுக்குத் திராணியில்லாதவர்கள் என்பது எங்களுக்குத் தெரியும்! இருந்தாலும், மக்கள் படும் கஷ்டங்களைப் புரிந்து கொண்டு ஆகக்குறைந்தது ஓர் அறிக்கையையாவது விடலாமே! முதலில் எங்களுடைய மக்கள் உரமில்லாமல் கஷ்டப்பட்டார்கள். அதுமாத்திரமன்றி, மீன்பிடித்துறை அமைச்சருடைய செயற்றிறனற்ற நடவடிக்கைகளால் வடக்கு, கிழக்கிலே இருக்கும் மீனவர்கள் பாதிக்கப்படுகின்றார்கள்.

பேக்கரி தொழிற்றுறையை எடுத்துக்கொண்டால், இன்று வடக்கு, கிழக்கிலே ஒரு பேக்கரியும் இயங்கவில்லை. அண்மையிலே நாங்கள் பயங்கரவாதத் தடைச் சட்டத்தை நீக்குமாறு கோரி கையொப்பங்களைச் சேகரிப்பதற்காக மலையகத்துக்குச் சென்றிருந்தபோது, அங்குள்ள பேக்கரிகளின் நிலைமை மோசமாக இருந்ததைக் காணக்கூடியதாக இருந்தது. அவர்கள் தங்களுடைய வாழ்வாதாரத்தை இழந்திருக்கிறார்கள். பதவி ஆசைக்காக, வாகனங்கள் கிடைக்கும் என்பதற்காக, சம்பளம் கிடைக்கும் என்பதற்காக, தங்களுடன் சுற்றுபவர் களுக்குச் சம்பளத்தையும் தேவையான வசதிகளையும் கொடுக்கலாம் என்பதற்காக மக்கள் படும் கஷ்டத்தைப் பார்த்தும் வடக்கு, கிழக்கிலே மாவட்ட அபிவிருத்திக் குழுத் தலைவர் என்ற பதவியை வைத்துக்கொண்டிருப்பவர்கள் மௌனம் காக்கின்றார்கள். ஏன், வெளியில் வந்து மக்களு டைய கஷ்டத்தைப் பற்றி ஒரு வார்த்தைகூட இவர்களால் சொல்ல முடியாது?

தற்பொழுது, இச்சபைக்குத் தலைமைதாங்கும் மாத்தறை மாவட்டத்தைப் பிரதிநிதித்துவப்படுத்துகின்ற கௌரவ உறுப்பினர் ஆளுங்கட்சியைச் சேர்ந்தவராக இருந்தாலும் இந்தச் சகோதரர், அரசாங்கத்தின் மோசமான செயற்பாடு களுக்கு எதிரான கருத்துக்களை வெளியிடும் இடங்களிலே

[ගරු සාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

இருந்ததை நான் பார்த்திருக்கிறேன். அவரால் அவ்வாறு செய்ய முடியுமென்றால் ஏன், மட்டக்களப்பு மாவட்டத்தைப் பிரதிநிதித்துவப்படுத்தும் வியாழேந்திரன், 'பிள்ளையான்' போன்றோர்களால் இதைச் செய்ய முடியாது? "இன்று எங்களுடைய மக்கள் மின்சாரம் இல்லாமல் கஷ்டப்படுகிறார்கள்; ஆகையால், இந்த அரசாங்கம் உரிய நடவடிக்கையை மேற்கொள்ளவேண்டும்" என்று ஏன் இவர்களால் சொல்ல முடியாது? ஏனென்றால், அவர்கள் மக்களுக்காக அரசியலுக்கு வந்தவர்கள் அல்லர். சுயநலத்திற்காக- சுயலாபங்களுக்காக, கொலைகளை, கற்பழிப்புக்களை மறைப்பதற்காகத்தான் இவர்கள் பாராளுமன்றத்திற்கு வந்திருக்கலாம் என்றுகூட எங்களால் சொல்லமுடியும்.

சர்வதேச மகளிர் தினமான இன்று சபை ஒத்திவைப்பு வேளையின்போது, பெண்கள் தொடர்பான ஒரு பிரேரணையை கௌரவ உறுப்பினர் ஒருவர் கொண்டுவர இருக்கின்றார். அந்தப் பிரேரணையிலே அவர் ஒரு விடயத்தைச் சேர்த்துக்கொண்டால் நன்றாக இருக்கும். மட்டக்களப்பு மாவட்டத்திலே பிறேமினி என்ற ஒரு சகோதரி சில வருடங்களுக்கு முதல் வெலிகந்தையில் வைத்து கற்பழித்துக் கொலை செய்யப்பட்டார். அதைச் செய்தவர்கள் மட்டக்களப்பிலே செல்வாக்குள்ள ஓர் அரசியல் கட்சியைச் சேர்ந்தவர்கள். அதாவது, தமிழ் மக்கள் விடுதலைப் புலிகள் கட்சிக்கு எதிராகத்தான் அந்தக் கொலைக் குற்றச்சாட்டு இருக்கிறது. இதனை நான் சொல்லவில்லை; ஊடகங்களில் சொல்லப்பட்டது. அந்தக் கட்சியைப் பிரதிநிதித்துவப்படுத்துகின்ற ஒருவர் இன்று பாராளுமன்றத்திலே அங்கம் வகிக்கின்றார். இதனை அவர் செய்தார் அல்லது அவருடைய நண்பர்கள் செய்தார்கள் என்று நான் சொல்லவில்லை. "தமிழ் மக்கள் விடுதலைப் புலிகள் என்ற கட்சிதான் பிறேமினியினுடைய கொலைக்குப் பொறுப்பு" என்று சொல்லப்படுகின்றது. அப்படியான ஒருவரை நீங்கள் பாராளுமன்றத்திலே உங்களுடைய சகாவாக வைத்துக்கொண்டு, இன்று பெண்கள் தொடர்பில் ஓர் ஒத்திவைப்புப் பிரேரணையைக் கொண்டு வரப் போகின்றீர்கள். ஒத்திவைப்புப் பிரேரணை மீதான விவாதத்திலும் நான் சில விடயங்களைப் பேசலாமென்று நினைக்கின்றேன்.

இன்று எங்களுடைய மாவட்டத்திலே நிர்வாக ரீதியாக மிக மோசமான ஒரு விடயம் நடந்துகொண்டிருக்கிறது. வட்டாரத்திலே வென்ற உறுப்பினர்களுக்கு நாற்பது இலட்சம் ரூபாய் நிதி ஒதுக்கீடு வழங்குவதாக கௌரவ நிதி அமைச்சர் அவர்கள் வரவு செலவுத்திட்ட உரையிலே சொல்லியிருந்தார். அதாவது, வட்டாரத்தில் வென்ற பிரதேச சபை உறுப்பினருக்கோ அல்லது மாநகர சபை உறுப்பினருக்கோ நாற்பது இலட்சம் ரூபாய் நிதி ஒதுக்கப்படும் என்று கூறியிருந்தார். இன்று ஆளுங்கட்சியைச் சேர்ந்த ஒருசிலர் பிரதேச அபிவிருத்திக் குழுத் தலைவர், மாவட்ட அபிவிருத்திக் குழுத்தலைவர் என்ற பதவிகளை வைத்துக்கொண்டு, அந்த நாற்பது இலட்சம் ரூபாய்க்கான முன்மொழிவுகளை வழங்குவதாகக் கூறுகிறார்கள். அப்படியென்றால், இந்த நாட்டில் ஜனநாயகம் இல்லையா? குறித்த வட்டாரத்திலே மக்களால் தெரிவுசெய்யப்பட்டவருக்கு அந்தத் தெரிவைச் செய்ய முடியாவிட்டால், பிறகு எதற்கு இந்த நாட்டிலே ஜனநாயகம்? உள்ளூராட்சிச் சபைகளைக் கலைத்துவிட்டு, மாவட்ட அபிவிருத்திக் குழுத் தலைவரிடம் அந்தப் பொறுப்பைக் கொடுங்கள்!

மாவட்ட அபிவிருத்திக் குழுக் கூட்டம் நடந்த வேளையிலே, சவாலுக்கு மத்தியிலே நானும் என்னுடைய சக உறுப்பினர் 'ஜனா'வும் இணைந்து, இதனை ஆளுநரிடம் ஆணித்தரமாகச் சொன்னோம். அந்த சபையைக் குழப்பும் அளவுக்குச் செயற்பாடுகள் நடந்த பிறகு, ஆளுநர் சொன்னார், "அது சரி, மன்னித்துக்கொள்ளுங்கள்! நான்காகப் பிரித்து பத்து இலட்சம் வீதம் வழங்குகின்றோம். முதலாவது quarter இற்கான பத்து இலட்சம் ரூபாய்க்கான செயற்றிட்டங்களை நாங்கள் தீர்மானித்துவிட்டோம். மீதியாகவுள்ள முப்பது இலட்சத்திற்கு நீங்கள் உங்களுடைய வட்டார உறுப்பினர்கள்மூலமாக முன்மொழிவுகளைத் தாருங்கள்" என்று. 2022.02.28ஆம் திகதிதான் அதற்கான இறுதித் திகதி. ஆனால், அதற்கான கடிதம் இன்றுதான் கிடைத்திருக்கிறது. அதாவது, மார்ச் 08ஆம் திகதியான இன்றுதான் சில வட்டார உறுப்பினர்களுக்கு அக்கடிதம் கிடைத்திருக்கின்றது. அவர்கள் இப்போது தங்களுடைய முன்மொழிவுகளை வழங்கினால், அதை ஏற்க முடியாது என்றுகூட பிரதேச செயலாளர் சொல்லலாம். நான் என்னுடைய Director, Planning உடன் இது சம்பந்தமாகக் கதைத்துவிட்டு, எங்களுடைய தவிசாளருக்கும் சில வட்டார உறுப்பினர்களுக்கும் தொலைபேசி அழைப்பை எடுத்து விடயத்தை எடுத்துச் சொன்னதால் முன்மொழிவுகளை உள்வாங்கக்கூடியதாக இருந்தது.

இன்று நாட்டில் எவ்வளவோ பிரச்சினைகள் இருக்கின்றன. மின்சாரம் இல்லை; எரிபொருள் இல்லை. இந்த நிலையிலே நீங்கள் மக்களைப் பற்றிச் சிந்திக்காமல், உங்களுடைய அரசியலை நடத்துவதற்காக முயற்சிக்கின்றீர்கள். அரசாங்கத்தின் கைக்கூலிகளாக இருந்துகொண்டு, அரசாங்கத்தால் வழங்கப்படும் எல்லாச் சலுகைகளையும் பெற்றுக்கொண்டு மக்களுக்குத் தேவையான விடயங்களைப் பற்றிப் பேசாமல் இருப்பதற்கு எதிர்காலத்தில் மக்கள் உங்களுக்குச் சரியான பாடத்தைக் கற்பிப்பார்கள் என்று சொல்லி, என்னுடைய உரையை முடித்துக்கொள்கின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**

(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)

(The Hon. Presiding Member)

පිළිතුරු කථාව, ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමා. ඔබතුමාට විනාඩි නවයක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.15]

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා (වෙළෙඳ අමාත්‍යතුමා)**

(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன - வர்த்தக அமைச்சர்)

(The Hon. (Dr.) Bandula Gunawardana - Minister of Trade)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද බුද්ධිමය දේපළ (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳ විවාදයට සහභාගි වූ සියලු ගරු මන්ත්‍රීතුමන්ලාට අපේ ගෞරවයත්, ස්තුතියත් පුද කරනවා. එහිදී මතු වූ කරුණු කිහිපයක් පිළිබඳව කියන්න ඕනෑ. විශේෂයෙන්ම මහාචාර්ය චරිත හේරත් මැතිතුමා මේ පනත් කෙටුම්පතට අදාළව, එහි සංවර්ධනය වෙනුවෙන් අලුත් අදහස් කිහිපයක් පිළිබඳව අපේ අවධානයට යොමු කළා. ඔබ අප සියලුදෙනා දන්නා ලෙස මේ ලෝකයේ වෙනස් වීම හැර අන් සියලුදේ වෙනස් වෙනවා. වෙනස් වීම තුළ ඉතා වේගයෙන් වෙනස් වන තොරතුරු තාක්ෂණය හා සම්බන්ධ කරුණු කාරණා විශාල ප්‍රමාණයක් ලෝක තාරුණ්‍යය විසින් නව නිපැයුම් ලෙස නිර්මාණය කර ලෝකයට දායාද කරනවා. නිදහස ලැබෙන්නට පෙර, මේ රට බ්‍රිතාන්‍ය යටත් විජිතයක් බවට පත් වීමෙන් පසු පැවැති ස්වයංපෝෂිත කෘෂිකාර්මික ආර්ථික රටාව වෙනස් කරලා, නිදහසින් පසුව තේ, රබර්, පොල් වැවිලි කෘෂිකාර්මික ආර්ථිකය පටන් ගත්තා. අපේ ගරු කනක හේරත් රාජ්‍ය අමාත්‍යතුමා සඳහන් කළ පරිදි එදා සිට අද දක්වාම අපේ ප්‍රධාන අපනයන භෝගය බවට තේ පත් වුණා. ඒ දීර්ඝ කාලීන ඉතිහාසය තුළ තේ අපනයනය

කරලා, පසුගිය වර්ෂයේදී අප ලබා ගත් ආදායම ඇමෙරිකානු ඩොලර් බිලියන 1.3යි. මෑත ඉතිහාසය තුළ සංවර්ධනය වූ තොරතුරු තාක්ෂණය තුළ සේවා අපනයනය කරලා අප ලබා ගත් ආදායම ඇමෙරිකානු ඩොලර් බිලියන 1.2යි. මේ සම්බන්ධයෙන් මා ගරු සභාවේ විශේෂ අවධානය යොමු කරවනවා. අපි බුද්ධිය අපනයනය කරලා ඇමෙරිකානු ඩොලර් බිලියන 1.2ක් හොයනකොට, දීර්ඝ කාලීන සාම්ප්‍රදායික තේ අපනයනයෙන් හොයලා තිබෙනවා, ඇමෙරිකානු ඩොලර් බිලියන 1.3ක්.

දෘෂ්‍ය අපනයනය හා අදෘෂ්‍ය අපනයනය කියලා කොටස් දෙකක් තිබෙනවා. භාණ්ඩ අපනයනය දෘෂ්‍ය අපනයන වෙළෙඳාමට අදාළ වෙනවා. අදෘෂ්‍ය අපනයන වෙළෙඳාමට තමයි සේවා අපනයනය අදාළ වෙන්නේ. තොරතුරු තාක්ෂණික සේවා අපනයනය කිරීමෙන් ඉන්දියාව වර්ෂයකට අපනයන ආදායම ලෙස ඇමෙරිකානු ඩොලර් බිලියන 200කට ආසන්න ප්‍රමාණයක් උපයා ගන්නවා. එහෙම කළොත්, අපේ මේ ප්‍රශ්න -ඩොලර් ප්‍රශ්න- සියල්ල ඉවරයි. මේ රටේ දරුවන්ගෙන් අතිමහත් බහුතරය, තාරුණ්‍යයෙන් අතිමහත් බහුතරය තොරතුරු තාක්ෂණය පිළිබඳ සේවා, software engineering වෙන්න පුළුවන්, hardware engineering වෙන්න පුළුවන්, robotics වෙන්න පුළුවන්, අලුත් තාක්ෂණයට අදාළ සේවා වැඩි වැඩියෙන් අපනයනය කළොත්, අපේ මේ ඩොලර් ප්‍රශ්නය අපට අර්බුදයක් වෙන්නේ නැහැ. එය දැනගෙන තමයි තුන්කල් දක්නා නායකයෙකු ලෙස මහින්ද රාජපක්ෂ මැතිතුමා එදා ජනාධිපති ධුරයට පත් වීමෙන් පසුව රටේ සියලු ප්‍රදේශවල - උතුරු නැඟෙනහිර ඇතුළුව - මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාර දහසක් ඇති කළේ. ඒ සෑම මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාරයකම පරිගණක හතළිහකින් යුක්ත පරිගණක විද්‍යාගාරයක් - IT lab-, පරිගණක විස්සක් තිබෙන භාෂාගාරයක් - language lab -, තනි පරිගණකයක් තිබෙන ගණිතාගාරයක් - mathematics lab - සහ distance learning lab එකක් තිබුණා. පරිගණක හැටදෙකක් සහිතව තමයි මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාර ඇති කළේ. මේ අනාගතය දැකලා තමයි ඒවා එසේ ඇති කළේ. අපේ රටේ අපනයන ක්ෂේත්‍රයේ ඉතා කෙටි කාලයක් තුළදී සංවර්ධනය කළ යුතු අංශය දැකලා තමයි එසේ කළේ. නමුත් අවාසනාවකට පසුගිය යහ පාලන රජය කාලයේ තාක්ෂණ විෂය ධාරාව සම්බන්ධයෙන් කටයුතු කළේ කොහොමද? නමුත් මම ගරු කරනවා, අපේ ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමාට. එතුමා උසස් අධ්‍යාපන අමාත්‍යවරයා වශයෙන් සිටියදී තාක්ෂණ විෂය ධාරාව විශ්වවිද්‍යාල පද්ධතියට ගෙන යෑම සඳහා විශ්වවිද්‍යාල තුළ තාක්ෂණ පීඨ ආරම්භ කරන්නත් කටයුතු කළා.

ඒ තත්ත්වය තුළ අපි මේ රටේ අනාගතය ගැන නම් කථා කරන්නේ, මෙවැනි බුද්ධිමය දේපළ පිළිබඳ සංවාදයක් ඇති වන අවස්ථාවේදී සාධනීය, ධනාත්මක එවැනි වෙනස්කම් පිළිබඳව දේශපාලන පක්ෂ, පාට භේදයෙන් තොරව යෝජනා ඉදිරිපත් වෙයි කියා මම හිතුවා. ඒ යෝජනා අපේ පැත්තේ ගරු චරිත හේරත් මැතිතුමා විසින් ඉදිරිපත් කළා. ගරු මන්ත්‍රීතුමනි, අපි ඒ සම්බන්ධයෙන් මැදිහත් වෙනවා. ඒ වාගේම තේ, කජු, වල්ලපට්ට වැනි දෑ පිළිබඳවත්, දේශීය ආහාර පාන යනාදිය පිළිබඳවත් විවිධ අමාත්‍යාංශ සමඟ ඒකාබද්ධ වෙලා භූගෝලීය දර්ශකය ලබා ගැනීමට අනාගතයේදී මැදිහත් වන බවත් මම සඳහන් කරන්න කැමැතියි.

වර්තමාන සිදුවීම් අල්ලාගෙන අද විපක්ෂයෙන් විශාල ලෙස අපට චෝදනා එල්ල කළා. විදුලිය නැහැ, ඩීසල් නැහැ, පාරවල් වැහිලා, පෝලිම් තිබෙනවා, උද්ඝෝෂණ කරනවා යනාදී වශයෙන් අපට චෝදනා එල්ල කළා. අපි - තමුන්නාන්සේලා පිළිගන්න ඕනෑ, නිදහසින් පස්සේ ලංකා ඉතිහාසයේ ප්‍රථම වතාවට තමයි ලංකාවේ ආර්ථිකය 2020දී සෘණ 3.6 දක්වා පහළට ගියේ කියලා. ආර්ථික වර්ධන වේගය සෘණ වුණා කියන්නේ, රටේ නිෂ්පාදන ක්‍රියාවලිය සම්පූර්ණයෙන් කඩා වැටුණා කියන එකයි. ඒ තත්ත්වය ඇති වුණේ අද-ඊයේ කරපු ක්‍රියා නිසා නොවෙයි. 2015දී යහ පාලන රජය බලයට පැමිණියා. ඉන් පසු 2015ට වඩා 2016දී ආර්ථික වර්ධන වේගය අඩු වුණා; 2016ට වඩා 2017දී අඩු වුණා; 2017ට වඩා 2018දී අඩු වුණා; 2018ට වඩා 2019දී අඩු වුණා. මුළු රටේම ඉතිහාසගත වාර්තාවක් තැබූ ආණ්ඩු කාලයක් තුළ අඛණ්ඩව රට කඩා වැටුණු කාල පරිච්ඡේදයක් ලෙස සංඛ්‍යා දත්ත අනුව එම කාලය ඉතිහාසයට එකතු වෙලා තිබෙනවා. රටක් එලෙසින් විනාශ වෙනකොට ඩොලර් ප්‍රශ්නය විශාල අර්බුදයක් බවට පත් වෙලා, උසුලාගන්න බැරි ලෙස ඒ රජය ඩොලර් අර්බුදයකට මුහුණ දුන්නා. අපි මේ රට භාර දෙනකොට රුපියල් 131ක්ව තිබුණු ඩොලරයේ වටිනාකම තවත් ඉහළ යෑමෙන් රුපියල බේරා ගැනීමට එවක සිටි මුදල් අමාත්‍ය රවි කරුණානායක මහතා අවුරුද්දකට ඇමෙරිකානු ඩොලර් බිලියන 3කට වඩා වෙළෙඳ පොළට දාලා පිච්චුවා. කාට හරි එය එසේ නොවෙයි කියලා කියන්න පුළුවන් නම්, සංඛ්‍යා දත්ත අනුව ඒක කියන්න. ඒ අනුව, ඩොලරයේ අගය කෘත්‍රිම ලෙස ආරක්ෂා කරන්න 2015 වර්ෂයේදී විතරක් ඇමෙරිකානු ඩොලර් බිලියන 3කට වඩා වැඩි ප්‍රමාණයක් වෙළෙඳ පොළට දාලා තිබෙනවා. ඒ වාගේම 2016දීත් දැම්මා, 2017දීත් දැම්මා. ඒ අවුරුදු පහේදී ඇමෙරිකානු ඩොලර් බිලියන 5කට වැඩියෙන් පිච්චුවා. ඉන් නොනැවතී මෙම විදේශ විනිමය අර්බුදයට මුහුණ දෙන්න හම්බන්තොට වරාය විකුණලා ඇමෙරිකානු ඩොලර් බිලියන 1.4ක් ගත්තා. නමුත්, ඒ මුදලින් ණය ගෙව්වේ නැහැ.

ඊට පසු සෑම වර්ෂයකදීම ජාත්‍යන්තර වෙළෙඳ පොළට ගිහිල්ලා Sovereign Bonds issue කරලා ලංකා ඉතිහාසයේ කිසිම රජයක් නොගත් ආකාරයට ඇමෙරිකානු ඩොලර් බිලියන 13ක් අරගෙන තිබෙනවා. 2029 වර්ෂය වනතෙක් එම මුදල ගෙවන්නත් තිබෙනවා. මේ තත්ත්වය උසුලාගෙන යන්න බැරි නිසා අද යෝජනා කරන පරිදිම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට යන්න ඒ රජයට සිද්ධ වුණා. ඒ අනුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ගිවිසුම තමයි, 2017, 2018, 2019 කියන වර්ෂ තුනේදී එක්සත් ජාතික පක්ෂය ක්‍රියාත්මක කළේ. නමුත්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ගත්තේ කීයද? ඇමෙරිකානු ඩොලර් බිලියන 1.5යි. ඇමෙරිකානු ඩොලර් බිලියන 1.5ක් අරගෙන ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කොන්දේසි සියල්ල එතුමන්ලා ඉෂ්ට කළා. දේශීය ආදායම් බදු පනත වෙනස් කළා, ආදායම වැඩි කරන්න කිව්වාම වැඩි කළා, ඛනිජ තෙල් සඳහා මිල සූත්‍රයක් ගේන්න කිව්වාම ඒක ගෙනාවා, රජයේ සේවයට බඳවා ගන්න එපා කිව්වාම බඳවා නොගෙන සිටියා. ඒ සියල්ල කරලාත් අන්තිමට ඩොලරය රුපියල් 182 දක්වා ඉහළ ගියා. ඒත් බැරි තැන, ඒ හිරවීම තුළ, අවසානයේදී ඇමෙරිකා එක්සත් ජනපදය සමඟ MCC - Millennium Challenge Corporation - ගිවිසුම අත්සන් කරලා ඒ හරහා ඇමෙරිකානු ඩොලර් මිලියන 480ක් ගන්න ගියා. පසුගිය රජය යටතේ මේ අර්බුදය සම්පූර්ණයෙන් උසුලා ගන්න බැරි ප්‍රමාණයක තිබුණා. නමුත්, වහගෙනයි සිටියේ. පාස්කු ප්‍රහාරයෙන් පසුව සහ කොවිඩ්-19න් පසුව ඒක උච්ච තත්ත්වයට පත් වීම තමයි වෙලා තිබෙන්නේ. ඒක නිසා මේ පිළිබඳ වගකීමෙන් අපි කාටවත් මිදෙන්න බැහැ. 2003දී එවකට අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා විසින් මේ සඳහා අවශ්‍ය උපාය මාර්ගය මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. ඒ තමයි, මූල්‍ය කළමනාකරණ වගකීම පනත. ඒ පනතේ කියලා තිබෙනවා, 2013 වන විට මේ රටේ ණය බර දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 60ට අඩු කරන්න ඕනෑ, අය වැය පරතරය සියයට 5ට වඩා අඩු කරන්න ඕනෑ කියලා. ඒකට අදාළ නීතියක් තමයි එදා ගෙනැල්ලා තිබුණේ. ඒ වැරැද්ද නිසා ඇතිවෙලා තිබෙන අර්බුදයට මේ පාර්ලිමේන්තුව සම්පූර්ණයෙන් වග කියන්න ඕනෑ. මොකද, ඒ පනතට අනුව මූල්‍ය කළමනාකරණය නොකළ නිසා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! අද දිනට නියමිත කටයුතු අවසන් වන තෙක් කාලය ලබා ගැනීමට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇතිවෙලා තිබෙන මේ අර්බුදයේ උච්චතම අවස්ථාවේදී රටක් ලෙස අලුතින් හිතලා, ජාතියක් ලෙස මේ අභියෝගයට මුහුණ දීලා, මේ අර්බුදයෙන් මිදීම සඳහා අපි සියලු දෙනා එකතුවෙලා කටයුතු කරමු. අපේ අඩුපාඩු හදාගෙන, අලුත් ඉසව් සොයා ගෙන යන ඒ ගමනට අද සම්මත කරන බුද්ධිමය දේපළ (සංශෝධන) පනත් කෙටුම්පත උදවු වේවායි කියා ප්‍රාර්ථනා කරමින් මගේ වචන කීපය මෙයින් සමාප්ත කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය.:***
***''පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය.'' - [ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා]***

*தீர்மானிக்கப்பட்டது.*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக." - [மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன]*

*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. (Dr.) Bandula Gunawardana.]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***
***[මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.]***

*குழுவில் ஆராயப்பட்டது.*
*[மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*

*Considered in Committee.*
*[THE HON. PRESIDING MEMBER in the Chair.]*

***1 සිට 8 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*1ஆம் வாசகத்திலிருந்து 8ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 1to 8 ordered to stand part of the Bill.*

## 9 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ XXXIIIඅ, XXXIIIආ, XXXIIIඇ, XXXIIIඇ සහ XXXIIIඉ අලුත් පරිච්ඡේද ඇතුළත් කිරීම)
### வாசகம் 9.- (முதன்மைச் சட்டவாக்கத்தில் XXXIIIஅ, XXXIIIஆ, XXXIIIஇ, XXXIIIஈ மற்றும் XXXIIIஉ என்னும் புதிய அத்தியாயங்களை உட்புகுத்துதல்)
CLAUSE 9.- (*Insertion of new Chapters XXXIIIA, XXXIIIB, XXXIIIC, XXXIIID and XXXIIIE in the principal enactment*)

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා.

(1) "13 වන පිටුවේ, 9 වන පේළියේ සිට 11 වන පේළිය දක්වා වන පේළි (එම පේළි දෙක ද ඇතුළුව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

> 'පෙන්නුම් කරන්නේ නම් හෝ හැඟවෙන්නේ නම් සහ භූගෝලීය දර්ශකයේ හිමිකරුවන්ගේ බැඳියාවන්වලට' "

(2) "15 වන පිටුවේ, 27 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

> '161ක. යම් භූගෝලීය දර්ශකයක් මේ පනතේ 142 වන වගන්තිය යටතේ' "

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendments put, and agreed to.*

***9 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*9ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 9, as amended, ordered to stand part of the Bill.*

***10 සිට 12 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*10ஆம் வாசகத்திலிருந்து 12ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 10 to 12 ordered to stand part of the Bill.*

## 13 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 172 වන වගන්තිය සංශෝධනය කිරීම)
### வாசகம் 13.- (முதன்மைச் சட்டவாக்கத்தின் 172 ஆம் பிரிவைத் திருத்துதல்)
CLAUSE 13.- (*Amendment of section 172 of the principal enactment*)

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා.

> "17 වන පිටුවේ, 4 වන පේළියේ සිට 6 වන පේළිය දක්වා වන පේළි (එම පේළි දෙක ද ඇතුළුව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:
>
> > 'බලපත්‍රය හෝ ලකුණ හෝ' යන වචන යෙදෙන කවර හෝ තැනක දී ඒ වචන වෙනුවට 'කාර්මික සැලසුම, පේටන්ට් බලපත්‍රය, ලකුණ,' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***13 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*13ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 13, as amended, ordered to stand part of the Bill.*

***14 සිට 16 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*14ஆம் வாசகத்திலிருந்து 16ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 14 to 16 ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
***පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.***

*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.*

*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported with Amendments.*

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල භාෂා හා මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ, අංක දෝෂ නිවැරදි කර ගැනීම හා ආනුෂංගික සංශෝධන සඳහා අවසර දෙන ලෙස ද ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන්වන වර කියවා සම්මත කරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம்முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill, as amended, accordingly read the Third time, and passed.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

## කල්තැබීමේ ප්‍රශ්න
## ஒத்திவைப்பு வினாக்கள்
## ADJOURNMENT QUESTIONS

**ගරු කපිල අතුකෝරල මහතා**
(மாண்புமிகு கபில அதுகோரல)
(The Hon. Kapila Athukorala)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍ය ගරු ජානක වක්කුඹුර රාජ්‍ය මැතිතුමා වෙතයි මා මේ ප්‍රශ්නය යොමු කරන්නේ.

1. කන්තලේ සීනි කර්මාන්තශාලාව ආරම්භ කළ දිනය කවදා ද? ආරම්භ කර ඇත්තේ කුමන රටක ප්‍රදානයක් මත ද?
2. සීනි කර්මාන්තශාලාව වසා දැමූ දිනය කවදා ද? එයට හේතු වූයේ කුමක් ද? එම අවස්ථාවේ සීනි කර්මාන්ත ආයතනය ලැබූ ලාභය හෝ අලාභය කොපමණ ද?
3. වසා දමන අවස්ථාවේ සීනි කර්මාන්ත ආයතනය මඟින් උත්පාදනය වී තිබූ සෘජු හා වක්‍ර රැකියා ප්‍රමාණය කොපමණ ද?
4. සීනි කර්මාන්තශාලාවට අයත් මුළු ඉඩම් ප්‍රමාණය කොපමණ ද; හා භූමිය තුළ පවතින වැව් ප්‍රමාණය කොපමණ ද?
5. සීනි කර්මාන්ත ආයතනය නැවත ආරම්භ කරනු ලබනවා ද? නැත්නම් වෙනත් නිෂ්පාදනයක් කරනු ලබන කර්මාන්ත ශාලාවක් ආරම්භ කරනු ලබයි ද? ඒ කුමන දිනයකදී ද?
6. කර්මාන්ත භූමිය තුළ පවතින පරණ කර්මාන්ත ශාලාව, වාහන සහ අබලි ද්‍රව්‍ය සඳහා ගනු ලබන ක්‍රියා මාර්ග කුමක්ද?
7. මෙම ආයතනය නැවත ආරම්භ කරනු ලබන්නේ නම්, එම ආයතනයට අයත් ඉඩම් බෙදාදීමේ කටයුතු සිදු කරනු ලබන්නේ කෙසේද?
8. සීනි කර්මාන්තශාලාව ආරම්භ කරනු ලැබුවහොත් ඒ මඟින් උත්පාදනය වන රැකියා අවස්ථා ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ජනතාව වෙත ලබා දෙන්නේ ද?

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඇත්තටම කාලයක් තිස්සේ ලාභ ලැබූ ආයතනයක් විදියට තමයි මේ සීනි කර්මාන්ත ආයතනය තිබුණේ. මෙය කන්තලේ ප්‍රදේශයේ තිබුණු හදවත බඳු ආයතනයක්. 1977න් පස්සේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව විසින් විවෘත ආර්ථික ක්‍රමය මේ රටට හඳුන්වාදීමෙන් අනතුරුව අපේ රටට සීනි ආනයනය කරන්න පටන් ගත්තාට පස්සේ මේ කර්මාන්තශාලාව වසා දැමෙනවා. ඒත් එක්කම, කර්මාන්තශාලාව හා බැඳී තිබුණු සෘජු රැකියා 1,000කට විතර ආසන්න ප්‍රමාණයකුත්, වක්‍ර රැකියා 7,000කට ආසන්න ප්‍රමාණයකුත් අහිමිවීමෙන් කන්තලේ ප්‍රදේශයේ හිටපු සහ සිටින ඒ අහිංසක මිනිස්සු අනන්ත අප්‍රමාණ දුක්ඛදෝමනස්සයන්ට මුහුණ දෙමින් සිටිනවා. ගරු ජානක වක්කුඹුර රාජ්‍ය ඇමතිතුමා මේ කර්මාන්තශාලාව නැවත ගොඩනැඟීම වෙනුවෙන් දැවැන්ත ප්‍රයත්නයක ඉන්න බව අපි දන්නවා, ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ වැඩ පිළිවෙළත් එක්ක. නමුත්, විරුද්ධ දේශපාලන මත දරන පිරිස් විසින් නොයෙකුත් දුර්මත මේ සමාජය තුළ ප්‍රචාරණය කරමින් පවතින නිසා ප්‍රදේශයේ තිබෙන මතයත් එක්ක මෙම ප්‍රශ්නය මේ සභාවට ඉදිරිපත් කරන්න තීන්දු කළා.

ස්තුතියි.

**ගරු ජානක වක්කුඹුර මහතා (උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි බෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜானக வக்கும்புர - கரும்பு, சோளம், மர முந்திரிகை, மிளகு, கறுவா, கராம்பு, வெற்றிலை உள்ளிட்ட சிறு பெருந்தோட்டப் பயிர்ச்செய்கை அபிவிருத்தி மற்றும் அதுசார்ந்த கைத்தொழில்கள் மற்றும் ஏற்றுமதி மேம்பாட்டு இராஜாங்க அமைச்சர்)
(The Hon. Janaka Wakkumbura -State Minister of Development of Minor Crops including Sugarcane, Maize, Cashew, Pepper, Cinnamon, Cloves, Betel Related Industries and Export Promotion)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු වැවිලි අමාත්‍යතුමා වෙනුවෙන් මා මෙම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

1. 1960.10.02 දින චෙකොස්ලෝවැකියානු රජයේ ප්‍රදානයක් මතයි.
2. 1994.03.31වැනි දා.

[ගරු ජානක වක්කුඹුර මහතා]

එයට හේතුව,

උක් වගාව සඳහා ප්‍රමාණවත් ජල පහසුකම් නොතිබීම.

කර්මාන්තශාලාව පුද්ගලීකකරණය කිරීමෙන් පසු එම කළමනාකාරිත්වයේ අයහපත් කළමනාකරණ ක්‍රමවේදය හේතුවෙන් සේවකයන් අතර ඇති වූ සේවක ආරාවුල් සහ එමඟින් කර්මාන්තශාලාවේ නිෂ්පාදන ක්‍රියාවලියට බාධා පැමිණීම.

ඊළඟට අසා තිබෙනවා, එම අවස්ථාවේ සීනි කර්මාන්ත ආයතනය ලැබූ ලාභය හෝ අලාභය කොපමණද කියලා.

මේ ආයතනය ලාභ ලබා තිබෙනවා.

ඊයේ තමයි මට මේ ප්‍රශ්නය ලැබුණේ. මට ලැබී තිබෙන පිළිතුර කෙටියෙන් කියවලා **සභාගත*** කරන්නම්.

3. නිවැරදිව නොදනී. ඒවා ලේඛනගතව තිබෙනවා. ඒවා පරීක්ෂා කර බලා මම උත්තරය හරියටම පසුව දෙන්නම්. දහසකට වැඩි පිරිසක් මේ ආයතනයේ රැකියා කළා. ඒ වාගේම 3500කට වැඩි වක්‍ර රැකියා ප්‍රමාණයක් මේ කර්මාන්තශාලාව ආශ්‍රිතව තිබුණා.

4. අක්කර 21,000 රූඩ් 03 පර්චස් 30ක් පමණ භූමිය තුළ පවතින වැව් ප්‍රමාණය 08කි.

5. ඔව්.

ඒ ප්‍රශ්නයේ ඊළඟ කොටසට පිළිතුර, අදාළ නොවේ.

6. පැරණි කර්මාන්තශාලාව කෞතුකාගාරයක් බවට පත් කිරීම. එමඟින් දෙස් විදෙස් සංචාරක ආකර්ෂණයක් ඇති ස්ථානයක් බවට කන්තලේ ප්‍රදේශය පත් කිරීම.

දැනට එතැන තිබෙනවා, වාහන සහ යන්ත්‍ර සූත්‍ර. මේ සියල්ලම ලංකා සීනි සමාගමට ලබාදීමට අපි කටයුතු කරනවා.

අබලි ද්‍රව්‍ය රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් තක්සේරුවක් ලබා ගෙන කර්මාන්ත අමාත්‍යාංශයට ලබාදීමට අපි කටයුතු කරනවා.

7. 2016 අගෝස්තු මස අත්සන් කරන ලද මුල් ගිවිසුමේදී එකඟ වූ පරිදි ඉඩම් ලබාදීම සිදු කරනවා.

කර්මාන්තශාලාව පිහිටුවීමට සහ එහි ව්‍යාපාර කටයුතු සඳහා හෙක්ටයාර 34.7280ක් මේ වන විටත් ඒ සමාගමට ලබා දීලා තිබෙනවා.

පැළ තවාන පිහිටුවීම සඳහා හෙක්ටයාර 167.6165ක් ලබා දීලා තිබෙනවා.

නේවාසික ප්‍රදේශය ඉදිකිරීම සඳහා හෙක්ටයාර 20ක් මේ M.G Sugars Lanka (Pvt.) Limited කියන ආයතනයට ලබා දීලා තිබෙනවා.

එම භූමි ප්‍රදේශය අයත් වන කොටස් වසර 30ක කාලයක් සඳහා මේ ආයෝජකයාට ලබා දීලා තිබෙනවා. ඒ සඳහා ගිවිසුමක් ඒ කාලයේම -2016- අත්සන් කරලා දීලා තිබෙනවා.

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

උක් වගාවට අදාළ වූ අක්කර 21,000ක භූමි භාගයේ අයිතිය රජය සතු වේ. ඒවා සුදුසු ක්‍රමවේදයක් යටතේ වගා කිරීම සඳහා ගොවීන් වෙත වගා බලපත්‍ර මත ලබා දෙනු ඇත.

එම අක්කර 21,000 සඳහා වගා බලපත්‍ර ලබාදීමේදී සියයට 51ක් රජයට කොටස් හිමි එම්.ජී. ෂුගර් සමාගමත්, උක් වගාකරුවන් හා ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාත් අතර ඇති කරගනු ලබන ත්‍රෛපාර්ශ්වික ගිවිසුමක් අනුව එම කටයුතු කරනවා.

කිසිම හේතුවක් නිසා මේ බලය කොම්පැනියට දෙන්නේ නැහැ. රජයට සියයට 51ක් කොටස් තිබෙන කොම්පැනියක් වුණත් ඉඩම් කොමසාරිස්වරයා යටතේ තියාගෙන තමයි වගා බලපත්‍රයක් දෙන්නේ. අපි ගිවිසුමක් අත්සන් කරන්නේ මේ නිසායි. අක්කර 21,000ක අපි වගා කරන්න දෙන්නේ උක් පමණයි. මේ කොම්පැනිය උක් කර්මාන්තශාලාවක් හැදුවාට පස්සේ ගොවීන් උක් නොදුන්නොත් කියන කාරණය නිසා තමයි මේ ගිවිසුම අත්සන් කරන්නේ. මේ සමාගමේ රජයට සියයට 51ක කොටස් තිබුණත් අපි ඉඩම් කොමසාරිස්වරයාගේ බලය තියාගෙන තමයි ගොවි ජනතාවට මේ වගා බලපත්‍ර ලබා දෙන්නේ.

8. උක් වගාකිරීම හා සීනි කර්මාන්තශාලාව සහ ඒ ආශ්‍රිත කර්මාන්ත මඟින් උත්පාදනය කෙරෙන සෘජු රැකියා සහ වක්‍ර රැකියා අවස්ථා, සුදුසුකම් මත ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ ජනතාවට ප්‍රමුඛතාව දෙමින් ලබා දෙනවා.

ගරු මන්ත්‍රීතුමනි, සීනි කර්මාන්තශාලාවක් ආරම්භ කරනකොට ඒකට අවශ්‍ය දැනුම තිබෙන ඉංජිනේරුවරු සියලුදෙනා ඒ ප්‍රදේශයේ නැති වෙයි. ඒ නිසා ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රදේශයේ ජනතාවට ප්‍රමුඛතාව දීලා, ඊට බාහිරව අපි බලාපොරොත්තු වෙනවා ඒකට අවශ්‍ය අනෙක් සේවකයන් බඳවා ගන්න. ඒ එක්කම ඒ ප්‍රදේශයේ වක්‍ර රැකියා සඳහා, ඒ කියන්නේ ට්‍රැක්ටර් යෙදවීම ආදී වශයෙන් වන සියලු කටයුතු තමුන්නාන්සේගේ ප්‍රදේශයේ ජනතාවට තමයි ලබා දෙන්නේ.

අපි මේ එක්කම ඉදිරියේදී කන්තලේ නව නගරයක් බවට පත් කරන්නත් බලාපොරොත්තු වනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඊළඟ ප්‍රශ්නය, ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි.

අද ලෝකයම සෑම ආකාරයෙන්ම වැඩ බිමක සිදු වන හිංසන ගැන කථා කරනවා. ඒ කුමන ආකාරයෙන් හෝ වන හිංසන වැඩ බිමෙන් තුරන් කරන්න ඕනෑ කියලා, මේ වන කොට මුළු ලෝකයම එකඟතාවකට එමින් සිටිනවා. ලිංගික හිංසනය, ශාරීරික හිංසනය, වාචික හිංසනය හා මානසික හිංසනය කියන මේ සියලු ආකාරයෙන් සිදු වන හිංසන මේ තුළ කියැවෙනවා. වැඩ බිමක් කිව්වාම, ගෘහිණියක් නම් ගෙදර සහ ඒ අවට පරිසරය; රජයේ හෝ පෞද්ගලික සේවයේ යෙදෙන්නෙකුට හෝ යෙදෙන්නියකට නම්, ගෙදරින් පිට වෙච්ච තැන ඉඳලා බස් රථය, කාර්යාලය ඇතුළු රාජකාරියේ නියැළෙන පරිසරය අයත් වනවා. ගරු අධිකරණ ඇමතිතුමනි, ජාත්‍යන්තර කම්කරු සංවිධානය -

ILO- කාන්තාවන්ට විතරක් නොවෙයි, සියලු පුද්ගලයන්ට වැඩ බිම හිංසනයෙන් තොර තැනක් වෙන්න ඕනෑය කියන C 190 යෝජනාව අනුමත කර තිබෙනවා.

අද ජාත්‍යන්තර කාන්තා දිනය. අද වැඩ බිමේ සිදු වන කාන්තා හිංසනය ගැන කථා කරනවා; කාන්තා අයිතිය ගැන කථා කරනවා. ඒ වාගේම ඒවාට අදාළ ප්‍රතිපත්ති හදනවා. හැබැයි, පාර්ලිමේන්තුව ඇතුළේත් කාන්තා හිංසනය සිදු වන බව අපි පසුගිය දවස්වල දැක්කා. එයට උදාහරණ පවා තිබෙනවා. මේ වෙලාවේ මම මතක් කරන්න ඕනෑ, පසු ගිය අවුරුද්දේ කාන්තා දිනයේදී විශේෂයෙන්ම පාර්ලිමේන්තු කාන්තා මන්ත්‍රීවරියන්ගේ සංසදය හැටියට අපි විශේෂ ඉල්ලීමක් කළ බව. ඒ වෙලාවේ කම්කරු ඇමතිතුමා අපට පොරොන්දුවක් දුන්නා, ILO Convention No. 190 බලාත්මක කරන්න පාර්ලිමේන්තුවට යෝජනාවක් ගේනවා කියලා. නමුත් කනගාටුයි, අවුරුද්දක් ගෙවිලත් එය නැවත වතාවක් මතක් කරන්න සිදුවෙලා තිබෙන එක ගැන. සමහරු හිතනවා අධිකරණ ඇමතිතුමනි මේ යෝජනාව ගෙනාවොත් කාන්තාවක් දිහා හැරිලා බලන්නවත් වෙන්නේ නැහැ, ඒ ඔක්කෝම අධිකරණයට ගෙනි යයි කියලා. හැබැයි මෙහිදී කථා කරන්නේ කාන්තාවන් ගැන විතරක් නොවෙයි, ස්ත්‍රී සහ පුරුෂ සියලු දෙනාට වැඩ බිම හිංසනයෙන් තොර තැනක් විය යුතුයි කියන කාරණයයි.

ඇත්තටම පාර්ලිමේන්තුව ඇතුළේත් කාන්තාවකට ඉතා නින්දිත විධියට කථා කළා. ඔබතුමන්ලාගේ පක්ෂයේ තරුණ මන්ත්‍රීවරයෙක් මා ඉලක්ක කරගෙන ඉතා කැත විධියට ප්‍රකාශයක් කළ බව තමුන්නාන්සේලා එදා දකින්න ඇති. ඒකට පක්ෂයේ ඉහළින් ආශිර්වාදය තිබ්බා කියලා ඒ පැත්තේම අය අපිත් එක්ක කියනවා. ඒ අය මිනිත්තු විස්සක් පරක්කුවෙලා රැස්වීමකට ගියා කියනවා; අදාළ මන්ත්‍රීතුමාගේ කථාව අහන්න ඕනෑ නිසා හිටියා කියනවා. පාර්ලිමේන්තුව ඇතුළත කාන්තාවන් හිංසාවට පත් කරන ගමන්, වැඩ බිමේ සිදු වන කාන්තා හිංසනය වළක්වන්න නීති හදන්න තමයි අපි දැන් මේ කථා කරන්නේ. හැබැයි පාර්ලිමේන්තුවේ ගරු කථානායකතුමාට අද වනතෙක් බැරි වුණා, ඒ අදාළ මන්ත්‍රීවරයාට මොනම ආකාරයෙන් හෝ දඬුවමක් ලබා දෙන්න. ඇත්තෙන්ම මම මේ කිව්වේ, බදුල්ලේ ජනතාවගේ ඡන්දයෙන් ආව තිසකුට්ටි ආරච්චි මන්ත්‍රීතුමා ගැනයි. ඒ සිද්ධිය ගැන මම වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කළා. නමුත්, ගරු කථානායකතුමාට මේ වනතෙක් -තවම- බැරිවෙලා තිබෙනවා, ඒ අදාළ මන්ත්‍රීවරයාට මොනම ආකාරයෙන් හෝ දඬුවමක් ලබා දෙන්න. ගරු ඇමතිතුමනි, ඒ නිසාම මම පසුගිය දා පුස්තකාලයෙන් ඉල්ලීමක් කළා, වරප්‍රසාද කඩ වුණාම ඉතිහාසයේ සිටි ගරු කථානායකතුමන්ලා හැසිරිලා තිබෙන්නේ කොහොමද කියලා වාර්තාවක් දෙන්න කියලා. මට පිටු 800ක විතර වාර්තාවක් දුන්නා. ගරු කථානායකතුමා දැන් ගරු සභාවේ නැතත් මම එතුමාට කියනවා, ඒ ටික කියවා බලන්න කියලා. ඒ කාලයේ හිටපු අනුර බණ්ඩාරනායක, වි.ජ.මු. ලොකුබණ්ඩාර කථානායකතුමන්ලා කොහොමද හැසිරුණේ කියලා ඒ වාර්තාව පොඩ්ඩක් කියවා බලන්න කියලා මම එතුමාට කියනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමිය ලිඛිතව ලබා දුන් ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රශ්නය පැහැදිලි කරන්න ඕනෑ. මොකද, අද කාන්තා දිනය නේ. හිටපු කථානායකතුමන්ලා කවදාවත් පාර්ලිමේන්තුව තුළ මේ විධියට කටයුතු නොකළ බවත් මතක් කරන ගමන් කිව යුතුයි, මේ කාරණය ගැන මීට කලින් කථා කරන කොට මට අවවාද කරලා ලියුමක් එවපු බව. මට අවවාද කරලා ලියුමක් එවන්න හදිසිය තිබුණාට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අදාළ මන්ත්‍රීවරයාට දඬුවමක් දෙන්න පාර්ලිමේන්තුවේ ගරු කථානායකතුමාට බැරිවෙලා තිබෙනවා.

ඒ නිසා එහෙම පාර්ලිමේන්තුවකට, එහෙම ආණ්ඩුවකට මේ රටේ කාන්තාවන්ගේ ප්‍රශ්නවලට සාධාරණයක් ඉෂ්ට කරන්න පුළුවන්ද කියන එක ගැන මම පුදුම වෙනවා.

හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මැතිනියත් වැඩ බිමේදී තමයි හිංසාවට ලක් වන්නේ. ඒ නිසා සභාව කල් තබන අවස්ථාවේ ප්‍රශ්නයක් හැටියට මම කම්කරු අමාත්‍යතුමාගෙන් මේ ප්‍රශ්නය අහනවා.

වැඩ ලෝකය තුළ සිදුවන හිංසනය හා ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් ජාත්‍යන්තර කම්කරු සංවිධානයෙන් - ILO - අනුමත කරන ලද C190 සම්මුතිය ශ්‍රී ලංකාව තුළ තවමත් අනුමත කර ගැනීමට නොහැකි වී ඇත.

1. එසේ අනුමත කර ගැනීමට නොහැකි වීම හා ප්‍රමාදයට හේතුව මන්ද?
2. C190 සම්මුතිය පාර්ලිමේන්තුවේ සම්මත කර ගැනීමට ඉදිරිපත් නොකරන්නේ ඇයි?
3. මෙහි වර්තමාන තත්ත්වය කුමක්ද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මට කාරණය කියන්න කිව්වත්, වරප්‍රසාද ප්‍රශ්න ගැන කිව්වත්, මම එතැනදී අදහස් කළේ මෙම C190 සම්මුතිය බලගන්වා තිබුණා නම්, පාර්ලිමේන්තුවේදී මම අසරණ වන්නේ නැහැ, හිරුනිකා මැතිනිය ඇයගේ වැඩ බිමේදී අසරණ වන්නේ නැහැ කියන කාරණයයි. ඒ ගැන නැවත මතක් කරන්නටත්, ඉදිරියේදී එවැන්නක් සිදු නොවන්නටත් තමයි මම මේ ප්‍රශ්නය ඉදිරිපත් කළේ.

**ගරු පියංකර ජයරත්න මහතා (විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළෙඳ පොළ විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன - வெளிநாட்டு தொழில்வாய்ப்பு மேம்பாடு மற்றும் சந்தைப் பல்வகைப்படுத்தல் இராஜாங்க அமைச்சர்)
(The Hon. Priyankara Jayaratne - State Minister of Foreign Employment Promotion and Market Diversification)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු රෝහිණී කවිරත්න මන්ත්‍රීතුමිය දීර්ඝ වශයෙන් ප්‍රශ්න රාශියක් ඇහුවා. මම හිතන හැටියට මෙය ඉතා වැදගත් ප්‍රශ්නයක්. අපේ ගරු කැබිනට් අමාත්‍යතුමාට අද විශේෂ කටයුත්තකට සහභාගි වීමට සිදු වූ නිසා මේ ගරු සභාවට පැමිණීමට හැකියාව ලැබුණේ නැහැ. නමුත්, එතුමා මේ ගැන රෝහිණී කවිරත්න මන්ත්‍රීතුමිය සමඟ සාකච්ඡා කළා. මේ ප්‍රශ්නයට පිළිතුරු ලබා දිය යුත්තේ එතුමා විසින්. ඒ නිසා එතුමියගේ එකඟතාව මත බ්‍රහස්පතින්දා තිබෙන විවාදයේදී මේ ප්‍රශ්නයට අදාළව සම්පූර්ණ විස්තර ඉදිරිපත් කරන බවට ගරු ඇමතිතුමා පවසා සිටියා. ඒ නිසා මෙම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා 2022.03.10 වන බ්‍රහස්පතින්දා තෙක් කාලය ඉල්ලා සිටිනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රෝහිණී කවිරත්න මන්ත්‍රීතුමිය ඉදිරිපත් කළ සභාව කල් තබන අවස්ථාවේ ප්‍රශ්නයට අදාළ පිළිතුර විෂය භාර කැබිනට් අමාත්‍යතුමා විසින් බ්‍රහස්පතින්දා ලබාදෙන බවට සඳහන් කරනවා. සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ඉදිරිපත් කිරීම.

## පාර්ලිමේන්තුව, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල නිසි කාන්තා නියෝජනය
### பாராளுமன்றம், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அதிகாரசபைகளில் அவசியமான பெண் பிரதிநிதித்துவம்
### ADEQUATE WOMEN'S REPRESENTATION IN PARLIAMENT, PROVINCIAL COUNCILS AND LOCAL GOVERNMENT AUTHORITIES

[අ.භා. 4.48]

**ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය**
**(மாண்புமிகு (திருமதி) கீதா சமன்மலீ குமாரசிங்ஹ)**
(The Hon.(Mrs.) Geetha Samanmale Kumarasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "ලෝක කාන්තා දිනය යෙදී තිබෙන මාර්තු 08 දිනය මුළු මහත් ලෝකයටම සුවිශේෂී දිනයකි. ඒ සුවිශේෂී බව මෙම ගරු සභාවටත් නිසැකව ලැබෙනුයේ මෙම ගරු සභාව නියෝජනය කරන ලද සියලු මන්ත්‍රීවරියන් විසින් කරන ලද සේවාව නිසාය.
>
> විශේෂයෙන්ම කාන්තාවන්ට සර්වජන ඡන්ද බලය දිනා ගැනීම වෙනුවෙන් නොයෙකුත් විරෝධතා මැද 1927 දී කාන්තා සමජන සංගමය පිහිටුවමින්, 1928 ඩොනමෝර් කොමිසම අභිමුඛයට ගොස් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ පදනම් කර ගෙන සියලුම කාන්තාවන්ට ඡන්දය පාවිච්චි කිරීමේ අයිතිය ඉල්ලා සිටි ඇග්නස් ද සිල්වා මහත්මිය ඇතුළු කාන්තාවන් ගෞරවයෙන් සිහිපත් කළ යුතුය. ඇය පසුව වාර්තා කළ පරිදි, "අපි ගියේ ආගම සඳහා ගෙන යන යුද්ධයකට සැරසුන ලෙසය. ඩොනමෝර් සාමිවරයා අපගෙන් ප්‍රශ්න කරමින් වතුවල වැඩ කරන ඉන්දියානු කම්කරුවන්ට ඡන්ද බලය ලබා දීමට කැමතිදැයි ඇසීය. මම උත්තර දෙමින් ඔවුන් කාන්තාවන් නොවේදැයි පිළිතුරු දුනි. අපට අවශ්‍ය සියලුම කාන්තාවන්ට ඡන්ද බලය ලබා ගැනීමටයි." ඇය පවසා තිබේ.
>
> ඉන් පසුව රාජ්‍ය මන්ත්‍රණ සභාවට තේරී පත්වූ ප්‍රථම මන්ත්‍රීතුමිය වූ ඇඩලින් මොලමුරේ මැතිනිය, වෛද්‍ය නේසුම් සරවනමුත්තු මැතිනියගේ සිට මේ සභාව වර්ණවත් කළ කුසුමා ගුණවර්ධන, විවියන් ගුණවර්ධන වාගේම ලෝකයේ ප්‍රථම අග්‍රාමාත්‍යවරිය වෙමින් ලාංකික කාන්තාවගේ ලෝක සලකුණ නිර්මාණය කළ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය වාගේම මෙම සභාව නියෝජනය කරන ලද ජනාධිපතිතුමිය, අග්‍රාමාත්‍යවරියන්, ඇමතිතුමියන්ලා, මන්ත්‍රීතුමියන්ලා රටේ සංවර්ධනයට වාගේම විශේෂයෙන්ම කාන්තාවන්ගේ අයිතීන් වෙනුවෙන් විශාල සේවයක් සිදුකොට ඇත.
>
> අද වන විට ශ්‍රී ලංකාවේ ජන සංයුතිය බැලුවොත් බහුතරය කාන්තාවන්, නමුත් මෙම සභාව නියෝජනය කරනුයේ සියයට 5ක පමණ ප්‍රමාණයකි. කාන්තාවන් අනෙක් සියලුම ක්ෂේත්‍රයන්ට වාගේම දේශපාලන ක්ෂේත්‍රයන්ටත් දායකත්වය ලබා දීමට නිසි අවස්ථාව ලබා දීම අද දවසේ අවශ්‍යතාවකි.
>
> එම නිසා පාර්ලිමේන්තුවට වාගේම පළාත් සභා සහ පළාත් පාලන ආයතනයන්හි නිසි කාන්තා නියෝජනය ලබා ගැනීමට අවශ්‍ය සංශෝධන ගෙන ආ යුතු යැයි මෙම ගරු සභාවට යෝජනා කරමි."

ලෝක කාන්තා දිනය යෙදී තිබෙන මාර්තු 08 දිනය මුළු මහත් ලෝකයටම සුවිශේෂ දිනයකි. එය අද දිනය බව අප සියලුදෙනාම දන්නා කරුණකි. සුවිශේෂී ලෙස මෙම ගරු සභාවෙන් අද කාන්තාවන්ට නිසැකවම ලැබෙනුයේ විශේෂ ගරුත්වයක්. ඒ මේ සියලු සභාවල අතීතයේ සිට සේවාවක් කළ මන්ත්‍රීතුමියන්ලා ඇතුළු සියලුදෙනා වෙනුවෙන්. විශේෂයෙන්ම කාන්තාවන්ට සර්වජන ඡන්දය ලබා දීම වෙනුවෙන් විරෝධතා මැද 1927 දී ඒ ගත් තීන්දු තීරණ වෙනුවෙන් මම ඉතාම කෙටියෙන් කරුණු කියනවා. ඊට පසුව රාජ්‍ය මන්ත්‍රණ සභාව තේරීමේදී එහි ප්‍රථම මන්ත්‍රීතුමිය වූ ඇඩලින් මොලමුරේ මැතිනිය, වෛද්‍ය නේසුම් සරවනමුත්තු මැතිනියගේ සිට සභාව වර්ණවත් කළ කුසුමා ගුණවර්ධන මැතිනිය, විවියන් ගුණවර්ධන මැතිනිය, ලෝකයේ ප්‍රථම අග්‍රාමාත්‍යවරිය වූ සිරිමාවෝ ආර්.ඩී. බණ්ඩාරනායක මැතිනිය, හිටපු ජනාධිපතිතුමිය ඇතුළු රටේ සංවර්ධන වැඩවලට, රටේ කාන්තාවන්ගේ අයිතිය වෙනුවෙන් පසුගිය කාල සීමාව තුළ කටයුතු කළ සියලු මන්ත්‍රීවරියන්ට අපගේ කෘතඥතාව සහ ගෞරවය පුද කරනවා. කනගාටුයි කියන්න, අද වන විට ශ්‍රී ලංකාවේ ජන සංයුතිය දෙස බැලූ විට සියයට පහක කාන්තාවන් තමයි තවමත් පාර්ලිමේන්තුව නියෝජනය කරන්නේ සිටින්නේ.

මේ යෝජනාව අද ගීතා කුමාරසිංහ වන මම ඉදිරිපත් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අප සියලුදෙනාම දන්නවා, මුළු ලෝකය පුරාම සියලුදෙනාම එක්ව කාන්තා දිනය සමරන බව. මා දන්නා විධියට 1908දී පමණ නිව්යෝර්ක් නුවරට 15,000ක පමණ කාන්තාවන් පිරිසක් පැමිණ සර්වජන ඡන්ද බලය ඉල්ලා සිටියා. එදායින් ඇරඹුණු මේ කාන්තා දිනය වසර ගණනාවක් තිස්සේ අපට අයිති, අපේ කියන හැඟීමක් ඇති අයිතීන් දිනා ගැනීම පිණිස මහා සටනක නියැලුණා.

මා මුලින්ම සඳහන් කළේ ඒ සටනට උර දුන් පක්ෂ විපක්ෂ සියලුදෙනා ගැනයි. නමුත්, අපි පිළිගන්න ඕනෑ මේ රටේ කාන්තාවට කවදාවත් නිසි තැනක් ලැබුණේ නැති බව. මම කියනවා, අපට සමස්තයක් වශයෙන් පිරිමියකුට ලැබෙන වේතනය ලැබුණේ නැහැ, නිදහස ලැබුණේ නැහැ, ගෞරවය ලැබුණේ නැහැ, අපේ ආත්ම ආරක්ෂාවට කටයුතු කරන්න අපට ඉඩ දුන්නේ නැහැ, අපට ජීවත් වෙන්න සිදු වී තිබෙන්නේ ඉතා අවාසනාවන්ත තත්ත්වයක කියලා. කාන්තාව දුර්වලයිලු. කාන්තාව කඳුළු සලන්නේ ජීවිතයේ ඇයට තිබෙන ප්‍රශ්න ගැන කියා ගන්නයි.

මට මේ ගරු සභාවේ දී වැදගත් දෙයක් කියන්න තිබෙනවා. ඊයේ-පෙරේදා බොහෝ දෙනකු කථා කළා අතිගරු ජනාධිපතිතුමාගේ නිවස වටලන්න ගිය හිටපු මන්ත්‍රීවරියන් පිළිබඳ. YouTube එක බලන්න, ඊයේ 'හිරු' නාලිකාවේ ප්‍රවෘත්ති බලන්න, ඊයේ මට වුණු සිදුවීමක් ගැන ඒවායෙහි පළ වුණා. මේ අවස්ථාවේ ගරු සභාවේ නැති වුණත් ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමනි, සජබයෙන් ඊයේ මගේ නිවසට thugsලා ටිකක් එවා තිබුණා. ඒක 'හිරු' නාලිකාවේ කිව්වා. YouTube එකේ ගියා. එතකොට කාන්තාවක් විධියට මා මොන තරම් අසරණ කර තිබෙනවා ද? බෙන්තර, හබුරුගල ගමේ පිහිටි මගේ නිවසට සජබ පක්ෂයෙන් හතර දෙනෙක් ත්‍රී වීලර් එකක නැඟලා වීරයෝ වාගේ ඇවිල්ලා තිබුණා, ඩීසල් කෑන් එකක් කරේ තියාගෙන මගෙන් ඩීසල් ඉල්ලන්න.

ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාට වැරදුණා ද දන්නේ නැහැ. ඛනිජ තෙල් සංස්ථාව භාර අමාත්‍යාංශයේ අමාත්‍ය ධුරය වෙනස් වෙනකොට ඊට අලුතින් පත් වූ ඇමතිතුමා ඉන්නේ බෙන්තර ඇල්පිටියේ කියලා හිතුවා ද දන්නේ නැහැ. ඔබතුමා බද්දේගමින් මිනිස්සු තුන් හතරදෙනෙක් එකතු කරලා එවන්න එපා. ඔබතුමන්ලාට ඉන්නවා වැදගත් මන්ත්‍රීවරු. එවනකොට ඒ වාගේ අය එවන්න. හේෂා විතානගේ මන්ත්‍රීතුමා, නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා වැනි අය ඉන්නවා. බැරිම වුණොත් රාසමාණික්කම් මන්ත්‍රීතුමා වුණත් එච්චාට කමක් නැහැ, හදිසියේ ඩීසල් ටිකක් ඕනෑ නම්. ඒ අය එවපු පුද්ගලයා ගැන මට තිබෙන්නේ බොහොම කනගාටුවක්. ඒ විධියටයි කාන්තාව අසරණ කරන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කථා කරන කොට තිබෙන අහිංසකකම ඊගොල්ලන් ළඟ තිබෙනවා නම් කොහොමද මා ඒ වාගේ අසරණ තත්ත්වයට පත් කළේ? අඩුම තරමින් මම ගෙදර ඉන්න දවසක, ගෙදර ඉන්න වෙලාවක

එවන්න තිබුණානේ. මම ගෙදර නැති වෙලාවක් හොයා බලා තමයි එවලා තිබෙන්නේ. ගමේ, මගේ office එකේ වැඩ කරන අහිංසක කාන්තාවන් දෙදෙනා හොඳටම භය වෙලා. ඉතින් මේවා කාන්තා හිංසන නොවෙයි ද? අපට කරනකොට ඒවා හොඳයි. අනෙක් අයට කරනකොට හිතට අමාරුයි. මොකක්ද, මේකේ තේරුම? මුළු මහත් ශ්‍රී ලාංකික කාන්තාවන්ම එක්කෝ ලිංගිකව, එක්කෝ වාචිකව -මේ හැම පැත්තෙන්ම- හිංසනයට ලක් වෙනවා. මොනවාවත් කියා ගන්න බැරි වුණොත් වචනවලින් හෝ දමා ගහනවා. ඒ වාගේම කාන්තාවන් කී දෙනෙක් නම් මරා දාලා තිබෙනවාද? ඒ අය ජීවිත දානයෙන් වන්දි ගෙවා තිබෙනවා.

මට කරපු හිංසනය අද කාන්තා දිනයේ මම හෙළා දකිනවා. සමස්තයක් වශයෙන් ශ්‍රී ලාංකික සියලු කාන්තාවන්ගෙන් ඉල්ලා සිටිනවා මේ සිද්ධිය හෙළා දකින්න කියලා. මේක හරි කැත, අශික්ෂිත, පහත් වැඩක් හැටියටයි මම සලකන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට වෙන් කර තිබෙන කාල වේලාව අවසානයි.

**ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) கீதா சமன்மலீ குமாரசிங்ஹ)
(The Hon.(Mrs.) Geetha Samanmale Kumarasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මට තව විනාඩි දෙකක කාලයක් ලබා දෙන්න. මට කියන්න ගොඩක් දේවල් තිබුණත් කාල වේලාව නැහැ.

ලංකාවේ පාර්ලිමේන්තුවේ කාන්තා නියෝජනය තිබෙන්නේ සියයට 5යි. පළාත් සභාව, ප්‍රාදේශීය සභාව දිහා බලද්දී කාන්තාවකට ඒ තැන්වලට එන්න තිබෙන අයිතිය සම්පූර්ණයෙන්ම නැති කරලා තිබෙනවා. මම මෙහෙම කියන්නේ අපහාසයකට නොවෙයි. බොහෝ විට ඥාති සම්බන්ධතා උඩ තමයි කාන්තාවන් පාර්ලිමේන්තුවට එන්නේ. තමන්ගේ සැමියාගේ වියෝවෙන්, පියාගේ වියෝවෙන්, සහෝදරයා නැති වුණාම, ඔන්න කාන්තාව දේශපාලනයට එනවා. රටට ආදරයෙන් දේශපාලනය කරන්න හදන අහිංසක කාන්තාවන්ට ඉදිරියට එන්න ඉඩ දෙන්නේ නැත්තේ ඇයි? අඩුම තරමින් සියයට 50ක කාන්තා නියෝජනයක් මේ පාර්ලිමේන්තුව තුළ තිබිය යුතු බව ඉතා ඕනෑකමින් පවසමින්, ලෝකය පුරා සිටින සමස්ත කාන්තාවන්ටම Happy Women's Day! කියමින් මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
යෝජනාව ස්ථිර කිරීම, ගරු මංජුලා දිසානායක මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි හතරක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.55]

**ගරු මංජුලා දිසානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) மஞ்சுலா திசாநாயக்க)
(The Hon.(Mrs.) Manjula Dissanayake)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපේ ගරු ගීතා කුමාරසිංහ මන්ත්‍රීතුමිය විසින් අද දින සභාව කල් තබන අවස්ථාවේ විවාදයට ගෙනා යෝජනාව මා ස්ථිර කරනවා.

ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් සියයට 52ක් පමණ සිටින්නේ කාන්තාවන්. කාන්තාවන් වෙනුවෙන් වෙන් වූ ජාත්‍යන්තර දිනයක් ලබා ගන්න කටයුතු කරපු ක්ලාරා සෙට්කින් මැතිනිය ජාත්‍යන්තර කාන්තා දිනය සමරන අද දිනයේ මම ඉතාම ගෞරවයෙන් සිහිපත් කරනවා. 1911 දී ජාත්‍යන්තර කාන්තා දිනය ප්‍රකාශයට පත් කරලා ඊට වසර 30ක් ගත වන කොටයි සමස්ත ශ්‍රී ලංකාවේ වැඩිහිටි ජනගහනයට සර්වජන ඡන්ද බලය හිමි වෙන්නේ. නමුත්, ජාත්‍යන්තර කාන්තා දිනය ප්‍රකාශයට පත් කරලා වසර 20කට පස්සේ -1931 දී- අපේ කාන්තාවට සර්වජන ඡන්ද බලය ලැබෙනවා. එය අපේ කාන්තාව ලැබූ විශාල ජයග්‍රහණයක්. හැබැයි, ඒ ජයග්‍රහණය ලබා වසර ගණනාවක් ගත වුණත් මේ පාර්ලිමේන්තුව තුළ තවමත් කාන්තා නියෝජනය තිබෙන්නේ සියයට 10කටත් වඩා අඩු ප්‍රමාණයක්. වර්තමාන පාර්ලිමේන්තුවේ කාන්තා නියෝජනය සියයට 5.3යි. පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරු 225දෙනාගෙන්ම මන්ත්‍රීවරියන් ඉන්නේ 12දෙනායි. එදා -1931දී- කාන්තාවන්ට සර්වජන ඡන්ද බලය ලැබුණත් මේ පාර්ලිමේන්තුව තුළ අපට සතුටු වෙන්න පුළුවන් ප්‍රමාණයකට කාන්තා නියෝජනයක් ලැබිලා නැහැ.

කාන්තාවක් විධියට යුතුකම් ඉටු කළාම අයිතිවාසිකම් ලබා ගන්න පහසු වෙනවා කියලා මම විශ්වාස කරනවා. නමුත් දේශපාලනය තුළ නම් ඒ අයිතිවාසිකම් ලබා ගන්න අපට අපහසුයි. මවක් විධියට, සහෝදරියක් විධියට, දියණියක් විධියට, පෙම්වතියක් විධියට, මිත්තණියක් විධියට, සමාජ ක්‍රියාකාරිනියන් විධියට අපේ සංස්කෘතික දායාද ඉදිරියට අරගෙන යන්න මහා මෙහෙවරක් කරන කාන්තාවගේ දේශපාලන නියෝජනය ශක්තිමත් කිරීමට අපේ යුතුකම් ඉෂ්ට කිරීම විතරක් ප්‍රමාණවත් වන්නේ නැහැ කියා මා විශ්වාස කරනවා. මේ රටේ දේශපාලනය තුළ කාන්තා නියෝජනය වැඩි කිරීම සඳහා මේ පාර්ලිමේන්තුව තුළ විශේෂ කාරක සභාවක් පත් කරලා, සාකච්ඡා කරලා ඉදිරියේදී ගෙනෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේදී වාගේම, පළාත් සභා හා පළාත් පාලන ඡන්ද ක්‍රමයට ගෙන එන සංශෝධන තුළින් අවශ්‍ය වටපිටාව සකස් කර දීම ඉතාම කාලෝචිත කාර්යයක් බව මා විශ්වාස කරනවා.

ජාත්‍යන්තර කාන්තා දිනය යෙදී තිබෙන අද, නිවස තුළ වේවා, රැකියා ස්ථානය තුළ වේවා, සමාජ වටපිටාව තුළ වේවා, විවිධ හැල හැප්පීම්වලට භාජන වෙමින් කටයුතු කරන, අම්මාගේ කාර්යභාරයෙන් නොනැවතී ඉන් එහාට ගිහිල්ලා සියලු තැන්හිදී වගකීම් දරමින් මේ රටේ ආර්ථික තත්ත්වය, දේශපාලන තත්ත්වය, සංස්කෘතිය අඛණ්ඩව ඉදිරියට අරගෙන යන්න කටයුතු කරන සියලු කාන්තාවන්ට මගේ ගෞරවය, ප්‍රණාමය පුද කරනවා. විශේෂයෙන් එදා ඇඩ්ලින් මොලමුරේ මැතිනියගෙන් පටන්ගෙන වර්තමානයේ මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරියන් 12දෙනා පත්වීම දක්වා වූ කාලය - ගෙවුණු වසර ගණනාව- තුළ මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන්න අවස්ථාව ලැබුණු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමියලා සියලුදෙනා ඉතාම කෘතවේදීව මේ අවස්ථාවේ මා සිහිපත් කරනවා.

ඔවුන් මේ සභා ගර්භය තුළ සිටිමින් කාන්තා නියෝජනය වැඩි කරන්න අවස්ථාව ලබා දෙන්න කියා හඬ නඟන්න ඇති; කථා කරන්න ඇති. ඔවුන්ගේ ඒ හඬ නැඟීම ප්‍රතිඵලදායක වුණාද, නැද්ද කියන එක අපට තවමත් හිතා ගන්න අපහසුයි. ජනගහනයෙන් සියයට 52ක් වුණු කාන්තාවන්ට දේශපාලනය තුළත් නියෝජනය වැඩි කරන්න අවශ්‍ය වටපිටාව මේ පාර්ලිමේන්තුව තුළින් සාදා දෙයි කියන විශ්වාසය තබමින් මට කථා කරන්න මේ අවස්ථාව ලබා දීම පිළිබඳව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි පහක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.00]

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට ලැබී තිබෙන කාලය කෙටි නිසා මා ඉක්මනින් අදහස් දක්වන්නම්.

පාර්ලිමේන්තුවේ සියයට 5ක් වූ කාන්තා නියෝජනය ද ඇතුළුව දේශපාලනයේ කාන්තා නියෝජනය වැඩි කිරීම පිළිබඳව ගරු ගීතා කුමාරසිංහ මන්ත්‍රීතුමිය කාන්තා දිනයේදී කථා කරන කොට ඇත්ත වශයෙන්ම මට ලොකු සතුටක් දැණුනා. ඒ වාගේම, ඇග්නස් ද සිල්වා මැතිනිය, ඇඩ්ලින් මොලමුරේ මැතිනිය, නේසම් සරවනමුත්තු මැතිනිය, විවියන් ගුණවර්ධන මැතිනිය, සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ආදි කාන්තාවන් ගැන කථා කරන කොට මට ලොකු අභිමානයක් දැණුනා. ඒ සියලුදෙනා සොහොන්වලින් නැඟිටලා එනවා වාගේ හැඟීමක් මට දැණුනා. හැබැයි ඒත් එක්කම, මේ කාරණයත් මතක් කරන්න ඕනෑ. ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියගේ යෝජනාවේ චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනියගේ නම නැහැ. එහි සඳහන් වන්නේ, නිකම්ම නිකම් "ජනාධිපතිතුමිය" කියලා විතරයි. එතුමියගේ නම තිබුණා නම් තවත් වටිනවා. මොකද, එතුමිය තමයි ලංකාවේ ප්‍රථම විධායක ජනාධිපතිනිය පමණක් නොව, ලෝකයේ ප්‍රථම විධායක ජනාධිපතිනිය වුණේත්.

1982 ජනමත විචාරණය අවස්ථාවේදී ජනතා විමුක්ති පෙරමුණේ නායක රෝහණ විජේවීර මැතිතුමා රැස්වීම්වලදී කියපු කාරණයක් මට මේ මොහොතේ මතක් වෙනවා. එතුමා කිව්වා, ජනමත විචාරණයේදී "කළ ගෙඩිය" ලකුණට කතිරය ගැසුවාම එම ඡන්දය ඡන්ද පෙට්ටිය තුළදී "ලාම්පුව" ලකුණට සලකුණු වෙනවා කියලා. එහෙම තාක්ෂණයක් සිංගප්පූරුවෙන් ද, ඇමෙරිකාවෙන් ද කොහෙන්දෝ ගෙනෙන බවක් මා පොඩි කාලයේ අසා තිබෙනවා වාගේ මතකයක් මට තිබෙනවා. නමුත් අපි දන්නවා, ඒ විධියට ඡන්ද වෙනස් කරන, ඡන්ද මාරු කරන ඡන්ද පත්‍රිකා ලෝකයේ නැති බව. හැබැයි, ඡන්ද ක්‍රම නම් හදන්න පුළුවන්. මේ ආණ්ඩුවට අද ඕනෑ වෙලා තිබෙනවා එහෙම ඡන්ද ක්‍රමයක් හදලා ඉදිරි පළාත් පාලන ඡන්දය දිනාගන්න. කාන්තා නියෝජනය අඩු පළාත් පාලන ආයතනයක් හදන්න මේ වන කොට පිඹුරුපත් සකස් කරමින් ඉන්න බව ගීතා කුමාරසිංහ මැතිනියත් දන්නවා ඇතැයි මා හිතනවා. පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරුන් සංඛ්‍යාව වැඩියි කියලා එතුමන්ලා අයින් කරන්න යන්නේ මෙන්න මේ කාන්තා නියෝජනයයි. ගරු ගීතා කුමාරසිංහ මන්ත්‍රීතුමියනි, මම ඔබතුමියට කියනවා, ඒ යෝජනාව ගෙන ආවේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මහාචාර්ය සුදන්ත ලියනගේ කියන, "වියත් මග" සාමාජික මහත්මයා බව. එතුමා ඔබතුමියගේ දිස්ත්‍රික්කයේ, ඔබතුමියගේ හිතවතෙකු වෙන්නත් පුළුවන්.

ඒක මරු ඡන්ද ක්‍රමයක්. ඡන්ද දායකයන් ගිහිල්ලා මේ රටේ ලියාපදිංචි පොඩි පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට කතිරය ගහනවා කියලා අපි හිතමු. විමල් වීරවංශ මහත්මයාගේ පක්ෂයට, උදය ගම්මන්පිල මහත්මයාගේ පක්ෂයට, මනෝ ගනේසන් මහත්මයාගේ පක්ෂයට -ඒ වාගේ සුළු පක්ෂයකට- හෝ ස්වාධීන කණ්ඩායමකට ඡන්දය දැම්මා කියලා හිතන්න. එහිදී, කතිරය පොඩි පක්ෂයට. හැබැයි, ධුරය ලැබෙන්නේ ඡන්දය පවත්වන වෙලාවේ බලය තිබෙන පක්ෂයට; මේ වෙලාවේ නම්, පොහොට්ටුව ලකුණ පක්ෂයට. මෙන්න මේ මරු ක්‍රමය 2018 මැතිවරණ ප්‍රතිඵලයට දාලා බැලුවාම, විරුද්ධ පක්ෂයට මන්ත්‍රී ධුර අඩු වෙනවා. විරුද්ධ පක්ෂයට මන්ත්‍රී ධුර අඩු කරන්න තමයි මේ ක්‍රමය ගෙනැල්ලා තිබෙන්නේ. මේ ක්‍රමය නිසා ජනතා විමුක්ති පෙරමුණ නැත්තටම නැති වෙලා යනවා. වතුකරයේ ද්‍රවිඩ පක්ෂවලට තිබෙන මන්ත්‍රී ධුරත් නැති වෙලා යනවා. පොඩි පක්ෂවලට මේකෙන් වාසියක් ලැබෙන්නේ නැහැ.

මැතිවරණ ඡන්ද විමසීම් පිළිබඳ ප්‍රතිසංස්කරණ හඳුනාගැනීම හා සංශෝධන ඉදිරිපත් කිරීම සඳහා පත් කළ විශේෂ කාරක සභාවේ දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමාත් ඉන්නවා. එතුමාගේ පක්ෂයත් නැත්තටම නැති වෙලා යනවා, මේ ක්‍රමය නිසා. ඒ නිසා මම එතුමාට කියනවා, මේ ඡන්ද ක්‍රමයට ඉඩ දෙන්න එපා කියලා. මේ ක්‍රමයට ඉඩ දෙන්න එපා! ආණ්ඩුව තමන්ගේ පක්ෂයට වාසියක් ගන්න මෙවැනි ඡන්ද ක්‍රමයක් ගැන යෝජනා කරන වෙලාවක තමයි, දේශපාලනයේ කාන්තා නියෝජනය වැඩි කිරීම ගැන මේ යෝජනාව අද පාර්ලිමේන්තුවට ඉදිරිපත් වන්නේ. මම සතුටු වෙනවා, දේශපාලනයේ කාන්තා නියෝජනය වැඩි කිරීම ගැන ජාත්‍යන්තර කාන්තා දිනයේදී යෝජනාවක් පාර්ලිමේන්තුවට ගෙන ඒම ගැන.

පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරුන් සංඛ්‍යාව වැඩියි කියලා දැන් වැරැදි මතයක් ගිහින් තිබෙනවා. 1969 වනතුරු ශ්‍රී ලංකාවේ ගම් සභා තිබුණා. 1969 වනතුරු පළාත් පාලන ආයතනවල නියෝජිතයන් 9,000ක් සිටියා. දැන් ඉන්නේ මන්ත්‍රීවරු 8,711 යි. ඒ අතරින් 385ක්ම එල්ලන ලද ආසනවල -overhang seats- මන්ත්‍රී ධුර හෙවත් Overhang මන්ත්‍රී ධුර. Overhang මන්ත්‍රී ධුරත් සමඟ කාන්තා මන්ත්‍රීවරියන් ඉන්නේ 2,002යි. ගරු මන්ත්‍රීතුමියනි, මෙන්න මේ කාරණය පැහැදිලි කරලා කියන්න. පළාත් පාලන ආයතනවල පිරිමි අපේක්ෂකයන් කොට්ඨාස 4,523ක් දිනන විට කාන්තාවන් දිනුවේ කොට්ඨාස 554ක් පමණයි. ඒ කියන්නේ 5,077න් 554යි. එය ප්‍රතිශතයක් විධියට 11යි. ඉතිරි ටික පිරුණේ overhang seat එකෙන් ලැබුණු මන්ත්‍රී ධුරය ද ඇතුළුව ඒ ඒ පක්ෂවල මහ ලේකම්වරුන් පත් කරපු මන්ත්‍රී ධුරවලින්. දැන් මෙන්න මේකට තමයි කට්ට ගහන්න යන්නේ. පසුගිය යහ පාලන රජයෙන් අප අරගෙන දීපු සියයට 25ක් වූ කාන්තා නියෝජනය නැති කරන්නයි මේ කටයුතු කරන්නේ. ගරු මන්ත්‍රීතුමියනි, මම හිතනවා, ඔබතුමියට මේ කාරණය තේරුම් යන්න ඕනෑ කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු වමින්ද විජේසිරි මන්ත්‍රීතුමා මේ මොහොතේ පැමිණෙන්නේ නැහැ. ඒ නිසා එතුමාගේ වෙලාවත් මට තිබෙනවා.

මා හිතනවා, මා මේ කියපු කථාව ගරු ගීතා කුමාරසිංහ මන්ත්‍රීතුමියට තේරෙන්න ඇති කියලා. පසුගිය අඟහරුවාදා එම විශේෂ කාරක සභාවට සුදන්ත ලියනගේ මහාචාර්යතුමා ඉදිරිපත් කළ යෝජනාව අනුව මන්ත්‍රී ධුර -overhang seats- 325ක් අඩු වෙනවා. බහුතරයක් කුඩා පක්ෂවලට සමානුපාතික ක්‍රමයට ලබාගන්න තිබුණු කාන්තා මන්ත්‍රී ධුර ටික ඒ තුළින් නැති වෙලා යනවා කියන එක මතක තබා ගන්න. ඒ නිසා මම ඔබතුමියට කියනවා, "අලුත් ක්‍රමයක් ගෙනෙන්න. හැබැයි, කාන්තා මන්ත්‍රී ධුර ටික නැති වන විධියේ ක්‍රම ගෙනෙන්න එපා" කියලා ඔබතුමියලාගේ පක්ෂවල මහ මොළවලට ඔබතුමියලා යෝජනා කරන්න කියලා. එහෙම නොවුණොත් වෙන්නේ, අපි ඉතා අමාරුවෙන් ගෙන ආ පළාත් පාලන ආයතනවල සියයට 25 කාන්තා නියෝජනය නැති වෙලා යන එකයි.

ගරු ගීතා කුමාරසිංහ මන්ත්‍රීතුමියනි, ඔබතුමියට හොඳ අත්දැකීමක් තිබෙනවා. ද්විත්ව පුරවැසිභාවය නිසා ඔබතුමියට ගෙදර යන්න සිද්ධ වුණා. හැබැයි, ද්විත්ව පුරවැසිභාවය තිබෙන අනෙක් අයට පාර්ලිමේන්තුවට එන්න පුළුවන් වන විධියට ඒ අය

විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් තමන්ට ඕනෑ හැටියට අවශ්‍ය වෙනස්කම් කර ගත්තා. මේ පූර්වාදර්ශය අරගෙන තමයි ඒ මහාචාර්යතුමාත්, ඔබතුමන්ලාගේ පක්ෂයේ "ඡන්ද හඳන යන්ත්‍රය" කියපු බැසිල් රාජපක්ෂ මහත්මයාත් මැතිවරණ ක්‍රම මේ විධියට සකස් කිරීමේ කටයුත්ත කරන්නේ කියන කාරණය මම ඔබතුමියට මේ වෙලාවේ බොහොම ගෞරවයෙන් මතක් කරනවා.

පළාත් පාලන ආයතනවලට හෝ වේවා, පළාත් සභාවලට හෝ වේවා, පාර්ලිමේන්තුවට හෝ වේවා සැබෑ වශයෙන්ම කාන්තා නියෝජනය වැඩි කරන්න ඕනෑ නම්, ඒ සඳහා මේ රටේ පක්ෂ නායකයන්ට ඕනෑකම තිබෙන්න ඕනෑ. ඒක පළමුවන කාරණය. ඒ වාගේම, ව්‍යවස්ථා සම්පාදකයන් හැටියට මේ පාර්ලිමේන්තුව තුළ සිටින අදාළ ඇමතිතුමා ඇතුළුව ඒ වගකීම් ගන්නා ඇමතිවරුන්ට, මන්ත්‍රීවරුන්ට මුලින්ම ඒ අවශ්‍යතාව ඇති වෙන්න ඕනෑ. පාර්ලිමේන්තුව තුළ අප කාන්තා නියෝජනය සම්බන්ධයෙන් කොච්චර කථා කළත්, 10ත් 13ත් අතර තමයි හැමදාම පාර්ලිමේන්තුවේ කාන්තා මන්ත්‍රී ධුර සංඛ්‍යාව රැඳී තිබුණේ. මේ ප්‍රමාණය ඇත්තටම වැඩි කරගන්න ඕනෑ නම් කළ යුත්තේ මොකක්ද? ජාතික ලැයිස්තුව අරගෙන බලන්න. සියලු පක්ෂවලින් 29 දෙනෙක් ජාතික ලැයිස්තුවෙන් පාර්ලිමේන්තුවට එනවා. හැබැයි, ජාතික ලැයිස්තුවෙන් කාන්තාවන් කීදෙනෙක් පාර්ලිමේන්තුවට එනවාද? මා සතුටු වෙනවා, ගරු මංජුලා දිසානායක මන්ත්‍රීතුමිය ජාතික ලැයිස්තුවෙන් පාර්ලිමේන්තුවට ඒම ගැන. හැබැයි, ජාතික ලැයිස්තුවෙන් පාර්ලිමේන්තුවට එන්නේ කාන්තාවන් කීදෙනාද කියලා බලන්න. ගරු ඇමතිතුමනි, කාන්තා නියෝජනය වැඩි කිරීමට සැබෑ ලෙස ඕනෑකම තිබෙනවා නම්, මා යෝජනා කරනවා, ජාතික ලැයිස්තුවෙන් සියයට 50ක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හරහා කාන්තාවන්ට දෙන්න කියලා. එතකොට අනිවාර්යයෙන් කාන්තා මන්ත්‍රීවරියන් 14 දෙනෙක් පාර්ලිමේන්තුවට පත් වී එනවා. මැතිවරණයෙන් දිනලා එන්නේ 10දෙනකු හෝ 11දෙනකු නම්, ජාතික ලැයිස්තුවේ 14දෙනාත් ආවාම කාන්තා මන්ත්‍රී ධුර සංඛ්‍යාව 25ක් පමණ වෙනවා. එතකොට පාර්ලිමේන්තුව තුළ 1/5ක්, එහෙම නැත්නම් සියයට 20ක් කාන්තා නියෝජනය වැඩි කරන්න පුළුවන් කියන කාරණය මා මේ අවස්ථාවේ ඔබතුමන්ලාට මතක් කරනවා.

කාන්තා නියෝජනය වැඩි කිරීමට පක්ෂ නායකයන්ට ඕනෑකම තිබෙන්න ඕනෑ. අපේක්ෂිකාවන් ලෙස කාන්තාවන්ගේ නාම යෝජනා -nominations- භාර දෙන්නේ නැත්නම්, මේ රටේ ඡන්ද දායකයන් ඡන්දය දීලා කාන්තාවන් මේ පාර්ලිමේන්තුවට, පළාත් සභාවට, පළාත් පාලන ආයතනවලට එවන්නේ මොන ආකාරයටද? ඒ නිසා නාම යෝජනා -nominations- ලැයිස්තුවෙන් යම්කිසි ප්‍රතිශතයක් කාන්තාවන්ට දෙන්න. මා නම් කැමැතියි, සියයට 5ක් දෙනවා නම්. මොකද, කාන්තාවන් කොතැනකදීවත් හැල්ලු වෙන්න ඕනෑ නැහැ කියා මා කියනවා. අද සෑම ක්ෂේත්‍රයකම කරට-කර දී, උරට-උර දී පිරිමියාත් එක්ක සටන් කරමින් තරගයට වැඩ කරන්න කාන්තාවන්ට පුළුවන් නම්, මේ පාර්ලිමේන්තුවේදී විතරක්, එහෙම නැත්නම් පළාත් සභාවේදී විතරක් කාන්තාව දෙවෙනි කොට සලකන්නේ ඇයි කියන ප්‍රශ්නය මම මේ අවස්ථාවේ අහනවා. නාම යෝජනා ලැයිස්තුවෙන් කාන්තා නියෝජනයට සියයට 50ක් දෙන්න බැරි නම්, කාන්තා නියෝජනය සියයට 40ක් වන ලෙස නාම යෝජනා භාර දෙන්න කියා මා ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව කොච්චර වෙලාවක් තිබෙනවාද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට තව විනාඩියක් තිබෙනවා.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
එහෙම නම්, මා කථාව අවසන් කරන්නම්.

අපට මේ ආකාරයේ යෝජනා ගෙනෙන්න පුළුවන්. ඒ විතරක් නොවෙයි. තීන්දු තීරණ ගන්නා තැන්වලදී, කමිටුවලදී කාන්තාවන්ට අවශ්‍ය තැන, නිසි තැන ලබා දෙන්න කියලා පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදය හැටියට අපි යෝජනා කරලා තිබෙනවා; විසඳුම් මාලාවක් දීලා තිබෙනවා;මැතිවරණ ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් අපි යෝජනා ඉදිරිපත් කරලා තිබෙනවා. අපි දන්නේ නැහැ, මේ වන කොට ඒ යෝජනාවලින් කොච්චර ප්‍රමාණයක් සැලකිල්ලට ගෙන තිබෙනවාද කියලා. අපි දුන් යෝජනාවලින් කොච්චර ප්‍රමාණයක් කාන්තා නියෝජනය වැඩි කිරීම සඳහා සැලකිල්ලට ගෙන තිබෙනවාද කියලා පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයේ ගරු සභාපතිනිය වන සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ රාජ්‍ය ඇමතිතුමියවත් දන්නවාද කියලා මා දන්නේ නැහැ. ඒ නිසා මා මේ ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා, අපි පළාත් පාලන ආයතනවලට ගෙන ආ සියයට 25 quota එක මොනම විධියකින්වත් නැති කරන්න කටයුතු කරන්න එපා කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැම දෙනාටම ප්‍රශ්නයක් තිබෙනවා, කාන්තාවන් පළාත් පාලන ආයතනවලට පත් වෙලා ඇවිත් මොනවාද කරන්නේ කියලා.

මේ කාන්තාවන් තවම අවුරුදු 4යි පළාත් පාලන ආයතනවල සිටියේ. පිරිමි අය අවුරුදු 73ක් තිස්සේ මේ රටේ බලය පාවිච්චි කරමින් ඒ වැඩ ටික කරගෙන යනවා. ඒ නිසා කාන්තාවන්ටත් කාලයක් දෙන්න. අපට දීර්ඝ කාලීනව quotas ඕනෑ නැහැ. මේ රටේ ජන සමාජය තුළ ආකල්පයක් ඇති වෙන්න ඕනෑ, කාන්තාවන් දේශපාලනයට එන්න ඕනෑ කියලා. ඒ දිනය එනකම් කාන්තා නියෝජනය වැඩි කරන්න රජයක් හැටියට, ආණ්ඩුවක් හැටියට සහයෝගය ලබා දෙන්න කටයුතු කරන්න කියන ඉල්ලීම කරමින්, ගරු ගීතා කුමාරසිංහ මැතිනිය, ජාත්‍යන්තර කාන්තා දිනය සමරන අද වාගේ දිනයක මේ යෝජනාව ගෙන ඒම ගැන එතුමියට ස්තුතිවන්ත වෙනවා. හැබැයි, සියයට 25 quota එක නැති කරන විධියේ ගුණ්ඩු දාලා අලුත් ඡන්ද ක්‍රම ගෙනෙන්න එපා කියලා ආණ්ඩුවට කියන්න කියන එකත් එතුමියට මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ රාජ්‍ය ඇමතිතුමිය. ඔබතුමියට විනාඩි 4ක කාලයක් තිබෙන්නේ.

[අ.භා. 5.11]

**ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය (ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) சுதர்ஷனி பர்னாந்துபுள்ளே - ஆரம்ப சுகாதார சேவைகள், தொற்று நோய்கள் மற்றும் கொவிட் நோய்க் கட்டுப்பாட்டு அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle - State Minister of Primary Health Care, Epidemics and Covid Disease Control)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

අද ජාත්‍යන්තර කාන්තා දිනය. ලෝකයම කාන්තාව ගැන කථා කරන දවස. කාන්තාව පවුලට, සමාජයට, රටට කළ මෙහෙවර ඇගැයීමට ලක් වන දිනය. ඒ වාගේම කාන්තාවන්ගේ

[ගරු (වෛද්‍යා) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය ]

විසඳී නැති ප්‍රශ්න කථා කරන දිනය. අභියෝග මැද, බාධක මැද තමන්ගේ ඉලක්ක කරා ගමන් කරන මුළු මහත් ශ්‍රී ලංකාවාසී කාන්තාවන්ට මම "සුබ කාන්තා දිනයක් වේවා" යි ප්‍රාර්ථනය කරනවා.

අපේ ගරු ගීතා කුමාරසිංහ මන්ත්‍රීතුමිය ඉතාම කාලීන යෝජනාවක් ඉදිරිපත් කළා, දේශපාලන ක්ෂේත්‍රයේ කාන්තා නියෝජනය වැඩි කරන්න කියලා. ඒක ඉතාම වැදගත් යෝජනාවක්. මොකද, මේ රටේ ජනගහනයෙන් සියයට 52ක් කාන්තාවෝ; ඡන්ද දායකයන්ගෙන් සියයට 56ක් කාන්තාවෝ. හැබැයි, අද පාර්ලිමේන්තුවේ කාන්තා නියෝජනය සියයට 5යි. ඒ සියයට 5ක කාන්තා නියෝජනය තුළත් බොහෝවිට සිටින්නේ අපි වාගේ කාන්තාවෝ. ඒ කියන්නේ ස්වාමිපුරුෂයා අහිමි වීම තුළ, පියා අහිමි වීම තුළ, සහෝදරයාගේ අහිමි වීම තුළ දේශපාලනයට ආපු කාන්තාවන්. හැබැයි, දේශපාලනය කරන්න හැකියාව තිබෙන, දේශපාලනය තෝරා ගත්ත කාන්තාවන්ට මේ රටේ දේශපාලන ප්‍රවාහයට ඇතුළු වීම සඳහා අවශ්‍ය ඉඩ කඩ සලසා දෙන්න ඕනෑ කියන මතයේ තමයි මම ඉන්නේ.

විශේෂයෙන්ම අපේ පසුගිය රජය කාලයේ එවකට සිටි ජනාධිපතිතුමාට -වර්තමාන අගමැතිතුමාට- මම ස්තුතිවන්ත වෙනවා, පළාත් පාලන ආයතනවල කාන්තා නියෝජනය සඳහා සියයට 25ක quota එකක් ලබා දීම ගැන. පළාත් පාලන ආයතනවල කාන්තා නියෝජනය තිබුණේ සියයට 2යි. සියයට 25ක quota එකක් ගෙනැල්ලා කාන්තාවන්ට දේශපාලන ප්‍රවාහයට ඇතුළු වෙන්න එතුමා අවස්ථාව ලබා දුන්නා. පාර්ලිමේන්තුවේ කාන්තා සංසදය විධියට කොයිම විධියකටවත් මේ සියයට 25 quota එක අඩු කරනවාට අපේ තදබල විරෝධතාව ප්‍රකාශ කරනවා. හැම දාම මේ quota එක දෙන්න කියලා අපි කියන්නේ නැහැ. අපි කියන්නේ කාන්තාවන්ට දේශපාලන ප්‍රවාහයට ඇතුළු වීමට ඉඩ කඩ, දොර විවෘත කරලා දෙන්න කියන එකයි. දේශපාලනයේ නිරත වෙන්න හැකියාව තිබෙන අයට මේ quota ක්‍රමය හරහා උඩට එන්න අවස්ථාව දෙන්න. අපි කියන්නේ, කාන්තාවන්ටත් නාම යෝජනා ලබාගෙන අනෙක් පිරිමි අපේක්ෂකයන් සමඟ තරග කරන්න පුළුවන් වට පිටාවක් මේ රටේ නිර්මාණය වෙනතුරු මේ quota එක හරහා අපට තාවකාලිකව හැකියාව ලැබෙනවා කියන එකයි.

පළාත් සභා අක්‍රිය වෙන වෙලාව වෙනකොට එහි කාන්තා නියෝජනය තිබුණේ සියයට 4යි, පාර්ලිමේන්තුවේ සියයට 5යි. අපි මතක් කරන්න ඕනෑ මේ රටේ කාන්තාවන්ට ඉතිහාසයේ කවදාවත් තමන්ගේ අයිතිවාසිකම් බන්දේසියේ තියලා ලැබුණේ නැති බව. 1931දී සර්ව ජන ඡන්ද බලය ලබා ගත්තේත්, ඒ අයිතිවාසිකම ලබා ගත්තේත් සටන් කරලා, වීථිවලට බැහැලා. දේශපාලන අයිතිය හැමෝටම තිබෙනවා. ඒ නිසා අපි රටේ කාන්තාවන්ට කියනවා, මේ අයිතිය අපි ආරක්ෂා කර ගන්න ඕනෑ කියලා. ඉතින් මේ අයිතිය ශක්තිමත් කරන්න අපි සියලුදෙනාම එකතු වෙමු. පිරිමි නියෝජනය වෙනස් කරන්න, අඩු කරන්න කියලා අපි කියන්නේ නැහැ. අපි කියන්නේ කාන්තාවන්ටත් ඉඩ දෙන්න කියලා. මොකද, මේ රටේ ජනගහනයෙන් සියයට 52ක් වෙනුවෙන් තීන්දු - තීරණ ගන්නේ බහුතරයක් පිරිමි අය.

කාන්තාවට සුවිශේෂී වූ ප්‍රශ්න තිබෙනවා. අද පොදු ප්‍රවාහනයේදී කාන්තාව හිරිහැරවලට ලක් වෙනවා. අපි ඉස්කෝලේ යන කාලයේ තිබුණු ප්‍රශ්නය තවම විසඳිලා නැහැ, ඒ ආකාරයෙන්ම තිබෙනවා. එහෙම හිරිහැරවලට ලක් වෙමින් සිටින කාන්තාව රටේ සංවර්ධනයට දායකත්වය දෙන්නේ කොහොමද? ඒ වාගේම කාන්තාව වැඩ බිමේදී හිංසනයට ලක් වෙනවා. වැඩ බිමේ කාන්තාවන් වෙනුවෙන් රෝහිණී කුමාරි විජේරත්න මැතිනිය සඳහන් කළ C190 ප්‍රඥප්තිය නීතිගත කරන්න කියන ඉල්ලීම මම නැවතත් කරනවා. ඒ වාගේම මේ රටේ කාන්තාවන්ගෙන් සියයට 25ක් ප්‍රචණ්ඩත්වයට ලක් වෙනවා.

නිදහස් අධ්‍යාපනයෙන් සහ සෞඛ්‍යයෙන් අද කාන්තාවන් බොහෝ ප්‍රයෝජන අරගෙන තිබෙනවා. විශේෂයෙන්ම අද වන විට විශ්වවිද්‍යාලවලට ඇතුළත් වෙන්නේ වැඩිපුරම ශිෂ්‍යාවන්. හැබැයි, විධිමත් ක්ෂේත්‍රයේ කාන්තා නියෝජනය සියයට 32යි. ඒකට හේතුව, කාන්තාවට අභියෝග රාශියක් තිබෙන එක. රට මානව සම්පත වෙනුවෙන් ආයෝජනය කරනවා. හැබැයි, විශ්විද්‍යාලයෙන් පිටවෙලා විවාහ ජීවිතයට ඇතුළත් වුණාට පසුව පවුලේ බර, -දරුවන් රැක බලා ගැනීමේ බර, දෙමව්පියන් රැක බලා ගැනීමේ බර, රෝගී අය රැක බලා ගැනීමේ බර- කාන්තාවට පැටවෙනවා. ඒ සියලු බර කාන්තාවට පැටවීම නිසා රටේ සංවර්ධනයට කාන්තාවගේ දායකත්වය ලැබෙන්නේ නැහැ.

දිවා සුරැකුම් මධ්‍යස්ථාන ඇති කිරීම සඳහා අපි ගරු කථානායකතුමාගෙනුත් ඉල්ලීමක් කළා. නැවත අපි ඒ ඉල්ලීම කරනවා. අපි ඒක පාර්ලිමේන්තුවෙන් පටන් ගනිමු. පාර්ලිමේන්තුවේ සේවය කරන තරුණ දෙමව්පියන්ට තමන්ගේ දුවා දරුවන් රැකබලා ගැනීමට දිවා සුරැකුම් මධ්‍යස්ථාන ඇති කරලා, ඒ හරහා අපි රටට ආදර්ශයක් වෙමු. රටේ තිබෙන අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථාවලත් දිවා සුරැකුම් මධ්‍යස්ථාන ඇති කළොත් තරුණ කාන්තා, පුරුෂ දෙගොල්ලන්ගේම දායකත්වය රටට ලබා ගන්න අපට පුළුවන් වෙනවා. අද අපේ flexihours නැහැ. කොවිඩ් වසංගතයත් එක්ක "work from home" සංකල්පය හඳුන්වා දුන්නා. එවැනි සංකල්ප හඳුන්වා දීම තුළින් කාන්තාවගේ වැඩි දායකත්වය ලබා ගන්න පුළුවන්. ගරු මන්ත්‍රීතුමිය කිව්වා වාගේ ජාතික ලැයිස්තුවෙන් සියයට 50ක නියෝජනයක් කාන්තාවට දීලා දේශපාලන ප්‍රවාහයට ඇතුළු වන්න අවශ්‍ය වටපිටාව සකස් කරන්න අවශ්‍ය සහයෝගය අපට ලබා දෙන්න කියලා අපේ ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් සහ පක්ෂ නායකයන්ගෙන් ඉල්ලා සිටිනවා. ඒ වාගේම අපි රටේ ජනතාවගෙන් ඉල්ලා සිටිනවා, මේ සඳහා අපට සහයෝගය, ශක්තිය ලබා දෙන්න කියලා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
**(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)**
(The Hon. Presiding Member)
Next, the Hon. Shanakiyan Rajaputhiran Rasamanickam. You have five minutes.

[අ.භා. 5.16]

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද ලෝක කාන්තා දිනය දවසේ සියලු කාන්තාවන්ට "Happy Women's Day!" කියලා මුලින්ම ප්‍රාර්ථනා කරනවා. විශේෂයෙන්ම අද කාන්තා දිනයේ අපේ ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මන්ත්‍රීතුමිය සභාව කල් තබන අවස්ථාවේ ඉතා වැදගත් යෝජනාවක් ගෙනැවිත් තිබෙනවා. අපේ ගරු අලි සබ්රි මහත්මයා පිළිතුරු දෙන විවාදයක මම හරි කැමැතියි කථා කරන්න. යම් යම් තීරණවලට අපි එකඟ නැති වුණත්, එතුමා කැබිනට් එකේ හෝ මේ පාර්ලිමේන්තුව තුළ යම්කිසි දෙයක් හරියට කරන්න උත්සාහයක් දරනවා කියලා අපට පෙනෙනවා.

ඇත්තටම ශ්‍රී ලංකාවේ කාන්තාව ගත්තාම, අද ලංකාවට විදේශ විනිමය වැඩිපුර උපයා දෙන්නේ කාන්තාව කියන එක භය නැතිව කියන්න පුළුවන්. කඳුකරයේ තේ දලු නෙළන කාන්තාවන්, ඇඟලුම් කර්මාන්තයේ නියැළී සිටින කාන්තාවන් තමයි අපට විදේශ විනිමය ගෙනෙන්නේ. කොවිඩ් - 19 වසංගතය කාලයේ මුළු ලංකාවම lock down කර තිබුණත් ඇඟලුම් කර්මාන්තයේ නියැළී සිටින කාන්තාව නිසා තමයි අපට යම් විදේශ විනිමය ප්‍රමාණයක් ලබා ගන්න පුළුවන් වුණේ. මම හිතන විධියට පිරිමින්ට වඩා කාන්තාවගෙන් ලංකාවේ ආර්ථිකයට තිබෙන contribution එක ඉතාම වැඩියි. ඒ නිසා මේ මන්ත්‍රීතුමිය කාලයට සුදුසු යෝජනාවක් තමයි මේ ගෙනැවිත් තිබෙන්නේ.

ඇත්තටම මමත් තරුණ මන්ත්‍රීවරයකු වශයෙන් තරුණ-තරුණියන්ගේ participation එක තිබෙන්න ඕනෑ කොහොමද, කාන්තා නියෝජනය වැඩි කරන්න ඕනෑ කොහොමද කියලා බොහොම වැඩසටහන්වලට "Zoom" තාක්ෂණය ඔස්සේ සම්බන්ධ වෙලා සාකච්ඡා කරලා තිබෙනවා. අපේ ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමියත් අපිත් එක්ක සෑහෙන සාකච්ඡාවලට සම්බන්ධ වෙලා තිබෙනවා. මම හිතන විධියට මේ කාන්තා නියෝජනය වැඩි කරන්න පුළුවන් එකම ක්‍රමය, ඒක නීත්‍යනුකූලව ගෙන ඒම පමණයි. ඒ මගේ මතය. අපේ ගරු සුදර්ශනි ප්‍රනාන්දුපුල්ලේ රාජ්‍ය ඇමතිතුමිය කිව්වා වාගේ අඩුම තරමින් යම් ප්‍රමාණයකට එනකල් හෝ යම්කිසි කාල වකවානුවකට ඒ කාන්තා නියෝජනය තිබිය යුතුයි. මම හිතන විධියට local government authoritiesවල තිබෙන කාන්තා නියෝජනය සියයට 25ත් මදි. කාන්තාවන්, තරුණයන් එකතු කරලා අඩුම ගණනේ සියයට 50ක් හෝ ඒ දෙගොල්ලන්ට ම එකතු වෙලා එන්න පුළුවන් විධියේ නීතියක් ලංකාව තුළ ගෙනෙන්න ඕනෑ. සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ රාජ්‍ය ඇමතිතුමිය very correctly කිව්වා වාගේ, though we boast about the first female Prime Minister of the world, she was a widow of a former Prime Minister. That is how she landed herself in that situation. අපේ චන්ද්‍රිකා බණ්ඩාරනායක හිටපු ජනාධිපතිතුමිය ගත්තාම, එතුමිය ඒ දවස්වල හිටපු ඉතා ප්‍රබල චරිතයක් වන විජය කුමාරණතුංග මහතාගේ බිරිඳ. එතුමියගේ සැමියා අභාවප්‍රාප්ත වුණාට පස්සේ තමයි එතුමියට අවස්ථාව ලැබුණේ. නමුත්, ඒ දෙදෙනාටම දක්ෂතාව, හැකියාව තිබුණු නිසා තමයි දිනන්න පුළුවන් වුණේ. හැබැයි, මම හිතන විධියට එතුමියට ඒ අවස්ථාව ලැබුණේ ස්වාමි පුරුෂයා නැති නිසා. ඒ වාගේම තමයි අපේ සුදර්ශනී ප්‍රනාන්දු පුල්ලේ රාජ්‍ය ඇමතිතුමියත්. එතුමියගේ සැමියාත් හිටපු ඉතා ප්‍රබල ඇමතිවරයෙක්. ඒ වාගේමයි අපේ විජයකලා මහේෂ්වරන් මැතිනියත්. ඒ වාගේ ලංකාවේ කාන්තාවන්ගෙන් සමහර අයට හැර අනෙක් සියලුදෙනාටම යම්කිසි special opportunities ලැබිලා තිබෙනවා. ඒ නිසා ගරු අලි සබ්රි මැතිතුමා Justice Minister හැටියට සිටින කාලය තුළ ඔබතුමා මේකට යම්කිසි දෙයක් නීත්‍යනුකූලව කරයි කියලා අපි බලාපොරොත්තු වෙනවා.

හැබැයි, එහෙම කොහොම හරි කට්ට කාලා අමාරුවෙන් පාර්ලිමේන්තුවට එන මන්ත්‍රීවරියන්ට අද මේ පාර්ලිමේන්තුව තුළ සලකන විධිය පිළිගත නොහැකියි. මම හිතන විධියට ආණ්ඩු පක්ෂයේ, විපක්ෂයේ සියලු කාන්තා මන්ත්‍රීවරියන් ඒකට විරෝධය ප්‍රකාශ කරලා තිබුණා. ගරු අධිකරණ ඇමතිතුමා ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නියෝජනය කරන කෙනෙකු නිසා එතුමාගෙන් මම දැනගන්න කැමැතියි, තිසකුට්ටි ආරච්චි මන්ත්‍රීතුමා කරන ලද ඒ අසභ්‍ය ප්‍රකාශයට අද වනතුරු ඔබතුමන්ලාගේ පක්ෂයෙන් අරගෙන තිබෙන ක්‍රියා මාර්ගය මොකක්ද කියලා. අද ගීතා සමන්මලී කුමාරසිංහ මන්ත්‍රීතුමිය මේ ගරු සභාවේ කථා කළා. මම එතුමියගෙනුත් අහන්න කැමැතියි, රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය පිළිබඳව කරන ලද ඒ අසභ්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් අරගෙන තිබෙන ක්‍රියා මාර්ගය මොකක්ද කියලා. ඉතාම අසභ්‍ය ප්‍රකාශයක් ඒ කළේ කියන එක අපි දන්නවා. ඒ සම්බන්ධයෙන් අරගෙන තිබෙන ක්‍රියා මාර්ගය කුමක්ද? ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ මාධ්‍ය සාකච්ඡාවලට ඇවිල්ලා එතුමා තමයි දැන් වැඩිපුර කථා කරන්නේ. අපි ඒක දකිනවා. එම පක්ෂයෙන් ඒ දේවල් අනුමත කරනවාද? අපි අමාරුවෙන් හෝ මේ කාන්තා නියෝජනය වැඩි කරන්න ඕනෑ කියලා කථා කරනවා. කොහොම හරි අමාරුවෙන් ඡන්දයක් දිනලා එන කාන්තාවටත් එහෙම අපහාස කරන පක්ෂයකින් මේ යෝජනාව ගෙන ඒමත් ඉතාම පුදුමයක්. මම මුලින් කියපු සිදුවීම සම්බන්ධව ගෙන තිබෙන පියවර මොකක්ද? ගරු ඇමතිතුමා ඒකට පිළිතුරක් ලබා දෙයි කියා මා බලාපොරොත්තු වෙනවා.

අපි දැක්කා, පෙරේදා හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය සමගි ජන බලවේගයේ කාන්තා පෙරමුණ සමඟ ගිහිල්ලා කළ උද්ඝෝෂණය. අපි එය අගය කරන්න ඕනෑ. ලංකාවේ ජනාධිපතිවරයා කියන්නේත් ඡන්දයෙන් තේරී පත් වූ පුද්ගලයෙක්. එහෙම නැතුව එතුමා crown princeවත්, රජතුමකුවත් නොවෙයි. අපිත් එතුමා හමුවන්න ජනාධිපති කාර්යාලයට ගියා. නමුත් එතුමා ආවේ නැහැ, අප හමුවන්න. එතුමා එදා කෝච්චි බලන්න රත්මලානට ගිහිල්ලා. ලංකාවේ පාර්ලිමේන්තුව නියෝජනය කරන, ලක්ෂ 20ක ජනතාව නියෝජනය කරන, උතුරු-නැඟෙනහිර සහ කොළඹ සිටින මන්ත්‍රීවරු දහතුන්දෙනකු රටේ ජනාධිපතිවරයා හමුවන්න ආවාම මොකක්ද කරන්න ඕනෑ? රත්මලානේ කෝච්චි බලන්න යන එකද වැදගත්, උතුරු-නැඟෙනහිර ජනතාවගේ ප්‍රශ්න ගැන කථා කරන්න ඇවිත් සිටින මන්ත්‍රීවරු හමුවන එකද වැදගත්?

පසුගිය දිනක හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය ඇතුළු කාන්තාවන් පිරිසක් ජනාධිපතිතුමා හමුවන්න ගිහිල්ලා උද්ඝෝෂණය කළ අවස්ථාවේ එතැන WPCsලා සිටියා නම්, එතැනදී එතුමියලා physically නවත්වන්න උත්සාහ කරාවි. මම හිතන විධියට එතැන පිරිමි පොලිස් නිලධාරින් හිටපු නිසා එතුමියලාට අත තබන්න තිබෙන බයට එතුමියලාට එතැනට යන්න ඉඩ දෙන්න ඇති. නමුත්, උතුරු-නැඟෙනහිර නම් ඔය වාගේ අවස්ථාවල WPCsලා යොදවා කකුල් පෑගීම වාගේ දේවල් කරන බව අපි දැක තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය ඇතුළු පිරිස කළ ඒ උද්ඝෝෂණයට විරුද්ධව එතුමියගේ ගෙදර ඉස්සරහට ගිහිල්ලා කළ දේත් ඉතාම පහත් දෙයක්. අපට පැහැදිලිව පෙනෙනවා, දේශපාලන පසුබිමක් නැතුව කවුරුවත් එහෙම කරන්නේ නැහැ කියන එක. ඊට අමතරව අපි දැකපු තව දෙයක් තිබෙනවා. කෝට්ටේ ආසනය නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීතුමෙක් තවත් පිරිසක් සමඟ ගිහිල්ලා සමගි ජන බලවේගයේ ප්‍රධාන කාර්යාලයට බිත්තර ගැහුවා. එතුමා ගැන අපි හිතාගෙන හිටියේ මීට වඩා වැදගත්කමකින් යුතු කෙනෙකු කියලායි. මොකක්ද, මේ පොදුජන පෙරමුණ පක්ෂයට වෙලා තිබෙන්නේ? අද ආණ්ඩුව කරන්නේ පොදුජන පෙරමුණද? සමගි ජන බලවේගයද? අපි අහන්න ඕනෑ ප්‍රශ්න -විපක්ෂයේ ඉන්න මන්ත්‍රීවරු අහන්න ඕනෑ ප්‍රශ්න- ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු අහනවා.

[ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් ]

මුලසුනේ සිටින මන්ත්‍රීතුමාටත් මම ගරු කරනවා. අපි දැක්කා, පසුගිය දිනක මුළු රටම හරි මහටද මොකක්ද කියලා උත්සවයක් පැවැතුණා. ඒකත් නාට්‍යයක් කියලා අපි දන්නවා. ඔබතුමා නියෝජනය කරන ජනතාව වෙනුවෙන් ඔබතුමාත් එයට සහභාගි වෙලා, ඒ පැවැති මාධ්‍ය සාකච්ඡාවේදී පිටුපස පේළියේ ඔබතුමාත් ඉන්නවා අපි දැක්කා. ඔබතුමාට අපි ගරු කරනවා. හැබැයි, අද එවැනි තත්ත්වයක් පවතිද්දි ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරියක් මේ වාගේ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවකුත් ගෙනැවිත් තිබෙනවා.

මම ගරු අලි සබ්රි ඇමතිතුමාට යමක් කියන්න කැමැතියි, Enforced disappearances ගැන. ඒ කියන්නේ ඒගොල්ලන් කොහේදිවත් නැතිවෙලා නොවෙයි. ඒගොල්ලන් හමුදාවට surrender වූ අය කියනවා; ඒගොල්ලන් හමුදාවෙන් අල්ලා ගෙන ගියා කියනවා. එහෙම නැතුව ඒගොල්ලන් නිකම්ම නැති වුණු අය නොවෙයි. උතුරු-නැඟෙනහිර පළාත්වල අතුරුදහන් වුණු ඒ පුද්ගලයන්ගේ මව්වරු ඊයේ-පෙරේදා උද්ඝෝෂණයක් කළා, Women's Day එකේ අයිතිය අපට නැහැ කියලා.

ගරු ඇමතිතුමනි, අපි පාර්ලිමේන්තුවේ, පළාත් සභාවේ සහ ප්‍රාදේශීය සභාවේ කාන්තා නියෝජනය වැඩි කරන්න ඕනෑ. ඒ වාගේම female කියන identity එක නිසා, දැනට දේශපාලනයේ යෙදෙන කාන්තාවන්ගේ දේශපාලන කටයුතු අඩපණ නොවන විධියටත් කටයුතු කරන්න ඕනෑ. පාර්ලිමේන්තුව නියෝජනය නොකරන කාන්තාවන් උද්ඝෝෂණය කරනකොට, ඒගොල්ලන්ට ඒකට ඉඩ ලබා දෙන්නත් ඕනෑ. උතුරු-නැඟෙනහිර ජීවත් වෙන අම්මලාටත් සාධාරණයක් ඉෂ්ට කරන්න ඕනෑ කියලා මම ගරු ඇමතිතුමාගෙන් නැවත වරක් ඉල්ලීමක් කරනවා. අවසාන වශයෙන් සියලු කාන්තාවන්ට "Happy Women's Day!" කියා සුබ පතමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතරක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.23]

**ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා**
(மாண்புமிகு (மேஜர்) சுதர்ஷன தெனிபிடிய)
(The Hon. (Major) Sudarshana Denipitiya)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අදට යෙදී තිබෙන ජාත්‍යන්තර කාන්තා දිනය නිමිත්තෙන් පළමුව මම සියලු කාන්තාවන්ට සුබ පතනවා. කාන්තාව කිව්වාම අපට මතක් වෙන්නේ 'අම්මා' කියන උතුම් වචනයයි. 'අම්මා' කියන ඒ උතුම් වචනය අමුතු වචනයක්; පුදුම වචනයක්. ඒක තමයි අපි ඉස්සෙල්ලාම අහන සහ කියන වචනය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාන්තාව කොතරම් දුක් විඳින කෙනෙකුද කියන එක මට මේ වෙලාවේ මතක් වෙනවා. මම එහෙම කියන්න හේතුවක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ බිරිඳට දෙවන දරුවා ලැබෙන්න සිටි අවස්ථාවේ මටත් labour room එකේ ඉන්න අවස්ථාව ලැබුණා. ඒ වෙලාවේ බිරිඳ විඳපු වේදනාව මම දැක්කා. ඒ වාගේම ඇය අපහසුතාවෙන් සිටි ආකාරයත් මම දැක්කා. පුදුම දුකක් විඳලා දරුවා බිහි කළ පසු ඇයගේ මුහුණේ රැඳුණු ඒ සුන්දර සතුටුදායක හිනාවත් මම දැක්කා. ඒක හරි අමුතු දෙයක්.

මම හිතන විධියට කාන්තාව කියන්නේ තනිව වේදනා විඳගන්න පුළුවන්, හිතාගන්න බැරි තරමේ අමුතු ශක්තියක් තිබෙන කෙනෙක්. මමත් හමුදාවේ ඉඳලා තුවාල වෙලා ආබාධිත තත්ත්වයට පත් වූ කෙනෙක්. මමත් වේදනා විඳ තිබෙනවා. නමුත්, දරුවකු බිහි කිරීමේදී දැනෙන වේදනාව වාගේ වේදනාවක් දරාගන්නවා කියන එක මට හිතාගන්නත් බැරි තරම් දෙයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාත්‍යන්තර කාන්තා දිනය යෙදී තිබෙන අද දවස ප්‍රයෝජනයට ගනිමින් මම යෝජනාවක් කරන්න කැමැතියි. අපේ ගරු ගීතා කුමාරසිංහ මන්ත්‍රීතුමිය අද ඉදිරිපත් කළ සභාව කල්තැබීමේ යෝජනාවට මම මේ යෝජනාවත් එකතු කරනවා. අම්මා කෙනෙකුට දරුවකු ලැබෙන්න සූතිකාගාරයේ - labour room - ඉන්නකොට, ඇයගේ සැමියාටත් ඒ ස්ථානයේ සිටීමට අවශ්‍ය කටයුතු සලස්වන්න කියා මා බලධාරීන්ගෙන් ඉල්ලා සිටිනවා. එහෙම වුණොත් ගොඩක් පවුල් ප්‍රශ්නත් නැති වෙයි, ඇය විඳින වේදනාව පිළිබඳ අවබෝධයත් ලැබෙයි. මහත්මයාගෙන් -සැමියාගෙන්- ආදරණීය හැඟීම්, ආදරය වැඩියෙන් ලැබෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කාලයේ රජයේ රැකියාවලට එන්නේ, එහෙම නැත්නම් විශ්වවිද්‍යාලයේ ඉන්නේ, විශ්වවිද්‍යාල අධ්‍යාපනයෙන් පසු උපාධියක් අරගෙන රැකියාවක් සඳහා යොමු වන්නේ සියයට 80ක්, 90ක් පමණ කාන්තාවන් බව අපි දකිනවා. ඔවුන් තමන්ගේ ශක්තියෙන්ම ඉදිරියට ගමන් කරනවා. ඔවුන්, තමන්ගේ ශක්තිය පෙන්වා හොඳට ඉගෙනගෙන, රැකියා සඳහා අවතීර්ණ වෙන්න අවශ්‍ය සුදුසුකම් සපුරා ගන්නා ආකාරය මේ කාලයේ අපි දකිනවා. ඒ නිසා ගරු ගීතා කුමාරසිංහ මන්ත්‍රීතුමිය අද ඉදිරිපත් කළ යෝජනාව සාධාරණ, අත්‍යවශ්‍ය, කාලෝචිත යෝජනාවක් බව මම මේ වෙලාවේ විශේෂයෙන්ම මතක් කරනවා. අද රටේ කාන්තා පරිපාලන නිලධාරිනියන් විශාල සංඛ්‍යාවක් ඉන්නවා. දේශපාලනයේත් එවැනි කාන්තාවන් ප්‍රමාණයක් සිටීම අපට ඉතාම වැදගත් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අද ගොඩක් කනගාටු වෙනවා. මොකද, විපක්ෂයේ මන්ත්‍රීවරු කවුරුවත් මේ වෙලාවේ මේ ගරු සභාවේ නැහැ, ජාත්‍යන්තර කාන්තා දිනය ගැන කථා කරන්න. අපේ කවිරත්න මන්ත්‍රීතුමිය මේ ගරු සභාවේ ඉන්නවා. ඔබතුමියට විපක්ෂ නායකතුමා ඇතුළු විපක්ෂයේ මන්ත්‍රීවරු ටික නවත්වා ගන්න තිබුණා නේ; "අද ජාත්‍යන්තර කාන්තා දිනය, අද අපේ දිනය. ඔබතුමන්ලා පොඩ්ඩක් ඉන්න. අපි වෙනුවෙන් කථා කරන්න. අද දවසේ අපට කථා කරන්න අවස්ථාවක් දෙන්න." කියලා ඔබතුමියට කියන්න තිබුණා. නමුත්, අද විපක්ෂයේ කිසිම මන්ත්‍රීවරයකු මේ වෙලාවේ සභාවේ නැහැ. මේක අපට ලොකු කනගාටුවක්. විය යුත්තේ එහෙම නොවෙයි. ජාත්‍යන්තර කාන්තා දිනය නිමිත්තෙන් එතුමන්ලා මේ ගරු සභාවේ රැඳී සිටිමින්, මේ ගරු මන්ත්‍රීවරියන්ට ගෞරව කරන්න තිබුණා. ඒ වාගේම මේ ගෙනා යෝජනාවට ගෞරව කරන්න තිබුණා. ඔබ සියලුදෙනා මේ සභාවෙන් ඉවත් වෙලා කාන්තාවන්ට ගෞරව කරන්න තිබුණු අවස්ථාවක් තමයි මේ නැති කරලා තිබෙන්නේ. ඒකට හේතුව මොකක්ද කියලා මම දන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොහොම වුණත් කමක් නැහැ, ජාත්‍යන්තර කාන්තා දිනය නිමිත්තෙන් සියලුම කාන්තාවන්ට සුබපතමින්, මගේ කථාව අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ නම කියපු නිසා මට පොඩි අවස්ථාවක් දෙන්න.

ගරු සුදර්ශන දෙනිපිටිය මන්ත්‍රීතුමනි, විපක්ෂය කාන්තාවන්ට සලකන්නේ කොහොමද කියන එක ගැන අපි විපක්ෂ නායකතුමාත් එක්ක බලා ගන්නම්. ඔබතුමන්ලා, - *[බාධා කිරීමක්]* විපක්ෂය කාන්තාවන්ට සලකන හැටි අපි දන්නවා. අද මේ වෙලාවේත් විපක්ෂ නායකතුමා ඇතුළු අපේ පක්ෂ කණ්ඩායම කාන්තාවන්ගේ වැඩ කටයුතු ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, පිළිතුරු කථාව ගරු අලි සබ්රි ඇමතිතුමා.

[අ.භා. 5.28]

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා (අධිකරණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி - நீதி அமைச்சர்)
(The Hon. M.U.M. Ali Sabry - Minister of Justice)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මේ පාර්ලිමේන්තුව තුළ, ඒ වාගේම මේ රටේ සහ මේ ලෝකයේ සිටින සියලුම කාන්තාවන්ට මම මුලින්ම ඉතාම හොඳ කාන්තා දිනයකට සුබ පතනවා. අපි විශ්වාස කරනවා, ලෝකය දෙවියන් විසින් මැව්වා කියලා. සමහර අය විශ්වාස කරනවා, ලෝකය ස්වභාව ධර්මය විසින් මැව්වා කියලා. මේ මැවීම් අතර විශිෂ්ටතම නිර්මාණය 'කාන්තාව' කියලා මම විශ්වාස කරනවා. අපි සියලුදෙනා අද මේ ලෝකයේ ජීවත් වෙනවා නම්, ඒකට හේතුව වෙලා තිබෙන්නේ කාන්තාව. යම් කෙනෙකු තුළ යම් යම් නිර්මාණශීලී හැකියා තිබෙනවා නම්, ඒ තුළින් ඉදිරියට යාම සඳහා ලොකුම influence එක ලබා දීලා තිබෙන්නේ ඒ තැනැත්තාගේ මව. ඒක කාටවත් වළක්වන්න බැහැ කියන එක අපට තේරෙනවා. ඒ නිසා කාන්තාවන් වෙනුවෙන් මෙවන් යෝජනාවක් ඉදිරිපත් කිරීම ගැන මම ස්තුතිවන්ත වන අතර, රජයක් වශයෙන් සහ අමාත්‍යාංශය වශයෙන් අපට කියන්න තිබෙන්නේ දැනට කාන්තාවන්ට දේශපාලනය සඳහා ලබා දීලා තිබෙන ඉඩ ප්‍රස්ථාව, ඒ අවස්ථාව සහ නිර්මාණ වැඩි කරනවා මිස, ඒවා හකුළා ගැනීමේ අවශ්‍යතාවක් ඇත්තේත් නැහැ, ඒ සඳහා සැලසුමකුත් නැහැ, එහෙම කරන්න බලාපොරොත්තුවකුත් නැහැ කියන එකයි. මොකද, අපිත් විශ්වාස කරනවා, කාන්තා නියෝජනය, කාන්තා නායකත්වය සමාජයට විතරක් නොවෙයි, රටකට විතරක් නොවෙයි, ලෝකයටම වැදගත් වෙනවා කියලා. අපි ඒක දන්නවා. අපි උදාහරණයක් ගනිමු. පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරියන් ඉන්නේ සියයට 5යි. මා සතුව තිබෙනවා, 2021 දෙසැම්බර් මාසය වෙනකොට අපේ සිර කඳවුරුවල සිටි රැඳවියන් පිළිබඳ තොරතුරු. ඒ අනුව, 18,722දෙනෙක් සිර කඳවුරුවල ඉඳලා තිබෙනවා. ඉන් 17,985දෙනෙක්ම පිරිමි. කාන්තාවන් 787දෙනායි ඉඳලා තිබෙන්නේ. ඒකෙන්ම පේනවා, කාන්තාවන් අතිබහුතරය අවිහිංසාවාදීව, ප්‍රචණ්ඩත්වයකින් තොරව ඉතා සංවරව ජීවත් වන බව.

ගරු මන්ත්‍රීවරුන් කියපු ආකාරයට, අපේ රටේ ආර්ථිකය ඉදිරියට පවත්වාගෙන යෑමට අතිවිශිෂ්ටතම හා විශාලම දායකත්වය ඔවුන්ගෙන් ලැබෙනවා. තේ කර්මාන්තය හෝ වේවා, විදේශ ශ්‍රම භාවිත කරලා මුදල් ප්‍රේෂණය කිරීම හෝ වේවා, apparel industry එක හෝ වේවා මේ සියල්ලම ඔවුන්ගෙන් තමයි සිද්ධ වෙන්නේ. ඒ හින්දා ඔවුන්ට විශේෂයෙන් සැලකුවා කියලා කිසිදු හානියක් වෙන්නේ නැහැ. එය රටකට වඩා හොඳයි කියන එක තමයි මමත් විශ්වාස කරන්නේ.

සාමාන්‍යයෙන් අපේ කලාපය තුළ කාන්තාව නායකත්වයට ආපු වෙලාවක අනෙක් අයට -පිරිමින්ට- නැති යම් විනයක් ඔවුන් සතුව තිබෙනවා. -සාමාන්‍යයෙන්- හැම එකටම විකල්ප තිබෙනවා; හැම එකටම ව්‍යතිරේක තිබෙනවා. නමුත් සාමාන්‍යයෙන් අනෙක් අයට නැති සංවේදීභාවයක් ඔවුන් තුළ තිබෙනවා. පිරිමින්ට වඩා වැඩි සහකම්පනයක් ඔවුන් තුළ තිබෙනවා. කාන්තාවන් අනෙක් අය පිළිබඳව දෙසැරයක් හිතනවා. ඒ හින්දා එවැනි නායකත්වයක් ඉතා වැදගත්. අනෙක් සියලු ක්ෂේත්‍රවල කාන්තා නායකත්වය අද ඉදිරියට යනවා. අද උදේ මම කාන්තා නීතිඥ සංගමය සංවිධානය කරපු රැස්වීමකට ගියා. ඔවුන් ඉතා ලස්සන රැස්වීමක් සංවිධානය කරලා කොවිඩ් උවදුරෙන් රට බේරා ගැනීම සඳහා විශිෂ්ට කැපවීම් කරපු කාන්තාවන් ඇගයීමකට ලක් කරනු ලැබුවා. එහිදී මම දැකපු ඉතා වැදගත් දෙයක් තමයි විවිධ ක්ෂේත්‍රවල කාන්තා නියෝජනය. අග්‍රවිනිශ්චයකාරතුමියක් අපට ඉඳලා තිබෙනවා. නීතිපතිවරියක් අපට ඉඳලා තිබෙනවා. ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරියන් ඉඳලා තිබෙනවා. ඒ සියලුදෙනාම අනෙක් අයට නොදෙවෙනිව ඉතා හොඳින් තමන්ගේ යුතුකම් ඉෂ්ට කරලා තිබෙනවා. අද ලෝකයේ විවිධ තැන් දිහා බැලුවාම, Finland, Ireland and New Zealand වාගේ රටවල කාන්තාව තමයි, Prime Ministerගේ සිට සම්පූර්ණ කැබිනට් මණ්ඩලයම වාගේ run කරන්නේ.

ඊළඟට අපි ලෝකයේ විවිධ අර්බුද දිහා බලනකොට යුද්ධයක් හෝ වේවා ප්‍රචණ්ඩත්වයක් හෝ වේවා කාන්තාව මූලික වෙලා අර්බුදයක් නිර්මාණය කිරීම ඉතා අඩුයි. ඒ හින්දා කාන්තාවට අපි අවස්ථාව ලබා දිය යුතුයි. කාන්තාවට විශේෂ අවසරයක් ලබා දිය යුතුයි. කාන්තාව දේශපාලනයට හා නායකත්වයට ඒම සඳහා අවස්ථාව සැලසෙන ආකාරයට ඉදිරියේදී නීති සැකසිය යුතුයි කියන ස්ථාවරයේ අපි ඉන්නවා. ඒක අපට තනියෙන් කරන්න බැහැ. ඒ නිසා මේ පාර්ලිමේන්තුව තුළ එවැනි කතිකාවක් ඇති කිරීම පිළිබඳව මම ස්තුතිවන්ත වෙනවා.

විශේෂයෙන්ම අපි එක කාරණයක් කියන්න ඕනෑ. මුලින් කථා කළ මන්ත්‍රීතුමිය කියපු ආකාරයට ප්‍රවේශයක් හැටියට කාන්තාව දේශපාලනය සඳහා යොමු කිරීමට 2017 අංක 17 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ (සංශෝධන) පනතෙන් විශාල සේවයක් ඉෂ්ට වෙලා තිබෙනවා. ඒක හේතුකොටගෙන මුල් අදියර හැටියට දේශපාලනයට අත ගැසීම සඳහා ඔවුන්ට හැකියාවක් ලැබිලා තිබෙනවා. ඔවුන් රැකගෙන, පෝෂණය කරලා ඊළඟ අදියර වෙත ඉදිරියට යන්නේ කොහොමද කියන එක පිළිබඳව අපි බලාගන්න ඕනෑ. ඒ සඳහා අපි සියලුදෙනාටම ලොකු වගකීමක් තිබෙනවා. අපි හැමදෙනාම කවුරු හෝ මවකගේ දරුවෙක්. අපි බොහෝ අයට බිරිඳක් ඉන්නවා; දරුවන් ඉන්නවා. ඒ හින්දා කවුරුහරි කාන්තාවට අපහාස කරන විධියට, උපහාස කරන විධියට, අශිෂ්ට විධියට සලකනවා නම් ඒක අපි උඩ බලාගෙන කෙළ ගසා ගැනීමක්, අපට කරන නිගාවක්, අපේ අම්මාට කරන නිගාවක් කියා මා හිතනවා. ඒක අපට කිසිසේත්ම අනුමත කරන්න බැහැ. එවැනි දෙයක් නොවෙයි අපි මේ රටින් බලාපොරොත්තු විය යුත්තේ කියන එකත් කියන්න ඕනෑ.

ගරු මන්ත්‍රීතුමියනි, එම නිසා මම නැවත වතාවක් ඔබතුමියලාට කියන්න ඕනෑ, දැනට කාන්තාවට තිබෙන අවස්ථා අවම කරන්න අපේ කිසිම බලාපොරොත්තුවක් නැති බව. අපි කරනවා නම් කරන්නේ ඒ තිබෙන අවස්ථා වැඩි දියුණු කිරීම මිස අන් කිසිවක් නොවෙයි.

අපේ කාන්තා සංසදයේ ගරු සභාපතිතුමියත් මේ සභාවේ ඉන්න හින්දා මා මේ කාරණය කියන්නේ. අද උදේ ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමා මගෙන් වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නය අහපු වෙලාවේ ඉතා හොඳ යෝජනාවක් ගෙනැල්ලා තිබුණා, සමූහ දූෂණයට ලක්වන කාන්තාවන්ට තමන්ගේ දරු ගැබ දිගටම තබා ගැනීමට අවශ්‍ය ද, එහෙම නැත්නම් එය ඉවත් කර ගැනීම සඳහා නීතියෙන් අවකාශ ලබා දිය යුතු ද, එහෙමත් නැත්නම් medical හේතු මත තමන්ගේ ජීවිතය හෝ දරුවාගේ ජීවිතය ඉතා අන්තරාදායක තත්ත්වයට පත් වුණු අවස්ථාවකදී

[ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා]

ගබ්සා කිරීම අයිතියක් හැටියට ලබා ගත යුතුද යන කාරණය ගැන. ඒ වාගේ දෙයක් සාකච්ඡා කිරීම හොඳයි, අනෙක් රටවලත් ඒ කටයුතු සිද්ධ වෙලා තිබෙන නිසා.

මේ රට වර්තමානයේදීත්, අනාගතයේදීත් ඉදිරියට ගෙනයෑම සඳහා කාන්තාව තවත් ශක්තිමක් කළ යුතුයි; කාන්තාවන්ට තවත් අවස්ථා ලබා දිය යුතුයි; ඔවුන්ට ලැබෙන ගෞරවය වැඩි වැඩියෙන් ලබා දිය යුතුයි. අයිතිවාසිකමක් හැටියට ඔවුන්ට ඒ අවස්ථා තිබෙනවාය කියන එක මම විශ්වාස කරනවා.

අද වනකොට කවුරු කිව්වත්, නොකිව්වත් පසුගිය අවුරුද්දේ - 2021- විශ්වවිද්‍යාල ප්‍රවේශයෙන් සියයට 62ක් අපේ කාන්තා දරුවන් ලබාගෙන තිබෙනවා. ලංකාවේ විතරක් නොවෙයි, ඇමෙරිකාවේත් undergraduate population එකෙන් සියයට 58ක් කාන්තාවන්. කාන්තාව සියලු ක්ෂේත්‍රවලින් ඉදිරියට යනවා නම්, ඒ හා සමගාමීව දේශපාලන ක්ෂේත්‍රයෙනුත් ඉදිරියට යා යුතු බව රජයක් වශයෙන් අපි පිළිගන්නා බව ප්‍රකාශ කරමින්, ඔබ සියලුදෙනාටම සුබ කාන්තා දිනයක් වේවා කියා නැවත වතාවක් ප්‍රාර්ථනා කරමින්, මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

***එකල්හි වේලාව අ.භා. 5.30 පසු කර තිබුණෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 5.36ට, 2022 මාර්තු 09 වන බදාදා පූ.භා. 10.00 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது நேரம் பி.ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால், மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, பி.ப. 5.36க்கு, பாராளுமன்றம் 2022 மார்ச் 09, புதன்கிழமை மு.ப. 10.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*And it being past 5.30 p.m.,* THE HON. PRESIDING MEMBER *adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 5.36 p.m. until 10.00 a.m. on Wednesday, 09th March, 2022.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

හැන්සාඩ් වාර්තා කොළඹ 5 කිරුළපන මාවතේ
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්
මිල දී ගත හැක.

මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්
බාගත කළ හැක.

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை கொழும்பு 5, கிருலப்பனை மாவத்தையிலுள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
Kirulapone Avenue, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.